

# ශ්‍රී ලංකාවේ ඉඩම් අර්බුදයන්ගේ අන්තර් ඡේදනීය ප්‍රවණතා

අගෝස්තු 2024

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

25 YEARS 1996 - 2021
CENTRE FOR POLICY ALTERNATIVES

# ශ්‍රී ලංකාවේ ඉඩම් අර්බුදයන්ගේ අන්තර් ඡේදනීය ප්‍රවණතා

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සම්පාදිත වාර්තාව**

**2024 අගෝස්තු**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු රාජ්‍ය පාලනය සහ ගැටුම් නිරාකරණය පිළිබඳ ගැටලු කෙරෙහි සිය මූලික අවධානය යොමු කරන ස්වාධීන සහ අපක්ෂපාතී ආයතනයකි. රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ විවාදයන්ට සිවිල් සමාජයේ ශක්තිමත් දායකත්වය අත්‍යවශ්‍ය බවට වන ස්ථිර විශ්වාසයෙන් යුතු ව වසර 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටු වන ලද අතර, රාජ්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණය, විකල්ප හඳුනා ගැනිම සහ බෙදා හැරීම පිණිස ඉවහල් වන පර්යේෂණ සහ උපදේශන වැඩසටහන් සඳහා කැපවී සිටී.


ලිපිනය : අංක 6/5, ලේයාර්ඩ්ස් පාර, කොළඹ, 00500.

දුරකථනය : +94 11 2081384, +94 11 2081385, +94 11 2081386


ෆැක්ස් : +94 11 2081388 වෙබ් අඩවිය: www.cpalanka.org

විද්‍යුත් තැපැල් ලිපිනය: info@cpalanka.org



අයි එස් බී එන් අංකය: 978-624-5914-25-8

Cover Image



*Chandraguptha Thenuwara,  "Landscape Undivided", 2024, Oil on Canvas, 92cmx 153 cm*

*Exhibited in the 'Meta-Real' solo exhibition of Chandraguptha Thenuwara at Saskia Fernando Gallery from 23rd July to 13th August 2024*

## ස්තුතිය

පර්යේෂණය සිදු කර මෙම වාර්තාව ලියන ලද්දේ භවානි ෆොන්සේකා, දිවාගරාණි මුනීස්වරන්, රෙහාන් පෙරේරා, සන්දීප් තිසාරච්චි සහ ෂබ්නම් මොහොමඩ් විසිනි. පර්යේෂණ සහාය සුකන්‍යා වොට්සන් විසින් සපයන ලදි. ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු සහ ලුවී ගනේෂතාසන් විසින් පෙර කෙටුම්පත් පිළිබඳ අදහස් ඉදිරිපත් කරන ලදි. මෙම වාර්තාව සංස්කරණය කරන ලද්දේ නූපුර ලියනගේ විසිනි. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල විවිධ පුද්ගලයන් සහ සංවිධාන විසින් ලබා දුන් ආධාර උපකාර නොවන්නට මෙම පර්යේෂණය සහ වාර්තාව සැකසීම සිදු කළ නොහැක්කකි.

**කෙටි යෙදුම්**

ඒ. එච්. ආර්. සී. - ඒ. එච්. ඒ. එම්. මානුෂීය සම්පත් මධ්‍යස්ථානය

බී. ඕ. අයි. - ආයෝජන මණ්ඩලය

සී. ඊ. ඒ. - මධ්‍යම පරිසර අධිකාරිය

සී. ඊ. බී. - ලංකා විදුලිබල මණ්ඩලය

සී. පී. ඒ. - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

සී. එස්. ඕ. - සිවිල් සමාජ සංවිධාන

ඩී. එස්. - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ඊ. අයි. ඒ. - පාරිසරික බලපෑම් තක්සේරුව

එෆ්. ඩී. අයි. - සෘජු විදේශ ආයෝජන

ජී. එන්. - ග්‍රාම නිලධාරී

ජී. එස්. එම්. බී. - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

එච්. එස්. ඉසෙඩ්. - අධි ආරක්ෂිත කලාපය

එල්. ඒ. ඒ. - ඉඩම් අත්පත් කර ගැනීමේ පනත

එල්. ඩී. ඕ. - ඉඩම් සංවර්ධන ආඥාපනත

එල්. එල්. ආර්. සී. - උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම

එම්. එස්. ඊ. ඩී. ඕ. - මන්නාරම සමාජ හා ආර්ථික සංවර්ධන සංවිධානය

එම්. ඕ. යූ. - අවබෝධතා ගිවිසුම

ආර්. ටී. අයි. - තොරතුරු දැනගැනීමේ අයිතිය

එස්. එල්. එස්. ඊ. ඒ. - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

එස්. එල්. ටී. ඩී. ඒ. - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ටී. එස්. එල්. - සීමාසහිත ටයිටේනියම් වැලි සමාගම

යූ. ඩී. ඒ. - නාගරික සංවර්ධන අධිකාරිය

පටුන

*සිතියම 1 ශ්‍රී ලංකාවේ සමස්ත උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන් හි ඇති ඉඩම් සම්බන්ධ අර්බුදයන්*.... 8

***සිතියම 2 කුච්චවෙලියේ පන්සල් සම්බන්ධ සිදුවීම් 32*** .......... **9**

**1.** හැඳින්වීම .......... **10**

1.1. පර්යේෂණ අරමුණු සහ පරිච්ඡේද දළ සටහන .......... 12

1.2. ක්‍රමවේදය .......... 12

1.3. සීමාවන් .......... 12

2. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ඉඩම් සම්බන්ධ අර්බුදය පිළිබඳ සිදුවීම් .......... 13

2.1. අම්පාර දිස්ත්‍රික්කය .......... 13

2.2. මඩකලපුව දිස්ත්‍රික්කය .......... 17

2.3. යාපනය දිස්ත්‍රික්කය .......... 19

2.4. කිලිනොච්චි දිස්ත්‍රික්කය .......... 27

2.5. මන්නාරම් දිස්ත්‍රික්කය .......... 29

2.6. මුලතිව් දිස්ත්‍රික්කය .......... 39

2.7. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය .......... 41

2.8. වවුනියාව දිස්ත්‍රික්කය .......... 55

3. ඛණ්ඩනය වූ සහ දෝෂ සහිත රාජ්‍ය ව්‍යුහය .......... 60

3.1. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව .......... 60

3.2. නාගරික සංවර්ධන අධිකාරිය .......... 62

3.3 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත .......... 63

3.4. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය .......... 66

3.5. මධ්‍යම පරිසර අධිකාරිය .......... 67

3.6. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව .......... 68

3.7. වාරිමාර්ග දෙපාර්තමේන්තුව .......... 69

3.8. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව .......... 70

3.9. සංචාරක අංශය .......... 71

3.10. 'උරුමය වැඩසටහන' .......... 72

3.11 පළාත් සභා .......... 73

4. ඉඩම් අර්බුදයන් හි අන්තර් ඡේදනීය ප්‍රවණතා .......... 76


4.1. වාර්ගිකවාදී ආඛ්‍යාන .......... 77

4.2. රජයේ අධිකාරීන්ගේ මැදිහත් වීම .......... 80

4.3. හමුදාකරණය .......... 84


4.4. පුද්ගලික ආයතනයන්ගේ මුලා ප්‍රතිලාභ....87
5. ඉදිරි මඟ....89
5.1. නිර්දේශ....89
5.2. නිගමනය....92

*සිතියම 1 ශ්‍රී ලංකාවේ සමස්ත උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන් හි ඇති ඉඩම් සම්බන්ධ අර්බුදයන්*




මෙම සිතියම ඉඩම් ගැටුම් ආශ්‍රිත සිද්ධි පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් සපයන්නේ නැත; එය වාර්තාවේ සාකච්ඡා කර ඇති අවස්ථා කිහිපයක් උදෙසා නිදර්ශනයක් සපයයි.

*සිතියම 2 කුච්චවේලියේ පන්සල් සම්බන්ධ සිදුවීම් 32*




*මෙම සිතියම තුළින් විහාරස්ථාන 32න් 16ක් ඉස්මතු කරයි. වැඩි විස්තර සඳහා, 2.7.5 පරිච්ඡේදය තුළ දක්වා ඇති වගුව බලන්න.

1. සංකමලේ පුරාණ රජ මහා විහාරය
2. නාගලෙන රජ මහා විහාරය
3. ආසිරිකාන්ත පුරාණ රජ මහා විහාරය
4. ශාන්ති පුරාණ රජ මහා විහාරය
5. ශ්‍රී සත්තර්ම යුක්තික වන සෙනසුන
6. යාන් ඔය පුරාණ රජ මහා විහාරය
7. අත්තානාගි කාන්ත පුරාණ රජ මහා විහාරය
8. මිහිඳුලෙනේ පුරාණ රජ මහා විහාරය
9. සප්තනාහ බප්පත වන සෙනසුන
10. පත්මරාජ පපත වනසේනගන
11. ගිරිහඬු සෑ නීත්තු පාපන රජ මහා විහාරය
12. සමුත්තිරගිරි පිච්චමල් පුරාණ රජ මහා විහාරය
13. චෛත්‍යගිරි පුරාණ රජ මහා විහාරය
14. බඹරකාල පුරාණ රජ මහා විහාරය
15. දෙබරගල පුරාණ රජ මහා විහාරය
16. විත්තිලෝග රජ මහා විහාරය

# 1. හැඳින්වීම

සිවිල් යුද්ධය අවසන් ව වසර 15ක් ගෙවී ගිය පසුව ද, ශ්‍රී ලංකාව ගැඹුරු වාර්ගික බෙදීම් අත්විඳිමින් සිටින අතර, ගැටුමේ මූල හේතු විසඳීමට අපොහොසත් වීම හේතුවෙන් රට පශ්චාත් ගැටුම්කාරී සමාජයක් කරා රැගෙන යාමට නොහැකි වී තිබේ. අවාසනාවකට මෙන්, දශක ගණනාවක් තිස්සේ පැවති ඉඩම් ගැටලුව පශ්චාත් යුද පසුබිම තුළ අඛණ්ඩ ව පවතින අතර, රාජ්‍ය මැදිහත් වීමෙන් පිහිටුවන ලද නව යාන්ත්‍රණයන් ප්‍රතිසන්ධාන ක්‍රියාවලින් වළක්වන බෙදීම් නිර්මාණය කරමින් සිටී. පසුගිය දශක තුනකට වැඩි කාලයක් මුළුල්ලේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල අසමමිතික බල තුලනයක් නිර්මාණය කිරීම පිණිස ඉඩම් පිළිබඳ ගැටලුව භාවිත කර ඇති අතර, ආක්‍රමණශීලී ක්‍රමවේදයන් ඔස්සේ මෙම ප්‍රදේශයන් හි ජීවත් වන ප්‍රාදේශීය ප්‍රජාවන් අතර භීතිය පැතිරවීමේ ප්‍රවණතාවක් වර්ධනය වෙමින් පවතී. ඒ අනුව, ඉඩම් හිමිකම, භාවිතය සහ ප්‍රවේශය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන අධිකාරීන්ගේ බහුවිධ භූමිකාවන් වෙත අවධානය යොමු කිරීම මෙන් ම ප්‍රාදේශීය ප්‍රජාවන් මෙකී පීඩනයට ප්‍රතිචාර දක්වන ආකාරය ගවේෂණය කිරීම මෙම වාර්තාවෙන් අරමුණු කෙරේ. රාජ්‍යය අනුග්‍රහය සහිත ව ව්‍යවස්ථාදායකය, රජයේ ආයතන, හමුදාව සහ පෞද්ගලික සංස්ථා විසින් සාර්ථක පශ්චාත්-ගැටුම් සමාජයක් බිහි කර ගැනීමෙහි ලා ප්‍රජාවන් සහ ජාතිය කෙරෙහි නිර්මාණය කරන දිගුකාලීන ප්‍රතිවිපාකයන්ගේ ස්වභාවය මෙහි දී ඉස්මතු කෙරේ. මෙහි දී වාර්ගිකත්වය, අඛණ්ඩ රජයේ අධිකාරී මැදිහත් වීම, මිලිටරි ව්‍යාප්තිය සහ පුද්ගලික ආයතනවල ලාභ ඉපැයීමේ අරමුණු වැනි අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් රැසකට හේතු වන ප්‍රධාන අන්තර් සම්බන්ධිත ප්‍රවණතා මාලාවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් හඳුනා ගනී.

ආරක්ෂා කළ යුතු මූලික අයිතිවාසිකම් වාර්ගික-බහුතරවාදී නැම්යාව විසින් උල්ලංඝනය කර ඇති ආකාරය මෙම වාර්තාවෙන් පෙන්වා දෙයි. ඒ අනුව, රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්, විශේෂයෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ මැදිහත්වීම් ඉහළ යාම හේතුවෙන් සතුරුකම් තව දුරටත් තීව්‍ර වීම දක්නට ලැබෙන්නකි. ඒ අනුව, භික්ෂූන් වහන්සේලා විසින් සුළු ජාතික ආගමික ප්‍රජාවන්ට අයත් ඉඩම්වලට ඇතුළු වී, අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මානික්කමඩු සිද්ධස්ථානය, යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි චූලිපුරම් පාරලෛ මුරුගන් කෝවිල සහ මුලතිව් දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කුරුන්තූමලෛ ආති ශිවන් අයියනාර් කෝවිල (මේ පිළිබඳ පසුව විස්තර කෙරේ) ප්‍රතිවිරෝධී සාක්ෂි තිබියදීත්, එම ඉඩම් උදුරා දමා, 'පූජා භූමි හෝ 'බෞද්ධ සිද්ධස්ථාන ලෙස නම් කර, යළි අත්පත් කර ගෙන ඇති බව මෙම වාර්තාවෙන් කියා සිටී. 'ජාතික උරුමය' යන වදන බහුතර මතය දිනා ගැනීම පිණිස භාවිතා කිරීම තුළින් එවැනි පාරිභාෂික වචනවල ජනවාර්ගික නැඹුරුව පෙන්නුම් කරන අතර, එය අප ජාතියක් ලෙස අනන්‍යතාවය වටහා ගන්නා ආකාරය පිළිබඳ පුළුල් ඇඟවුම් ලබා දෙයි. ඉඩම් ආරවුල් සඳහා බෞද්ධ පූජ්‍ය පක්ෂය වැඩි වැඩියෙන් මැදිහත් වීම බොහෝ විට රාජ්‍ය ක්‍රියාකාරීන් සමඟ ඇති කුමන්ත්‍රණකාරී සම්බන්ධයක් පිළිබිඹු කරන අතර, ඉඩම් පවරා ගැනීමේ දී භික්ෂූන් වහන්සේලාගේ භෞතික ආරක්ෂාවට හමුදා සහ පොලිස් නිලධාරීන් සහය වේ. වාර්ගිකවාදී හැඟීම් වැඩි කිරීමේ රාජ්‍ය න්‍යාය පත්‍රය යටතේ උතුරු නැගෙනහිර දෙපළාතේ ඉඩම් අත්පත් කර ගැනීම සිදු වන අතර සුළු ජාතික ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව බෞද්ධ පූජකවරුන් වෙත සහාය දැක්වීමෙන් රජයට බොහෝ දේශපාලන වාසි පවතින බව වාර්තාව තර්ක කරයි. මීට අමතරව, වාර්ගික ජාතිකවාදී හැඟීම් වැඩි වීම, විශේෂයෙන් වැඩි වූ සිංහල-බෞද්ධකරණය සහ හින්දුත්ව ජාතිකවාදය පිළිබඳ නිරීක්ෂණ වාර්තාව ඉස්මතු කරයි. මේ අනුව, රජයේ න්‍යාය පත්‍රයට අනුපූරක වන රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් බල ගැන්වීම මගින් වාර්ගිකවාදී හැඟීම් තහවුරු කිරීම බොහෝ විට සිදු කරනු ලබයි.

විශේෂයෙන්ම එළැඹෙන ජාතික මැතිවරණ සන්දර්භය තුළ සහ ඓතිහාසික වශයෙන් සුළු ජාතීන් විසින් ආධිපත්‍යය දරන ප්‍රදේශවල වාර්ගික හා ආගමික සංයුතිය වෙනස් කිරීම පිණිස ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පාර්ලිමේන්තු අණපනත් භාවිතා කිරීම මෙන් ම අවභාවිතය ද සිදු වන බව වාර්තාව තව දුරටත් පෙන්වා දෙයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වැනි ආයතන මෙසේ සිදු කරනු ලබන රාජ්‍ය මැදිහත්වීම් පිළිබඳ වාර්තාව සාක්ෂි සහිත ව තහවුරු කරයි. මෙම නියෝජිතායතන බොහෝ විට ප්‍රජාවන් විසින් සියවස් ගණනාවක් තිස්සේ භාවිතා කළ ඉඩම්වලට, දැනුම් දීමකින් තොරව ඇතුල් වන අතර, ඉඩමට ප්‍රවේශ වීම

වැළැක්වීමට කටයුතු කරයි. එවැනි ක්‍රියාවන් දශක ගණනාවක් ප්‍රචණ්ඩත්වය අත්විඳි ප්‍රදේශවල, ප්‍රචණ්ඩත්වය පිළිබඳ තර්ජනාත්මක භීතිය යළි ඇති වීමට හේතුවී තිබේ. මන්නාරමට දකුණින් මායිම් ව ඇති මුල්ලිකුලම් ගම්මානය සහ නවගිරි ගම්මානයේ නිලාවරෙ ළිඳ ආශ්‍රිත සිදුවීම්වල දී පැහැදිලි වන පරිදි, දෙපාර්තමේන්තු ඉඩම් සම්බන්ධ සිය ආධිපත්‍ය පුළුල් කර ගැනීම පිණිස බොහෝ විට නීතිමය රාමුව භාවිතා කරයි, මේ පිළිබඳ මෙම වාර්තාවේ තව දුරටත් සාකච්ඡා කෙරේ. රාජ්‍ය පාර්ශවකරුවන්ගේ මෙම අත්තනෝමතික සහ අනපේක්ෂිත මැදිහත්වීම් හේතුවෙන් තම ඉඩම්වල ජීවත් වීමට සහ තම ජීවනෝපාය කර ගෙන යාමට ඇති හැකියාව පිළිබඳ ව ප්‍රජාවන් තුළ සහ ඔවුන් අතර භීතියක් ඇති වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශීය ප්‍රජාවන් සහ රාජ්‍ය බලධාරීන් අතර ආතතීන් වැඩි වෙමින් පවතී.

රාජ්‍ය මැදිහත්වීමේ ක්‍රියාමාර්ග කාලයත් සමග සැලකිය යුතු ලෙස පරිණාමය වී ඇතත්, පවතින ගැටුම් සඳහා ඓතිහාසික සහ සමකාලීන උපක්‍රම යන දෙකම දායක වී ඇත. ප්‍රදේශවාසීන්ට ඔවුන්ගේ ඉඩම්වලට ප්‍රවේශ වීම අවහිර කිරීම සඳහා හමුදා විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ අතීත උපක්‍රමය දිගටම ක්‍රියාත්මක විය. ශ්‍රී ලංකාවේ නැගෙනහිර සාම්පූර් වැනි සිද්ධීන් සමග දශක ගණනාවක් තිස්සේ ප්‍රදේශවාසීන්ට ඔවුන්ගේ ඉඩම්වලට ඇතුළු වීමට සහ ඒවා භාවිතා කිරීමට බාධා කිරීමට හමුදාව විසින් උත්සාහ කර ඇති ආකාරය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදු කළ නියැලීම්වලින් පෙන්නුම් කෙරේ[1]. හමුදා විසින් ඉඩම් අත්පත් කර ගැනීම ව්‍යාප්ත වීමෙහි බලපෑම බොහෝ විට ජනතාව ඉවත් කිරීමට සහ අවතැන් වීමට හේතු වන අතර ආර්ථික ක්‍රියාකාරකම් ඇතුළු ව ජීවනෝපාය නැවත ආරම්භ කිරීමට ඇති හැකියාවන් ද අවහිර කෙරෙන බව වාර්තාවේ එන සිදුවීම් මගින් පෙන්වා දෙයි. බොහෝ විට, ඉඩම් සඳහා ප්‍රවේශය නොමැතිවීමේ ප්‍රතිවිපාක අති මහත් වන අතර, දරිද්‍රතාවය ඉහළ යාමට සහ නෙරපා හැරීම්වලට මෙන් ම ජීවන තත්ත්වය විශාල ලෙස පහත වැටීමට ද එය හේතු වේ. හමුදාව සහ රාජ්‍ය පාර්ශවකරුවන් දිගින් දිගටම අත්පත් කර ගන්නා ඉඩම් ආපසු ලබා දෙන්නේ ද යන්න ප්‍රශ්නකාරී වන අතර එවැනි මුලපිරීම් හේතුවෙන් ඒ පිටුපස ඇති රාජ්‍ය අභිප්‍රායන් පිළිබඳ ව ප්‍රජාවන් අතර සැකයක් මෝදු වෙමින් පවතී. තවද, අතීත ජනපදකරණ යෝජනා ක්‍රම ගැටුම්වලට හේතු වූ තත්ත්වය තුළ, 'උරුමය වැඩසටහන' වැනි නව යෝජනා ක්‍රම කෙරෙහි බියක් ද ඇති වී තිබේ. මෙම නව වැඩසටහන්වල සම්පූර්ණ ප්‍රතිවිපාක සංකීර්ණ මෙන් ම තවමත් පැහැදිලිව දැකිය නොහැකි නමුත් ඒ ගැන අඛණ්ඩ ව විමසිල්ලෙන් සිටීම අත්‍යවශ්‍ය වේ.

මීට අමතරව, මෑත කාලීන ව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය මත උතුරු නැගෙනහිර ක්‍රියාත්මක වූ වැලි කැණීම වැනි ව්‍යාපෘතීන් තුළින් දුර්වල අධීක්ෂණ සහ සීමිත නියාමන ප්‍රතිපාදන සහිත ව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද ප්‍රදේශවාසීන් මුහුණ දෙන දැඩි පාරිසරික හා ආර්ථික බලපෑම්වලට උදාහරණ බවට පත් ව තිබේ. වාර්තාවේ පසුව සාකච්ඡා කරනු ලබන අදානි ග්‍රීන් එනර්ජි සමාගමේ සුළං බල ව්‍යාපෘතිය සම්බන්ධ සිදුවීම එවැනි එක් උදාහරණයකි. රට ආර්ථික සහ පාලන අර්බුදයක ගිලී පවතින පසුබිමක, සෘජු විදේශ ආයෝජන හඹා යාමේ දී සුළුතර ප්‍රජාවන්ගේ ජීවනෝපාය පරිත්‍යාග කිරීමට ඇති කැමැත්ත ඉඩම් ගැටලු සඳහා පදනම් වී තිබේ. තවද, ප්‍රාදේශීය ප්‍රජාවන්ට සැලකිය යුතු ගැටලු ඇතිකරමින් ඉඩම් අයිතිය අඩපණ කිරීමට, පරිසරය හායනය කිරීමට සහ සම්පත් අසමානුපාතික ලෙස උකහා ගැනීමට රාජ්‍ය ව්‍යුහයන් මගින් සංස්ථාවන් හැකි කරවන ආකාරය ද ඉස්මතු වන්නකි.

මෙකී විවිධ ප්‍රවණතාවන් වාර්තාවේ දක්වා ඇති අවස්ථා හරහා විමර්ශනය කෙරේ. සමස්තයක් ලෙස, ගැටුම් සඳහා ඉඩම් හේතු වන ආකාරය වාර්තාවේ දක්වා ඇති අතර උතුරු හා නැගෙනහිර වර්ධනය වෙමින් පවතින ආතතීන් මැඩපැවැත්වීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ හදිසි අවධානය යොමු කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි.

[1] 'සාම්පූර්: වාර්තාමය' වැඩසටහන (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2016 අප්‍රේල් 6)<https://www.cpalanka.org/sampur-documentary/> ප්‍රවේශය 2024 ජූලි 30.

## 1.1. පර්යේෂණ අරමුණු සහ පරිච්ඡේද දළ සටහන

වාර්තාවට පර්යේෂණ අරමුණු සතරක් ඇති අතර, පහත පරිච්ඡේද මගින් ඒවා තනි තනිව ආමන්ත්‍රණය කෙරේ:

1. ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ඉඩම් ගැටුම් පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයීම (පරිච්ඡේදය2).

2. ඉඩම් සම්බන්ධ සිදුවීම්වල දී විවිධ රජයේ අධිකාරීන්ගේ භූමිකාවන් සහ ඉඩම් ගැටලු සම්බන්ධයෙන් භාවිතා කරන නීතිමය රාමුව පැහැදිලි කිරීම (පරිච්ඡේදය 3).

3. මෙකී සිදුවීම් මත පදනම් ව, ශ්‍රී ලංකාවේ ඉඩම් සම්බන්ධ අර්බුදයට පහසුකම් සලසන සහ එකී අර්බුදය පවත්වා ගෙන යාමට හේතු වන අන්තර්ඡේදනීය ප්‍රවණතා හඳුනා ගෙන විග්‍රහ කිරීම (4 පරිච්ඡේදය)

4. එම ප්‍රවණතාවලට එරෙහි ව සටන් කිරීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රතිපත්තිමය නිර්දේශ සැපයීම (පරිච්ඡේද 5).

## 1.2. ක්‍රමවේදය

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ, විශේෂයෙන් ම උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ඉඩම් හිමිකම, එහි භාවිතය සහ ප්‍රවේශය පිළිබඳ ගැටලු හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කරන අතර, බොහෝ දුරට සුළුතර වාර්ගික ජනතාවට අයත් ඉඩම් පවතින ප්‍රදේශයන් හි රාජ්‍ය පාර්ශවකරුවන්ගේ, හමුදාවේ සහ පූජකයන්ගේ භූමිකාවන් හි ඉහළ යමින් පවතින බලපෑම තක්සේරු කරයි. ක්‍රමෝපායිකව, වාර්තාව පුළුල් පර්යේෂණ සංකලනයකින්, ක්ෂේත්‍ර පර්යේෂණ, සම්මුඛ සාකච්ඡා සහ ද්විතීයික දත්ත මූලාශ්‍ර විශ්ලේෂණය ඇතුළත් මිශ්‍ර ක්‍රමවේදයක් අනුගමනය කරන අතර, පසුගිය වසර කිහිපය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සමීපව නිරීක්ෂණය කළ අවස්ථා සම්බන්ධයෙන් වඩාත් පුළුල් දළ විශ්ලේෂණයක් සිදු කරයි.

මෙහි දී ප්‍රාථමික මූලාශ්‍ර එක්රැස් කිරීමේ දී අන්තර්කරණය කර ගත් දත්ත රැස් කිරීමේ ප්‍රවේශයක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට ලක් වූ සිවිල් වැසියන්, රජයේ නිලධාරීන් සහ රාජ්‍ය දෙපාර්තමේන්තු බලධාරීන් සමඟ රැස්වීම් පැවැත්වීම ඇතුළු ව ක්ෂේත්‍ර චාරිකා සහ සම්මුඛ සාකච්ඡා මාලාවක් පැවැත්වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේක්ෂකයන් කටයුතු කරන ලදි. මෙයට අමතරව, ද්විතීයික පර්යේෂණ මූලාශ්‍ර ලෙස පුවත්පත් ලිපි (2 වන පරිච්ඡේදයේ එන ඉඩම් සම්බන්ධ සිදුවීම් සඳහා), රජයේ ආයතනවල වෙබ් අඩවි (3 පරිච්ඡේදයේ එන රජයේ ව්‍යුහයන් හඳුනා ගැනීම සඳහා) සහ සඟරා ලිපි (4 පරිච්ඡේදයේ සිදු කෙරෙන විශ්ලේෂණය සඳහා) දායක කරගනු ලැබිණි.

## 1.3. සීමාවන්

1. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සම්මුඛ සාකච්ඡා ලබා දෙන ලෙස සිදු කළ ඉල්ලීම්වලට ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් රජයේ නියෝජිතයින් වෙත ප්‍රවේශය සීමිත විය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයේ අධිකාරීන් සම්බන්ධ කර ගැනීමට විවිධ උත්සාහයන් ගත් නමුත්, බොහෝ අවස්ථාවල දී සම්මුඛ පරීක්ෂණ සඳහා අවස්ථාව හිමි නොවී ය.

2. මෙම වාර්තාව පරිපූර්ණ නොවන අතර, ඉඩම් අර්බුදය පවත්නා ගැටලුවක් ලෙස පිළිගන්නා බවත්, වාර්තාව ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව මතුවිය හැකි නව සිද්ධීන් පිළිබඳ නිරන්තර අධීක්ෂණය අවශ්‍ය වන බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙන්වා දෙයි. මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන කරුණු ඉස්මතු කිරීම වාර්තාවේ අරමුණ වේ.

# 2. ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ඉඩම් සම්බන්ධ අර්බුදය පිළිබඳ සිදුවීම්

රාජ්‍ය බලධාරීන්, විවිධ ජනවාර්ගිකවාදීන්, මිලිටරි අනුගාමිකයින් සහ ලාභ ලබන ආයතන සම්බන්ධිතව දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ පවතින අර්බුද සඳහා උත්ප්‍රේරකයක් බවට ඉඩම් පත් ව තිබේ. විශේෂයෙන් ම රාජ්‍ය මැදිහත් වීමක් පැහැදිලිව දක්නට ලැබෙන අවස්ථාවන් හි දී පවා, ඉඩම් පවරා ගැනීමට සම්බන්ධ පාර්ශවයන් 'ජාතික උරුමය', 'ජාතික ආරක්ෂාව' සහ 'සංවර්ධනය' ඇතුළු කරුණු රාශියක් හුවා දක්වමින් එකී කටයුතු සාධාරණීකරණය කරනු දක්නට ලැබෙන්නකි. මෙකී පරිච්ඡේදය තුළින් ඉඩම් අර්බුදයන්ගේ මෙකී පැතිකඩ විමසා බලයි.

මෙම වාර්තාවේ සිතියම 1 හි දක්වා ඇති පරිදි (8 පිටුව බලන්න) මෙකී සිදුවීම් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර දෙපළාතට අයත් දිස්ත්‍රික්ක 8 එනම් අම්පාර, මඩකලපුව, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය සහ වවුනියාව යන දිස්ත්‍රික්ක පුරා පැතිර පවතී. සැලකිය යුතු කරුණක් වනුයේ, මෙම දිස්ත්‍රික්ක බොහොමයක බහුතර ජනගහනය ජාතියේ වාර්ගික සහ ආගමික සුළු ජාතීන්ගෙන් සමන්විත වන නමුත්, අදාළ අවස්ථාවන් හි දී ප්‍රදර්ශනය කෙරෙන පරිදි, ඉඩම් ගැටුම්වලින් පීඩාවට පත් වූවන් විවිධ ප්‍රජාවන්ගෙන් සමන්විත වේ. ඉඩම් අර්බුද හා සම්බන්ධ සම්පූර්ණ ලැයිස්තුවක් මෙම පරිච්ඡේදය තුළ අඩංගු නොවූව ද, එතුළින් සිද්ධීන්ගේ පුළුල් බව විදහා දැක්වීමට අදහස් කරන අතර, රාජ්‍ය ආයතනවල සහ ඊට සම්බන්ධ අනෙකුත් විවිධ ක්‍රියාකාරීන්ගේ සක්‍රීය සහ නිහඬ මැදිහත් වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කෙරේ. මෙකී සිදුවීම් මෙම වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ ඉඩම් අර්බුදයෙහි විවිධ ප්‍රවණතා සම්බන්ධ ඇගයීමෙහි පදනම වනු ඇත.

## 2.1. අම්පාර දිස්ත්‍රික්කය

### 2.1.1. මානික්කමඩු මායක්කල්ලි කන්ද

අම්පාර දිස්ත්‍රික්කයේ ඉරක්කාමම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මානික්කමඩු ගම්මානයේ මායාලක්කල්ලි කන්ද පිහිටා තිබේ[2]. අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලාංකික මුස්ලිම්, සිංහල සහ ශ්‍රී ලාංකික දෙමළ ජන වර්ගවලින් සමන්විත වන අතර බහුතර මුස්ලිම් වාර්ගික පදනමක් පවතී[3]. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගැසට් නිවේදනයක් මගින් මානික්කමඩු ගම්මානයේ මායාලක්කල්ලි කන්ද 'පුරාවිද්‍යා භූමියක්'ලෙස නිල වශයෙන් නම් කර තිබේ[4].

2016 ඔක්තෝම්බර් 29 දිනට යෙදෙන (දෙමළ දීපවාලි) දින ගිරින්තිවෙල සෝමරත්න නම් භික්ෂූන් වහන්සේගේ මූලිකත්වයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ඇති ව බුද්ධ ප්‍රතිමාවක් බලහත්කාරයෙන් තැන්පත් කරන ලදි[5]. ඒ වන විටත් මීට එරෙහි ව අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය විසින් වාරණ නියෝගයක් නිකුත් කර තිබිණි[6]. 2016 දෙසැම්බර් මස 15 වැනි දින මායාලකල්ලි කන්දේ බුද්ධ ප්‍රතිමාව ස්ථාපිත කිරීමෙන් පසු ගිරින්තිවෙල සෝමරත්න (අම්පාර විද්‍යානන්ද මහ පිරිවෙනේ ප්‍රධාන සංඝයා වහන්සේ) නැගෙනහිර පළාත් ඉඩම් කොමසාරිස් වෙත ලිපියක් යොමු කරන

---

2 ප්‍රාදේශීය ප්‍රජාව සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සම්මුඛ සාකච්ඡාව (අම්පාර දිස්ත්‍රික්කය, 2023 සැප්තැම්බර් 14).

3 'දළ විශ්ලේෂණයී (අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය)<http://www.ampara.dist.gov.lk/index.php/en/about-us/overview.html#:~:text=It%20consist%20of%2043.58%25%20Sri,a%20assistant%20government%20agent%20Division> ප්‍රවේශය 2024 ජූලි 10.

4 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1884 ගැසට් පත්‍රය.

5 'Sri Lanka: Opposition to allotment of land to Mayakalli Malai Buddhist monastery' *BBC News Tamil* (18 September 2018) <https://www.bbc.com/tamil/sri-lanka-45498244> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 1.

6 Mohammad Thambi Marikar, 'Mayakalli Malai: Persistence' *Tamil Mirror* (11 September 2018) <https://shorturl.at/WxAi0> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 2.

ලදි[7]. මෙකී ලිපි හුවමාරුව අතරතුර ඉරක්කාමම් - මායාලකල්ලි කඳුකරයේ බෞද්ධ විහාරස්ථානයක් පිහිටුවීම පිණිස ඉඩමක් ලබා දෙන ලෙස විධිමත් ඉල්ලීමක් සිදු කරන ලදි. 2018 අගෝස්තු මස 07 වැනි දින නැගෙනහිර පළාත් ඉඩම් කොමසාරිස් ඩී.ඩී. අනුර ධර්මදාස් විසින් ගිරින්තිවෙල සෝමරත්න හිමියන්ගේ ඉහත ලිපියට පිළිතුරු ලෙස බෞද්ධ ආරාමයක් ඉදි කිරීමට අක්කරයක ඉඩමක් වෙන් කර ඇති බවත් එහි ඉඩම් මැනීම සහ පවරා දීමට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පහසුකම් සපයනු ඇති බවටත් දන්වා ලිපියක් යොමු කර තිබිණි[8].

ඉරක්කාමම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර නිශ්චිත තීරණයකට එළඹෙන තෙක් මායක්කල්ලි කන්දේ බෞද්ධ විහාරස්ථානය ඉදි කිරීමට ඉඩමක් ලබා නොදෙන බවට සාමූහික එකඟතාවකට පැමිණීමට කටයුතු කෙරිණි[9]. කෙසේ වෙතත්, 'පුරාණ රජ මහා විහාරය' නමින් හඳුන්වනු ලබන විහාරස්ථානය 2018 වසරේ ඉදි කරන ලද්දක[10]. මෙම විහාරස්ථානය පුද්ගලික ඉඩමක ඉදි කර ඇති අතර ඊට එරෙහි ව නොයෙකුත් පැමිණිලි ඉදිරිපත් ව තිබේ[11].

ඉතිහාසයට අනුව, ගව පාලනය සහ ගඩොල් කැපීම වැනි අරමුණු සඳහා 1957 දී ඉඩම් හිමියාගේ පියා ඉඩම ලබා ගෙන ඇති අතර[12], වසර 1997 දී එහි අයිතිය සිය පුත්‍රයා වෙත පැවරීමට කටයුතු කර තිබේ[13]. මේ අතර, අදාළ ඉඩමෙන් අක්කර 27ක් ගල්ඔය යෝජනා ක්‍රමය යටතේ දෙමළ ජාතිකයින් 9 දෙනෙකුට 1965 දී වෙන් කරන ලද අතර එක් අයෙකුට අක්කර 3 බැගින් හිමි විය[14]. මෙම ඉඩම් 1981 වසරේ දී සමන්තුරේ ප්‍රදේශයේ මුස්ලිම් ජාතිකයෙකුට බදු දෙන ලදි[15]. යුද්ධය අතරතුර, මෙම පුද්ගලයා ඉඩමේ අයිතිය වෙනස් කිරීම සඳහා මුල් අයිතිකරුවන්ගේ හිමිකම් වංචනික ලෙස වෙනස් කිරීමට කටයුතු කර තිබේ. මේ පිළිබඳ ව ඉඩම් කොමසාරිස්වරයාට විවිධ අවස්ථාවන් හි දී පැමිණිලි කළ ද කොමසාරිස්වරයා හෝ වෙනත් බලධාරියෙකු කිසිදු පියවරක් ගෙන නැත.

### 2.1.2. මුල්ලිකුලම් මලෙල

මුල්ලිකුලම් මලෙල ප්‍රදේශය, අඩ්ඩාලිචේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති අතර එහි බහුතරය මුස්ලිම් ජනතාවගෙන් සමන්විත වේ. 1999 ඔක්තෝම්බර් 15 වැනි දින පුරාවස්තු පනතේ 16 වැනි වගන්තිය යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මුල්ලිකුලම් මලෙල ප්‍රදේශය පුරාවිද්‍යා භූමියක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර[16], එම වසරේ දෙසැම්බර් 31 වැනි දින පනතේ 15 වැනි වගන්තිය යටතේ පුරාවිද්‍යා භූමියක් ලෙස නැවත වරක් ප්‍රකාශ කර තිබේ[17]. .

---

[7] ඉහත පාද සටහන.

[8] ඉහත පාද සටහන.

[9] ඉහත පාද සටහන.

[10] ඉහත පාද සටහන.

[11] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (පාද සටහන අංක 2), මෙම සම්මුඛ සාකච්ඡාවේ දී ප්‍රාදේශීය ප්‍රජාවේ සාමාජිකයෙකු ප්‍රකාශ කළේ "මෙම ඉඩමේ වරෙක අවුරුදු 3 හමාරක් පැරණි පොල් ගස් 55ක් පමණ තිබුණි. අවාසනාවකට මෙන්, මෙම ගස් බොහොමයක් විනාශ වී ඇති අතර, අක්කර 2ක භූමි ප්‍රමාණයක් පමණක් නොවෙනස් ව පවතී" යනුවෙනි.

[12] ඉහත පාද සටහන.

[13] ඉහත පාද සටහන.

[14] ඉහත පාද සටහන.

[15] ඉහත පාද සටහන.

[16] 1999 ඔක්තෝම්බර් 15 දිනැති අංක 1102 ගැසට් පත්‍රය අනුව "අදාළ ස්මාරකය පෞරාණික ස්මාරකයක් ලෙස සැලකිය යුතු අතර පැරණි ස්මාරකවලට අදාළ මෙම ආඥාපනතේ සියලු ම විධිවිධාන පුරාණ ස්මාරකයක් ලෙස එම ස්මාරකයටද අදාළ විය යුතු ය".

[17] 1999 දෙසැම්බර් 31 දිනැති අංක 1113 ගැසට් පත්‍රය අනුව "නියමිත කොන්දේසිවලට යටත්ව, රජයේ ඉඩමක පිහිටි ඕනෑම පෞරාණික ස්මාරකයකට නියමිත දුර ප්‍රමාණයක් තුළ කිසියම් ඉඩමක ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ පතල් කැණීම්, කැණීම් හෝ පිපිරුම් මෙහෙයුම් සිදු කිරීම තහනම් කිරීම හෝ සීමා කිරීම සඳහා නියාමනය කළ හැකි ය".

මුල්ලිකුලම් මලෛල කඳු පාමුල කද්දුවඩ්ඩෙයි සහ මලයාඩිකන්දම්[18] යන නම්වලින් හඳුන්වනු ලබන අතර, 1990 ගණන්වල සිට මෙම භූමිය ප්‍රදේශවාසී මුස්ලිම් ජනතාව කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගෙන ඇත[19]. 1998 දෙසැම්බර් 16 වන දින හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය විසින් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ මෙම ප්‍රදේශයෙන් හෙක්ටයාර් 0.65ක ඉඩම් කොටසක් මුස්ලිම් ජාතිකයන් පස් දෙනෙකු වෙත ප්‍රදානය කරන ලදී[20]. මෙම පුද්ගලයින් හට ඉදිරි වසර 10 සඳහා ඉඩම පිළිබඳ අයිතිය පැවති නමුත් යුද සමයේ දී ඉඩම් හිමියන්ට ඉඩමට ප්‍රවේශ වීමට නොහැකි විය[21]. කෙසේ වෙතත්, වසර 2007 දී කෘෂිකාර්මික කටයුතුවල නියැලීමට ඔවුන් ආරම්භ කිරීමත් සමඟ මුල්ලිකුලම් මලෛල පුරාවිද්‍යා භූමියක් බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කරන ලදී[22]. ඉහත කී ඉඩම නීති විරෝධී ලෙස බලහත්කාරයෙන් සන්තකයේ තබාගෙන ඇති බවත්, ඒ හේතුවෙන් ඔහුට නොතීසි මගින් දැනුම් දුන් පරිදි හිමිකරුගෙන් මසකට රුපියල් 500 බැගින් අය කරන බවත්, 2007 මැයි 01 වැනි දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව චෝදනා කරන ලදී[23]. මෙය නීතිමය ආරවුලකට තුඩු දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පහත කාලසටහනෙහි එන සිදුවීම් සිදුවන්නට විය[24]:

තම ඉඩමේ වගා කිරීම තහනම් කර ඇති ඉඩම් හිමියන් තම කෘෂිකාර්මික කටයුතු කර ගෙන යාමට අවසර ඉල්ලා 2008 සැප්තැම්බර් 29 වැනි දින අක්කරපත්තුව දිසා අධිකරණයේ (නඩු අංක එල්/241/08) නඩුවක් ගොනු කළහ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තර්ක කර ඇත්තේ මායිම් ගල එම ඉඩමේ තිබී ඇති බවත්, එම ගලෙහි තිබී හමු වූ කැපූ ගල සහ කරල් ගල් ඒවාට හානි විය හැකි කෘෂිකාර්මික කටයුතුවලින් ආරක්ෂා කළ යුතු ද්‍රව්‍ය ලෙස අමාත්‍යාංශය විසින් හඳුනා ගෙන ඇති බවත් ය.( නඩු අංක එල් /241/08).

කෙසේ වෙතත්, 2008 දී තීන්දුව ගොවීන්ට හිතකර විය. එම නිසා 2013 ජූලි 8 වන දින එම කන්දට කිසියම් හෝවෙන් කිරීමක් කළ යුතු බවට කිසිදු හිමිකම් පෑමක් සිදු කර නොතිබුණි. (නඩු අංක එල්/241/08)

2022 දී භික්ෂූන් වහන්සේ පිරිසක් එම ස්ථානයට පැමිණ විහාරස්ථානයක් ඉදි කිරීමට කටයුතු සම්පාදනය කළ අතර, විහාරස්ථානය ඉදි කිරීම නිසා පෞද්ගලික ඉඩම් ආක්‍රමණයක් සිදුවීම ප්‍රදේශයේ ජනතාව අතර ආතතියට හේතු විය[25]. 2022 මාර්තු 22 වන දින නැගෙනහිර පළාත් හිටපු අමාත්‍යවරයකු, හිටපු පළාත් සභා මන්ත්‍රීවරයකු සහ තවත් ප්‍රාදේශීය දේශපාලනඥයන් රැසක් සමඟ අඩ්ඩාලිච්චේන ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා එම ස්ථානයට පැමිණීමත් සමඟ ප්‍රදේශවාසීන් සහ දේශපාලනඥයින්ට මෙකී ඉදිකිරීම් අඩාල කිරීමට හැකියාව ලැබිණි[26]. පුරාවස්තු සහ පෞරාණික සංකේත පවතින බවට පවසමින් අවශ්‍ය අවසරයකින් තොරව බාහිර පුද්ගලයන්ට ඉදිකිරීම් සිදු කිරීමට

[18] 2019 ජනවාරි 28 දින සමීක්ෂණය කරන ලද මැනුම් සැලසුම් යොමු අංක 2768.
[19] සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (අම්පාර දිස්ත්‍රික්කය, 2023 සැප්තැම්බර් 14).
[20] ප්‍රදාන යොමු අංක AM/AT/S/R/737 1998 දෙසැම්බර් 18.
[21] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (19 වන පාද සටහන).
[22] ඉහත පාද සටහන.
[23] නඩු අංකය.L/241/08.
[24] ඉහත පාද සටහන.
[25] 'An attempt to build a Buddhist monastery in Ampara was prevented by local politicians and the public' *Supeedsam* (9 March 2022) <https://www.supeedsam.com/159473/> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 20.
[26] ඉහත පාද සටහන.

ඉඩ නොදෙන බවට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයා පොරොන්දු වීමත් සමඟ මෙය සිදු විය[27].

### 2.1.3. මුහුදු මහා විහාරය

මුහුදු මහා විහාරය බහුතර මුස්ලිම් ජනතාවක් වෙසෙන පොතුවිල් ප්‍රදේශයේ පිහිටා ඇත. 1950 දශකය වන විට එය ප්‍රාදේශීය ප්‍රජාවගේ සහයෝගය ඇති ව නඩත්තු කරන ලද එක් භික්ෂූන් වහන්සේ නමක් වාසය කල කුඩා පන්සලක් විය[28]. 1951 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මන්මලෛ ප්‍රදේශය 'පුරාවිද්‍යා භූමියකී ලෙස ප්‍රකාශයට පත් කළ අතර ඉඩම් මැනුම් සැලැස්මකින් තොරව පුරාවිද්‍යා කටයුතු සඳහා අක්කර 72ක් හඳුනා ගන්නා ලදි[29]. 1965 වසරේ නිකුත් කරන ලද රජයේ ගැසට් නිවේදනයකට අනුව මෙම විහාරස්ථානය පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ආරක්ෂා කිරීම සඳහා අක්කර 30ක් ලබා දී ඇති බවට සඳහන් විය[30].



*Image Source: Hideaway*

2020 දී මීට ඉඳුරාම වෙනස් ප්‍රකාශයක් සිදු කරමින් 1951 දී අක්කර 72ක ඉඩම ලබා දුන් බවත්, පසුව එය 1965 දී අක්කර 32 දක්වා අඩු කර ඇති බවත්, ඒ අනුව එම ඉඩමේ පදිංචි පවුල් 42ක් පන්සල් දේපළ "ආක්‍රමණය" කර ඇති බවත්, භික්ෂූන් වහන්සේ නමක් කියා සිටින්නට විය[31]. මෙයට සමගාමී ව, ලේකම්වරයාගේ ප්‍රමුඛත්වයෙන් නැගෙනහිර පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම සඳහා පිහිටු වන ලද ජනාධිපති කාර්යය සාධක බලකාය පිළිබඳ ව සාකච්ඡා කිරීමට එවක ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ මහා සංඝරත්නය අතර හමුවක් සංවිධානය කර තිබිණි[32]. එහි දී මුහුදු මහා විහාරයෙහි නාවික හමුදා අනු ඛණ්ඩයක් ස්ථාපිත කිරීම හරහා මෙම ස්ථාන ආරක්ෂා කිරීමටත් "විනාශ කිරීම්" සඳහා දැඩි දඬුවම් පැනවීමටත් ජනාධිපතිවරයා ප්‍රතිඥා දෙන ලදි[33].

2020 ජුනි 19 වන දින පොලිස් හා හමුදා භටයන් සිය ගණනක් ප්‍රදේශයට රැස්ව සිටි අතර, ඔවුන්ගේ ආරක්ෂාව යටතේ මුහුදු මහා විහාරය අවට අක්කර 72 ක භූමි ප්‍රමාණය මැන ලකුණු කිරීමට උත්සාහ

---

[27] 'Outsiders will not be allowed to carry out construction work in Ampara Mullikulam hill area - Director of General Archaeology Department Assurance to Hakeem (M.P)' *Vidivelli* (27 March 2022) <https://www.vidivelli.lk/article/12705> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 20.

[28] 'Muhudu Maha Viharaya: Racial fire moving towards Pottuvil' *Vidivelli* (8 September 2019) <https://www.vidiyal.lk/post/--63> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 21.

[29] U.L. Mafrook, 'Using Muslim land in the name of Buddhist Temples - Controversy in Sri Lanka' *BBC News Tamil* <https://www.bbc.com/tamil/sri-lanka-> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 21.

[30] 'Marvels of Muhudu Maha Vihara' *Sunday Observer* (29 May 2022) <https://archives1.sundayobserver.lk/2022/05/29/marvels-muhudu-maha-vihara> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 21.

[31] 'Damages to national heritage will not be tolerated - Sri Lanka's Defence Secretary' *Tamil Guardian* (23 May 2020) <https://www.tamilguardian.com/content/%E2%80%9Cdamages-national-heritage-will-not-be-tolerated%E2%80%9D-%E2%80%93-sri-lanka%E2%80%99s-defence-secretary> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 22.

[32] 'Sri Lankan president pledges military will protect Buddhist sites in east' *Tamil Guardian* (23 May 2020) <https://www.tamilguardian.com/content/sri-lankan-president-pledges-military-will-protect-buddhist-sites-east> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 23.

[33] ඉහත පාද සටහන.

කරන ලදි[34]. නැගෙනහිර පළාතේ පුරාවිද්‍යා උරුමයන් කළමනාකරණය පිණිස ස්ථාපිත ජනාධිපති කාර්යය සාධක බළකායේ (පී. ටී. එෆ්.) නියෝගයකට අනුව විහාරස්ථාන දේපළ හා යාබද ඉඩම් සිතියම්ගත කිරීම මිනින්දෝරු දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ආරම්භ කළ අතර, ඔවුන්ගේ වැඩ කටයුතුවලට එරෙහි ව උද්ඝෝෂණයක් පැවැත්වීමට ප්‍රදේශවාසීන් කටයුතු කරන ලදි[35]. මෙම ප්‍රදේශයේ මුස්ලිම් පවුල් 300ක් ජීවත් වන බවත්, හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියගේ පාලන සමයේ දී 'ජය භූමි' වැඩසටහන යටතේ මෙම ඉඩම් ලබා දීම හේතුවෙන් එම ඉඩම් නීත්‍යානුකූලව ඔවුන්ට හිමි බවත් මෙහි දී අම්පාර ප්‍රාදේශීය ලේකම්වරයා ප්‍රකාශ කරනු ලැබීය[36].

2023 අගෝස්තු මස 15 වන දින මුහුදු මහා විහාරය 'අම්පාර මුහුදු මහා විහාරය පුදබිම' ලෙස ගැසට් මගින් ප්‍රකාශ කරන ලද්දේ මේ අතර ය[37]. 2024 පෙබරවාරි 15 වන දින ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මුහුදු මහා විහාරය ඇතුළු විහාරස්ථාන 11ක පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ පූජනීය වැදගත්කම හඳුනා ගනිමින් රජයේ ගැසට් පත්‍රයේ 'පූජනීය ස්ථාන' ලෙස නිල වශයෙන් නම් කරන ලදි[38]. පසුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් කියා සිටි අන්දමට මුහුදු මහා විහාරයට අදාළ ගැසට් නිවේදනය පිළිබඳ ව 2024 ජූලි 25 වන දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සාකච්ඡාවක් පවත්වා ඇති අතර[39], මුහුදු මහා විහාරය සමඟ දීර්ඝ කාලයක් තිස්සේ පවතින සීමා මායිම් ගැටලු හේතුවෙන් ප්‍රදේශවාසීන්ට ඉඩම් අහිමි වූ බවත්, එම ගැටලුවලට දැන් විසඳුම් ලැබී ඇති බවත් පසුව ඔහු විසින් අවධාරණය කරන ලදි[40].

## 2.2. මඩකලපුව දිස්ත්‍රික්කය

### 2.2.1. මාතවනෙයි, මයිලත්තමඩු

මාතවනෙයි, මයිලත්තමඩු යනු මඩකලපුව මායිමේ පිහිටා ඇති මාදුරු ඔයේ අතු ගංගාවක් වන මන්දාරි ගඟට මායිම් ව පිහිටි එරාවූර් පත්තු චෙන්කලඩි සහ කෝරළෙයි පත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සාරවත් තෘණ භූමියකි. මෙම ප්‍රදේශය ගව පාලනය සඳහා ප්‍රචලිත වන අතර සිතන්ඩි, වන්තර්මොලෙ " ඉලුපයියාඩිචේනයි සහ මුරක්කද්දන් චෝල්ලෙ යන ප්‍රදේශවල දෙමළ කිරි ගොවීන් මෙම තණබිම් සිය ගොවිතැන් කටයුතු සඳහා භාවිතා කරයි[41]. පශු සම්පත් කර්මාන්තය මෙහි ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන අතර 2023 සංඛ්‍යාලේඛන දත්තවලට අනුව ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ පවුල් 1072ක් මෙම ප්‍රදේශයේ සත්ව පාලන ගොවිතැන් කටයුතුවල නිරතව සිටිති[42].

---

34 'Tense situation in Pottuvil following archaeological survey' *Daily FT* (22 June 2020) <https://www.ft.lk/News/Tense-situation-in-Pottuvil-following-archaeological-survey/56-701991> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 24.

35 ඉහත පාද සටහන.

36 Mafrook (29 වන පාද සටහන).

37 2023 අගෝස්තු 15 දිනැති අංක 2345/37 දරන ගැසට් පත්‍රය.

38 'Several historical shrines designated as sacred sites' (*President's Media Division*, 25 June 2024) <https://pmd.gov.lk/news/several-historical-shrines-designated-as-sacred-sites/> ප්‍රවේශය 2024 ජූනි 26" — පූජනීය ස්ථාන ලෙස පිළිගෙන ඇති මෙම ප්‍රදේශ සඳහා අදාළ ලිපි ලේඛන ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කර ඇත." යනුවෙන් නිවේදනය කරයි.

39 'Pottuvil Muhudu Maha Viharaya: Discussion in Ministry of Urban Development' *Thinakaran* (25 June 2024) <https://www.thinakaran.lk/2024/06/25/local/68149> ප්‍රවේශය 2024 ජූනි 26

40 ඉහත පාද සටහන.

41 ප්‍රාදේශීය ප්‍රජාව සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (මඩකලපුව දිස්ත්‍රික්කය, 2023 සැප්තැම්බර් 15).

42 2023 මැයි 1 දිනැති ලිපිය නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා, ත්‍රිකුණාමලය යන ලිපිනයට ලියා ඇත.

වසර 2013 සිට අම්පාර සහ පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවලින් පැමිණි සිංහල පදිංචිකරුවන් විසින් මාතවනෙයි සහ මයිලත්තමඩු ප්‍රදේශයන් හි තණබිම් අත්පත් කර ගෙන ඇති අතර[43], නව පදිංචිකරුවන් දහස් ගණනක් හේතුවෙන් එඬේර ඉඩම් හෙක්ටයාර් 3150ක් පමණ තර්ජනයට ලක් ව ඇත[44]. 2012 සිට 2023 දක්වා, පශු සම්පත්වලට අයත් සතුන් 6948 ක් පීඩාවට පත් වූ අතර, මියගිය, තුවාල වූ, අතුරුදහන් වූ හෝ බලහත්කාරයෙන් අත්පත් කර ගත් සතුන් මෙන් ම අධිකරණ ක්‍රියාදාමයන්, විදුලිසර වැදීම් මෙන් ම වල් නාශක ඉසීමෙන් බලපෑමට ලක් වූ සතුන් ද ඇතුළත් ය[45]. මෙහි දී ප්‍රාදේශීය මානව හිමිකම් ආරක්ෂකයින් උපුටා දක්වමින් හියුමන් රයිට්ස් වොච් ප්‍රකාශ කළේ, "විශ්‍රාමික හමුදා සෙබළුන් රජයේ සහයෝගය ඇති ව එම ප්‍රදේශයේ පදිංචිව සිටින අතර, ඔවුන් නීති විරෝධී ආයුධ භාවිතා කරමින් ගවයින් ඝාතනය කරන" බව යි[46].

මහවැලි සංවර්ධන වැඩසටහන - මහවැලි බී කලාපය

ගොවිබිම් සම්බන්ධ මෙම ගැටලු මහවැලි අධිකාරිය විසින් අවට ප්‍රදේශ සංවර්ධනය කිරීමත් සමඟ ගැටගැසී පවතී. 1979 දී මාතාවනෙයි සහ මයිලත්තම්පට්ටිවල තෘණ ඉඩම් අක්කර 12,000ක් මහවැලි බී කලාපය යටතේ මහවැලි අධිකාරිය විසින් අත්පත් කර ගන්නා ලදි[47]. මහවැලි බී යෝජනා ක්‍රමය මගින් පොළොන්නරුව සහ මඩකලපුව දිස්ත්‍රික්ක ආවරණය වේ[48]. වාර්තාවලට අනුව, පොළොන්නරුව, අම්පාර සහ දකුණේ අනෙකුත් දිස්ත්‍රික්කවල සිංහල පදිංචිකරුවන් 'මහවැලි බී' යෝජනා ක්‍රමය තුළ පිහිටි ඉඩම්වල නැවත පදිංචි කර ඇත[49]. 2020 දී මහවැලි අධිකාරිය සහ හිටපු නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරිය විසින් කෘෂිකාර්මික සංවර්ධනය යටතේ තෘණ භූමිවල බඩඉරිඟු සහ රටකජු වගා කිරීමට දිරිමත් කිරීම හේතුවෙන් ඉහත ගැටලු උත්සන්න වී ඇති අතර[50], මේ හේතුවෙන් මෙම ප්‍රදේශය ආරවුල් බහුල කලාපයක් බවට පත් ව තිබේ[51]. කෝරළෙයි පත්තු දකුණ ප්‍රාදේශීය ලේකම්වරයාට එරෙහි ව වසර 2012 දී වාලච්චේන මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ

---

43 'Reprisal Against Peaceful Protesters Protesting against ongoing pasture land encroachment in Madhavani and Mayilathamdu, Batticaloa' (*Defenders at Risk Active Cases,* 12 October 2023) <https://www.frontlinedefenders.org/en/statement-report/reprisals-against-peaceful-protesters-protesting-against-ongoing-pastureland> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 19" —අතුරුදහන් වූ තම ගවයන් සොයමින් සිටි දෙමළ ගොවීන් ව සන්නද්ධ සිංහල පුද්ගලයන් විසින් පැහැරගෙන ගොස් අමානුෂික ලෙස පහර දී තිබේ. මීට අමතරව, මහවැලි අධිකාරියේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මෙම දෙමළ කිරි ගොවීන්ට අසාධාරණ ලෙස පදනම් විරහිත චෝදනා එල්ල කර ඇත.

44 ලිපිය (42 වන පාද සටහන).

45 ඉහත පාද සටහන.

46 'If We Raise Our Voices, They Arrest Us - Sri Lanka's Proposed Truth and Reconciliation Commisison' (18 September 2023) Human Rights Watch <https://www.hrw.org/report/2023/09/18/if-we-raise-our-voice-they-arrest-us/sri-lankas-proposed-truth-and-reconciliation#3009> ප්‍රවේශය 2023 සැප්තැම්බර් 30.

47 Oakland Institute, 'Endless War – The destroyed land, life and identity of the Tamil People in Sri Lanka' (7 March 2021) <https://www.oaklandinstitute.org/tamils-sri-lanka-endless-war> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 1.

48 Bhavani Fonseka and Uvin Dissanayake, 'Sri Lanka's Vistas of Prosperity and Splendour: A Critique of Promises Made and Present Trends' (2021) Centre for Policy Alternatives <https://www.cpalanka.org/sri-lankas-vistas-of-prosperity-and-splendour-a-critique-of-promises-made-and-present-trends/> ප්‍රවේශය 2024 ජූනි 25.

49 Bhavani Fonseka and Dharsha Jegatheeswaran, 'Politics, Policies And Practices With Land Acquisitions And Related Issues In The North And East Of Sri Lanka' (2013) Centre for Policy Alternatives <https://www.cpalanka.org/policy-brief-politics-policies-and-practices-with-land-acquisitions-and-related-issues-in-the-north-and-east-of-sri-lanka/> ප්‍රවේශය 2024 ජූනි 25 දින, "මහවැලි බී හා සමාන ව, මහවැලි එල් ක්‍රමය තුළ, 1985 වන විට, මනල්ආරු ප්‍රදේශයේ සිටි සියලු ම දෙමළ සිවිල් වැසියන් පාහේ ප්‍රචණ්ඩත්වය සහ හමුදා පීඩනය හේතුවෙන් පලවා හැර ඇත. 1988 දී පවුල් 3364 කට එල් කලාපයේ ඉඩම් ලබා දී ඇති බවට වාර්තා වූ අතර, පවුල්වලින් විශාල බහුතරයක් සිංහලයන් වේ.

50 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව , (42 වන පාද සටහන)

51 ඉහත පාද සටහන.

නඩු 13ක් ගොනු කර තිබේ[52]. හිරිහැර කළ තැනැත්තා පිළිබඳ තොරතුරු ලබා දීමට ගොවීන්ට නොහැකි වීම හේතුවෙන් එම පැමිණිලි සම්බන්ධයෙන් කරදියනාරු පොලිස් ස්ථානය කිසිදු ක්‍රියාමාර්ගයක් ගනු ලැබුවේ නැත[53].

2021 ජනවාරි 21 වන දින අභියාචනාධිකරණය ඉදිරියේ මීට අදාළ ව නඩුවක් ගොනු කළ අතර එය එම වසරේ පෙබරවාරි 11 වන දින අධිකරණය විසින් කැඳවන ලදි[54]. 2021 පෙබරවාරි 28 වැනි දිනට පෙර අනවසර පදිංචිකරුවන් පිටව යනු ඇති බවට අධිකරණය ඉදිරියේ ප්‍රතිඥාවක් ලබා දෙමින් මහවැලි අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදි[55]. ඒ අනුව, මෙම ඉඩම්වල හේන් වගාවේ යෙදී සිටින සියලු ම ගොවීන් 2021 ජූලි 21 වන දින හෝ ඊට පෙරාතුව ඉවත් විය යුතු බවට අධිකරණය නියෝග කළේ ය[56]. කෙසේ වුව ද, මෙම වාර්තාව සැකසෙන දින වන විටත් එකී අධිකරණ නියෝගය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කිරීමට අසමත් ව තිබේ. 2023 ඔක්තෝම්බර් මස 15 වන දින භික්ෂූන් වහන්සේ නමකගේ ප්‍රධානත්වයෙන් නැගෙනහිර පළාත් හිටපු ආණ්ඩුකාරතුමියගේ සහභාගීත්වය ඇති ව නව බුද්ධ ප්‍රතිමාවක් ස්ථාපනය කරන ලදි[57].

2023 ඔක්තෝම්බර් මස 15 වන දින මඩකලපුව දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් මයිලත්තමඩු තණබිම් අනවසරයෙන් ආක්‍රමණය කිරීම වළක්වාලමින් මයිලත්තමඩු ප්‍රදේශය තෘණ වගාව සඳහා වෙන් කරන ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින ලදි[58]. එහි දී ගොවීන් සඳහා මයිලත්තමඩු ප්‍රදේශයෙන් පිටත ඉඩම් ලබා දීමට ජනාධිපතිවරයා එකඟ වූ අතර, අධිකරණ නියෝගයක් මගින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට නියෝග කරන ලදි[59]. නීති විරෝධී ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් වගකිව යුත්තන්ට එරෙහි ව බලධාරීන් පියවර ගත යුතු බවටත්, මයිලත්තමඩු ප්‍රදේශයේ ඉඩම් තණබිම් ලෙස නිල වශයෙන් නම් කළ යුතු බවටත් බලකරමින් කිරි ගොවීන් දින 300කට අධික කාලයක් විරෝධතාවල නිරත වීමත් සමඟ මෙම නියෝග ක්‍රියාත්මක නොවී ය. මෙම ගැටලු රජය විසින් විසඳනු ඇත් ද යන්න ඉදිරියේ දී දැක ගත හැකි වනු ඇත.

### 2.3. යාපනය දිස්ත්‍රික්කය

### 2.3.1. චූලිපුරම් පරලෛ මුරුගන් කෝවිල

පරලෛ මුරුගන් කෝවිල යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් බටහිර ප්‍රාදේශීය පරිපාලන සීමාව යටතේ නැගෙනහිර චූලිපුරම් ප්‍රදේශයේ පිහිටා ඇති අතර, ජනගහනයෙන් බහුතරයක් හින්දු භක්තිකයන්ගෙන් සමන්විත වේ. මෙය දිස්ත්‍රික්කයේ පිහිටි ඉපැරණි මුරුගන් කෝවිලක් වන අතර එම කෝවිලේ ප්‍රධාන වෘක්ෂය ('තල විරුච්චම්' ලෙස ද හැඳින්වෙන අතර) එය බෝ ගසකි.

---

[52] ඉහත පාද සටහන.

[53] ඉහත පාද සටහන.

[54] 'Adjournment of hearing Mathavani and Mayilathamadu Case' *Virakesari* (11 February 2021) <https://www.virakesari.lk/article/100244> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 4.

[55] 'Adjournment of hearing Mathavani and Mayilathamadu Case' *Aruvi News* (23 February 2021) <https://aruvi.com/article/tam/2021/02/24/22987/> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 4.

[56] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව , (42 වන පාද සටහන).

[57] 'The ethnic, religious and cultural reconstruction taking place in the North and East will not end smoothly; Alan Keenan says history suggests the same' *Virakesari* (17 October 2023) <https://www.virakesari.lk/article/167123> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 21.

[58] 'Presidential order to evict illegal settlers' *Page Tamil* (15 October 2023) <https://shorturl.at/eU943> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 21.

[59] ඉහත පාද සටහන.



*Image Source: Justice Voice for People*

පන්සල් පාලනාධිකාරියට අනුව, පන්සලේ ඔප්පුව 1762 දී ලියා ඇත[60]. සංඝමිත්තා තෙරණිය විසින් ශ්‍රී ලංකාවට වැඩම කරවන ලදුව අනුරාධපුර ප්‍රදේශයේ දැනටමත් පවතින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට ඓතිහාසික සම්බන්ධයක් ඇති ශාඛාවකින් මෙම බෝ ගස හටගත් බවට සිංහල-බෞද්ධයන් විශ්වාස කිරීම මෙම ආරවුලට හේතු වී තිබේ[61].

මේ අතර, චූලිපුරම් පරලෛ මුරුගන් කෝවිලේ භාරකරුවන් සහ බැතිමතුන් විසින් කෝවිලේ බුද්ධ ප්‍රතිමා ඉදි කිරීමට ඉඩ නොතබන බවට ඒකමතික ව තීරණය කරන ලදි[62]. චූලිපුරම් පරලෛ මුරුගන් කෝවිලේ බෝධීන් වහන්සේ පාමුල පූජාවක් පැවැත්වීමට භික්ෂූන් වහන්සේලා සූදානමින් සිටින බවට වාර්තා වීමත් සමඟ විහාරස්ථානයේ පැවැති සාකච්ඡාවක දී මෙම තීරණය ගනු ලැබිණි[63]. මෙහි දී කනස්සල්ලට හේතු වෙමින් උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ චූලිපුරම් නැගෙනහිර ප්‍රදේශයේ අංක ජේ /174, ග්‍රාම නිලධාරී වසමේ පරලෛ .ම්මානයේ මුරුගන් කෝවිල් පරිශ්‍රය තුළ පිහිටා ඇති 'සංඝමිත්තා බෝධිය නමින් හැඳින්වෙන පැරණි වෘක්ෂය' පිළිබඳ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදි[64]. මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ මෙකී ගැසට් නිවේදනය පිළිබඳ මේ වන තුරුත් කෝවිල් භාරකාර මණ්ඩලය හෝ වලිකාමම් දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නොදැන සිටීම යි. පරලෛ මුරුගන් විහාරස්ථානයේ පිහිටි බෝධිය පිළිබඳ රජයේ ගැසට් නිවේදනයට විරෝධය පළ කරමින් චූලිපුරම් ප්‍රදේශයේ විරෝධතාවක් පැවැත්විණි[65].

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු මෙකී වර්ධනයන්ට විරෝධය පළ කරමින් ගැසට් නිවේදනය ඉල්ලා අස්කර ගන්නා ලෙස ජනාධිපතිවරයා හමුවී ඉල්ලා සිටින ලදි[66]. පරලෛ මුරුගන් විහාරස්ථානයේ පිහිටි බෝධීන් වහන්සේ සංඝමිත්තා මහරහතන් වහන්සේ විසින් ගෙන ආ එකක් බවට තමන් විශ්වාස නොකරන බවත් පෘතුගීසි ආක්‍රමණයේ දී බෝධීන් වහන්සේ සියල්ල විනාශ වූ බවත් මෙම හමුවේ දී ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ ය[67]. ඒ අනුව පරලෛ මුරුගන් විහාරයේ පිහිටි බෝධීන් වහන්සේගේ වයස විද්‍යාත්මක ව තක්සේරු කරන ලෙස ඔහු බලධාරීන්ට නියෝග කරන ලදි[68].

### 2.3.2. නිලාවරෛ ළිඳ

වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ කෝපායි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරිපාලන අංශයට අයත් නවගිරි ගම්මානයේ නිලාවරෛ ළිඳ පිහිටා ඇත. නිලාවරෛ ළිඳෙහි ගැඹුර

---

[60] 'Challenges faced by the Paralai Murugan Temple' *Page Tamil* (3 August 2023) <https://shorturl.at/4hTRY> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 7.

[61] 'Paralai Bo Tree and Sangamitha' *Virakesari* (13 August 2023) <https://www.virakesari.lk/article/162281#google_vignette> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 7.

[62] 'Paralai Murugan temple is not allowed to place Buddha statue or perform Buddhist rituals' *Tamil Win* (17 March 2022) <https://shorturl.at/mZWl8> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 7.

[63] ඉහත පාද සටහන.

[64] 2023 පෙබරවාරි 1 දිනැති අංක 2317/57 දරන ගැසට් පත්‍රය.

[65] 'Chulipuram Paralai Murugan Temple issue: Protests are taking place!' *Thinakkural* (2023) <https://thinakkural.lk/article/266955> ප්‍රවේශය 2023 ජූලි 1.

[66] සිවඥානම් ශ්‍රීදරන් (ප.ම), 'දෙමළ ජාතිකයන්ගේ සම්ප්‍රදායික අනන්‍යතා බලහත්කාරයෙන් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදන යළි කැඳවන ලෙසට කරන ලද ඉල්ලීම, යොමු අංක.MP/JF/KN/Si.Sh/President/2023 දිනය 2023 අගෝස්තු 8.

[67] වීරකේසරී (61 වන පාද සටහන).

[68] ඉහත පාද සටහන.

හේතුවෙන් එයට ඓතිහාසික වැදගත්කමක් ලැබී ඇති අතර, එය පුරාණෝක්තිමය වශයෙන් අහසේ සඳ දක්වා පවතින බව කියැවේ. එබැවින්, 'නිලාවරෛ' යන නම ලැබී ඇත[69]. තවද, ප්‍රදේශවාසීන් විසින් ළිඳ පිහිටි ඉඩම නවසෛව ඊශ්වරන් කෝවිලට පරිත්‍යාග කිරීමත්, එය විහාරස්ථානයේ පූජනීය මූලාශ්‍රය ලෙස සැලකීමත් විශේෂත්වයකි[70]. දීර්ඝ කාලයක් මුළුල්ලේ මෙම ප්‍රදේශය ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් බවට පත් ව තිබේ. ළිඳ වටා ආරක්ෂිත වැටක් සවි කිරීම, වාහන නැවැත්වීමේ සහ ආලෝකකරණ සේවා සඳහා ටෙන්ඩර් නිකුත් කිරීම ඇතුළු එහි නඩත්තු කටයුතු වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැවරී ඇත[71]. මීට අමතරව, ජාතික ජලාපවහන මණ්ඩලය විසින්, 'වරවත පානීය ජල සම්පාදන යෝජනා ක්‍රමය' නමින් නිලාවරෛ ළිඳ සඳහා ජල සැපයුම ලබා දීමට කටයුතු කර තිබේ. කෙසේ වුව ද, මෙසේ දීර්ඝ කාලයක් පුරා ළිඳ ඵලදායී ලෙස කළමනාකරණය කර තිබියදීත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එය 'පුරාවිද්‍යා ස්ථානයක්' ලෙස නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි[72].

2021 ජනවාරි 21 වැනි දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන් නිලාවරෛ ළිඳ ආසන්නයේ ගසක් යට කැණීම් කටයුතු සිදු කරන ලදි[73]. එම ප්‍රදේශයේ පෞරාණික නිර්මාණයක් තිබූ බව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වාර්තා කළ අතර, මේ සම්බන්ධයෙන් වැඩිදුර පර්යේෂණ ආරම්භ කිරීම නිලධාරීන්ගේ අදහස විය[74]. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැන ගැනීමට ලැබුණු පරිදි මෙම කැණීම් සඳහා පළාත් පාලන ආයතනයෙන් අවසර ලබා ගෙන නොතිබිණි. ඒ අනුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මින් ඉදිරියට පර්යේෂණ කටයුතු සිදු කිරීමට පෙර ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීමෙන් සහ දිස්ත්‍රික් සංවර්ධන සම්බන්ධීකරණ කමිටු රැස්වීම් යන දෙකෙන් ම පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවට වලිකාමම් නැගෙනහිර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සිය සභා රැස්වීමේ දී තීරණය කරන ලදි[75]. මේ අනුව, රාජ්‍ය අමාත්‍යවරයා විසින් මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නියෝගයක් නිකුත් කිරීමට පියවර ගැනිණි[76].

කෙසේ වෙතත්, 2021 මාර්තු 26 වන දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හමුදා ආධාර ඇති ව ළිඳ වටා අත්තිවාරමක් කැපීම ආරම්භ කළහ[77]. ඊට ප්‍රතිචාර වශයෙන් වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ප්‍රමුඛ ප්‍රාදේශීය ප්‍රජාව එම ස්ථානයට රැස් වී දෙපාර්තමේන්තුවේ මැනුම් කටයුතු යළි ආරම්භ කිරීමට බාධා පමුණුවන ලදි[78]. මෙම සිදුවීමෙන් පසු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා ප්‍රකාශ කර සිටියේ පුරාවිද්‍යා ස්ථාන හඳුනාගනිමින් කැණීම් සහ සංරක්ෂණ කටයුතු සිදු කරන අතර උතුර, නැගෙනහිර සහ දකුණ එක සේ ආවරණය කරනවා මිස

---

[69] 'Research about Nilavarai Well' *Vanakkam London* (24 September 2022) <https://vanakkamlondon.com/stories/research-stories/2022/09/171885/> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 12.

[70] Royal Asiatic Society of Sri Lanka, 'The Journal of the Ceylon Branch of the Royal Asiatic Society of Great Britain and Ireland' (1865), 123-127.

[71] 'A case has been filed against the Chairman of the Valikamam East DS' *Virakesari* (1 February 2023) <https://www.virakesari.lk/article/147198> 2023 ඔක්තෝබර් 12.

[72] 2007 පෙබරවාරි 23 දිනැති අංක 1486 දරන ගැසට් පත්‍රය.

[73] 'Sudden excavation work in Nilavarai Jaffna' *Virakesari* (21 January 2021) <https://www.virakesari.lk/article/98907> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 12.

[74] ඉහත පාද සටහන.

[75] යොමු අංක 5/2021.04.08 සහ 2021 අප්‍රේල් 8 දිනැති ලිපිය.

[76] 'Prior approval from the District Development Coordinating Committee (DCC) meeting is required to conduct archaeological research - State Minister Vithura Issued Order' *Valampuri* (2021) <https://epaper.valampurii.lk/> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 17.

[77] සිවඥානම් ශ්‍රීදරන්, 'පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් උතුරු සහ නැගෙනහිර පළාත්වල පවත්වන ලද අත්පත් කර ගැනීමේ වැඩසටහන් 2023).

[78] 'At present, for the second time, the Department of Archaeology' *Page Tamil* (26 March 2021) <https://shorturl.at/T6M6U> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 14.

කිසිදු ජාතියක් හෝ ආගමක් ඉලක්ක කිරීමේ කිසිදු උත්සාහයක් නොපවතින බව යි[79]. මෙහි දී නිල පුරාවිද්‍යා කටයුතුවලට බාධා කළ බවට චෝදනා කරමින් වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට එරෙහි ව නඩු පැවරීමට කටයුතු කරන ලදි[80]. පසුව මෙම නඩුව 2023 දෙසැම්බර් 15 වැනි දින විභාගයට ගැනීමට නියමිතව පැවති අතර පසුව නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීම ප්‍රමාද වන බවට අච්චුවේලි පොලිස් ස්ථානය කරුණු වාර්තා කිරීමත් සමඟ 2024 ජුනි 12 දිනට නඩුව කල් තැබීමට කටයුතු කෙරිණි[81].

ළිඳට නැගෙනහිර පසින් පිහිටි බෝධීන් වහන්සේ නමක් යට බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කිරීමත් සමඟ යළි නොසන්සුන්තාවක් ඇති විය[82]. විරෝධතා හේතුවෙන් වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව මැදිහත් වීමෙන් පසු හමුදාව විසින් මෙම ප්‍රතිමාව ඉවත් කරනු ලැබුව ද, එම ප්‍රතිමාව එම ප්‍රදේශයේ යොදවා සිටි හමුදාව විසින් ඉදි කරන ලද්දක් බවට පැවසේ[83]. ඒ අනුව, ඉඩම් ඇඳාගැනීම් සම්බන්ධ ව වැඩෙන මිලිටරි මැදිහත් වීම මෙන් ම, ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර දෙපළාත තුළ සිංහල-බෞද්ධත්වය ව්‍යාප්ත කිරීමේ අඛණ්ඩ අභිලාෂයන් මේ තුළින් පෙන්නුම් කෙරේ.

### 2.3.3. මණ්ඩතිව්

මණ්ඩයිතිව් යනු යාපනය අර්ධද්වීපයේ, වේලනෛ පරිපාලන කොට්ඨාසය යටතේ පිහිටා ඇති වර්ග කිලෝමීටර් 10.1ක විශාලත්වයකින් යුත් දූපතකි. සිවිල් යුද්ධයෙන් පසුව මණ්ඩයිතිව් ප්‍රදේශයේ බොහෝ හමුදා කඳවුරු ස්ථාපිත කර තිබීමත් සමඟ දිවයින පුරා පැතිරී ඇති මිලිටරිකරණය බොහෝ කනස්සල්ලට හේතු වී තිබේ. 1990 .ණන්වල දී වේළුසුමන නාවික හමුදා කඳවුර පිහිටු වීම සඳහා ප්‍රදේශයෙන් ඉවත් වන ලෙස පදිංචිකරුවන්ගෙන් ඉල්ලා සිටින ලදි[84]. එහි ප්‍රතිඵලයක් ලෙස වරින් වර හමුදාව විසින් ඉඩම් අත්පත් කර ගැනීම් හරහා කලාපයේ පෞද්ගලික ඉඩම් දිගින් දිගටම රාජසන්තක කර ඇත. මෙම සන්දර්භය තුළ, උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ (එල්. එල්. ආර්. සී.) කොටසක් ලෙස ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරියා ඉඩම් හිමියන් 29 දෙනෙකුට 2015 නොවැම්බර් 2 දිනැති ලිපිය යොමු කරමින්, 'මහජන යහපත පිණිස' එම ඉඩම මැනීමට සහ පසුව අත්පත් කර ගැනීමට සැලසුම් කර ඇති බවට ප්‍රකාශ කරන ලදි[85].

2020 නොවැම්බර් 10 වැනි දින යාපනයේ දෙමළ දේශපාලනඥයන් සහ ප්‍රදේශවාසීන් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මණ්ඩයිතිව් හි නාවික කඳවුරක් පිහිටු වීමට ගත් උත්සාහයට විරෝධය පළ කළහ[86]. මෙම වර්ධනයන්ට සමගාමී ව අක්කර 49ක්, රූඩ් 7ක් සහ පර්චස් 150ක ඉඩමක් අත්පත් කර ගැනීමේ මූලික පියවරවල කොටසක් ලෙස ඉහත සඳහන් ඉඩම් හිමියන් වෙත විධිමත් ලිඛිත දැනුම්දීමක් නිකුත්

---

79 'In the southern part of the Buddhist temple, there are Hindu temples inside - Misunderstanding Among Northern and Eastern Communities - Director, Department of Archaeology' *Virakesari* (28 March 2021) <https://www.virakesari.lk/article/102900> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 13.

80 නඩු අංක' B/421/PC/21.

81 'Adjournment due to non-availability of advice from the Attorney-General for the Nilavarai case' *Page Tamil* (15 December 2023) < https://pagetamil.com/2023/12/15/நிலாவைர-வழக்+-சட்ட-மா-அத/ > ප්‍රවේශය 2024 මැයි 1.

82 'A Buddha statue suddenly sprouted in the Nilavarai!' *Virakesari* (25 February 2023) <https://www.virakesari.lk/article/149123> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 14.

83 ඉහත පාද සටහන.

84 'Navy plans acquisition of 18 acres in Mandaitivu' *Tamil Guardian* (23 May 2018) <https://www.tamilguardian.com/content/navy-plans-acquisition-18-acres-mandaitivu> ප්‍රවේශය 2023 ඔක්තෝබර් 15.

85 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ දැන්වීම සහ යොමු අංක.ACQ/Q/J/D/222.

86 'Tamil politicians and locals in Jaffna protest against Sri Lankan navy land grab efforts' *Tamil Guardian* (10 November 2020) <https://www.tamilguardian.com/content/tamil-politicians-and-locals-jaffna-protest-against-sri-lankan-navy-land-grab-efforts> 2023 Tlaf;dan¾ 17'

කර ඇත[87]. මෙම ක්‍රියාවලියේ මූලික අදියරේ දී රජයේ ඉඩම් මැනුම් කාර්යාලය විසින් ඉඩම් හිමියන් නව දෙනෙකු වෙත 2023 ජුනි 30 වැනි දිනැති ව ලිපි යොමුකර තිබේ[88]. ජේ/07 හි පිහිටි අක්කර 18ක් සහ රූට් 1ක ඉඩම 2023 ජූලි 12 වන දින නාවික හමුදා මූලස්ථානයක් පිහිටු වීම සඳහා මනිනු ලබන අතර අතිරේක මැනුම් දිනයන් දැනුම් දීමට නියමිත බව මෙම ලිපිවල සඳහන් විය[89]. ප්‍රදේශවාසීන්, ප්‍රාදේශීය ප්‍රජාවන් සහ දේශපාලන පක්ෂවල දැඩි විරෝධතා හේතුවෙන් 2023 ජූලි 13 වන දින ඉඩම් මැනීමේ කටයුතු අත්හැර දමන ලදි[90].

### 2.3.4. අධි ආරක්ෂිත කලාපය, වලිකාමම් උතුර

යාපනය දිස්ත්‍රික්කයේ වලිකාමම් උතුර සහ නැගෙනහිර පරිපාලන කොට්ඨාසවල අධි ආරක්ෂිත කලාප (එච්. එස්. ඉසෙඩ්. එස්.) ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ගණනාවක් පවතී[91]. විවිධ යුද්ධ සහ අවතැන්වීම්වලින් යුත් යාපනය අර්ධද්වීපයේ නූතන සන්දර්භය අවබෝධ කර ගැනීම සඳහා මෙම කලාපවල ඉතිහාසය ඉතා වැදගත් වේ[92].

යුද සමයේ දී රජය විසින් අධි ආරක්ෂිත කලාප පිහිටු වීම පෙන්වා දිය හැක්කේ මිලිටරි හා ආර්ථික මධ්‍යස්ථාන සුරක්ෂිත කිරීමෙහි ලා වැදගත් උපායමාර්ගික පියවරක් වශයෙනි[93]. අධි ආරක්ෂිත කලාප ප්‍රමාණයෙන් මෙන් ම සීමා මට්ටම්වලින් ද එකිනෙකින් වෙනස් වේ[94]. විශේෂයෙන් ම යාපනය ප්‍රදේශයේ වැඩි ම අධි ආරක්ෂිත කලාප පිහිටා ඇති අතර, එහි ඉඩම්වලින් 16ක් පමණ දැඩි හමුදා රැකවල් යටතේ පවතින අතර සිවිල් ප්‍රවේශය සැලකිය යුතු ලෙස සීමා කර තිබේ[95]. 1980 ගණන්වල මැද භාගයේ සිට, රජය විසින් ප්‍රධාන හමුදා කඳවුරු, ඉදිරි ආරක්ෂක මාර්ග සහ ප්‍රධාන සැපයුම් මාර්ග ඇතුළු ව තීරණාත්මක ස්ථානවල අධි ආරක්ෂිත කලාප පිහිටු වන ලදි. 2009 මැයි මාසය වන විට, යාපනයේ අධි ආරක්ෂිත කලාප හේතුවෙන් 65,000 කට වැඩි පිරිසක් අවතැන් වී ඇත[96]. යාපනයේ විශාලතම අධි ආරක්ෂිත කලාපය තෙලිපල්ලයි/වලිකාමම් අධි ආරක්ෂිත කලාපය වූ අතර, එමගින් ග්‍රාම නිලධාරී කොට්ඨාස 43ක් ආවරණය වන අතර බලපෑමට ලක් වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක් පවතී. තෙලිපල්ලයි වඩාත් බලපෑමට ලක් ව ඇති අතර (එහි ග්‍රාම නිලධාරී කොට්ඨාස 45න් 35ක් අත්පත් කර ගෙන තිබේ). අධි ආරක්ෂිත කලාපවලින් ඉඩම් නිදහස් කිරීමේ සැලකිය යුතු ප්‍රගතියක් 2010 අග භාගයේ දී ආරම්භ වූ අතර, විරෝධතා සහ අධිකරණවල ආරම්භ කළ නඩු කටයුතු මෙයට හේතු විය[97].

ආදර්ශමත් ලෙස, නීත්‍යානුකූල අත්පත් කර ගැනීම ආරම්භ කරන විට, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය යන දෙකෙහි ම නඩු ගොනු කරන ලදි[98]. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රිට්

---

87 'Public protests against Navy's land acquisition in Mandaitivu – Jaffna' *Virakesari* (12 July 2023) <https://www.virakesari.lk/article/159817>2023 ඔක්තෝබර් 17.

88 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ දැන්වීම සහ යොමු අංක.AA/Ys/VLN/2018/107.

89 *Virakesari* (87 වන පාද සටහන).

90 ඉහත පාද සටහන.

91 Bhavani Fonseka and Mirak Raheem, 'Land in the Northern Province: Post-War Politics, Policy, and Practices' (2011) Centre for Policy Alternatives <https://cpalanka.org/wp-content/uploads/2011/12/Land-Issues-in-the-Northern-Province-Post-War-Politics-Policy-and-Practices-.pdf> ප්‍රවේශය 2024 ජූලි 31.

92 Fonseka and Jegatheeswaran (49 වන පාද සටහන).

93 Fonseka and Raheem (91 වන පාද සටහන).

94 ඉහත පාද සටහන.

95 ඉහත පාද සටහන.


96 ඉහත පාද සටහන.

97 ඉහත පාද සටහන.

98 98 *Arunasalam Kunabalasingham and 1473 others v A.Sivaswamy and 2 others* (15 May 2013) CA (Writ) No.125/2013.

අයදුම්පතක් ගොනු කිරීමට සහාය විය. පෙත්සම්කරුවෝ (අරුණාසලම් කුනබාලසිංහම් සහ තවත් 1473 දෙනෙක්) උතුරු පළාතේ මීට පෙර අධි ආරක්ෂිත කලාප ලෙස සලකනු ලැබූ ඉඩම්වල ඉඩම් හිමියන් වූහ[99]. අක්කර 6381කට ආසන්න පාරම්පරික ඉඩම් පොදු කටයුත්තක් සඳහා රජයට පවරා ගැනීමට ගෙන ඇති පියවරයන්ට එරෙහි ව මෙම නඩුව පවරා තිබේ[100]. මෙකී ඉඩම් අවශ්‍යතාවය 'ආරක්ෂක බලඇණි මූලස්ථානයක්' පිහිටු වීම වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මේ වන විට පෙත්සම්කරුවන්ට නැවත තම ඉඩම්වලට පැමිණීමට නොහැකි වී තිබේ[101]. පුද්ගලයන් 702 දෙනෙකු විසින් මේ ආකාරයට ම ඉඩම් අත්පත් කර ගැනීමේ නියෝග නීතිය ඉදිරියේ අභියෝගයට ලක් කර ඇති අතර, ඒ අනුව, පුද්ගලයින් අවතැන් වීම සම්බන්ධයෙන් අදාළ ආරක්ෂක අංශ සහ යාපනය දිස්ත්‍රික් ලේකම්වරයාගේ උපදෙස් කැඳවීමට අධිකරණය කටයුතු කරන ලදි[102].

මෑත කාලයේ ඇති වූ ධනාත්මක වර්ධනයක් වනුයේ, හමුදාව විසින් යම් ඉඩම් ප්‍රමාණයක් එහි නියම අයිතිකරුවන් වෙත ආපසු ලබා දීමයි. මෙය මන්දගාමී ක්‍රියාවලියක් වීම හේතුවෙන් බොහෝ දෙනෙකුට තවමත් අභියෝගවලට මුහුණ දීමට සිදුව තිබේ. 2024 සිට මෑත සිදුවීම් ග්‍රහණය කර ගත්ත ද, නීත්‍යානුකූල හිමිකරුවන්ට ඔවුන්ගේ ඉඩම්වලට ප්‍රවේශ වීමට ඇති අඛණ්ඩ බාධාවන් පිළිබඳ ව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත දැනුම් දී ඇත. ඒ පිළිබඳ පහත ග්‍රැෆික් මගින් දැකගත හැකි යඃ




[99] ඉහත පාද සටහන.

[100] ඉහත පාද සටහන.

[101] ඉහත පාද සටහන.

[102] Fonseka and Raheem (91 වන පාද සටහන).

පසුගිය මාස කිහිපය තුළ රජයේ බලධාරීන් විවිධ අවශ්‍යතා සඳහා ඉඩම් මැනීමට උත්සාහ කරන බවට වාර්තා විය[103]. කෙසේ වෙතත්, අවසානයේ දී, බොහෝ ඉඩම් තවමත් හමුදාවේ පාලනය යටතේ පවතී. වන්දි ගෙවීමකින් තොරව මෙම ඉඩම් නිදහස් කර ගැනීම වුව ද පෙන්වා දිය හැක්කේ දශක ගණනාවක් තිස්සේ පාර්ශවකරුවන් විසින් දැක්වූ ප්‍රතිවිරෝධතාවන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් වන අතර, ඉඩම් අත්පත් කර ගැනීමෙහි ලා රජයේ පාර්ශවකරුවන් ක්‍රියාත්මකවීමේ දී ඔවුනට හිමිවූ දණ්ඩමුක්තිය තව දුරටත් පෙන්නුම් කරයි.

### 2.3.5. ජනාධිපති මන්දිරය, කන්කසන්තුරේ



*Image Source: Daily News*

වාර්තා වන අන්දමට ජනාධිපති මන්දිරය 2012 වසරේ යාපනයේ කන්කසන්තුරේ නගුලේෂ්වරම් සහ වලිකාමම් ප්‍රදේශයේ සුඛෝපභෝගී "මන්දිරයක්" ලෙස හමුදාව විසින් ඉදි කර ඇත[104]. හෙක්ටයාර 12 ක පමණ භූමි ප්‍රමාණයකින් යුත් මෙම ගොඩනැගිල්ල අවට ඉඩම පුද්ගලික හිමිකරුවන් 17 දෙනෙකුට මුලින් හිමි ව තිබුණි[105]. මන්දිරය ඉදි කිරීම සඳහා යොදාගත් අක්කර 62ක ඉඩම් කොටසක් කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ කොටසක් ලෙස පැවතුණි[106]. මෙම ගොඩනැගිල්ල හෙක්ටයාර් 9.95ක් පුරා විහිදෙන අතර කාමර 20කින් සහ පිහිනුම් තටාක 2කින් සමන්විත වේ[107]. මුලින් ඉදි කරන ලද්දේ රුපියල් බිලියන 3.5ක අති විශාල වියදමකිනි. 2015 දී ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ ඉදිකිරීම් දියත් කරමින් කියා සිටියේ මෙම ගොඩනැගිල්ල නේවාසික මාලිගයක් නොව විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයින් සහ ප්‍රභූන්ට සත්කාර කිරීම සඳහා ඉදි කරන ලද "ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථානයක්" වනු ඇති බව යි.[108] එවක උතුරු පළාත් ආණ්ඩුකාර සුරේන් රාඝවන් 2019 දී කියා සිටි පරිදි උතුරු පළාතේ 16,000ක් පමණ ඉඩම් අහිමි ව සිටින අතර 5000ක් ජනතාව විවිධ ඉඩම් ආරවුල්වලට මැදි වී තිබෙන තත්ත්වයක් තුළ මෙම ඉඩම රජයේ සුඛෝපභෝගී සංචාරක අරමුණු සඳහා භාවිත කිරීම වඩාත් කැපී පෙනෙන තත්ත්වයකි[109]. කෙසේ වෙතත්, 2015 දී රාජ්‍ය පාලන තන්ත්‍රයේ වෙනස් වීමත් සමඟ මෙහි ඉදිකිරීම් කටයුතු අත්හිටුවන ලදි[110].

---

[103] 'Land grabbing attempt halted by resident protests in Jaffna's Valikamam North' *Tamil Guardian* (12 February 2024) <https://www.tamilguardian.com/content/land-grabbing-attempt-halted-resident-protests-jaffnas-valikamam-north> ප්‍රවේශය 2024 මාර්තු 3.

[104] 'Presidential palace built on occupied Jaffna land to be leased by government' *Tamil Guardian* (24 October 2023) <https://www.tamilguardian.com/content/presidential-palace-built-occupied-jaffna-land-be-leased-government> ප්‍රවේශය 2023 දෙසැම්බර් 1 .

[105][105] ඉහත පාද සටහන.

[106] ඉහත පාද සටහන.

[107] ඉහත පාද සටහන.

[108] ඉහත පාද සටහන.

[109] ඉහත පාද සටහන.

[110] 'UDA to convert Rs.2 Bn Presidential Palace project in Jaffna to university' *Daily News* (26 October 2023) <https://www.dailynews.lk/2023/10/26/business/189815/uda-to-convert-rs-2-bn-presidential-palace-project-in-jaffna-to-university/> ප්‍රවේශය 2023 දෙසැම්බර් 1.

ඓතිහාසික වශයෙන්, 1990 .ණන්වල දී, ශ්‍රී ලංකා හමුදාව මෙම ඉඩම අත්පත් කර ගත් අතර, පසුව එය මහජන ප්‍රවේශය සීමා කරමින් අධි ආරක්ෂිත කලාපයක් බවට පරිවර්තනය කරන ලදි (පරිච්ඡේදය 2.3.4 බලන්න)[111]. 2023 මාර්තු 03 වන දින වසර 32කට පසු ප්‍රථම වතාවට ක්‍රිෂ්ණා කෝවිල් භාරකාර මණ්ඩලය ග්‍රාම නිලධාරී සමඟ ජනාධිපති මන්දිරය පිහිටි ස්ථානයේ නිරීක්ෂණ චාරිකාවක් සිදු කරන ලදි[112]. කෙසේ වෙතත්, ජනාධිපති මන්දිරය ඉදි කිරීම සඳහා ඉපැරණි ශිවන් කෝවිලක් කඩා ඉවත් කිරීමක් සිදු නොවූ බව අදාළ රාජ්‍ය බලධාරීන් ප්‍රකාශ කර තිබේ[113].

ජනාධිපති මන්දිරය පිහිටි ඉඩම ශ්‍රී ලංකා හමුදාව විසින් පාලනය කර තිබුණ ද, එම ස්ථානය වසර 2022 දී නිල වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා දී තිබිණි[114]. අදාළ බඳු ගිවිසුම අවසන් වූ පසු, අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීම සඳහා ඉඩම ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයට පැවරීමට අපේක්ෂා කෙරේ[115].



Image Source: CPA Field Visit

ඉතා මෑතක, එනම් 2023 දෙසැම්බර් 15 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ අවශ්‍යතා සඳහා ඇල්වන්මලෙ, වේලර්කාඩු සහ ඒ අවට ප්‍රදේශවල අක්කර 29ක භූමි ප්‍රමාණයක් මැනීමට උත්සාහ කරන ලදි[116]. ප්‍රාදේශීය විරෝධය හේතුවෙන් මැනුම් කටයුතු නතර වූ අතර[117], 2024 මාර්තු 27 වන දින වන විට ප්‍රදේශවාසීන් ඉඩම් මැනීමේ නිලධාරීන්ට විරෝධය පළ කරමින් යාපනයේ එකී අක්කර 29ක භූමි භාගය නාගරික සංවර්ධනය සඳහා පවරා ගැනීමට බාධා පමුණුවමින්, ඉඩම් පවරා ගැනීමේ උත්සාහයන්ට එරෙහි ව ශක්තිමත් ව සිය ප්‍රතිරෝධය දක්වන ලදි.

### 2.3.6. තිස්සමහාරාම තෛද්දි

තෛද්දි යනු දෙමළ පවුල් 380ක් පමණ වාසය කරන කන්කසන්තුරේ වරායට ආසන්නයේ පිහිටි වෙරළබඩ ගම්මානයකි[118]. එය 2016 දක්වා අධි ආරක්ෂිත කලාපයෙහි කොටසක් ලෙස පැවති අතර පසුව ප්‍රදේශවාසීන්ට එහි නැවත පදිංචි වීමට අවසර හිමි විය[119]. මෙම කාලය තුළ හමුදාව විසින් එම ප්‍රදේශයේ 'ගජබා රෙජිමේන්තුවේ පළමු වන බලැණියයි ස්ථාපිත කරන ලදි[120]. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා හමුදාව, ඉඩම් අත්පත් කරන අතරතුර බෞද්ධ විහාරස්ථානයක් (තිස්ස රජ මහා විහාරය නමින්) ඉදි

---

[111] Fonseka and Raheem (91 වන පාද සටහන).

[112] 'Has the President's House been built in the Keerimalai Temple? Response from Presidential Media Unit' *Tamil Win* (10 March 2023) <https://tamilwin.com/article/keerimalai-temple-president-s-house-sri-lanka-1678498146> ප්‍රවේශය 2023 දෙසැම්බර් 2.

[113] ඉහත පාද සටහන.

[114] 'Is the Girimalai Shiva temple demolished and the Sri Lankan President's House built?' *BBC News Tamil* (10 March 2023) <https://www.bbc.com/tamil/articles/cpe7ee3exy4o> ප්‍රවේශය 2023 දෙසැම්බර් 2.

[115] 'President's House premises in Jaffna for SLIIT' *Sri Lanka Mirror* <https://srilankamirror.com/news/presidents-house-premises-in-jaffna-for-sliit/> ප්‍රවේශය 2024 ජුලි 20.

[116] 'Surveying of Keerimalai President's House was abandoned due to public opposition' *Virakesari* (15 December 2023) <https://www.virakesari.lk/article/171759> ප්‍රවේශය 2024 ජනවාරි 2.

[117] ඉහත පාද සටහන.

[118] රජයේ නිලධාරියෙකු සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දුරකථනයෙන් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (යාපනය දිස්ත්‍රික්කය, 2023 ඔක්තෝබර් 17).

[119] ඉහත පාද සටහන.

[120] ඉහත පාද සටහන.

කර ඇති අතර, විහාරස්ථානයේ කොටසක් දෙමළ ඉඩම් හිමියන්ට අයත් පෞද්ගලික ඉඩම් වසා පැතිර ගොස් තිබේ[121]. මුල දී තිස්ස විහාරය නමින් පැරණි ආරාමයක් තෛද්දියේ පිහිටා තිබූ බවට කියවේ[122].

2023 මැයි 04 වැනි දින එම අනවසර ඉදිකිරීම් අවට දෙමළ පවුල් 14කට අයත් ඉඩම් ආපසු ලබා දෙන ලෙස බලකරමින් ප්‍රදේශවාසීන් විරෝධතාවල නිරත විය[123]. මේ අතර, ශ්‍රී ලංකා හමුදාව අමතර ඉඩම් එකතු කර ගනිමින් තම පැවැත්ම තව දුරටත් තහවුරු කර ගැනීමට කටයුතු කරමින් සිටී[124]. විහාරස්ථානය හැර සෙසු ප්‍රදේශවලට ඇතුළු වීම සීමා කරමින් හමුදාව විසින් මෙම ඉඩම වටා කටුකම්බි වැටක් ඉදි කිරීමට කටයුතු කර තිබේ. ඉඩම් හිමියන්ට සැලකිය යුතු දුෂ්කරතාවන් ඇති වීමට මෙය හේතු වී ඇති අතර, සීමා කරන ලද භූමියේ කෘෂිකර්මාන්තයේ නිරත වීමට ද එතුළින් බාධා පැමිණ තිබේ. 2023 වන තුරුත්, මෙම විහාරස්ථානය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ලැයිස්තුගත කර නැත[125].

අවශ්‍ය අවසරයකින් තොරව පෞද්ගලික ඉඩමක සංඝාවාසයක් ඉදි කිරීම සම්බන්ධයෙන් වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව සිය මහා සභා රැස්වීමක දී අවධානය යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 2022.07.07. 14/21 දරන යෝජනාව මෙම රැස්වීමේ දී සම්මත කරන ලද අතර, එම ඉදිකිරීම් කටයුතු වහාම නතර කරන ලෙස ඉල්ලා සිටියේ ය. බෞද්ධ විහාරය ඉවත් කරන ලෙස බලකරමින් වසරකට ආසන්න කාලයක් ජනතාව සෑම පෝය දිනකම (පුර පසළොස්වක පොහොය) විරෝධතාවයේ නිරත වෙමින් සිටිති[126]. 2024 මාර්තු 12 වන දින ජාතික ආරක්ෂාව පිළිබඳ ශ්‍රී ලංකා අධීක්ෂණ කමිටුව විසින් වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම්වරයාට නියෝගයක් නිකුත් කරමින් පෞද්ගලික ඉඩමක් විහාරස්ථානයට පැවරිය යුතු බවට නියෝග කරනු ලැබී ය.[127] මෙම පැවරුමෙන් දේපළ හානියට පත් දෙමළ වැසියන් සඳහා විකල්ප ඉඩම් ලබා දෙන ලෙස ද මෙකී නියෝගයෙන් යෝජනා කෙරිණි[128].

## 2.4. කිලිනොච්චි දිස්ත්‍රික්කය

### 2.4.1. උරුතිරපුරම් ශිවන් කෝවිල

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කරච්චි පරිපාලන අංශය යටතේ උරුතිරපුරම් ගම්මානයේ උරුතිරපුරම් ශිවන් කෝවිල පිහිටා ඇත. උරුතිරපුරම් ශිවන් කෝවිල වසර 2400ක පමණ දක්වා දිවෙන

---

[121] 'More protests in Thaiyiddy over illegally constructed Sinhala Buddhist shrine' *Tamil Guardian* (23 April 2024) <https://www.tamilguardian.com/content/more-protests-thaiyiddy-over-illegally-constructed-sinhala-buddhist-shrine> ප්‍රවේශය 2024 අප්‍රේල් 25.

[122] ඉහත පාද සටහන, නිලධාරියෙකු ප්‍රකාශ කළේ, "ශත වර්ෂ කිහිපයකට පෙර, දේවානම්පියතිස්ස රජුගේ පාලන සමයේ දී (ක්‍රි.පූ. 250-210) ජම්බුද්වීපයෙන් දඹකොළ පටුනට ගොඩ බැස අනුරාධපුරයට යන අතරමග දී සංඝමිත්තා භික්ෂුණින් වහන්සේ විරාමයක් බලාපොරොත්තුවෙන් ගිමන් හරින ලද ස්ථානය බව බෞද්ධයන් විශ්වාස කළ බව යි.

[123] 'Protesters demand removal of Tissa Rajamaha Vihara in Thaiyiddy, Point Pedro' *Tamil Guardian* (4 May 2023) <https://www.tamilguardian.com/content/protesters-demand-removal-tissa-rajamaha-vihara-thaiyiddy-point-pedro> ප්‍රවේශය 2024 ජනවාරි 5.

[124] 2018 සැප්තැම්බර් 7 දිනැති ලිපියක් මගින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන ලද තොරතුරු දැනගැනීමේ ඉල්ලීමක් හරහා මෙම තොරතුරු ලබා ගෙන ඇත (යොමු අංකය.VN/DS/EB/RTI/2018).

[125] රජයේ නිලධාරියෙකු සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (යාපනය දිස්ත්‍රික්කය, 2023 නොවැම්බර් 2).

[126] 'More protests in Thaiyiddy over illegally constructed Sinhala Buddhist shrine' *Tamil Guardian* (23 April 2024) <https://www.tamilguardian.com/content/more-protests-thaiyiddy-over-illegally-constructed-sinhala-buddhist-shrin> ප්‍රවේශය 2024 අප්‍රේල් 25.

[127] 2024 මාර්තු 12 දිනැති ලිපිය.

[128] ඉහත පාද සටහන.

ඉතිහාසයකට උරුමකම් කියන පුරාණ ශිවන් කෝවිලකි[129]. මෙම කෝවිල 1958 දී අගම ක්‍රමය යටතේ ආරම්භ කරන ලද අතර, මෙම කෝවිල පාලනය කරනු ලබන්නේ කීරිමලෙ හි අයියම්පිල්ලේ ගුරු පරම්පරාව විසිනි[130]. කිලිනොච්චියේ ඇති පුරාවිද්‍යාත්මක සොයාගැනීම්, ප්‍රදේශයේ ඓතිහාසික වැදගත්කම පෙන්නුම් කරයි. මෙය වසර 2400 කට පෙර අනුරාධපුරයේ පැවති හින්දු කෝවිල් දෙකක් පිළිබඳ එන මහාවංශ සඳහනෙන් සනාථ වේ[131]. මෙම කෝවිල අක්කර 1.2ක භූමි භාගයක් පුරා පිහිටා ඇත[132]. මුල් කාලයේ දී කෝවිල අවට ප්‍රදේශය වනාන්තර ප්‍රදේශයක් ව පැවති අතර 1952 දී ජනාවාසයක් බවට වර්ධනය වීම වැනි යම් යම් මතභේදයන් කෝවිලේ මූලාරම්භය වටා ගොඩනැගී පැවතීම විශේෂත්වයකි[133]. තවද, 1958 සිට පුරාවිද්‍යා කොමසාරිස්වරයාගේ වාර්තාවකට අනුව, උරුතිරපුරම් වැව වෙත මාර්ගයක් ඉදි කිරීම සඳහා ඉඩම එළි පෙහෙළි කිරීමේ දී මෙහි ඉපැරණි ස්තූපයක් සොයා ගත් නමුත් අවාසනාවකට එය පසුව විනාශ වී තිබේ[134]. මේ අනුව එම භූමිය බෞද්ධ උරුමයක් ද, එසේත් නැත්නම් හින්දු උරුමයක් ද යන ගැටලුව පවතී.

එසේ වුව ද, 2016 මාර්තු 24 වන දින ගැසට් නිවේදනයක් යටතේ විහාරස්ථානය 'පුරාවිද්‍යා ස්ථානයක්' ලෙස ප්‍රකාශයට පත් කරන ලදී[135]. මේ අනුව, ඉඩම් පිළිබඳ ආරවුල් ඔස්සේ රජය විසින් ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ කනස්සල්ල ඉස්මතු වී ඇති අතර, අවස්ථා කිහිපයක දී ම හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරීන්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නිලධාරීන් සහ බෞද්ධ භික්ෂූන් වහන්සේ යන පිරිස හමුදා ජීප් රථවලින් විහාරස්ථාන භූමියට පැමිණ ඉඩම පරීක්ෂා කර තිබේ[136]. විවිධ පාර්ශවකරුවන් අතර අන්තර් ඡේදනය මෙහි දී පැහැදිලි ව දක්නට ලැබෙන්නකි. 2021 මාර්තු 16 වැනි දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (යාපනය) නිලධාරීන් සමඟ පූර්ව දැනුම් දීමකින් තොරව පැමිණි අතර, ආගමික කටයුතුවලට බාධා කරමින් සහ බැතිමතුන් පලවා හරිමින් ස්ථාන පිරිසිදු කිරීමට එම පිරිස කටයුතු කර තිබිණි[137]. මේ පිළිබඳ කෝවිල් භාරකාර මණ්ඩලයට පැහැදිලිව ම ප්‍රමාණවත් දැනුම්දීමක් සිදු කිරීමට ඔවුන් අපොහොසත්ව තිබිණි.

2021 මාර්තු 23 වන දින කැණීම් කටයුතු ආරම්භ කරන බවත්, කෝවිල් පරිශ්‍රයේ අර්ධ ස්ථිර කුඩාරම් පිහිටු වන බවත් සහකාර කොමසාරිස්වරයා එම ස්ථානයේ සිටි පුද්ගලයින්ට දන්වා තිබුණි[138]. කෙසේ වුව ද, ප්‍රබල ජනතා විරෝධය හේතුවෙන් මූලික කැණීම් සහ මැනුම් කටයුතු නතර කිරීමට මේ වන විට සිදු වී තිබේ[139]. 2021 මාර්තු 24 වැනි දින පාර්ලිමේන්තු සැසිවාරයේ දී උරුතිරපුරම් විහාරස්ථානය පිළිබඳ ව සාකච්ඡා කළ අතර[140], පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම් කටයුතු වහා නතර කරන ලෙසට බලකරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු එහි දී දැඩි විරෝධය පළ කළහ[141].

---

129 පාර්ලිමේන්තු මන්ත්‍රී සිවඥානම් ශ්‍රීතරන් විසින් යොමු කරන ලද 2023 මැයි 13 දිනැති ලිපිය යොමු අංක MP/JF/KN/Si.Sh/President/2023.

130 K. Kritharan, 'Do you know the historical antiquity of Kilinochchi Uruthirapuram Temple?' *Vanakkam London* (24 March 2021) <https://vanakkamlondon.com/news/2021/03/105979/> ප්‍රවේශය 2024 ජනවාරි 10.

131 ඉහත පාද සටහන.

132 ඉහත පාද සටහන.

133 ඉහත පාද සටහන.

134 'Losing Heritage of Uruthirapuram Buddhist Ruins in Kilinochchi' (*Amazing Lanka)* <https://amazinglanka.com/wp/uruthirapuram/> ප්‍රවේශය 2024 ජනවාරි 15.

135 ගැසට් අංක 1960 - 2016/03/24

136 'People of the Uruthirapuram Area Raise Concern About the Disturbing Activities Taking Place in the Sivan Kovil Premises in Kilinochchi' *Center for Human Rights and Development* (19 March 2021) <https://srilankachrd.org/dynamic.php?news=216> ප්‍රවේශය 2024 ජනවාරි 16.

137 ලිපිය (129 වන පාද සටහන).

138 ඉහත පාද සටහන.

139 *Center for Human Rights and Development* (136 වන පාද සටහන).

140 'Excavation Work at Uruthirapuram Shiva Temple Should Be Stopped Immediately: T.N.F in the Parliament' *Thinakkural* <https://thinakkural.lk/article/115950> ප්‍රවේශය 2024 ජූලි 31.

141 ඉහත පාද සටහන.

ජනාධිපතිවරයා දෙමළ මන්ත්‍රීවරුන් සමග මෙම ගැටලු සාකච්ඡා කර 2023 මැයි 11 වැනි දින එවැනි ඉඩම් අත් කර ගැනීම් නතර කරන බවට ප්‍රතිඥා දුන්න ද මෙම ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාමාර්ග අවසන් වී නැත[142]. යාපනය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකවරයා විසින් 2023 මැයි මස 04 වැනි දින පුරාවිද්‍යා ස්මාරකය පිහිටි භූමිය සීමා කිරීම සඳහා ඉඩම් මැනීමක් පිළිබඳ ව ප්‍රාදේශීය ලේකම්වරයා සහ කෝවිල් භාරකාර මණ්ඩලය ඇතුළු අදාළ පාර්ශව වෙත නිල ලිපියක් යොමු කර තිබීම සැලකිය යුතු කරුණක් බවට පත් ව තිබේ[143]. 2023 මැයි 25 දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උරුතිරපුරම් විහාරස්ථානයේ මිනින්දෝරු කටයුතු අත්හිටුවන බව අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා නිවේදනය කළේ ය[144].

## 2.5. මන්නාරම් දිස්ත්‍රික්කය

### 2.5.1. අදානි ග්‍රීන් එනර්ජිස් හි සුළං බල ව්‍යාපෘතිය

මෑත කාලයේ පෞද්ගලික සංස්ථා විසින් ආරම්භ කරන ලද සංවර්ධන ව්‍යාපෘති උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ප්‍රාදේශීය ප්‍රජාවන්ට අයත් ඉඩම්වලට නව තර්ජනයක් බවට පත් ව තිබේ[145]. අදානි ග්‍රීන් එනර්ජිස් හි සුළං බල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ද එවැනි කනස්සලුකාරී තත්ත්වයන් නිර්මාණය වී ඇත. මන්නාරම සුළං බලාගාර ව්‍යාපෘතියේ පළමු අදියර වන තම්බපවනි සුළං බලාගාරය මගින් මන්නාරම දකුණු වෙරළ තීරයේ නඩුකුඩා ගම්මානයේ සහ ඒ අවට ප්‍රදේශයේ සුළං උත්පාදන යන්ත්‍ර 30ක් ඉදි කරන ලදී[146]. 2020 වසරේ සම්පාදිත වාර්තාවන්ට අනුව මෙම ව්‍යාපෘතියට ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයා ඇත[147].



Image Source: CPA Field Visit

මෙයින් පසු අදානි සුළං බලාගාර ව්‍යාපෘතියට ප්‍රාදේශීය ප්‍රජාවන් වෙතින් සැලකිය යුතු විරෝධයක් එල්ල වී තිබේ[148]. 2023 පෙබරවාරි මස සීමා සහිත අදානි ග්‍රීන් එනර්ජි (ශ්‍රී ලංකා) සමාගම විසින් සුළං බලාගාර ව්‍යාපෘති දෙකක් සඳහා තාවකාලික අනුමැතිය ලබා ගන්නා ලදී. මින් පළමුවැන්න මෙගාවොට් 250ක ධාරිතාවයකින් යුක්ත ව මන්නාරම ප්‍රදේශයේ සහ මෙගාවොට් 234ක ධාරිතාවයකින් යුතු තවත් බලාගාරයක් පූනරීන් හි ඉදි කිරීමට යෝජිත ය. මන්නාරම ප්‍රදේශයේ යෝජිත ව්‍යාපෘති භූමිය අක්කර 250ක් ආවරණය කරන අතර පරිසර සංවේදී ප්‍රදේශයක පිහිටා ඇත. 2014 වසරේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය (එස්. එල්. එස්. ඊ. ඒ.) මන්නාරම දූපතේ 'බලශක්ති සංවර්ධන ප්‍රදේශයකී ප්‍රකාශයට පත් කිරීමත් සමග මෙම ව්‍යාපෘතිය ආරම්භ වූ අතර[149], නාගරික

---

[142] ලිපිය (129 වන පාද සටහන).

[143] ඉහත පාද සටහන.

[144] 'Survey Work of Uruthirapuram Shiva Temple Will Be Stopped - Minister Vidura Confirms' *Virakesari* (25 May 2023) <https://www.virakesari.lk/article/156155> ප්‍රවේශය 2024 ජනවාරි 20.

[145] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, සිවිල් සමාජ සංවිධානයක් සමග සම්මුඛ පරීක්ෂණය (මන්නාරම දිස්ත්‍රික්කය), 2024 අප්‍රේල් 25).

[146] 'Could "greenwashing" Adani wind project help save Mannar?' *The Island* (9 April 2024) <https://island.lk/could-greenwashing-adani-wind-project-help-save-mannar/#google_vignette> ප්‍රවේශය 2024 මැයි 3.

[147] 'Wind Farms: The Death of Mannar' Groundviews <https://sway.cloud.microsoft/Al0FmhFK7KqpjBKY?ref=Link> ප්‍රවේශය 2024 මැයි 3.

[148] ඉහත පාද සටහන.

[149] 2014 අප්‍රේල් 17 දිනැති අංක 1858/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය.

සංවර්ධන අධිකාරිය මෙම ප්‍රදේශය ධීවර, සංචාරක සහ සුළං බල ක්ෂේත්‍රයන්ගෙන් දියුණුවට පත් වීමට සහාය වීම සඳහා 'කාර්මික ප්‍රදේශයක්' ලෙස නැවත කලාපකරණය කරන ලදී[150]. ඒ අනුව, මන්නාරම සහ පුනරින් සුළං බලාගාර සංවර්ධනය කිරීම සඳහා ඉන්දියාවේ අදානි ග්‍රීන් එනර්ජි සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට (එම්. ඕ. යූ.) එළැඹීමට 2022 වසරේ දී කැබිනට් අනුමැතිය හිමි විය[151].

පසුව, 2022 ජූලි 7 වන දින, සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සභාපතිවරයා විසින් අදානි ග්‍රීන් එනර්ජි වෙත මූලික අනුමැතිය ප්‍රධානය කළ අතර ව්‍යාපෘතිය සඳහා පහසුකම් සපයන ලෙස පාර්ශවකරුවන්ට උපදෙස් නිකුත් කෙරිණි[152]. 2022 අගෝස්තු 16 වන දින වන විට අමාත්‍ය කංචන විජේසේකර විසින් උතුරු පළාතේ සුළං බල ව්‍යාපෘති දෙකක් සඳහා ඩොලර් මිලියන 500කට වැඩි ආයෝජනයක් සඳහා අදානි ග්‍රීන් එනර්ජි සමාගමට ශ්‍රී ලංකා රජයේ තාවකාලික අනුමැතිය ප්‍රකාශයට පත් කරන ලදී[153]. මෙම ව්‍යාපෘතියට ලංකා විදුලිබල මණ්ඩලයේ (සී. ඊ. බී.) බාධා ඇති වුව ද, 2022 සැප්තැම්බර් 18 වන දින, එය සුනිත්‍ය බලශක්ති අධිකාරියේ බලය අභිබවා යාම මත ලංවිම සාමාන්‍යාධිකාරීවරයා විසින් පූනරින් හි මෙගාවොට් 234ක සුළං බල ව්‍යාපෘතියට තාවකාලික අනුමැතිය නීති විරෝධී ලෙස ප්‍රදානය කරන ලදී[154]. මෙම නීතිමය ගැටලු මෙන් ම අදානි ග්‍රීන් එනර්ජි සමාගමට එරෙහි අපරාධ චෝදනා 2023 දී වසරේ දී ද එල්ල වෙමින් පැවතුණි[155]. මෙකී ගැටලු එසේ ම පැවතිය දී, 2023 දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (බී. ඕ. අයි.) විසින් අදානි සමූහ ව්‍යාපාරය විසින් දියත් කරන ලද ඩොලර් මිලියන 442ක පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියට කොළ එළි දල්වමින් මන්නාරම සහ පූනරීන් ප්‍රදේශවල සුළං බලාගාර ව්‍යාපෘති සඳහා තාවකාලික අනුමැතිය ලබා දෙන ලදී[156].

මෙසේ ආයෝජන මණ්ඩලය විසින් අනුමැතිය ලබා දීමේ යටිබිම්ගත ක්‍රියාවලිය ගැටලු සහගත බව දක්නට ලැබෙන අතර, 2023 ජනවාරි 4 වන දින, සීමාසහිත පාරිසරික පදනමේ (ඊ. එෆ්. එල්.) තොරතුරු ඉල්ලීමකට දක්වන ලද ප්‍රතිචාර පිළිබඳ පැහැදිලි කරන ලෙස තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ කොමිෂන් සභාව ආයෝජන මණ්ඩලය වෙත නියෝග කරන ලදී[157]. පාරිසරික ගැටලු හේතුවෙන් මෙමම තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ අයදුම්පත යොමු කර තිබූ අතර,

---

[150] ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයඃ සුළං බල උත්පාදන ව්‍යාපෘතිය - නැවත ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම් (2021 සැප්තැම්බර්)<https://www.adb.org/sites/default/files/project-documents/49345/49345-002-rp-en_1.pdf> ප්‍රවේශය 2024 ජූලි 31.

[151] Namini Wijedasa, 'Official letters show CEB Chairman was instructed to facilitate Adani projects' *The Sunday Times* (19 June 2022) <https://www.sundaytimes.lk/220619/news/adani-to-expand-still-further-in-sri-lanka-through-wind-and-solar-power-projects-486419.html> ප්‍රවේශය 2024 මැයි 10.

[152] Niranjala Ariyawansha, 'CEB says approval for Adani project illegal' *The Sunday Times* (18 September 2022) <https://www.sundaytimes.lk/220918/news/ceb-says-approval-for-adani-project-illegal-496165.html> ප්‍රවේශය 2024 මැයි 10.

[153] 'Sri Lanka grants Adani Green Energy approvals for wind projects' *The Economic Times* (16 August 2023) <https://economictimes.indiatimes.com/industry/renewables/sri-lanka-grants-adani-green-energy-approvals-for-wind-projects/articleshow/93600715.cms?from=mdr> ප්‍රවේශය 2024 මැයි 11.

[154] Ariyawansha (152 වන පාද සටහන).

[155] Hannah Ellis-Petersen and Simon Goodley, 'Modi-linked Adani family secretly invested in own shares, documents suggest' *The Guardian* (31 August 2023) <https://www.theguardian.com/world/2023/aug/31/modi-linked-adani-family-secretly-invested-in-own-shares-documents-suggest-india> ප්‍රවේශය 2024 මැයි 15.

[156] 'Sri Lanka approves $442-million wind power project of Adani Group' *The Hindu* (24 February 2023) <https://www.thehindu.com/news/international/sri-lanka-approves-442-million-wind-power-project-of-adani-group/article66544744.ece> ප්‍රවේශය 2024 මැයි 15.

[157] 'A Power Project In The Dark; RTI Voices Concern Regarding Transparency Around The Adani 'Green Energy' Project' *Colombo Telegraph* (8 January 2024) <https://www.colombotelegraph.com/index.php/a-power-project-in-the-dark-rti-voices-concern-regarding-transparency-around-the-adani-green-energy-project/> ප්‍රවේශය 2024 මැයි 15.

අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේ ද සහ ව්‍යාපෘතිය සිදු කරන නිශ්චිත ස්ථානය පිළිබඳ ව එමගින් විමසා තිබිණි[158]. තොරතුරු දැනගැනීමේ පනතේ 29 වගන්තිය යටතේ රහස්‍යභාවය සඳහන් කරමින් ආයෝජන මණ්ඩලය විසින් මීට පෙර මෙම තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර පැවතිය ද, අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති බවත්, මූලික අනුමැතිය ලබා දී ඇති බව සහ අදාළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතනවලින් අවසර ලබා ගෙන ඇති බව පසුව තහවුරු කරන ලදී[159]. කෙසේ වුව ද, ආයෝජන මණ්ඩලයේ සහතිකයට පටහැනි ව, ව්‍යාපෘතිය සඳහා මන්නාරම සහ පූනරීන් ප්‍රදේශවල ඉඩම් තවමත් හඳුනා ගෙන නොතිබුණි, එනම් මධ්‍යම පරිසර අධිකාරියේ (සී. ඊ. ඒ.) පාරිසරික අනුමැතිය තවමත් ඉතිරි ව පවතී[160].

අවසාන වශයෙන්, 2024 ජනවාරි 28 වන දින, මධ්‍යම පරිසර අධිකාරිය විසින් යෝජිත මන්නාරම සුළං බල ව්‍යාපෘතිය (II අදියර) සඳහා පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ඉදිරිපත් කරන ලද අතර, අදානි ව්‍යාපෘතිය සඳහා රජය විසින් බොහෝ දුරට පුද්ගලික සන්තකයේ පවතින ඉඩම් හෙක්ටයාර 201.98ක් අත්පත් කර ගන්නා ලදී[161]. 2024 පෙබරවාරි 04 වැනි දින මන්නාරම ප්‍රදේශයේ ප්‍රාදේශීය ප්‍රජාවන් විසින් ව්‍යාපෘතියේ පළමු අදියරට එරෙහි ව ගැටලු මතුකරමින් විරෝධතා පවත්වන ලදී[162]. ක්‍රියාවලිය වටා ඇති මූලික ගැටලු අතරට:

- ඉදි කරන ලද සුළං මෝල් විවිධ සංක්‍රමණික පක්ෂීන්ගේ ගමන් මාර්ගයෙහි පිහිටා තිබීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස පක්ෂීන් මරණයට පත් වීම[163].

- ව්‍යාපෘතිය නිසා ඇති වන කැළඹීම් මත්ස්‍ය හැසිරීමට බලපාන බැවින් සමුද්‍ර පරිසර පද්ධති කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇතිවීමේ හැකියාව සහ එහි ප්‍රතිඵලයක් ලෙස මන්නාරම ප්‍රදේශයේ ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවරයින්ට හානි සිදුවීමේ හැකියාවක් පැවතීම[164].

- ආර්ථිකමය වශයෙන්, ශ්‍රී ලංකාවේ කිලෝවොට් එකකට ඩොලර් ශත 8.26 ගෙවීම ගෝලීය සාමාන්‍ය ශත 3 ට වඩා බෙහෙවින් වැඩි අගයක් ගනී.[165] ඉහත සඳහන් කළ රහස්‍ය මෙන් ම අපිළිවෙල ක්‍රියාවලිය ගැඹුරින් සලකා බැලිය යුතු ය.

- 2023 ජූනි මස ඉඩම් අත්පත් කර ගැනීමේ දැන්වීම් ආරම්භ කිරීමත් සමග[166], ඉඩම් හිමියන් එකී දැන්වීම් පිළිබඳ දැන නොසිටීම හෝ අවබෝධ කර නොගැනීම මෙන් ම, ක්‍රියාවලිය නීති විරෝධී බවට චෝදනා එල්ල වීම ද, සැලකිය යුත්තකි. ප්‍රාදේශීය ප්‍රජාවන් නීතිමය ක්‍රියාදාමයන් පිළිබඳ ව නො දැන සිටි බවත් මීට පෙර සිදු වූ බියගැන්වීම් හේතුවෙන් සටන් කිරීමට ඉදිරිපත් වීමට අකමැති වූ බවත් තොරතුරුකරුවන්ගේ අදහස විය[167].

---

[158] ඉහත පාද සටහන.

[159] ඉහත පාද සටහන.

[160] ඉහත පාද සටහන.

[161] 'Land acquisition begins for Adani wind power project; hi-tech system to protect birdlife' *The Sunday Times* (28 January 2024) <https://www.sundaytimes.lk/240128/news/land-acquisition-begins-for-adani-wind-power-project-hi-tech-system-to-protect-birdlife-546772.html> ප්‍රවේශය 2024 මැයි16.

[162] 'Gone with the wind: Mannar fisherfolk fear of being blown away by turbine project' *The Sunday Times* (4 February 2024) <https://www.sundaytimes.lk/240204/news/gone-with-the-wind-mannar-fisherfolk-fear-of-being-blown-away-by-turbine-project-547275.html> ප්‍රවේශය 2024 මැයි16.

[163] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (සම්මුඛ සාකච්ඡාව)(145 වන පාද සටහන).

[164] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (සම්මුඛ සාකච්ඡාව)(145 වන පාද සටහන).

[165] Disna Mudalige, 'TISL Demands Transparency in Adani Wind Power Project: Files Right to Information Applications' (*Transparency International Sri Lanka*, 5 June 2024) <https://www.tisrilanka.org/tisl-demands-transparency-in-adani-wind-power-project-files-right-to-information-applications/> ප්‍රවේශය 2024 ජූනි 30.

[166] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ප්‍රාදේශීය තොරතුරුකරුවෙකු සමග සම්මුඛ සාකච්ඡාව (මන්නාරම දිස්ත්‍රික්කය, 2024 මැයි 16).

[167] ඉහත පාද සටහන .

- ව්‍යාපෘතිය හේතුවෙන් වාසයට සුදුසු ඉඩම් අහිමිවීමේ අවදානම.

එසේ වුව ද, තාක්ෂණික සමාලෝචනයකින් සහ මහජන උපදේශනයකින් පසුව, සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් මන්නාරම සූර්ය බලශක්ති ව්‍යාපෘතිය 2024 මැයි 6 වන දින අනුමත කරන ලදි[168]. ජුනි මස 3 වන දින සීමාසහිත පාරිසරික පදනම ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කරමින් ව්‍යාපෘතියේ ඇති පාරිසරික බලපෑම් සහ මෙම 'සංවර්ධන ව්‍යාපෘතිය' සඳහා තරගකාරී ලංසු තැබීමට අසමත් වීම පිළිබඳ අධිකරණයේ අවධානය යොමු කරන ලදි[169]. 2024 ජුනි 23 වන දින වන විට, ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රමාණවත් තොරතුරු උපුටා දක්වමින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අදානි ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප කළේ ය[170]. අවසාන වශයෙන්, ඉහත පැහැදිලි කර ඇති කාල රාමුව තුළ අදානි ග්‍රීන් එනර්ජි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ විවිධ අංශවල සාමූහික උත්සාහයක් පෙන්නුම් කරන අතර ව්‍යාපෘතිය ආරම්භ වන්නේ කවදා ද යන්න දැන සිටිනුයේ කාලය පමණි.

සංවර්ධන ව්‍යාපෘති වටා ඇති ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණය සහ ඒ ආශ්‍රිත ගැටලු 4.4 පරිච්ඡේදයේ සාකච්ඡා කෙරේ.

### 2.5.2 මුල්ලිකුලම්

මන්නාරමෙන් දකුණට මායිම් ව පිහිටි මුල්ලිකුලම් ගම්මානය මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේ. මෙම ප්‍රදේශයේ අක්කර 1200ක පමණ භූමි ප්‍රමාණයක් වගා කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර ඉතිරි ඉඩම් ජනතාව විසින් අත්පත් කර ගෙන තිබීම විශේෂත්වයකි[171]. මෙම ප්‍රදේශයේ ඉඩම් රජය විසින් අත්පත් කර ගැනීමේ මූලයන් සිවිල් යුද්ධයෙන් ආරම්භ වූ අතර, මිලිටරි අවශ්‍යතා සඳහා පුද්ගලික ඉඩම් පවරා ගැනීම මෙහි දී සලකා බැලිය යුත්තකි[172]. මුල්ලිකුලම් යනු දකුණු මන්නාරමේ වෙරළබඩ ප්‍රදේශයේ පිහිටි ධීවර ගම්මානයක් වන අතර, බොහෝ දුරට ගොවීන් වන මෙම ජනතාව වී වගාව සහ ගව පාලනය ඇතුළත් ගොඩබිම් ආර්ථිකයක් මත යැපෙන්නන් වේ[173]. මෙම ප්‍රදේශයට වැදගත් සිදුවීම් පහත දැක්වෙන කාල සටහන විස්තර කරයි:[174]

---

[168] 'Adani Green Energy's wind power project undergoes technical review' *The Sunday Times* (31 March 2024) <https://www.sundaytimes.lk/240331/business-times/adani-green-energys-wind-power-project-undergoes-technical-review-553313.html> ප්‍රවේශය 2024 මැයි 17.

[169] නඩු අංක SCFR149/2024, මෙම නඩුව දැනට විභාග වෙමින් පවතී.

[170] Namini Wijedasa, 'Regulator refuses approval for Adani wind power project' *The Sunday Times* (23 June 2024)<https://www.sundaytimes.lk/240623/news/regulator-refuses-approval-for-adani-wind-power-project-561878.html> ප්‍රවේශය 2024 ජූලි 20.

[171] Ruki Fernando, 'The Struggle to Go Home in Post-War Sri Lanka: The Story of Mullikulam' *Groundviews* (1 August 2012) <https://groundviews.org/2012/08/01/the-struggle-to-go-home-in-post-war-sri-lanka-the-story-of-mullikulam/> ප්‍රවේශය 2023 නොවැම්බර් 1.

[172] ඉහත පාද සටහන.

[173] 'Civil Society Urges The President To Revoke Musali Gazette' *Colombo Telegraph* (26 April 2017) <https://www.colombotelegraph.com/index.php/civil-society-urges-the-president-to-revoke-musali-gazette/> ප්‍රවේශය 2023 නොවැම්බර් 2.

[174] Fernando (171 වන පාද සටහන).

| | |
|---|---|
| 1983 | මුල්ලිකුලම් සිය පළමු සන්නද්ධ ප්‍රචණ්ඩ ක්‍රියාව දුටුවේ හමුදාව විසින් පවුල් තුනක පුද්ගලයන් හය දෙනෙකු ඝාතනය කළ බව කියන විට ය. ඔවුන්ගේ නිවාස විනාශ වූ අතර මුහුදු වෙරළේ සිරුරු ගිනි තබා ඇත. මෙය පුළුල් භීතියකට තුඩු දුන් අතර, අවට වනාන්තරවලට පලා යාමට සහ මායිම් ගම්මානවල රැකවරණය පතා යාමට ගම්වැසියන් පොළඹවන ලදි. |
| 2002 | 2002 සටන් විරාම ගිවිසුමත් සමඟ 2003 දී බොහෝ අවතැන් වූ පුද්ගලයන් ආපසු සිය නිවෙස් කරා පැමිණියහ. අවාසනාවකට මෙන්, ඔවුන්ගේ නිවාස නටබුන්, බඩු බාහිරාදිය කොල්ලකෑම සහ රුපියල් මිලියන ගණනක් වටිනා ජීවනෝපාය උපකරණ අතුරුදහන් වී ඇති බව ඔවුහු සොයා ගත්හ. |
| 2007 | රජය විසින් මුල්ලිකුලම් ප්‍රදේශයෙන් පවුල් 400ක් බලහත්කාරයෙන් ඉවත් කරන ලදි. ජනතාව කිසි දිනක මුල්ලිකුලම් වෙත නොපැමිණි අතර අවතැන් විය. ඔවුන් තල්වුපාඩු, වල්කයිපෙට්‍රන්කන්ඩාල්, තලෙයිමන්නාරම, නානත්තන් සහ මඩුක්කරේ වෙත සංක්‍රමණය වූ අතර සමහරු මන්නාරම නගරයේ ද ජීවත් වූහ. |

ඉවත් කිරීම ආරම්භ වූ විට පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමට පටන් ගත් හමුදාව දින තුන හතරක් ඇතුළත ඉඩම ආපසු ලබා දෙන බවට පොරොන්දු විය[175]. එසේ වුව ද, ”ස්ථිර හමුදා කඳවුරක් පිහිටු වීම සඳහා සම්පූර්ණ භූමි ප්‍රමාණය ම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවරා ගන්නා ලද” බව හමුදාව පසුව නිවේදනය කරන ලදි[176]. අනතුරුව, 2009 මැයි මස 14 වන දින 'වයඹ විධාන මූලස්ථානය' නමින් කඳවුරක් සහ 'එස්. එල්. එන්. එස්. හරණී නමින් නාවික ආයතනයක් පිහිටු වන ලද්දේ, වන්කාලෙෙ සහ සිලාවතුරෙෙ හි ද තවත් කඳවුරු දෙකක් පිහිටු වීමත් සමඟිනි[177]. පසුව පුත්තලම වයඹ නාවික හමුදා මූලස්ථානය මුල්ලිකුලම් වෙත ගෙන යන ලද අතර එය 2010 සැප්තැම්බර් 02 වන දින එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදි[178].

2011 මැද භාගයේ දී මුල්ලිකුලම් ප්‍රදේශයේ නාවික හමුදා නිලධාරීන් නිවැසියන්ට නැවත ගමට යාමට ඉඩ දීමට කැමැත්ත පළ කළ බවක් දක්නට විය[179]. එහි දී සංචාරයන් කිහිපයක් සංවිධානය කරන ලද අතර, නාවික හමුදා නිලධාරියෙකු පෙන්වා දුන්නේ මුල්ලිකුලම් හි පිහිටි ඔවුන්ගේ කඳවුර විසුරුවා හැරීමට නාවික හමුදාව අදහස් කරන බවත්, මාස තුනක කාලයක් ගම හමුදා පාලනය යටතේ පවතිනු ඇති බවත්, පසුව ගම්වාසීන්ට ආපසු යාමට අවසර දෙන බවත් ය[180].

මෙම කාලය තුළ ඉහළ ගිය හමුදාකරණයෙන් අවතැන් වූවන් සඳහා රජය විසින් සැබෑ විසඳුම් ලබා දී නොවී ය[181]. ගම්වැසියන් නාවික හමුදාව විසින් අත්පත් කර ගෙන ඇති ඉඩම් තුළ පිහිටි ඔවුන්ගේ පල්ලියට සහ පාසලට ප්‍රවේශය සහිත ව මුල්ලිකුලමෙන් පිටත මීටර් 750 සීමාවට රැගෙන යාමට 2012 දෙසැම්බරයේ දී රජය යෝජනා කරන ලදි[182]. ඊට අමතරව නාවික හමුදාව රඳවා තැබීමකින් හෝ මුරපොලකින් තොර ව තම පල්ලියට සහ පාසලට නිදහස් සහ ආරක්ෂිත ප්‍රවේශ මාර්ගයක් ලබා

175 ඉහත පාද සටහන.

176 ඉහත පාද සටහන.

177 ඉහත පාද සටහන.

178 ඉහත පාද සටහන.

179 ඉහත පාද සටහන.

180 ඉහත පාද සටහන.

181 සිවිල් සමාජ සංවිධානයක් සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ පරීක්ෂණය (මන්නාරම දිස්ත්‍රික්කය, 2024 අප්‍රේල් 26).

182 Fernando (n 171).

දෙන ලෙස ජනතාව ඉල්ලා සිටියහ[183]. , නාවික හමුදාව විසින් අත්පත් කර ගෙන සිටින ගම්මානයට පිටතින් හිඳිමින් මාසයකට වැඩි කාලයක් දිවා රෑ මුළුල්ලේ පවත්වන ලද විරෝධතාවයකින් පසුව, වසර අවසන් වන විට ඉඩම් අක්කර 100ක් නිදහස් කිරීමට 2017 අප්‍රේල් මස 29 වන දින නාවික හමුදාපතිවරයා පොරොන්දු විය[184]. අද වන විට ඉඩම් අක්කර 77ක් නිදහස් කර ඇතත් නාවික හමුදාව විසින් පදිංචිව සිටි නිවාස 27ක් තවමත් නිදහස් කර නැත[185]. මන්නාරම, නානාද්දන්, මුසලි, මාන්තෙයි බටහිර, මඩු ඇතුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පහක දෙමළ ජනතාව දැනට හමුදාව විසින් අත්පත් කර ගෙන සිටින තම ඉඩම ආපසු ලබා දෙන ලෙස ඉල්ලා ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ වෙත තැපැල්පත් 5000ක් යවා ඇති අතර මෙම ඉඩම් නැවත ලබා ගැනීමේ සටන දිගට ම ක්‍රියාත්මක වේ[186].

මෙම ඉඩම වටා ඇති නීතිමය ගැටලු බහුමානීය ස්වභාවයක් ගනී. රජය පොදු අවශ්‍යතා සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත ප්‍රමාණවත් ලෙස අනුගමනය කිරීම හෝ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බලපත්‍ර සහ ප්‍රදාන අවලංගු කිරීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කර නොමැති බව පැහැදිලි වන්නකි. මීට අමතරව, මුල්ලිකුලම් අධි ආරක්ෂිත කලාපයක් ලෙස ගැසට් කර නොතිබූ අතර, අත්පත් කර ගැනීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න මතු විය. ඉඩම් අත්පත් කර ගැනීමේ දී අවශ්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් නීතිමය ගැටලු මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ විස්තර කෙරේ.

### 2.5.3. පුල්ලරුන්තන් කන්දල් තණබිම්

මන්නාරම, පුල්ලරරුන්දන් ප්‍රදේශයේ පිහිටි කන්දල් තෘණ භූමිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන රැසක අත්පත් කර ගැනීම්වලට ලක් ව ඇති අතර එමගින් ගවයන් ඇති කිරීම සඳහා මෙම තණබිම් භාවිතා කිරීමට බාධා එල්ල වී ඇත. මන්නාරම - නානාටන් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ කිරි ගොවීන් තම ගවයින්ට තෘණ භූමි ප්‍රමාණවත් නොවීම පිළිබඳ නැවත නැවතත් ඉස්මතු වන අභියෝගය සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත දැනුම් දෙන ලදි. සෑම වසරක ම තණබිම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කිරි ගොවීන්ට තම ගවයින් මාන්තෙයි බටහිර, ඉලුප්පක්කඩවායි ප්‍රදේශයට රැගෙන යාමට සිදුව ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස තම පශු සම්පත්වලට සහ ආර්ථිකයට සිදු වන සැලකිය යුතු හානීන් වැනි විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දීමට ඔවුන්ට සිදුවී තිබේ[187]. උදාහරණයක් ලෙස 2023 වසරේ මාන්තෙයි බටහිර ප්‍රදේශය වෙත ගවයින් 15,000ක් ප්‍රවාහනය කර ඇති අතර ගවයින් 3500ක් පමණ ගංවතුරට ගසාගෙන ගොස් ඇතත් ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් නිහඬ ව සිටි පළාත් පාලන ආයතන විසින් මේ පිළිබඳ පැමිණිලි කර තිබියදීත් ගව හිමියන්ට වන්දි ලබා දී නොමැත[188].

183 Fernando (71 වන පාද සටහන).

184 'Initial success of Mullikulam area release: Minister Swaminathan' *Virakesari* (1 May 2017) <https://www.virakesari.lk/article/19584> ප්‍රවේශය 2023 නොවැම්බර් 4.

185 'Order to release Mullikulam lands' *Yaal* (29 April 2017) <https://shorturl.at/yd6jB> ප්‍රවේශය 2023 නොවැම්බර් 4.

186 '"Give us our lands back!" - Tamils in Mannar send 5,000 postcards to Sri Lankan president demanding return of land' *Tamil Guardian* (4 March 2024) <https://www.tamilguardian.com/content/give-us-our-lands-back-tamils-mannar-send-5000-postcards-sri-lankan-president-demanding> ප්‍රවේශය 2023 නොවැම්බර් 5.

187 කිරි ගොවීන් සමග විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (මන්නාරම දිස්ත්‍රික්කය, 2024 අප්‍රේල් 26).

188 ඉහත පාද සටහන.

ඓතිහාසික වශයෙන් 1899 සිට තෘණ භූමිය පිහිටා ඇති කට්ටුක්කරයිකුලම් ප්‍රදේශයේ මිනිස් ජනාවාස පවතී[189]. ඇස්තමේන්තුවලට අනුව එහි දී ගම්මාන 34ක් පිහිටුවා තිබූ අතර[190], 1901 දී ඉතා ගැටලු සහගත ලෙස රජය විසින් කට්ටුක්කරයිකුලම් එළි පෙහෙළි කිරීමේ අරමුණින් මෙම ප්‍රදේශවලින් ජනතාව ඉවත් කළ අතර එසේ ඉවත් කළ තැනැත්තන්ට වෙනත් ස්ථානවල ඉඩම් ලබා දීමට කටයුතු කරන ලදී[191]. පසුව, 1938 දී රජය විසින් මීට පෙර ජනාවාසව පැවති ගම්මාන 34 එම ගම්මානවලට උතුරු දෙසින් වන වනාන්තර ප්‍රදේශය දක්වා (වර්තමාන ඉසිමලෛතලව් ගම්මානය) මැනුම් කටයුතු සිදු කළ අතර වනාන්තර ප්‍රදේශය කුරුලු අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී[192]. 1954 දී අක්කර 9985ක්, රූඩ් 1ක් සහ පර්චස් 19ක ඉඩමක් කුරුලු අභය භූමියක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කර තිබේ. කෙසේ වෙතත්, එක් පවුලක් අභය භූමිය ආක්‍රමණය කළ අතර, ඔවුන්ගෙන් පැවත එන්නන් වනාන්තරය කපා හෙළි පෙහෙළි කර එයින් කොටසක් වගා කළ හැකි කුඹුරු බවට පත් කළහ[193]. ඉතිරි ඉඩම් රාජ්‍ය දෙපාර්තමේන්තු ඇතුළු විවිධ පාර්ශව විසින් ක්‍රමක්‍රමයෙන් අත්පත් කර ගැනීමට කටයුතු කරන ලදී[194].

මෙකී ඉඩම් ආරවුල් මධ්‍යයේ 2019 වසරේ මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති රැස්වීමකට එවක ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සහභාගී විය[195]. නානාටන් ප්‍රාදේශීය සභාව විසින් කට්ටුක්කරයිකුලම් ප්‍රදේශයේ කුරුලු අභය භූමි විනාශය පිළිබඳ ව සාකච්ඡා කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2019 මැයි මාසයේ දී දිස්ත්‍රික් ලේකම්වරයා මේ පිළිබඳ ව පරීක්ෂණයක් අවශ්‍ය බවත් සම්පූර්ණ වාර්තාවක් අග්‍රාමාත්‍යවරයා වෙත ලබා දෙන ලෙසත් දන්වමින් උපදෙස් දීමට කටයුතු කරන ලදී[196]. 2019 ජුනි මස 01 වැනි දින එවකට අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් පරිදි වාරිමාර්ග දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, මන්නාරම දිස්ත්‍රික් පුරවැසි කමිටුව, මාධ්‍යවේදීන්, නානාටන් ප්‍රාදේශීය ලේකම් ඇතුළු පිරිස ප්‍රදේශයේ සංචාරයක නිරත විය. එකී විමර්ශනයේ දී, වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අක්කර 800 සිට 1000 දක්වා ඇස්තමේන්තුගත වනාන්තර ප්‍රමාණයක් විනාශ කර ඇති බව වාර්තා වූ අතර ඒ පිළිබඳ විස්තර තොරතුරු සහ ඡායාරූප 2019 ජුනි 3 වන දින දිස්ත්‍රික් ලේකම්වරයාට[197] සහ එම වසරේ ඔක්තෝබර් 15 වන දින පළාත් ආණ්ඩුකාරවරයාට[198] යොමු කරන ලදී. නමුත් අදාළ බලධාරීන් ඒ සඳහා කිසිදු පියවරක් ගෙන නොමැත.

කෙසේ වෙතත්, 2020 අගෝස්තු මස 11 වන දින වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුව වාර්තාවක් සකස් කළ අතර එමගින් ප්‍රදේශයේ වන විනාශය බහුල ව පවතින බව පෙන්වා දෙන ලදී[199]. පසුව මෙම වාර්තාව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා ඇතුළු අදාළ බලධාරීන් වෙත යවා කෘෂිකර්මාන්තය මුවාවෙන් මෙම වනාන්තර ඉඩම අත්පත් කර ගැනීම නවත්වන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත[200]. මෙම ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොමැත.

---

[189] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (181 වන පාද සටහන).

[190] කටුක්කරෛ මැනුම් යොමු අංක 62683 සහ අංක 82684.

[191] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (181 වන පාද සටහන).

[192] කටුක්කරෛ මැනුම් යොමු අංක (190 වන පාද සටහන).

[193] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (181 වන පාද සටහන).

[194] ඉහත පාද සටහන.

[195] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (181 වන පාද සටහන).

[196] ඉහත පාද සටහන.

[197] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (187 වන පාද සටහන).

[198] ඉහත පාද සටහන.

[199] ඉහත පාද සටහන.

[200] ඉහත පාද සටහන.

### 2.5.4. වැලි කැණීම් ව්‍යාපෘති

වර්ග කිලෝමීටර් 2002ක මුළු භූමි ප්‍රමාණයකින් සමන්විත මන්නාරම දිස්ත්‍රික්කය ලොව සිව්වන විශාලතම ඉල්මනයිට් නිධියට හිමිකම් කියයි[201]. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට (ජී. එස්. එම්. බී.) අනුව, දිවයිනේ ඛනිජ වැලි ටොන් මිලියන 53ක් ඇති බවට ගණන් බලා ඇති අතර, ඉල්මනයිට්, ලියුකොක්සීන්, සර්කෝනියම්, රූටයිල්, ටයිටේනියම් ඔක්සයිඩ්, ගුැනයිට්, සිලිමනයිට් සහ ඕතොක්ලේස් වැනි වටිනා ඛනිජ වර්ග පස තුළ දක්නට ලැබේ[202].

ගැටලු සහගත ලෙස 2015 වසරේ සිට විවිධ සමාගම්වල දායකත්වයෙන් මන්නාරම දූපතේ ඛනිජ ගවේෂණ ව්‍යාපෘතියෙහි මූලික අදියර ආරම්භ විය. ඍණාත්මක පාරිසරික හා සමාජීය බලපෑම් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහ පරිසරවේදීන්ගේ සැලකිය යුතු මතභේදයන්ට සහ විරෝධයන්ට තුඩු දී තිබේ[203]. මන්නාරම දූපතේ ඛනිජ ගවේෂණ කටයුතු සඳහා ශ්‍රී ලංකා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් දේශීය සමාගම් පහකට බලපත්‍ර 9ක් නිකුත් කිරීමට කටයුතු කරන ලදි[204]. ඒ අනුව, 2015 සැප්තැම්බර් මාසයේ දී එක් බලපත්‍රයක් හිමි කර ගත් කිල්සයිත් එක්ස්ප්ලෝරේෂන් සමාගම; 2015 සැප්තැම්බර් මාසයේ දී බලපත්‍ර දෙකක් හිමි කර ගත් හැමස්මිත් සිලෝන් සමාගම; 2015 සැප්තැම්බර් මස දී බලපත්‍ර දෙකක් හිමි කර ගත් සුප්‍රීම් සොලූෂන් සමාගම; 2015 සැප්තැම්බර් මස දී බලපත්‍ර දෙකක් හිමි කර ගත් සනර් මිනරල්ස් සමාගම; සහ 2015 ජූලි මස දී බලපත්‍ර දෙකක් හිමි කර ගත් ඔරයින් මිනරල්ස් සමාගම මේ අතර විය[205]. පසුව, මෙම දේශීය සමාගම් මොරිෂියානු ෂෙල් සමාගම් දෙකක් වන බ්‍රයිට් එන්ජල් ලිමිටඩ් සහ ස්රිනෙල් හෝල්ඩින්ස් විසින් අත්පත් කර ගන්නා ලද අතර, අවසානයේ දී ඒවා ටයිටේනියම් සැන්ඩ්ස් ලිමිටඩ් (ටී.එස්.එල්.) නම් ඕස්ට්‍රේලියානු සමාගමක් විසින් අත්පත් කර ගන්නා ලදි. මුල දී, ශ්‍රී ලංකාවේ ඛනිජ කැණීම සඳහා තමන්ට සැලසුමක් නොමැති බව ටී. එස්. එල්. පවසා සිටින්නට විය[206].

පරිසරයට සහ දිවයිනේ වැසියන්ගේ ජීවනෝපායට සිදු වන අහිතකර බලපෑම් පිළිබඳ ව සැලකිලිමත් වන ප්‍රදේශවාසීන්ගේ සහ පරිසරවේදීන්ගේ අඛණ්ඩ විරෝධතාවන්ට මෙම ව්‍යාපෘතිය ගොදුරු වී තිබේ. මන්නාරම් දූපත මුහුදු මට්ටමේ සිට 63 % ක් පහළින් පිහිටා ඇති බැවින් සහ අධික ලෙස නිස්සාරණය කිරීම ගංවතුර ඇති වීමට මෙන් ම කෘෂිකර්මාන්තයට සහ ධීවර කටයුතුවලට අහිතකර බලපෑම් ඇති විය හැකි බැවින් පාරිසරික හායනය ප්‍රධාන ගැටලුවක් බවට පත් වී තිබේ. මීට අමතරව, අධික ලෙස කැණීම් සහ පතල් කැණීම් කටයුතු, ලවණ ජලය සැලකිය යුතු ලෙස ගොඩබිමට පැමිණීමට හේතු විය හැකි අතර එතුළින් පානීය ජල සැපයුම දූෂණය විය හැකි ය[207]. ධීවර කර්මාන්තය සහ කෘෂිකර්මාන්තය තම ජීවනෝපාය ලෙස පවත්වාගෙන යන දස දහස් සංඛ්‍යාත නිවැසියන්ගේ ජීවිතවලට මෙම පාරිසරික ප්‍රශ්න දැඩි ලෙස බාධා කළ හැකි ය[208].

---

201 'Sand Excavation in Sri Lanka's Mannar Will Lead To Destruction' *Earth Journalism Network* (28 February 2022) <https://earthjournalism.net/stories/sand-excavation-in-sri-lankas-mannar-will-lead-to-destruction> ප්‍රවේශය 2024 මැයි 26.

202 ඉහත පාද සටහන.

203 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (145 වන පාද සටහන).

204 'Australian Company destroying Mannar Island' *Ceylon Today* (1 October 2022) <https://ceylontoday.lk/2022/10/01/australian-company-destroying-mannar-island/> ප්‍රවේශය 2024 මැයි 27.

205 Kamanthi Wickramasinghe, 'Spotlight on Mineral exploration project: Alarming ilmenite project threatens Mannar community, biodiversity' *Daily Mirror* (28 September 2022) <https://www.dailymirror.lk/print/news-features/Spotlight-on-Mineral-exploration-project-Alarming-ilmenite-project-threatens-Mannar-community-biodiversity/131-245718> ප්‍රවේශය 2024 ජුනි 2.

206 R.Ramakumar, 'Sand Excavation in Sri Lanka's Mannar Will Lead To Destruction' *Earth Journalism Network* (28 February 2022) <https://earthjournalism.net/stories/sand-excavation-in-sri-lankas-mannar-will-lead-to-destruction> ප්‍රවේශය 2024 මැයි 30.

207 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (145 වන පාද සටහන).

208 ඉහත පාද සටහන.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මෙම අඛණ්ඩ විරෝධතාවලට ප්‍රතිචාර වශයෙන් 2021 අප්‍රේල් මස දී මන්නාරම ඛනිජ වැලි ව්‍යාපෘතිය සඳහා වූ සියලු ම ගවේෂණ බලපත්‍ර අවලංගු කරන ලදි[209]. කෙසේ වුව ද, 2021 දෙසැම්බර් මස මෙකී බලපත්‍ර අභිරහස් ලෙස නැවත නිකුත් කළ අතර, ටී.එස්.එල්. හට 2022 ජනවාරි මාසයේ දී සිය ගවේෂණ සහ කැණීම් කටයුතු නැවත ආරම්භ කිරීමට ඉඩ ලබා දෙන ලදි[210]. ඕස්ට්‍රේලියානු සමාගම ප්‍රදේශවාසීන්ට වන්දි ලබා දෙන බවට සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල අහිතකර බලපෑම් නිවැරදි කරන බවට පොරොන්දු වුව ද, සැලකිය යුතු පියවරක් ගැනීමට මෙතෙක් කටයුතු කර නැත[211]. මන්නාරම් දූපතේ ක්‍රියාත්මක වන රජය සහ පෞද්ගලික ආයතන එක්ව අඩි 50 ට අඩු ගැඹුරකින් යුත් ළිං 4500 කට වැඩි ප්‍රමාණයක් හාරා ඇති බව විරෝධතාකරුවෝ පවසති[212]. මේ අතරින්, ටී.එස්.එල්. විසින් කලාපීය අධ්‍යයනයක් සඳහා ගවේෂණාත්මක සිදුරු 4000කට වඩා වැඩි ප්‍රමාණයක් හෑරීමට කටයුතු කර ඇති අතර මින් ඇතැම් ඒවා මීටර් 12ක් තරම් ගැඹුරට හාරා තිබේ. වාර්තා වන අන්දමට ඒ සඳහා පුද්ගලික ඉඩම් හිමියන්ගේ අවසර ලබා ගෙන නොමැත[213]. වැලි ගොඩ දැමීම සඳහා විවිධ නියෝජිතයින් විසින් ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් බහුවිධ පැමිණිලි ලැබී ඇති බව ප්‍රාදේශීය සිවිල් සමාජ සංවිධාන විසින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත දැනුම් දී තිබේ[214]. සිද්ධියෙන් පෙන්නුම් කරන පරිදි, සම්පත් නිස්සාරණයට ඉඩ සලසන බලපත්‍ර නිකුත් කිරීම සහ පසුව ඒ හේතුවෙන් ජීවනෝපායන් විනාශ වීම, අවධානය යොමු කළ යුතු ප්‍රධාන අභියෝගයකි.

### 2.5.5. සිලාවතුරෙයි

සිලාවතුරෙයි යනු මන්නාරමට නිරිත දෙසින්, මුසලි කොට්ඨාසයේ වර්ග කිලෝමීටර් 2.95ක වපසරියකින් යුත් කුඩා ගම්මානයකි. 1990 දශකය වන විට මෙම ගම්මානයේ පවුල් 250ක් පදිංචි වී සිටියහ[215]. 1990 දී දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය විසින් මුස්ලිම් ජනතාව උතුරෙන් පලවා හැරීමත් සමඟ මෙම ප්‍රදේශයේ ජනතාව අවතැන්භාවයට පත් විය[216]. එකල සිසුන් තුන්සියයකට අධික පිරිසක් සිලාවතුර පාසලේ ඉගෙනුම ලැබූහ[217]. ඇතැම් පැරණි පදිංචිකරුවන්ගෙන් බොහෝ දෙනෙක් පුත්තලම, කැට්පිඩ්ඩි, පල්ලිවසල්තුරේ, කුරිංචුපිට්ටි, නුරයිචෝලෙයි, පාලවි, අනුරාධපුර සහ කොළඹ යන ප්‍රදේශවල නැවත පදිංචි වූහ[218]. මේ අතර පවුල් 50කට ආසන්න සංඛ්‍යාවක් ඉන්දියාවේ සරණාගතයන් බවට ද පත් විය[219].

---

209 *Ceylon Today* (204 වන පාද සටහන).

210 Wickramasinghe (205 වන පාද සටහන).

211 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (145 වන පාද සටහන).

212 'Stop sand mining or Mannar will go under water, warn protestors' *Tamil Guardian* (26 January 2024) <https://www.tamilguardian.com/content/stop-sand-mining-or-mannar-will-go-under-water-warn-protestors> ප්‍රවේශය 2024 ජුනි 1.

213 ඉහත පාද සටහන.

214 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, සිවිල් සමාජ සංවිධානයක් සමඟ දුරකථනයෙන් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (මන්නාරම දිස්ත්‍රික්කය, 2024 ජූලි 18).

215 මන්නාරම සමාජ හා ආර්ථික සංවර්ධන සංවිධානය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2019 පෙබරවාරි 22 දිනැති ව යොමු කළ ලිපිය.

216 ඉහත පාද සටහන.

217 ඉහත පාද සටහන.

218 ඉහත පාද සටහන.

219 ඉහත පාද සටහන.

එකල මෙම පවුල් මුතු කැණීම සහ වෙළඳාම සිය ජීවනෝපාය බවට පත් කොට ගෙන සිටිය ද පසුව ඔවුන් ක්‍රමයෙන් වී ගොවිතැන සහ අනෙකුත් වගාවන් වෙත ද යොමු විය[220]. 2002 වසරේ මැයි මස 22 වැනි දින මුස්ලිම් ජාතික පදිංචිකරුවන් සිලාවතුර ගම්මානයට පැමිණි නමුත් එම කාලය තුළ සිය ගම්මානය වනාන්තරයක් බවට පත් ව ඇති බව ඔවුන්ට දක්නට ලැබිණි[221]. නැවතත් 2009 දී ඔවුන් තම උපන් ප්‍රදේශය වෙත යන විට මෙම පවුල් සංඛ්‍යාව 750 දක්වා වැඩි වී තිබිණි[222]. නැවත සිය ජීවිතය ගොඩ නැගීමේ අපේක්ෂාවෙන් සිලාවතුර වෙත පැමිණි ඔවුන්ට දක්නට ලැබුණේ තමන් කලක් ජීවත් වූ අක්කර 36ක ප්‍රදේශය ම නාවික හමුදා කඳවුරක් විසින් අත්පත් කර ගෙන ඇති ආකාරය යි[223]. කෙසේ වෙතත්, 2009 වසර අවසන් වන විට, නාවික හමුදා කඳවුරේ දකුණු සහ උතුරු කොනෙන් ඉඩම් අක්කර 6ක් නිදහස් කළ අතර, මුලින් අත්පත් කර ගෙන පැවති පෞද්ගලික ඉඩම්වලින් අක්කර 36ක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් දිගටම අත්පත් කර ගෙන සිටින්නට විය[224]. නගරය මධ්‍යයේ පිහිටි අක්කර 36ක භූමි භාගයෙ හි පෞරාණික මුස්ලිම් පල්ලියක්, අම්මාන් කෝවිලක්, තැපැල් කාර්යාලයක්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්, පුස්තකාලයක්, අයිස් කර්මාන්ත ශාලාවක්, ශ්‍රී ලංකා ධීවර සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක්, පෙර පාසලක්, කඩ සාප්පු 60කට අධික ප්‍රමාණයක් සහ ජනාවාස 120කට වඩා වැඩි ප්‍රමාණයක් ඇතුළු තවත් බොහෝ දේ ඇතුළත් විය[225]. පොදුවේ 'ජාතික ආරක්ෂාව' යන්න හමුදාමය කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සාධාරණීකරණය කිරීම පිණිස අඛණ්ඩ ව උපයෝගී කර ගනු ලබන අතර, මෙම අවස්ථාවේ දී නාවික හමුදාව විසින් පවරා ගත් පෞද්ගලික ඉඩම් සඳහා වන්දි ගෙවන බව ප්‍රකාශ කර ඇත[226].

ඒ අනුව, නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළ අතර, ඇතැම් විපතට පත් පවුල් මෙම යෝජනා ක්‍රම යටතේ පදිංචි කරන ලදි[227]. නමුත් මේ සියලු ස්ථානවල පානීය ජලය ඇතුළු නිසි පහසුකම් නොවී ය[228]. එහෙයින් ජනතාව නැවත සිය මුල් ඉඩම් වෙත යාමට අදහස් කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස වසර ගණනාවක් පුරා දිවෙන විරෝධතා මාලාවක් ඇති ව තිබේ[229]. නිදසුනක් ලෙස වසර 2011 දී ආර්ථික අමාත්‍යවරයා රෝහලක් විවෘත කිරීමට පැමිණි අවස්ථාවේ දී ප්‍රජා සාමාජිකයින් 20 දෙනෙකු විරෝධය පළ කළ අතර එම වසරේ අග භාගයේ දී ඉන්දීය නිවාස ව්‍යාපෘතිය යටතේ පවුල් 56කට පර්චස් 20 බැගින් ඉඩම් කොටස් හිමි විය[230].

2013 වසරේ දී ප්‍රදේශයේ ජනතාවට ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බලපත්‍ර ලබා දුන් නමුත් සිලාවතුර කඳවුර යටතේ පැවති අක්කර 6යි පර්චස් 88ක භූමි ප්‍රමාණය නිදහස් කිරීම සිදු නොවී ය. 2019 දී අග්‍රාමාත්‍යවරයා සමඟ පැවති සාකච්ඡාවක දී අමාත්‍ය රිෂාඩ් බදියුද්දීන් මෙම කරුණු අවධාරණය කළ ද[231], අවාසනාවන්ත ලෙස ඉඩම් නිදහස් කිරීමේ කිසිදු ප්‍රගතියක් දක්නට නොලැබිණි. මෙහි ප්‍රතිඵලය වූයේ දේශපාලනඥයින් සහ ආගමික නායකයින්ගේ සහභාගීත්වයෙන් 2019 පෙබරවාරි

---

[220] Piyumi Fonseka, 'Bitter homecoming for Muslims in Mannar' *Daily Mirror* (3 April 2019) <https://www.dailymirror.lk/print/plus/Bitter-homecoming-for-Muslims-in-Mannar/352-164909> ප්‍රවේශය 2023 නොවැම්බර් 20.

[221] ලිපිය (215 වන පාද සටහන).

[222] Fonseka (220 වන පාද සටහන).

[223] ඉහත පාද සටහන.

[224] ලිපිය (215 වන පාද සටහන).

[225] 'Silavathurai Village Land Case Study' *Tamil Mirror* (5 April 2017) <https://shorturl.at/o5gOJ> ප්‍රවේශය 2023 නොවැම්බර් 21.

[226] ඉහත පාද සටහන.

[227] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (145 වන පාද සටහන).

[228] ඉහත පාද සටහන.

[229] ලිපිය (215 වන පාද සටහන).

[230] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (145 වන පාද සටහන).

[231] 'Various issues of Mannar district will be examined in the review meeting led by the Prime Minister!' *Tamil Fast News* (15 February 2019) <https://tamil.fastnews.lk/66970/> ප්‍රවේශය 2023 නොවැම්බර් 22.

20 වන දින සිට දින 61ක විරෝධතාවයක් පැවැත්වීම යි[232]. 2019 මාර්තු 15 වන දින මුසලි සහ පුත්තලම ප්‍රදේශයේ මුස්ලිම් ජාතිකයන් 1000ක් පමණ සිලාවතුරේ නාවික හමුදා කඳවුර ඉදිරිපිට උද්ඝෝෂණයේ නිරත වූයේ අක්කර 36කට ආසන්න සිය ඉඩම් නැවත ලබා දෙන ලෙස ඉල්ලමිනි[233]. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආරක්ෂක ලේකම්වරයා ජනාධිපතිවරයා සමඟ ප්‍රශ්නය සාකච්ඡා කරන බවට පොරොන්දු වූ අතර පාර්ලිමේන්තු මන්ත්‍රී කාදර් මස්තාන් 2019 අප්‍රේල් මස අවසන් වන විට ඉඩම නිදහස් කරන බවට දැඩි ලෙස ප්‍රතිඥා දුන්නේ ය[234]. . කඳවුරට ඇතුල් වන ස්ථානයේ මෑතක දී තාප්පයක් ඉදි කර තිබේ.[235]

## 2.6. මුලතිව් දිස්ත්‍රික්කය

### 2.6.1. කුරුන්තුමාලෛ ආති ශිවන් අයියනාර් කෝවිල



Image Source: CPA Field Visit

කුරුන්තුමාලෛ යනු බහුතර දෙමළ-හින්දු ජනගහනයකින් සමන්විත[236] තන්නිමුරිප්පු පොකුණට උතුරු දෙසින් පිහිටි අක්කර 78ක වපසරියකින් යුත් කඳු ගැටයකි[237]. පිළිම පිහිටුවමින් දෙවියන් වැඳ පුදා ගැනීමේ ගැමි සම්ප්‍රදාය පරම්පරා ගණනාවක සිට මේ ප්‍රදේශයේ ස්ථාපිත ව ඇති අතර එම පුරුද්ද අද දක්වා ම පවතී[238]. 1933 මැයි 12 වැනි දින බ්‍රිතාන්‍ය රජය විසින් පාලනය කරන ලද ලංකා රජයේ ගැසට් පත්‍රය හරහා අක්කර 78ක භූමි ප්‍රමාණයක් 'පුරාවිද්‍යා භූමියක්' ලෙසින් මායිම් කරමින් කුරුන්තුමාලේ කෝවිල ප්‍රථම වරට ගැසට් කරන ලදි[239]. ඒ අනුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2013 වසරේ දී ජී පී එස් භාවිතයෙන් මෙම ස්ථානය හඳුනාගැනීම විශේෂත්වයකි.[240]

වසර 2018 සැප්තැම්බර් 04 වැනි දින බෞද්ධ භික්ෂූන් වහන්සේලා දෙදෙනකු ඇතුළු පිරිසක් මෙම ප්‍රදේශයේ බුදු පිළිමයක් ඉදි කිරීමට උත්සාහ ගැනීම, ප්‍රදේශවාසීන් සමඟ ආරවුලක් ඇති වීමට හේතු විය[241]. මෙවැනි ක්‍රියා මගින් ප්‍රදේශයේ සාමයට බාධා පැමිණෙන බවටත්, ඒ හේතුවෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඇතුළු පිරිසට එම ප්‍රදේශයට ඇතුළු වී ප්‍රතිමාව ස්ථාපනය කිරීම තහනම් කරන ලෙසටත් ඉල්ලා අධිකරණයේ නඩුවක් ගොනු කරන ලදි[242]. පසුව, 2018 දී අධිකරණය විසින් කුරුන්තුමලේ හින්දු ආගමික පූජාස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් කළ අතර, හින්දු පූජකවරුන්ට

---

[232] 'Muslims protest Sri Lanka navy occupation in Mannar' *Tamil Guardian* (21 February 2019) <https://www.tamilguardian.com/content/muslims-protest-sri-lanka-navy-occupation-mannar> ප්‍රවේශය 2023 නොවැම්බර් 23.

[233] ඉහත පාද සටහන.

[234] Maneshka Borham, 'Promises to release land yet to be fulfilled: Silavathurai residents to fight tooth and nail to regain ancestaral land' *Sunday Observer* (7 April 2019) <https://archives1.sundayobserver.lk/2019/04/07/news-features/promises-release-land-yet-be-fulfilledsilavathurai-residents-fight-tooth> ප්‍රවේශය 2023 නොවැම්බර් 22.

[235] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සමාජ ක්‍රියාකාරිකයෙකු සමඟ දුරකථනයෙන් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (මන්නාරම දිස්ත්‍රික්කය, 2024 අගෝස්තු 5).

[236] Human Rights Watch (46 වන පාද සටහන).

[237] නඩු අංක.AR/673/18.

[238] ඉහත පාද සටහන.

[239] 1933 මැයි 12 දිනැති අංක 7981 දරන ගැසට් පත්‍රය.

[240] නඩුව (237 වන පාද සටහන).

[241] 'Ban on going to Kurunthur hill: Court orders' *Virakesari* (7 September 2018), <https://www.virakesari.lk/article/39925> ප්‍රවේශය 2024 පෙබරවාරි 1.

[242] ඉහත පාද සටහන.

දිගටම පූජා පැවැත්වීමට අවසර දෙමින් කලබල වළක්වා ගැනීමට පොලිසියට තව දුරටත් උපදෙස් දෙන ලදි[243].

මෙම ප්‍රදේශය ඓතිහාසික වශයෙන් සාමකාමී බව ප්‍රදේශවාසීන් මාර්ගයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත දැන ගැනීමට ලැබුණු අතර, සැලකිය යුතු පුරාවිද්‍යාත්මක සොයාගැනීම් එහි පොහොසත් සංස්කෘතික උරුමයට සාක්ෂි දරයි[244]. ප්‍රදේශයේ ඉඩම මැන බැලීමක් සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2020 දෙසැම්බර් 14 වැනි දින 'කුරුන්ධි විහාරයක්' ගැන සඳහන් වන සමීක්ෂණ වාර්තාවක් නිකුත් වී තිබේ[245]. මේත් සමඟ ආරක්ෂක හමුදාවේ ආධාර ඇති ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කුරුන්තුමලේ පුරාවිද්‍යා කටයුතු ආරම්භ කිරීම 2021 ජනවාරි මස දී සනිටුහන් විය[246]. ඒත් සමඟ ම, මෙම ඉඩම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලබා දෙන ලෙස උතුරු පළාත් ආණ්ඩුකාරවරයාට සහ කරෛතුරෛපත්‍ර ප්‍රාදේශීය ලේකම්වරයාට දැඩි බලපෑම් එල්ල වූ බව ද වාර්තා විය[247]. එපමණක් නොව නැවත සිය ඉඩම්වලට යාමට උත්සාහ කළ තන්නිමුරිප්පු ප්‍රදේශයේ පදිංචිව සිටි දෙමළ ගොවීන්ට බෞද්ධ භික්ෂූන් වහන්සේලා තර්ජනය කර බිය ගන්වන බව ද වාර්තා විය[248]. කුරුන්තුමලේ පුරාවිද්‍යා භූමියට අයත් මෙම ප්‍රදේශයේ සාමය සහ සමාජ සංහිඳියාව කඩ වීම වැළැක්වීම සඳහා බොහෝ නඩු, පෙත්සම්, ක්ෂේත්‍ර සමීක්ෂණ සහ නියෝග පවතී. උදාහරණයක් ලෙස:[249]

2020 සැප්තැම්බර් 10 වන දිනට නියමිත ඉදිකිරීම් කටයුතු මගින් පෙර ගිවිසුම් කඩ කර වාර්ගික සාමයට බාධාවක් වනු ඇතැයි යන කනස්සල්ල හේතුවෙන් 2020 සැප්තැම්බර් 9 වන දින, කුරුන්තුමලේ ආදි අයියනාර් විහාරස්ථානයේ භාරකාර මණ්ඩලය නඩුවක් ගොනු කළහ.

2020 ඔක්තෝම්බර් මස 12 වන දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරීවරයා ප්‍රකාශ කළේ කරෛතුරෛපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ද සහය ඇති ව ආරක්ෂක පවුරක් ඉදි කිරීමට තමන් පියවර ගත් බවත් කිසිදු ආගමික ක්‍රියාමාර්ගයක් නොගත් බවත් ය.

භාරකාර මණ්ඩලය වෙනුවෙන් සහ පැමිණිල්ල වෙනුවෙන් අධිකරණයේ කරුණු දැක්වීමක් 2020 ඔක්තෝම්බර් මස 12 වන දින සිදු කරන ලදි. මෙහි දී, රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන විසින් ශෛව පූජනීය ස්ථානය වැඳ පුදා ගැනීම සම්බන්ධයෙන් කිසිදු තහංචියක් නොකළ යුතු බව සඳහන් කරන ලද අතර ම බෞද්ධ පිළිම හා විහාරස්ථාන ඉදිකිරීම ද ජනතාවගේ මූලික අයිතිවාසිකම් කඩකිරීමක් ලෙස සඳහන් කරන ලදි.

---

243 නඩුව (237 වන පාද සටහන).

244 N.K.S. Thiruchelvam, 'It is unacceptable to believe that only Buddhism existed on Kurunthur Hill' *Virakesari* (2 March 2023) <https://www.virakesari.lk/article/149538> ප්‍රවේශය 2024 පෙබරවාරි 4, "කුරුන්තුමලේ පිළිබඳ අධ්‍යයනයන්, එහි මූලාරම්භය සහ වැදගත්කම පිළිබඳ පරස්පර විරෝධී අදහස් හෙළි කරයි. හින්දු භක්තිකයන්ගේ විශ්වාසයට අනුව එහි අතීතයේ සිට හින්දු නමස්කාරය සිදු ව ඇති අතර, එහි යුප්ප කලා වැනි සැලකිය යුතු බෞද්ධ කෞතුක වස්තු ඇති බව බෞද්ධයන් පෙන්වා දෙයි. බ්‍රිතාන්‍ය ගවේෂකයන්ට හින්දු සහ බෞද්ධ නමස්කාරය පිළිබඳ සාක්ෂි සොයාගෙන ඇති අතර, නටඹුන්, එකී සම්ප්‍රදායන් ද්විත්වයෙ හි ම බලපෑමේ සම්මිශ්‍රණයක් යෝජනා කරයි. මහාචාර්ය පද්මනාදන් පල්ලව යුගයේ සිට පැවත එන නාග ලිංගයක් හඳුනා ගත් අතර අනෙකුත් විද්වතුන් බෞද්ධ හා හින්දු අංගවල මිශ්‍රණයක් සටහන් කර තිබේ."

245 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාව (මුලතිව් දිස්ත්‍රික්කය, 2023 සැප්තැම්බර් 14).

246 'Sri Lanka's archaeological department and Buddhist monks attempt another land grab in Mullaitivu' *Tamil Guardian* (26 March 2021) <https://www.tamilguardian.com/content/sri-lankas-archaeological-department-and-buddhist-monks-attempts-another-land-grab> ප්‍රවේශය 2024 පෙබරවාරි 5.

247 'Kurunthoormalai' (People's Alliance for Right to Land (PARL), March 2021) <https://www.parlsl.com/land-disputes?province=8&district=21&issue=12#> ප්‍රවේශය 2024 පෙබරවාරි 5.

248 ඉහත පාද සටහන.

249 නඩුව (237 වන පාද සටහන).

2022 ජුලි 14 වැනි දින වන විට කුරුන්තූර් කන්දෙන් විහාරය සහ ඒ ආශ්‍රිත ඉදිකිරීම් ඉවත් කළ යුතු බවත්, එහි තව දුරටත් ඉදිකිරීම් සිදු නොකළ යුතු බවත් අධිකරණය නියෝග කළේ ය[250]. 2023 මාර්තු මස 2 වන දින අධිකරණ නියෝගය කඩ කර, ඉදිකිරීම් කටයුතු සිදු කරන බවට ප්‍රදර්ශනය කෙරෙන ඡායාරූප සාක්ෂි සහිත මෝසමක් මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදි[251]. එහි දී කුරුන්තූර් කඳු ගැටය සම්බන්ධයෙන් මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණය විසින් දැනටමත් නිකුත් කර ඇති නියෝග නොතකමින් ඉදිකිරීම් සිදුකර ඇති බව තහවුරු විය[252]. පසුව 2023 අගෝස්තු 31 වැනි දින මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණය නියෝගයක් නිකුත් කරමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නිලධාරීන් අධිකරණ නියෝග පිළිපැදීමට අපොහොසත් වීමත් සමඟ පුරාවිද්‍යා අධ්‍යක්ෂක ජනරාල්වරයා අධිකරණයට අපහාස කර ඇති බවත්, අධිකරණ නියෝගයක් තිබියදීත් 2022 ජුලි 14 වෙනිදායින් පසු කුරුන්තූමලේ ප්‍රදේශයේ වැඩ අවසන් කළ සියලු ඉදිකිරීම් ඉවත් කිරීමටත්, නියෝග කරන ලදි[253]. නොසන්සුන්තාවක් ඇති විය හැකි බවට නීතිපතිවරයා අවධාරණය කර තිබියදීත් අධිකරණය මෙම තීරණය යළි තහවුරු කරන ලද්දේ පෙර නියෝග ක්‍රියාත්මක කර නොමැති බව ද අවධාරණය කරමිනි.[254]

2024 ජූනි 20 වන දින මිහින්තලේ සිට බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ බහුතර ජනවාර්ගික කණ්ඩායම ඇතුළු 200 කට අධික පිරිසක් කුරුන්තූර් කන්ද වෙත වන්දනා ගමනක පැමිණ එහි වන්දනා කළහ[255]. අධිකරණ නියෝග නොතකා කුරුන්තූමලේ ආති අයියනාර් කෝවිලේ පිළිම ඉවත් කර එම ස්ථානයේ ම බෞද්ධ ස්තූපයක් ඉදි කරමින් සිටින බව වාර්තා විය[256]. තවද, යම් බෞද්ධයන් පිරිසක් කුරුන්තූර් කඳුකර පුරාවිද්‍යා භූමියට පනවා ඇති සංරක්ෂණ රෙගුලාසි නොපිළිපදිමින් එහි ගස් කැපීමේ හා ගිනි තැබීමේ නිරත වන බවට පසුගිය දිනවල වාර්තා විය[257]. මාධ්‍ය වාර්තාවලට අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මෙම නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නැත[258]. සිය දුක්ගැනවිලි පිළිබඳ ව ප්‍රදේශවාසීන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැනුම්වත් කරමින් කියා සිටියේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, පොලිසිය ඇතුළු රාජ්‍ය යාන්ත්‍රණය ප්‍රදේශවාසීන් නොසලකා හරිමින් බහුතර ප්‍රජාවට මෙම කටයුතු සඳහා සක්‍රීයව සහය දක්වන බව යි.[259]

## 2.7. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

### 2.7.1. බොරලුකන්ද රජ මහා විහාරය

බොරලුකන්ද රජ මහා විහාරය නගර සීමාවට යාබද ව ශ්‍රේවස්ට් කොට්ඨාසය සහ කුච්චවේලි කොට්ඨාසය මායිමේ පිහිටි පෞද්ගලික ඉඩමක පිහිටා ඇති අතර ඉලුපායිකුලම් සහ පෙරියකුලම් ගම්මානවලින් වට වී ඇත. ජනගහනයෙන් බහුතරය දෙමළ (පවුල් 536) ජනතාවගෙන් සමන්විත වන

---

250 තඩුව (237 වන පාද සටහන).

251 තඩුව (237 වන පාද සටහන).

252 'Kurunthur Hill Issue - Historic Order of the Court' *IBC Tamil* (2023) <https://ibctamil.com/article/kurundur-mala-case-judgment-1693476038> ප්‍රවේශය 2024 පෙබරවාරි 6.

253 'Contempt of Court in Kurunthumalai incident: Archaeological Department official held accountable' *Tamil Guardian* (2 September 2023) <https://www.tamilguardian.com/content/contempt-court-kurunthurmalai-incident-archaeological-department-official-held-accountable> ප්‍රවේශය 2024 පෙබරවාරි 6.

254 ඉහත පාද සටහන.

255 'The state machinery that supports the majority ethnic Buddhists does not respect the law' *Virakesari* (24 June 2024) <https://www.virakesari.lk/article/186816> ප්‍රවේශය 2024 ජූනි 30.

256 ඉහත පාද සටහන.

257 ඉහත පාද සටහන.

258 ඉහත පාද සටහන.

259 ඉහත පාද සටහන.

අතර මෙම විහාරස්ථානය අසල පදිංචි ව සිටිනුයේ සිංහල පවුල් 4ක් පමණි[260]. බෞද්ධ විහාරය සඳහා ඉදිකිරීම් 2018 වසරේ ආරම්භ වූ අතර පසුව බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ 2021 දෙසැම්බර් 9 වන දින වෙල්ගම ප්‍රධාන සංඝනායක අම්පිටිය සේලවංක තිස්ස සහ තවත් භික්ෂූන් වහන්සේලා 7 නමක් සමඟ අංක 1315-024 යටතේ ලියාපදිංචි කරන ලදි[261].

මෙම බෞද්ධ විහාරය ඉදි කිරීම සඳහා ඉඩම් ලබා දීමට කිහිප වතාවක් ම උත්සාහ කරන ලදි. ත්‍රිකුණාමලය නගර සහ ග්‍රේවස්ට් හි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඇතැම් ඉඩම් පරිහරණය සඳහා 2021 නොවැම්බර් 22 දින අනුමැතිය ලබා දෙන ලදි[262]. මෙම වර්ධනය පිළිබඳ ව ප්‍රාදේශීය ප්‍රජාවන් සහ දේශපාලන ආයතන දැන නොසිටි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2023 සැප්තැම්බර් 3 වන දින දෙමළ-හින්දු ගම්මානයේ බෞද්ධ විහාරස්ථානයක් අනවසරයෙන් ඉදි කිරීමට එරෙහි ව විරෝධතාවක් පවත්වන ලදි[263]. මෙම විරෝධතාවයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු සමඟ විශාල පිරිසක් එක්ව සිටියහ. පසුව ආණ්ඩුකාරවරයා විසින් මෙම ඉදිකිරීම් කටයුතු නවතා දැමුව ද, 2023 සැප්තැම්බර් 09 වන දින මහජන විරෝධතා මධ්‍යයේ එක රැයකින් එම ප්‍රදේශයේ 'බොරලුකන්ද රජ මහා විහාරයී නමින් නාම පුවරුවක් සවි කරන ලදි [264].

පසුව හිමිකම තහවුරු කිරීම සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් ඉඩම් එළි පෙහෙළි කිරීමේ කටයුතුවල නිරත විය[265]. මේ හේතුවෙන් ප්‍රදේශයේ ප්‍රජාවගේ විරෝධය එල්ල වූ අතර, එම හිමි නම මෙම ඉඩමට ඇතුළු වීමට සහ එහි වැඩ වාසය කිරීමට එරෙහි ව වාරණ නියෝගයක් ලබා ගන්නා ලෙස නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා ප්‍රාදේශීය ලේකම්වරයාට උපදෙස් ලබා දුන්නේ ය[266]. එසේ තිබියදීත් 2023 සැප්තැම්බර් මස 12 වන දින සහ 2023 සැප්තැම්බර් 28 වන දින නැවතත් බෞද්ධ භික්ෂූන් වහන්සේ විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ඉදිරිපිට A6 මාර්ගය අවහිර කළ සේක[267]. ඒ අතර මෙකී ගම ඓතිහාසික වශයෙන් දෙමළ-හින්දු ගමක් වන බවටත්, බෞද්ධ විහාරයක් ඉදි කිරීමට දිගින් දිගට ම විරුද්ධ බවටත්, තර්ක කරමින් ප්‍රදේශවාසී හු විරෝධය දැක්වූහ. බෞද්ධ විහාරය ඉදි කරන භූමියට යාබද ව පුරාවිද්‍යා භූමියක් පවතින බව ද ප්‍රදේශවාසීන් සඳහන් කර ඇති අතර, එම පුරාවිද්‍යා භූමියේ පිහිටි බොරලුකන්ද විහාරය, වෙල්ගම විහාරය සමඟ ඒකාබද්ධ කිරීම මෙම සංවර්ධනයේ අරමුණ විය හැකි බවට ඔවුහු කියා සිටිති[268].

2023 අගෝස්තු 28 වැනි දින ත්‍රිකුණාමලය නගර සහ ග්‍රේවස්ට් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් බොරලුකන්ද රජ මහා විහාරස්ථානයට 'පූජා භූමියක්' වශයෙන් ඉඩමක් ලබා දීම පිණිස නිකුත් කරන ලද පෙර ලිපියක් අවලංගු කරමින් නව ලිපියක් යොමු කරන ලදි[269]. කෙසේ වෙතත්, බොරලුකන්ද රජ මහා විහාරයේ ඉදිකිරීම් තවමත් සිදුවෙමින් පවතින අතර, 2023 නොවැම්බර් 06 වන දින උදැසන දෙමළ ජනතාවගේ විරෝධය නොතකා බෞද්ධ භික්ෂූන් වහන්සේ සහ සිංහල පුද්ගලයින් විසින් එම ස්ථානයේ බුද්ධ ප්‍රතිමා දෙකක් ඉදි කරන ලදි[270].

---

[260] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිවිල් සමාජ සංවිධාන සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා (ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කය, 2024 මැයි 30).

[261] බුද්ධ ශාසන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංක 13/15/024 සහිත සහතිකය.

[262] ප්‍රාදේශීය ලේකම් අනුමත යොමු අංකය.DTG/ADM/M/MUDAF/TRG/06.

[263] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (260 වන පාද සටහන).

[264] ඉහත පාද සටහන.

[265] 'The Governor of Eastern Province has no power!' *Tamil Win* (2023) <https://tamilwin.com/article/vidura-wickramanayake-regarding-senthil-thondaman-1692938633> ප්‍රවේශය 2024 මාර්තු 2.

[266] ඉහත පාද සටහන.

[267] 'Demonstration by Buddhist monks in Trincomalee' *Virakesari* (28 August 2023) <https://www.virakesari.lk/article/163348> ප්‍රවේශය 2024 මාර්තු 2.

[268] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (260 වන පාද සටහන).

[269] 2023 ජූලි 9 දිනැති පූජා භූමි විශේෂ ප්‍රදාන No.DTG/LND..

[270] 'Two Buddha Statues in Illupaikulam' *Virakesari* (7 November 2023) <https://epaper.virakesari.lk/newspaper/Daily/main/2023-11-07#page-3> ප්‍රවේශය 2024 මාර්තු 3.

### 2.7.2. මලෛ නීලි අම්මාන් කෝවිල

වසර 1865 ට පෙර කාලය දක්වා දිවෙන ඉපැරණි නිර්මාණයක් වන මලෛ නීලි අම්මාන් කෝවිල වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ පිහිටා ඇත. පුරාවස්තු පනත යටතේ විවිධ ක්‍රියාකාරකම් තහනම් කරන රෙගුලාසි සහිත ව 1979 දෙසැම්බර් 14 දිනැති අංක 67 දරන ගැසට් පත්‍රය මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් මෙය 'පුරාවිද්‍යා ස්ථානයක්' ලෙස නිල වශයෙන් නම් කරන ලදි[271]. සිවිල් යුද්ධය අතරතුර, ප්‍රාදේශීය ප්‍රජාවන් අවතැන් කරමින් ගුවන් ප්‍රහාරයකින් කෝවිලට හානි සිදු විය[272]. 2007 දී නැවත පදිංචි කිරීම් සිදු වීමත් සමඟ හමුදාව විසින් කෝවිල අත්පත් කර ගන්නා ලදි[273]. මෙය එහි නටබුන් ඉවත් කර 2009 දී භික්ෂූන් වහන්සේලා විසින් බෞද්ධ විහාරස්ථානයක් ආරම්භ කිරීමට හේතු විය[274].

එහි ප්‍රතිඵලයක් ලෙස විහාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ වීමත් සමඟ, ගම්වැසියන් පරම්පරා ගණනාවක් තිස්සේ වී වගා කළ අවට ගොවිබිම් අක්කර 50කට වැඩි ප්‍රමාණයක් රාජසන්තක කරන ලද අතර, එතුළින් ජනතාවගේ ජීවනෝපායන්ට දැඩි ලෙස බලපෑම් එල්ල විය[275]. මලෛ නීලි අම්මාන් කෝවිල ප්‍රතිසංස්කරණය කිරීමට අවසර ලබා නොදෙන අතර ම පුරාවිද්‍යා භූමිය තුළ බෞද්ධ විහාරස්ථානයක් ඉදි කිරීමට අවසර දීම සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙනස් කොට සැලකීමේ ක්‍රියාමාර්ග ගන්නා බවට ප්‍රදේශවාසීන් චෝදනා කරයි[276]. මෙම ගැටලුවලට ප්‍රතිචාර වශයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂකවරයා විසින් පුරාවිද්‍යා භූමිය නැවත සමීක්ෂණයට ප්‍රමුඛත්වය දෙමින් මුතූර් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ලිපියක් යොමු කරන ලදි[277]. කෙසේ වුව ද, කාරණය තවමත් විසඳී නැත.

### 2.7.3. මුතූර් 64 සැතපුම් කණුව (මලයාඩි පිල්ලෙයාර් - රාජවන්තන් කන්ද)

ජිනනගර් ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටා ඇති රාජවන්තන් කන්ද, මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයට අයත් වේ[278]. හින්දු පිළිම වන්දනාව මෙන් ම ශිව ලිංග වන්දනාව ද දශක ගණනාවක් තිස්සේ දෙමළ ජනයා විසින් මෙම කන්ද මුදුනේ සිදු කර ඇත[279]. පැහැදිලිව ම, මෙම කන්දේ උතුරු කොටස පෞද්ගලික ඉඩමකින් සමන්විත නේවාසික ප්‍රදේශයක් වන අතර තම අයිතිය ඔප්පු කිරීමට ඉඩම් හිමියන්ට ඔප්පු පවතී[280].

---

271 1979 දෙසැම්බර් 14 දිනැති අංක 67 දරන ගැසට් පත්‍රය.

272 'The Neeli Amman Temple is being transformed into a Buddhist site' *Voice of People* (August 2023) <https://ahrc.lk/index.php/news-stories-2?view=frontlist&catid[0]=> ප්‍රවේශය 2024 මාර්තු 5.

273 'Sinhala-Buddhist temple to replace Kaali temple in Trincomalee' *TamilNet* (24 April 2013) <https://www.tamilnet.com/art.html?catid=13&artid=36253> ප්‍රවේශය 2024 මාර්තු 10.

274 *Voice of people* (272 වන පාද සටහන).

275 ඉහත පාද සටහන.

276 'Give the Hindu temples in Tirumala to the local people' *Kuriyeedu* (12 October 2016) <https://www.kuriyeedu.com/?p=18510> ප්‍රවේශය 2024 මාර්තු 10.

277 2021 ඔක්තෝබර් 27 දිනැති ලිපිය.

278 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (260 වන පාද සටහන).

279 'Muthur Rajavantan is a Hindu At the Place of Buddhist Dominance?' *Elakku Weekly Newspaper* (23 July 2022) <https://www.ilakku.org/wp-content/uploads/2022/07/ilakku-Weekly-ePaper-192-July-23-2022.pdf> ප්‍රවේශය 2024 මාර්තු 11; තව දුරටත් බලන්න 'President Ranil is Indirectly Pushing a Sinhalese Chauvinistic Agenda - Selvarasa Gajendran' *Virakesari Online* (10 August 2022) <https://www.virakesari.lk/article/133345> ප්‍රවේශය 2024 මාර්තු 11.

280 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (260 වන පාද සටහන).

කඳු පාමුල 'මලයාඩි පිල්ලෙයාර් කෝවිල' නමින් හැඳින්වෙන ඉපැරණි පිල්ලියාර් කෝවිලක් පවතී. 64 වන සැතපුම් කණුව අසල පිහිටි මලයාඩි පිල්ලෙයාර් කෝවිල වසර ගණනාවක් පුරාවට ත්‍රිකුණාමලය - මඩකලපුව මාර්ගයේ ගමන් ගන්නා අවට ගම්වාසීන් සහ සාමාන්‍ය ජනතාව විසින් වන්දනාමාන කරනු ලබති[281]. 2021 දෙසැම්බර් මාසයේ දී මලයාඩි පිල්ලෙයාර් කෝවිලේ පිල්ලෙයාර් පිළිමයට ඉහළින් බුදු පිළිමයක් තැබීමත් සමඟ මෙහි ආරවුල නිර්මාණය විය[282]. පසුදා උදෑසන ප්‍රාදේශීය ප්‍රජාවන් මෙයට ප්‍රතිචාර වශයෙන් විරෝධතාවක් ආරම්භ කළහ[283]. අනතුරුව පොලිසියේ මැදිහත් වීමෙන් බුද්ධ ප්‍රතිමාව ඉවත් කළ නමුත් දින කිහිපයකට පසු ජනතාවගේ දැඩි විරෝධය මධ්‍යයේ විහාරස්ථාන පරිශ්‍රය අසල බුද්ධ ප්‍රතිමාවක් යළි ස්ථාපිත කර ඇත[284].

කන්ද මුදුනේ සිට පෙනෙන ක්ෂිතිජය දක්වා විහිදෙන සියලු ම භූමි ප්‍රදේශය මෙම බෞද්ධ ආරාමයට අයත් බව පවසමින් විහාරාධිපති හිමි නම 'පූජා භූමි' හරහා අවට පෞද්ගලික ඉඩම්වල අයිතිය ප්‍රකාශ කොට තිබේ[285]. 1908 අප්‍රේල් මස 06 වැනි දින අක්කර 15යි රූඩ් තුනක් සහ පර්චස් 19ක භූමිප්‍රදේශයක් කෘෂිකාර්මික ඉඩමක් ලෙස මැන බලා ගොවීන්ට එහි පදිංචිය හිමි කර දෙන ලදී[286]. මෙම ස්ථානය තවමත් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ගැසට් කර නොමැති නමුත් මෙම ක්‍රියාවලිය සඳහා මූලික පියවර මේ වන විටත් ආරම්භ කර ඇති අතර, එහි දී මුතූර් ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2019 සැප්තැම්බර් 28 වැනි දින ත්‍රිකුණාමලයේ ඉඩම් මැනුම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මිනුම් අධිකාරී වෙත මැනුම් සඳහා ඉල්ලීම් ලිපියක් යොමු කරන ලදී[287].

ඉන් අනතුරුව කන්ද මත 'කොට්ටියාරාම ශ්‍රී භද්‍ර ධාතු රජ මහා විහාරයක්' ඉදිකිරීමේ කටයුතු ආරම්භ වූ අතර[288], ඒ සමඟ අනෙකුත් ජන කොටස්වල කෘෂිකාර්මික කටයුතු ද ආරම්භ විය[289]. පසුව, 2022 අප්‍රේල් 22 වන දින, බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක්, ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් සමඟ ත්‍රිකුණාමලයේ, මුතූර් හි ඓතිහාසික රාජවන්තන් පුදබිමට හින්දු බැතිමතුන් සහ පූජකවරුන් පැමිණීම වැළැක්වීමට උත්සාහ කළ බව වාර්තා වේ[290]. දිගින් දිගට ම සිද්ධස්ථානයට පැමිණෙන හින්දු බැතිමතුන්ට එම හිමි නම දිගින් දිගට ම තර්ජන එල්ල කළ බවට චෝදනා එල්ල වී ඇත[291]. අද වන විට යුද හමුදාවේ සහ නාවික හමුදාවේ මැදිහත් වීමත් සමඟ මෙම විහාරස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරට පැමිණ තිබේ[292].

### 2.7.4. කංගුවේලි වැව, මුතූර්

කංගුවේලි වැව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මුතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. එම කලාපයේ කෘෂිකාර්මික කටයුතු සඳහා තීරණාත්මක වන කංගුවේලි වැව අක්කර 350ක වපසරියකින්

---

281 'Sinhalisation Continues as Sri Lankan Army Helps Construct Buddhist Shrine in Tamil Area of Muthur' *Tamil Guardian* (2 June 2022) <https://www.tamilguardian.com/content/sinhalisation-continues-sri-lankan-army-helps-construct-buddhist-shrine-tamil-area-muttur> ප්‍රවේශය 2024 මාර්තු 12.

282 ඉහත පාද සටහන.

283 ඉහත පාද සටහන.

284 ඉහත පාද සටහන.

285 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡා (260 වන පාද සටහන).

286 Survey Plan No.250950; see also Donation Certificate No.4747.

287 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (260 වන පාද සටහන).

288 ඉහත පාද සටහන.

289 Statement from the Peoples Collective for Climate Justice, Eastern Province (14 October 2021).

290 'Sinhala Buddhist monk hurls racist abuse at Tamils in Trincomalee' *Tamil Guardian* (27 April 2022) <https://www.tamilguardian.com/content/sinhala-buddhist-monk-hurls-racist-abuse-tamils-trincomalee> accessed 2 August 2024 ප්‍රවේශය 2024 අගෝස්තු 2.

291 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (260 වන පාද සටහන).

292 ඉහත පාද සටහන.

යුක්ත වන අතර එය වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇත[293] එතුළින් කංගුවෙල්ලි සහ පුලියන්චෝ පුලියන්චෝලෙ දෙමළ ගම්මානවලට සෙත සැලසෙන අතර වැව් ජලයෙන් කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටින පුද්ගලයින් 750කට වැඩි පිරිසක් වාසය කරති[294]. යුද්ධය අවසන් වීමෙන් පසු සිංහල ගොවීන් 11 දෙනෙකු වැවට බටහිරින් අක්කර 180ක පමණ භූමි ප්‍රමාණයක් බලහත්කාරයෙන් අත් කර ගෙන ඇති අතර බොහෝ ස්ථානවල වැව් බැම්ම කපා දමමින් හුළං ගේට්ටු කඩා තම ප්‍රයෝජනය සඳහා ජලය ලබා ගෙන තිබේ[295]. මේ නිසා බොහෝ ප්‍රාදේශීය ප්‍රජාවන්න්ගේ කෘෂිකාර්මික කටයුතුවලට බාධා එල්ල වී ඇත[296].

2019 දෙසැම්බර් 19 වැනි දින මුතූර් ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයා වගකිවයුත්තන්ට එරෙහි ව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට සහ පසුව ඔවුන් නෙරපා හැරීම සඳහා යෝජනාවක් ගෙන එන ලදි[297]. මෙම යෝජනාව ඒකමතික ව සම්මත වූ අතර ඉන් අනතුරුව 2019 වසරේ දී රුපියල් මිලියන 24ක වියදමින් වැව ප්‍රතිසංස්කරණය කරන ලදි[298]. මෙම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ දී අපරාධකරුවන් විසින් බර යන්ත්‍ර සූත්‍ර යොදා වැව් බැම්වලට, ඇළ මාර්ගවලට හානි කරමින් සහ ගොවිතැන් කටයුතු ආක්‍රමණය කරමින් සිට ඇති බවට වාර්තා විය[299]. මේ සම්බන්ධයෙන් 2019 ජූලි මස දී ශේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කළ අතර එමගින් වින්දිතයන් විසින් තම ජීවනෝපාය වන ගොවිතැනෙහි නියුක්ත වීමට ඉඩ ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි[300]. පසුව තිරුකරයිසයියම්පති ගොවි සංගමය විසින් මෙම ගැටලුව නිරාකරණය කර කංගුවේලි වැව ප්‍රතිසංස්කරණය කරන ලෙස ඉල්ලා ජනාධිපති ලේකම් කාර්යාලයට ඉල්ලීමක් ඉදිරිපත් කළ අතර, ඊට 2023 සැප්තැම්බර් 22 වැනි දින ජනාධිපති ලේකම් කාර්යාලය ප්‍රතිචාර දක්වා ඇත[301].

2019 දෙසැම්බර් 05 වැනි දින එම ප්‍රදේශයට පැමිණි වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් දන්වා සිටියේ නීති විරෝධී ක්‍රියාවල නිරත වූ 11 දෙනාට ශ්‍රී මංගල පුර ප්‍රදේශයෙන් විකල්ප ඉඩමක් ලෙස (අක්කර 1.5ක ඉඩමක්) ලබා දෙන බව යි[302]. කෙසේ වෙතත්, අද දක්වා අදාළ පුද්ගලයින්ට වෙන් කළ ඉඩම බෙදා දී නොමැත[303]. රජය විසින් සිදු කොට ඇති මෙම අතපසු වීමත් සමග අනෙකුත් ගොවීන් 11 දෙනා සමග සිංහල ජනතාව විසින් ඉඩම් ආක්‍රමණය කිරීමේ වැඩි වීමක් සිදු වී ඇත[304]. වඩාත් මෑතක දී, 2023 සැප්තැම්බර් මාසයේ දී, ගොවීන් නීති විරෝධී ලෙස වැවට අනවසරයෙන් ඇතුළු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රදේශය තුළ ස්ථාන පහකට පමණ හානි සිදුව තිබේ[305]. මෙම සිද්ධියට ප්‍රතිචාර වශයෙන් කංගුවේලි තිරුකරයිසයිම්පති

---

[293] ඉහත පාද සටහන.

[294] 2023 ඔක්තෝම්බර් 10 දිනැති 'කංගුවේලි පොකුණ ආක්‍රමණය කිරීම තහනම් කරන්නී යන ඉල්ලීම් ලිපිය, කංගුවේලි, තිරුක්කරයිසායම්පති ගොවි සංවිධානයේ සභාපති එම්. සුමන්තිරන් සහ ආර්.ශානකියන් යන මන්ත්‍රීවරුන් වෙත යොමු කරන ලදි.

[295] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාව (ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කය, 2023 ඔක්තෝබර් 25).

[296] 2023 ඔක්තොම්බර් 6 දිනැති ලිපිය, ලේකම්, තිරුක්කරයිසායම්පති ගොවි සංගමය, කංගුවේලි විසින් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත යවන ලදි.

[297] 'Muthur Kanguveli Pond Encroachment: Farmers of the area are worried that the pond is being damaged' *Virakesari* (11 October 2023) <https://www.virakesari.lk/article/166632> ප්‍රවේශය 2024 මාර්තු 17.

[298] ඉහත පාද සටහන.

[299] ඉහත පාද සටහන.

[300] ඉහත පාද සටහන.

[301] ලිපි යොමු අංකය.PS/DPR/21/12/02.

[302] *Virakesari* (297 වන පාද සටහන).

[303] ඉහත පාද සටහන.

[304] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාව (ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කය, 2023 ඔක්තෝබර් 25).

[305] *Virakesari* (297 වන පාද සටහන).

ගොවි සංවිධානය මුතූර් සහ වෙරුගල්වල පොලිස් ස්ථානවලට පැමිණිලි කළ ද පොලීසිය කිසිදු පියවරක් ගෙන නැත[306].

පසුව, 2023 ඔක්තෝම්බර් 6 වැනි දිනැති ලිපියක් ප්‍රාදේශීය ප්‍රජාව විසින් නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත යොමු කළ අතර, 2023 ඔක්තෝම්බර් 31 දිනට පෙර කංගුවේලි වැව සම්බන්ධයෙන් ඇති ආරවුල්වලට අදාළ ව විසඳුමක් නොලැබුණහොත් විරෝධතාවයක් පවත්වන බව එමගින් සඳහන් කරන ලදී[307]. මෙම කාරණය ත්‍රිකුණාමලය ප්‍රාදේශීය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමග මතු කරනු ලැබුව ද තවමත් රාජ්‍ය අවධානය යොමු කර නොමැත[308].

### 2.7.5. කුච්චවේලි හි පිහිටි බෞද්ධ විහාරස්ථාන 32

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය කුච්චවේලි, පදවි-ශ්‍රී පුර, ගෝමරන්කඩවල, මොරවැව, නගරය සහ ග්‍රේවට්ස්, තඹලගමුව, මුතූර්, කින්නියා, කන්තලේ, සේරුවිල සහ වෙරුගල් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11කින් සමන්විත වේ[309]. මෑත වසරවල දී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෞද්ධ විහාරස්ථාන 32ක් ඉදි කිරීම ආරම්භ කළ අතර, මෙය උතුරු නැගෙනහිර ප්‍රදේශවල 'සිංහල-බෞද්ධකරණයී (පරිච්ඡේදය 4.1 බලන්න) පිළිබඳ උත්කර්ෂවත් බව පෙන්නුම් කරයි. විහාරස්ථාන 32 සඳහා කුච්චවේලි ප්‍රදේශයේ දෙමළ ජනතාවට අයත් පෞද්ගලික ඉඩම් අක්කර 2506.5කට වැඩි ප්‍රමාණයක් පවරා ගෙන ඇතැයි කියවෙන අතර අවශ්‍ය ඉදිකිරීම් මේ වන විටත් ආරම්භ කර ඇත[310]. වසර 2023 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රදේශය තුළ පවත්වන ලද රැස්වීම්වල දී විහාරස්ථාන 32 පිළිබඳ විස්තර අඩංගු පහත ලැයිස්තුව ලබා ගැනීමට හැකි විය.[311]

---

306 ඉහත පාද සටහන.

307 ඉහත පාද සටහන.

308 ඉල්ලීම් ලිපිය (294).

309 'Overview' (*District Secretariat of Trincomalee Ministry of Home Affairs*) <http://www.trincomalee.dist.gov.lk/index.php/en/> ප්‍රවේශය 2024 මාර්තු 18

310 ප්‍රාදේශීය ප්‍රජාව සමග CPA සම්මුඛ පරීක්ෂණය (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, 2023 මැයි 10)

311 ඉහත පාද සටහන.

| ග්‍රාම නිලධාරී වසම | පන්සලේ නම | අත්පත් කර ගත් ඉඩම් පිළිබඳ තොරතුරු | ලියාපදිංචි කිරීම |
|---|---|---|---|
| නිලාවේලි | කන්දල් කාඩු පුරාණ රජ මහා විහාරය [312] | හෙක්ටයාර 2.0234 | |
| කුඹුරුපිටි උතුර | කොක්කරඩි මලෛ බුධරාජ වන සෙනසුන [313] | අක්කර 400 | |
| කුඹුරුපිටි උතුර | කොට්ටිකුලම සංගරය වන සෙනසුන [314] | අක්කර 400 | |
| කුඹුරුපිටි උතුර | මඩුවක්කුලම ධර්මාය වන සෙනසුන [315] | අක්කර 400 | |
| කුඹුරුපිටි නැගෙනහිර | බඹරකාල පුරාණ රජ මහා විහාරය [316] | හෙක්ටයාර 102.408 | 2013 |
| කුඹුරුපිටි නැගෙනහිර | භාහිය පබත වන සෙනසුන [317] | හෙක්ටයාර 16.8417 | 2018 |
| කුඹුරුපිටි නැගෙනහිර | මහාබෝධි බෞද්ධ පදනම [318] | හෙක්ටයාර 0.8094 | 2022 |
| කුඹුරුපිටි නැගෙනහිර | දෙබරගල පුරාණ රජ මහා විහාරය [319] | හෙක්ටයාර 4.0469 | 2018 |
| කුඹුරුපිටි නැගෙනහිර | දියන මණ්ඩපය [320] | අක්කර 5 | |
| කුඹුරුපිටි නැගෙනහිර | විත්තිලෝග රජ මහා විහාරය [321] | හෙක්ටයාර 0.1064 | 2020 |
| | ඇත්පොකුණ පුරාණ රජ මහා විහාරය [322] | | 2018 |

[312] ඉහත පාද සටහන, මෙම ස්ථානය ප්‍රධාන වශයෙන් දෙමළ ජනයා සඳහා වූ අතර ජනගහනයෙන් 96] ක් හින්දු ආගමට අනුගත වේ. මෙම විහාරස්ථානය 2021 මැයි 18 වන දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ නිල වශයෙන් ලියාපදිංචි කරන ලද අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ හෙක්ටයාර් 6.3888ක භූමි ප්‍රමාණයක් යොමු අංක 1496 යටතේ වෙන් කර ඇති අතර එමගින් ප්‍රදේශවාසීන් මෙම ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා, විශේෂයෙන් කුඹුරු වගාව සඳහා ඓතිහාසික ව භාවිතා කර ඇත.

[313] ඉහත පාද සටහන, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ ලියාපදිංචි බෞද්ධ විහාරස්ථානයක් (ලියාපදිංචි අංක 13/06/025) සඳහා හෙක්ටයාර් 161.943ක භූමි ප්‍රමාණයක් නම් කරන ලදි.

[314] ඉහත පාද සටහන, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ ලියාපදිංචි බෞද්ධ විහාරස්ථානයක් (ලියාපදිංචි අංක 13/06/027)

[315] ඉහත පාද සටහන, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි බෞද්ධ විහාරස්ථානයක් (ලියාපදිංචි අංක 13/06/026)

[316] ඉහත පාද සටහන, මෙම විහාරස්ථානය නිල වශයෙන් ලියාපදිංචි කරන ලදි (ලියාපදිංචිය අංක 13/06/011) 2015 මැයි 15. මුල දී බදු පදනම මත ලබා දුන් අතර, පසුව විහාරස්ථානයේ ඉඩම අංක 3287 යටතේ ප්‍රදානයක් බවට පරිවර්තනය විය. 2022 දී "පූජා ප්‍රදානය" සිට "පූජා භූමි" ලෙස ඉඩම් අයිතිය වෙනස් කිරීම සඳහා විහාරස්ථානයේ මණ්ඩලය විසින් විධිමත් ඉල්ලීමක් කරන ලදි. කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒ සඳහා අවශ්‍ය ලියකියවිලි 2020 මාර්තු 4 දිනැති, යොමු අංක DS/Ku/LND/Pooja/4/4-15. සමඟ සකස් කරන ලදි.

[317] ඉහත පාද සටහන, 2018 මැයි 30 දින ලියාපදිංචි කරන ලද බෞද්ධ විහාරස්ථානයකි (ලියාපදිංචි අංක 13/06/15). විහාරස්ථානය සඳහා වන මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 29.5125කි. එයට පූජා භූමි (කැබලි අංක 3274) සහ පූජා ප්‍රදානය (2021 ජනවාරි 8 දිනැති ප්‍රදාන අංක 4/6/8419) අයත් වේ.වෙන් කරන ලද ඉඩම පුද්ගලික ඉඩමකින් සමන්විත බැවින්, DS විසින් නිර්දේශයක් සඳහා පළාත් ඉඩම් කොමසාරිස් වෙත ලිපියක් යවන ලදි (DS/KU/LND/Pooja/4/4-13 දින 2020 මාර්තු 4 දිනැති).

[318] ඉහත පාද සටහන , 2022 මාර්තු 29 වන දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (G/A00255575) යටතේ ලියාපදිංචි විහාරස්ථානයක්. මහාබෝධි බෞද්ධ පදනම කුඹුරුපිටිය ගම්මානයේ (240B) හෙක්ටයාර් 0.8094ක් බදු පදනම මත ඉල්ලා ඇති අතර, මේ අනුව මෙම ඉඩම No. DS/KU/LND/Pooja/4/4-30 යටතේ 2022 නොවැම්බර් 30 දින පවරා දෙන ලදි.

[319] ඉහත පාද සටහන, 2018 මැයි 30 වන දින ලියාපදිංචි බෞද්ධ විහාරස්ථානයක් වන අතර, ආගමික කටයුතු සඳහා හෙක්ටයාර 20.080ක් වෙන් කර ඇති අතර, එයට පූජා ප්‍රදානයක් (හෙක්ටයාර 4.04), බදු දීමනාවක් (හෙක්ටයාර් 16. 034) සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති හෙක්ටයාර 83.16ක ඉඩම් ඇතුළත් වේ.

[320] ඉහත පාද සටහන , මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 2.024කි.

[321] ඉහත පාද සටහන, 2020 අගෝස්තු 20 දිනැති ලියාපදිංචි බෞද්ධ විහාරස්ථානයක් (ලියාපදිංචි අංක 13/06/24) විහාරස්ථානය සඳහා මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 0.1064කි.

[322] ඉහත පාද සටහන.

| | | | |
|---|---|---|---|
| කුඹුරුපිටි නැගෙනහිර | | | |
| කුච්චවේලි | සමුත්තිරගිරි පිච්චමල් පුරාණ රජ මහා විහාරය [323] | හෙක්ටයාර 0.9315 | 2011 |
| කුච්චවේලි | චෛත්‍යගිරි පුරාණ රජ මහා විහාරය [324] | හෙක්ටයාර 24.1341 | 2011 |
| ජයනගර් | සකරපුර සමුත්තිරගිරි වන සෙනසුන [325] | හෙක්ටයාර 36.0596 | 2014 |
| ජයනගර් | පුරාණ ගල්ලෙන රජ මහා විහාරය [326] | | |
| කාසිම්නගර් | මසංගවැව පිංකත්තුගම රජ මහා විහාරය [327] | හෙක්ටයාර 152.679 | 2011 |
| කල්ලම්පත්තයි | ශ්‍රී කෙත්තාරාම විහාරය [328] | | 2020 |
| කඩ්ඩුකුලම් | ගිරිහඬු සෑ නීත්තු පාපන රජ මහා විහාරය | හෙක්ටයාර 102.5766 | 2015 |
| තිරියාය | පත්මරාජ පපත වන සෙනගන | හෙක්ටයාර 44.325 | 2020 |
| තිරියාය | තාපසුබළුග වන සෙනගන | හෙක්ටයාර 2.4598 | 2020 |
| තිරියාය | සප්තනාහ බප්පත වන සෙනසුත | හෙක්ටයාර 20.2343 | 2018 |
| පුල්මුඩේ 01 | අත්තානාගි කාන්ත පුරාණ රජ මහා විහාරය | හෙක්ටයාර 88.6966 | 2012 |
| පුල්මුඩේ 01 | ආසිරිකාන්ත පුරාණ රජ මහා විහාරය | හෙක්ටයාර 109.986 | 2012 |
| පුල්මුඩේ 01 | ශ්‍රී සත්තර්ම යුක්තික වන සෙනසුන [329] | හෙක්ටයාර 1.0438 | 2018 |
| පුල්මුඩේ 01 | මිහිඳුලෙනේ පුරාණ රජ මහා විහාරය | හෙක්ටයාර 20.2343 | 2014 |
| පුල්මුඩේ 01 | මයිමුණි රජ මහා විහාරය | | |
| පුල්මුඩේ 01 | යාන් ඔය පුරාණ රජ මහා විහාරය | හෙක්ටයාර 147.318 | 2012 |
| පුල්මුඩේ 03 | නාගලෙන රජ මහා විහාරය | හෙක්ටයාර 59.0255 | 2002 |

[323] ඉහත පාද සටහන, 2011 අගෝස්තු 24 දින විහාරස්ථානය ලියාපදිංචි කර ඇත (ලියාපදිංචිය අංක 13/06/003) පූජා ප්‍රදානය හෙක්ටයාර් 0.93ක් ඇතුළු ව හෙක්ටයාර 24.9614ක මුළු භූමි ප්‍රමාණයකින් යුක්ත විය. මෙම ප්‍රදේශය පෞද්ගලික ඉඩමකින් සමන්විත වන බැවින් ඉදිකිරීම් කටයුතු නවතා ඇති අතර ප්‍රාදේශීය ලේකම්, (DS/KU/LND/Pooja/4/4/03 දින 2022 මාර්තු 22) පළාත් ඉඩම් කොමසාරිස් වෙත ලිපියක් යවා ඇත. (EP/28/LB/LS/Pooja/42 දින 7 අප්‍රේල් 2022)

[324] ඉහත පාද සටහන.

[325] ඉහත පාද සටහන, මෙම විහාරස්ථානය නිල වශයෙන් ගැසට් කර ඇති අතර කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා 2014 දෙසැම්බර් 10 වැනි දින නිල වශයෙන් ලියාපදිංචි කර ඇත (ලියාපදිංචිය අංක 13/06/012).

[326] ඉහත පාද සටහන.

[327] ඉහත පාද සටහන, මෙම විහාරස්ථානය පිහිටා ඇත්තේ හෙක්ටයාර් 152.79ක පෞද්ගලික ඉඩම් කැබැල්ලක වන අතර, එය දීර්ඝ කාලයක් තිස්සේ ගම්මානයේ වෙසෙන ගොවි ප්‍රජාව විසින් කෘෂිකාර්මික කටයුතු සඳහා මූලික වශයෙන් භාවිතා කර ඇත. එය 2011 අගෝස්තු 22 වන දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බෞද්ධ විහාරස්ථානයක් ලෙස විධිමත් ලෙස (ලියාපදිංචිය අංක 13/06/002) ලියාපදිංචි කරන ලදි.

[328] ඉහත පාද සටහන.

[329] ඉහත පාද සටහන.

| | | | |
|---|---|---|---|
| පුල්මුඩේ 04 | ශාන්ති පුරාණ රජ මහා විහාරය [330] | හෙක්ටයාර 40.4206 | 2014 |
| පුල්මුඩේ 04 | ශ්‍රී ධර්මෝදය දහම් පාසල | | |
| තෙන්නමරවාඩි | සංකමාලේ පුරාණ රජ මහා විහාරය | හෙක්ටයාර 62.3434 | 2012 |
| තෙන්නමරවාඩි | මේස වැව [331] | | |

මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන බෞද්ධ විහාරස්ථාන සංඛ්‍යාව, ඓතිහාසික ව වැඩි වශයෙන් මුස්ලිම් සහ දෙමළ ප්‍රජාවන්ගෙන් සමන්විත ප්‍රදේශයක අනන්‍යතා දේශපාලනයට සහ මැතිවරණ ප්‍රතිඵල සඳහා සැලකිය යුතු ඇඟවුම් ඇති කරන අතර ශ්‍රී ලංකාවේ නැගෙනහිර ජන විකාශ වෙනස් කිරීමේ දේශපාලන න්‍යාය පත්‍රයක් පවතින බවට පෙන්නුම් කරයි. මෙම ප්‍රදේශයට අදාළ ප්‍රධාන සිදුවීම් කිහිපයක විස්තර පහත දැක්වේ:

(අ). ආසිරිකාන්ත පුරාණ රජ මහා විහාරය

පුල්මුඩේ 2 කොටසේ අරිසිමලේ හි පිහිටි ආසිරිකාන්ත පුරාණ රජ මහා විහාරය සැලකිය යුතු ඓතිහාසික වැදගත්කමකින් යුක්ත වේ. මීට වසර 45 කට පෙර මෙම ගම්මානයෙහි ප්‍රදේශවාසීන් වාසය කළ නමුත් යුද්ධයෙන් පසු නාවික හමුදාව එම ප්‍රදේශයේ කඳවුරක් පිහිටුවා ගත් අතර, වන්දනාමාන කිරීම සඳහා බුද්ධ ප්‍රතිමාවක් ස්ථාපනය කරන ලදි.[332] 2013 වර්ෂයේ දී බෞද්ධ භික්ෂූන්වහන්සේ නමක් විසින් 'ආසිරිකාන්ත පුරාණ රජ මහා විහාරය' නමින් ස්තූපයක් ගම්මානයේ ආරම්භ කළ අතර, පසුව එය 2012 ජනවාරි මස 12 වන දින නිල වශයෙන් කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යටතේ ලියාපදිංචි කරන ලදි.[333] පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගැසට් නිවේදනයක් නිකුත් කරමින් පුරාවස්තු පනතේ 16 වැනි වගන්තිය යටතේ එම ස්ථානය ඉපැරණි ස්මාරකයක් ලෙස පිළිගනු ලැබී ය.[334] මේ සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් විසින් පැමිණිලි, විරෝධතා සහ අභියාචනා රැසක් සංවිධානය කරනු ලැබූහ.[335] විශේෂයෙන්, පුල්මුඩේ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පුල්මුඩේ ප්‍රදේශයේ මුස්ලිම් පවුල් හයකට අයත් කෘෂිකාර්මික ඉඩම් අත්පත් කර ගැනීමට ද ස්තූපය ඉදි කිරීම ආරම්භ කළ භික්ෂු නම සම්බන්ධ වී තිබීම විශේෂත්වයකි.[336]

පසුව නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත (269 පරිච්ඡේදය) 6(2) සහ 21(2) (බී) වගන්ති යටතේ ආසිරිකාන්ත පුරාණ රජමහා විහාරය 'පූජනීය ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කළ අතර මෙය 2022 මාර්තු 22 දින ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලදි.[337] වර්තමානයේ,'පූජනීය ප්‍රදේශයක්' වන මෙම

[330] ඉහත පාද සටහන, මෙම විහාරස්ථානය 2014 දෙසැම්බර් 10 වන දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (ලියාපදිංචි අංක 13/06/014) ලියාපදිංචි කරන ලදි. මෙම විහාරස්ථානය නගර සහ ගම් සැලසුම් ආඥාපනත යටතේ 'නාගරික සංවර්ධන ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. මෙම විහාරස්ථානයේ සම්පූර්ණ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 20.2216ක් වන අතර, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ඉඩම් 20.199ක් ලියාපදිංචි කර ඇත (ලියාපදිංචි අංක 4/6/8448 2021 මාර්තු 30 දින). මෙයින් අක්කර 100ක ඉඩම පෞද්ගලික ඉඩමකින් සමන්විත වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස කුච්චවේලි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් 2023 මාර්තු 4 දින නීතිපතිවරයා වෙත උපදේශනය සඳහා යොමු අංක DS/KU/LND/Pooja/4/4-15 සමඟ ලිපියක් යවා ඇත.

[331] ඉහත පාද සටහන, ලියාපදිංචි බෞද්ධ විහාරස්ථානයක් (ලියාපදිංචි අංක 13/06/010) පූජා භූමි නමින් හෙක්ටයාර 1562.02ක ඉඩමක්, පූජා ප්‍රදානය සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙම විහාරස්ථානය සඳහා වෙන් කර ඇත. පෞද්ගලික ඉඩමක් ද ඇතුළත් මෙම විහාරස්ථානය සඳහා විශාල වශයෙන් ඉඩම් වෙන් කිරීම හේතුවෙන් විහාරස්ථානයේ ඉදිකිරීම් ඇන හිට ඇත.

[332] 'Secret of Arisi Malai' *Tamil Mirror* (15 August 2021).

[333] ලියාපදිංචි අංකය.13/06/006.

[334] ගැසට් අංක.1823/73 2013 අගෝස්තු 16 දින.

[335] 'Arismalai monk, appropriating the native land of Pulmoddai villagers' *Virakesari* (24 September 2023) <https://www.virakesari.lk/article/165309> ප්‍රවේශය 2024 අප්‍රේල් 5

[336] ඉහත පාද සටහන.

[337] ගැසට් අංක.2272/32 2022 මාර්තු මස 22 දින.

ප්‍රදේශයට හෙක්ටයාර් 109.9858ක භූමි ප්‍රමාණයක් වෙන් කර ඇත. අරිසිමලයෙ‍ෙ විහාරස්ථානය විසින් විහාරස්ථාන පරිශ්‍රය සඳහා අමතර අක්කර 500ක් ඉල්ලා ඇති බව කුච්චවේලි දිස්ත්‍රික් ලේකම්වරයා කියා සිටී.[338] ඒ අනුව, විහාරස්ථානය සඳහා තවත් ඉඩම් අක්කර 25ක් ලබා දීමටත්, විහාරස්ථානය අවට ඉඩම් අක්කර 500ක් "පුරාවිද්‍යා රක්ෂිතයක්" ලෙස ප්‍රකාශයට පත් කිරීමටත් තීරණය කර ඇත.[339] නොසන්සුන්කාරී වාතාවරණය මධ්‍යයේ ප්‍රදේශය මැනීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ගත් උත්සාහයට ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ විරෝධතා හේතුවෙන් එය නවතාලීමට තීරණය කරන ලදි.[340]

(ආ). වෙයිත්තියගිරි පුරාණ රජ මහා විහාරය

මතභේදයට තුඩු දී ඇති කඳු ගැටය මත චෙම්බීස්වරර් නමින් හැඳින්වෙන ශිවන් කෝවිලක් පැවති අතර මෙම පෞරාණික කෝවිල විනාශ කර, [341] එම ස්ථානයේ 'වෙයිත්තියගිරි පුරාණ රජ මහා විහාරය' නමින් නව විහාරයක් ඉදි කරන ලද බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැනගන්නට ලැබී ඇත.[342] මෙම බෞද්ධ විහාරය ලියාපදිංචි කිරීම 2011 අගෝස්තු මස 24 වන දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සිදු විය.[343] පෞද්ගලික හා පොදු දේපළවලින් සමන්විත හෙක්ටයාර 50කට අධික භූමි ප්‍රමාණයක් මේ වන විට 'පූජා භූමි සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර ඇත.[344] 2023 ජූලි 19 දිනැති ලිපියක් (DS/KU/LND/COURT/5) කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම පිණිස නීතිපතිවරයා වෙත යොමු කර ඇත.

(ඇ). ගිරිහඬු සෑය නීත්තු පාපන රජ මහා විහාරය

ගිරිහඬු සෑය යනු තිරියාය ප්‍රදේශයේ කුඩා කඳු මුදුනක පිහිටි බෞද්ධ විහාරයකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විමර්ශනවලින් අනතුරුව බුදු හිමියන්ගේ කේශ ධාතූන් සහිත විහාරස්ථානයේ ඓතිහාසික පැවැත්ම 1930 ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කරන ලදි.[345] 1951-1952 කාලය තුළ විහාරස්ථානයේ 'චෛතිය' සහ 'වටදාගෙය' ප්‍රතිසංස්කරණය කළ ද, ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය ඉහළ යාමත් සමඟ එම ප්‍රදේශයේ විසූ සිංහල ජනතාව, විහාරස්ථානයේ වැඩ සිටි භාරකාර හිමියන් සමඟ 1982 දී ප්‍රදේශයෙන් පිටව ගියහ.[346]

වෙනත් බොහෝ සිද්ධීන් මෙන් නොව, මෙම බෞද්ධ විහාරය ප්‍රදේශයේ ලේඛනගත ඓතිහාසික පැවැත්මක් ඇති බව පෙන්වා දෙයි. කෙසේ වෙතත් කනස්සල්ලට හේතුව වන්නේ විහාරස්ථානය අත්පත් කර ගෙන සිටින භූමි ප්‍රමාණය පුළුල් කිරීමට පියවර ගෙන තිබීම යි. උදාහරණයක් ලෙස 2014 ජූලි මස 18 වන දින ගිරිහඬු සෑය ජනතා අයිතියට පත් කළ අතර මිලින්ද මොරගොඩ පදනම යටතේ "උරුමයක උල්පත" වැඩසටහන මගින් ගිරිහඬු සෑයේ වන්දනා මාන සඳහා විවේකාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.[347] 2010 වසරේ දී විහාරස්ථානය අවට අක්කර 3600ක පමණ භූමි

338 'Buddhist Temple And Residents Fight Over Land in Sri Lanka' *Buddhist Art News* (25 May 2014) <https://buddhistartnews.wordpress.com/2014/05/25/buddhist-temple-and-residents-fight-over-land-in-sri-lanka/> ප්‍රවේශය 2024 අප්‍රේල් 5

339 'Sinhalization of the North and East' (*PEARL*) <https://pearlaction.org/sinhalization-of-the-north-east-pulmoaddai/#:~:text=District%20Secretary%20Pushpakumara%20Nissanka%20said,as%20an%20Archaeological%20Forest%20Reserve> ප්‍රවේශය 2024 ජූලි 30.

340 *Buddhist Art News* (n 338).

341 'The Sembiswaram Expedition in Kuchaveli: Sembimalai - Part 1' (*N.K.S. Thiruchelvam*, 27 June 2020) <https://nksthiru.blogspot.com/2020/06/1_27.html> ප්‍රවේශය 2024 අප්‍රේල් 7.

342 ප්‍රාදේශීය ප්‍රජාව සමඟ සම්මුඛ සාකච්ඡාව (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, 2023 සැප්තැම්බර්)

343 ලියාපදිංචි අංකය.13/06/001.

344 CPA සාකච්ඡාව (n 342).

345 Ama Vanniarachchy, 'Sri Lanka's First Stupa, Girihandu Seya' (Amazing Sri Lanka, 5 June) <https://amazingsrilanka.lk/sri-lankas-first-stupa-girihandu-seya/> ප්‍රවේශය 2024 ජූලි 10.

346 CPA සාකච්ඡාව (n 342).

347 'Rest Room for Pilgrims at Girihandu Seya' (Tobacco Unmasked, 15 June 2021) <https://tobaccounmasked.com/index.php/Rest_Room_for_Pilgrims_at_Girihandu_Seya> ප්‍රවේශය 2024 ජූලි 10.

ප්‍රමාණයක් එහි භාවිතය සඳහා නීත්‍යානුකූල ව මායිම් කර ඇති බව විහාරස්ථානයේ ප්‍රධාන භික්ෂූන් වහන්සේ මැතක දී ප්‍රකාශ කර තිබේ.[348]

2022 අප්‍රේල් වන විට කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලිපියක් යොමු කරමින් ගිරිහඬු සෑය සඳහා විහාරස්ථානයේ නායක භික්ෂූන් වහන්සේගේ ඉල්ලීම පරිදි පෞද්ගලික නේවාසික සහ කෘෂිකාර්මික ඉඩම් ඇතුළු තවත් අක්කර 3065ක් වෙන් කරන ලෙස දන්වා සිටින සේක.[349] තවද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ඉඩම් අක්කර 25ක් ද, 'පූජා භූමි' ප්‍රදානය යටතේ ඉඩම් අක්කර 253ක් ද මෙම විහාරය සඳහා වෙන් කර ඇත.[350]

(ඇ). නාගලෙන රජ මහා විහාරය

නාගලෙන රජ මහා විහාරය කුච්චවේලි පරිපාලන කොට්ඨාසයේ පුල්මුඩේ 03 හි කන්නීරවු පුලවු ගම්මානයේ පිහිටා ඇත. මෙම මුළු ගම්මානය ම ලෙන් ලිපි, පෞරාණික ගොඩනැගිලිවල නටබුන් සහ පුරාවිද්‍යාත්මක සාක්ෂි සහිත වෙනත් නටබුන්වලින් සමන්විත වන අතර, ඒ අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ගැසට් නිවේදනයක් මගින් මේවා 'පෞරාණික ස්මාරක' ලෙස ප්‍රකාශයට පත් කර ඇත.[351] පසුව නාගලෙන රජමහා විහාරයේ භාරකාර මණ්ඩලය විසින් පුල්මුඩේ 03 ප්‍රදේශයේ හෙක්ටයාර 6.0956 සහ 10.6882 ප්‍රමාණයෙන් 'ආගමික කටයුතු' සඳහා රජයේ ඉඩම් වෙන් කරන ලෙස ඉල්ලා සිටි අතර පසුව එම ඉල්ලීම ගැසට් නිවේදනය මගින් ප්‍රසිද්ධියට පත් කරන ලදී.[352] 2022 වන විට විහාරස්ථානය පිහිටි භූමිය 'පූජනීය ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කළ අතර,[353] ඒ වන විට එය හෙක්ටයාර 63.54ක භූමි ප්‍රමාණයකින් සමන්විත විය.[354]

(ඉ). පත්මරාජ පපත වන සෙනගන

මෙම විහාරස්ථානය 2020 අගෝස්තු 20 වන දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිල වශයෙන් ලියාපදිංචි කරන ලදී.[355] 2020 දෙසැම්බර් මස 23 වන දින විහාරස්ථානයට අයත් නිශ්චිත ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 44.325ක භූමි ප්‍රමාණයකින් යුක්ත බවට මනිනු ලැබුව ද [356] පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් විහාරස්ථානය සඳහා හෙක්ටයාර් 194.06ක විශාල භූමි ප්‍රමාණයක් සලකුණු කර ඇත. පසුව, මෙම පුළුල් කරන ලද ප්‍රදේශය 2021 පෙබරවාරි 3 වන දින 'පූජා භූමියකී ලෙස නිල වශයෙන් නම් කරන ලදී.[357] තවද, මෙසේ නැවත නම් කරන ලද ඉඩම් කොටස 2021 පෙබරවාරි 8 වන දින පළාත් ඉඩම් කොමිසමේ ලියාපදිංචි කරන ලදී.[358] මෙම ප්‍රදේශයේ අක්කර 370ක ඉඩමක් සඳහා විහාර භාරකාර හිමියන් විසින් අවසර ලබා ගෙන ඇති අතර, ඓතිහාසික ව දෙමළ පුද්ගලයන් සතුව පැවති ඉඩම්වල ගල් බාධක ඉදි කර, එම ප්‍රදේශය එළි පෙහෙළි කර, දැනට වගාබිම් බඳු දීම ඇතුළු කෘෂිකාර්මික කටයුතුවල නියැලෙමින් සිටින බව පෙන්වා දිය යුතුය.[359] නීති විරෝධී ලෙස ඉඩම්

[348] 'Tamil MPs Hold Discussion with Thiriyai Residents Over Land Grabbing Attempt by Sinhala Buddhist Monk' *Tamil Guardian* (13 April 2023) <https://www.tamilguardian.com/content/tamil-mps-hold-discussion-thiriyai-residents-over-land-grabbing-attempt-sinhala-buddhist> ප්‍රවේශය 2024 ජූලි 11.

[349] CPA සාකච්ඡාව (n 342).

[350] සමාජ ක්‍රියාකාරිකයෙකු සමඟ CPA සම්මුඛ සාකච්ඡාව (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, 2023 නොවැම්බර් 21).

[351] 2013 අගෝස්තු 16 දිනැති අංක 1823/73 ගැසට් පත්‍රය.

[352] 2020 ඔක්තෝබර් 2 දිනැති අංක 2196 ගැසට් පත්‍රය.

[353] 2022 මාර්තු 22 දිනැති අංක 2272/32 ගැසට් පත්‍රය.

[354] මෙම ප්‍රදේශය කැබලි අංක 1459 (හෙක්ටයාර 2.2397), කැබලි අංක 1460 (හෙක්ටයාර 6.0956), කැබලි අංක 1461 (හෙක්ටයාර 10.6862), කැබලි අංක 1464 (හෙක්ටයාර් 36.5515), කැබලි අංක 15267 (හෙක්ටයාර් 4.5267) කින් සමන්විත වේ. 1468 (හෙක්ටයාර 3.4525) 2019 සැප්තැම්බර් 16 දිනැති සමීක්ෂණ සැලැස්ම FTP සමඟ.

[355] ලියාපදිංචි අංක 13/06/023.

[356] සමීක්ෂණ සැලැස්ම Topo PP32.

[357] යොමු අංකය DS/Ku/LND/Pooja/4/4-26 සහ 59A 2R සහ පර්චස් 3 ක ඉඩමක් වෙන් කරන ලදී.

[358] යොමු අංකය Arch/ESt/Tri/EXP/Pooja Boomi/01/2021.

[359] CPA සම්මුඛ පරීක්ෂණය (n 342).

අත්පත් කර ගැනීම අභියෝගයට ලක් කරමින් ප්‍රදේශයේ ගොවීන් ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට කටයුතු කර තිබේ.[360]

(ඊ). සංකමලේ පුරාණ රජ මහා විහාරය

තෙන්නමරාවාඩි ගම්මානයේ පිහිටි සංකමලේ පුරාණ රජ මහා විහාරය 2022 ජූනි මස 17 වන දින නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත යටතේ 'පූජනීය ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.[361] 2020 දී පන්සල් භාරකාර මණ්ඩලය සිය 'ආගමික අරමුණු' සඳහා හෙක්ටයාර 20.2343ක් ඉල්ලා සිටි නමුත් 'පූජා භූමි' නමින් අතිරේක ඉඩම් හෙක්ටයාර් 42.1091ක් සහ 3.3748ක් ඒ සඳහා වෙන් කර දී ඇත.[362] මෙම ඉඩමෙහි කොටස්වලට පෞද්ගලික ඉඩම් ද ඇතුළත් වන අතර දැනට හෙක්ටයාර 65.9322ක පමණ භූමි ප්‍රමාණයකින් සමන්විත වන අතර එය 2012 දෙසැම්බර් මස 12 වන දින සිට කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බෞද්ධ විහාරස්ථානයක් ලෙස ලියාපදිංචි කර ඇත.[363]

කන්දස්වාමි කෝවිලේ මාසික උත්සවයකට පැමිණීමට දෙමළ ජාතිකයන් පිරිසක් කටයුතු කිරීම, ශ්‍රී ලංකා පොලිසිය විසින් පසුගිය දා තහනම් කරන ලදි.[364] විහාරස්ථානය පිහිටි ප්‍රදේශය සංකමලේ බෞද්ධ විහාරස්ථානයට අයත් පුරාවිද්‍යා භූමියක් වන අතර හින්දු ආගමික කටයුතුවල නිරත වීම හෝ විරෝධතා ඇති විය හැකි කිසිදු කටයුත්තක යෙදීම තහනම් බව එහි දී පොලිසිය ප්‍රකාශ කර තිබේ.[365] පසුව, ගම්වාසීන් විසින් උත්සවය සූදානම් කරමින් සිටිය දී විහාර භූමියට ඇතුළු වූ ශ්‍රී ලංකා පොලිසිය, විශේෂ කාර්යය බළකායේ නිලධාරීන් මෙන් ම ශ්‍රී ලංකා හමුදාව විසින් ගම් වාසීන් රඳවා ගැනීමටත්, අදාළ ප්‍රදේශයට පිටස්තරයන් ඇතුළු වීම වළක්වාලීමටත්, කටයුතු කළ අතර එතුළින් උත්සවයට බාධා ඇති විය.[366] එම ස්ථානයේ විරෝධතා හෝ ගැටුම් ඇති විය හැකි ක්‍රියාකාරකම් වැළැක්වීම සඳහා පුල්මුඩේ පොලිසිය විසින් ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ කරුණු ගොනු කරන ලදි.[367]

(උ). සත්තනාහ පබ්බත වන සෙනසුන

සත්තනාහ පබ්බත වන සෙනසුන, කුච්චවේලි හි තිරියාය ගම්මානයේ පිහිටා ඇත. විහාරස්ථානයේ භාරකාර මණ්ඩලය විසින් විහාරස්ථානය සඳහා රජයේ ඉඩම් හෙක්ටයාර **20.2343**ක් ඉල්ලා සිටි අතර **2020** ඔක්තෝම්බර් මස **02** වැනි දින ගැසට් නිවේදනයක් මගින් මෙම ඉල්ලීම ඉටු කරන ලදි.[368] පූජා ප්‍රදානය යටතේ අක්කර **50**ක ඉඩමක් වෙන් කර ඇත. මේ හේතුවෙන් මෙම තත්ත්වය යටතේ පීඩාවට පත් පුද්ගලයන් ත්‍රිකුණාමලය අධිකරණය ඉදිරියේ නීතිමය කටයුතු ආරම්භ කර ඇත.[369] මෙම තත්ත්වය විසඳුමකින් තොරව පවතින අතර බෞද්ධ විහාරස්ථානයේ කටයුතු බාධාවකින් තොරව සිදුවෙමින් පවතී.

(ඌ). යාන් ඔය පුරාණ රජ මහා විහාරය

යාන් ඔය රජ මහා විහාරය, පුල්මුඩේ 01, කුච්චවේලි ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇත. 2011 සිට 2015 දක්වා කාලය තුළ පුරාවිද්‍යා පර්යේෂණ පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය මගින් යාන් ඔය ගම්මානයේ පුරාවිද්‍යා නටබුන් පවතින බව සොයා ගත් අතර ඒත් සමඟ මෙම ගම්මානයට රාජ්‍ය

360 නඩුව No.HCT/WRIT/649/20.
361 CPA සම්මුඛ පරීක්ෂණය (n 342).
362 ඉහත පාද සටහන.
363 ලියාපදිංචි අංක.13/06/009.
364 'Sri Lankan Police Prevent Tamils from Attending Monthly Festival at Trinco Temple' *Tamil Guardian* (23 February 2024) <https://www.tamilguardian.com/content/sri-lankan-police-prevent-tamils-attending-monthly-festival-trinco-temple> ප්‍රවේශය 2024 අප්‍රේල් 20.
365 ඉහත පාද සටහන.
366 ඉහත පාද සටහන.
367 CPA සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාව (n 342).
368 2020 ඔක්තෝබර් 2 දිනැති අංක 2196 දරන ගැසට් පත්‍රය.
369 kvqj (n 360).

මැදිහත් වීම ආරම්භ විය.[370] 2013 දී යාන් ඔය ගම්මානයේ වනාන්තර ප්‍රදේශයේ පිහිටි ගල් පාලමක නටබුන් 'පෞරාණික ස්මාරකයක්' ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.[371]

යාන් ඔය රජමහා විහාරය එම යුගයේ පිහිටුවනු ලැබූ අතර කුච්චවේලි කොට්ඨාසය යටතේ බෞද්ධ විහාරස්ථානයක් ලෙස ලියාපදිංචි කරන ලදී.[372] අනතුරුව 2023 අගෝස්තු මස 15 වැනි දින ගැසට් නිවේදනය මගින් නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත (269 පරිච්ඡේදය) යටතේ මෙම ඉඩම 'නාගරික සංවර්ධන ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.[373] පසුව, 2024 පෙබරවාරි 15 වන දින ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් යාන් ඔය රජමහා විහාරයෙහි ඇති පුරාවිද්‍යාත්මක, ඓතිහාසික සහ පූජනීය වැදගත්කම හඳුනා ගනිමින් රජයේ ගැසට් පත්‍රයේ 'පූජනීය ස්ථානයක්' ලෙස නිල වශයෙන් නම් කරන ලදී.[374]

කුච්චවේලි ප්‍රදේශය සම්බන්ධ සිදුවීම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් විහාරස්ථාන නම් කිරීමට පමණක් සීමා නොවන බව සඳහන් කිරීම වැදගත් වේ. රජය හා සම්බන්ධ අනෙකුත් ක්‍රියාකාරීන්ගේ මැදිහත් වීම, ඉඩම් අත්පත් කර ගැනීම් සහ ගැටුම් සම්බන්ධයෙන් රාජ්‍ය මැදිහත් වීමට අදාළ ජාලය කෙතරම් පුළුල් ද යන්න පෙන්නුම් කරයි, තෙන්නමරවාඩි ප්‍රදේශයේ පහත තත්ත්වය මේ බව ප්‍රදර්ශනය කරන්නකි:

### 2.7.5.1. තෙන්නමරවාඩි

තෙන්නමරවාඩි යනු උතුරු සහ නැගෙනහිර පළාත් අතර කන්දස්වාමි කන්දේ පිහිටි පුරාණ දෙමළ ගම්මානයකි. ගම්මානය ම පිහිටා ඇති ප්‍රදේශය ජනාවාස අක්කර 248කින් සහ කුඹුරු අක්කර 900කින් සමන්විත වන අතර එහි වැසියන් ප්‍රධාන වශයෙන් ගොවිතැන සහ මසුන් ඇල්ලීම මත යැපෙන අතර අවට වනාන්තරවල තෘණ ආහාරයට ගනු ලබන සතුන් ඇති කිරීම ද සිදු කරයි.[375]

තෙන්නමරවාඩි ගම්මානයේ පවුල් 95ක් ජීවත් වන බවට වාර්තා තිබුණ ද දකුණු මරවාඩි ගම්මානයේ දැනට ජීවත් වන පවුල් සංඛ්‍යාව 57කි..[376] ත්‍රිකුණාමලයේ වත්මන් ජනවාර්ගික සංයුතිය වෙනස් කිරීමේ අරමුණින් විවිධ දේශපාලන පක්ෂ විසින් කන්තලේ, පතාවය, මොරවැව, මහතිවුල්ල වැනි විවිධ සංවර්ධන ව්‍යාපෘති හඳුන්වා දෙන ලදී.[377] එහි ප්‍රතිඵලයක් ලෙස 1980 .ණන්වල දී දෙමළ ජනයා තෙන්නමරවාඩියෙන් වෙනත් ප්‍රදේශ වෙත පිටමන් වීමට පටන් ගත්හ.[378] එතැන් සිට, අවට සිංහල ප්‍රජාව මෙම ප්‍රදේශය අත්පත් කර ගැනීමට උත්සාහ ගෙන ඇති අතර, බොහෝ විට එසේ ඉඩම් ඇඳා ගැනීමේ දී 'පූජා භූමි' යන්න ඉස්මතු කිරීමට කටයුතු කර තිබේ. ප්‍රදේශයට නව පාර්ශවයන් ඇතුළු වීමත් සමඟ ම, පුරාණ සෙල්ලිපි, විශේෂයෙන් ම කන්දස්වාමි කඳු මුදුනේ පිහිටි මුරුගන් කෝවිලේ ඇති සෙල්ලිපි විකෘති කරන ලද බවත්, බොහෝ දෙමළ ගොවි ගම්මාන සිංහලයන්ට පවරා දී ඇති බවත් වාර්තා පෙන්වා දෙයි.[379] 2013 වසරේ දී කන්දස්වාමි කන්ද ආරක්ෂිත 'පුරාවිද්‍යා භූමියක්' ලෙස

---

370 CPA සම්මුඛ සාකච්ඡාව (n 342).

371 2013 අගෝස්තු 16 දිනැති අංක 1823/73 දරන ගැසට් පත්‍රය.

372 2012 ජනවාරි 11 දිනැති ලියාපදිංචි අංක 13/06/007.

373 2023 wf.daia;= 15 Èke;s wxl 2345$39 ork .eiÜ m;%h'

374 President's Media Division, 'Several Historical Shrines Designated as Sacred Sites' (2024 පෙබරවාරි 16) <https://pmd.gov.lk/news/several-historical-shrines-designated-as-sacred-sites/> ප්‍රවේශය 2024 අප්‍රේල් 30, එහි සඳහන් වන්නේ "වර්තමානයේ,පූද බිම් ලෙස පිළිගෙන ඇති මෙම ප්‍රදේශ සඳහා අදාළ ලිපි ලේඛන ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයට ඉදිරිපත් කර ඇති" බව යි.

375 AHRC, 'Ancient Tamil Village Thennamarakudi, General Information and Land Issues Report' (2022 මාර්තු 23).

376 ඉහත පාද සටහන .

377 ඉහත පාද සටහන .

378 ඉහත පාද සටහන .

379 'Ancient Murugan temple in Thennamaravadi has also been appropriated by the Archaeological Department - Reporter for Global Tamil News' *Global Tamil News* (2018 දෙසැම්බර් 10)

රජය විසින් ප්‍රකාශයට පත් කළ නමුත් [380] එම කන්දේ පිහිටි මුරුගන් කෝවිල ආරක්ෂා කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව දක්නට ලැබෙන්නකි. විහාරස්ථානය අවට අක්කර 8ක කුඹුරු ඉඩමක් ඇති අතර මෙය බෞද්ධ භික්ෂුවක් විසින් අත්පත් කර ගෙන ඇත.[381]

2022 සැප්තැම්බර් මස 24 වැනි දින, පනිකවායල් ආරම්භයේ සිට තෙන්නමරවාඩි දක්වා වූ ඉඩම් අක්කර 358ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අත්පත් කර ගැනීමෙන් පසු තෙන්නමරවාඩියේ ජනතාව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ප්‍රශ්න කරන්නට පටන් ගත් අතරල[382] මෙසේ අත්පත් කර ගත් ඉඩම්වලට ඓතිහාසික වශයෙන් දෙමළ පුද්ගලයන් සතුව පැවති කෙත්වතු ද ඇතුළත් විය.[383] ඒ අවට අරිසිමලේ ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේ නමකගේ ඉල්ලීමකට අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් තම ගම්මානයේ ඉඩම් පවරාගෙන ඇති බව තෙන්නමරවාඩි ප්‍රදේශයේ ප්‍රාදේශීය ප්‍රජාව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත වාර්තා කර තිබේ.[384]

අවතැන් වූ බොහෝ ජනතාව යුද්ධයෙන් අනතුරුව නැවත තෙන්නමරාවාඩියට පැමිණ, තම කුඹුරු ඉඩම් පිළිබඳ සොයා බැලීමේ දී ඒවායෙන් බොහොමයක් රජයේ විවිධ දෙපාර්තමේන්තු සහ සිංහල ජනතාව කිසිදු නීතිමය ලියකියවිල්ලකින් තොරව අත්පත් කර ගෙන ඇති බව දැනගන්නට ලැබී තිබීම මෙහි ලා සඳහන් කළ යුතුය.[385] මෙම ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන්ට නැවත ලබා දීමට ගැසට් නිවේදනයක් නිකුත් කර තිබුණ ද ඒ කිසිවක් ආපසු ලබා දීමට කටයුතු කර නොතිබිණි.[386] මේ හේතුවෙන් මෙයට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග වශයෙන් පස් දෙනකු විසින් ත්‍රිකුණාමලය මහාධිකරණය ඉදිරියේ නඩු පවරනු ලැබූ අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ද පැමිණිලි ඉදිරිපත් කර ඇත.[387] ඇතැම් පවුල්වලට වලංගු නීතිමය ලියකියවිලි නොමැති වීම මෙන් ම තවත් අයට ඔවුන්ගේ නඩු වෙනුවෙන් පෙනීසිටීමට නීතිඥයින්ට මුදල් දීමට නොහැකි වීම, මෙම නීතිමය සටන් ජයගැනීමෙහි ලා දුෂ්කරතා ලෙස පැන නැගී තිබේ.[388] මීට අදාළ ව පෙත්සම්කරුවන් තිදෙනෙකු විසින් (HCT/Writ/650/20) යනුවෙන් රිට් අයදුම්පතක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සහ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට එරෙහි ව නැගෙනහිර පළාත් පළාත්බද මහාධිකරණය ඉදිරියේ ගොනු කර තිබුණි. එසේ ම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සහ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට එරෙහි ව පෙත්සම්කරුවන් 17 දෙනෙකු විසින් නැගෙනහිර පළාත් පළාත්බද මහාධිකරණයට තවත් රිට් අයදුම්පතක් (HCT/Writ/649/20) ගොනු කරන ලදි. මෙකී නඩු දෙකම නිෂ්ප්‍රභා විය.[389]

මේ අනුව, මෙම බලපෑමට ලක් වූ ප්‍රජාවන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙයි. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තර්ජන සහ හිරිහැර කිරීම්වලට මුහුණ දීම ද මෙයට ඇතුළත් වේ.[390] මීට අමතරව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් තෙන්නමරාවාඩියේ (කොඩ්ඩඩියන් කන්දසාමි මලෛ) අක්කර 200ක භූමි භාගයක් පුරාවිද්‍යා භූමියක් ලෙස නම් කර ඇති අතර, මෙම ඉඩම පවුල් 4කට අයත් ව පැවති පෞද්ගලික

---

<https://globaltamilnews.net/english/ancient-murugan-temple-in-thennamaravadi-has-also-been-appropriated-by-the-archaeological-department-reporter-for-global-tamil-news/> 2024 අප්‍රේල් 23.

380 2013 අගෝස්තු 16 දිනැති අංක 1823/73 දරන ගැසට් පත්‍රය.

381 AHRC (n 376).

382 'Sinhalisation of North-East: 358 acres of land from Panikkanvayal to Thennamaravadi confiscated' *Tamil Guardian* (14 October 2020) <https://www.tamilguardian.com/content/sinhalisation-north-east-358-acres-land-panikkanvayal-thennamaravadi-confiscated> ප්‍රවේශය 2024 අප්‍රේල් 24.

383 'Trinco's Thennamaravadi residents face land, housing issues' *The Morning* (27 June 2022) <https://www.themorning.lk/articles/208685> ප්‍රවේශය 2024 අප්‍රේල් 27.

384 ප්‍රාදේශීය ප්‍රජාව සමඟ CPA සම්මුඛ සාකච්ඡාව (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, 2024 මැයි 2).

385 AHRC (n 376).

386 *The Morning* (n 384).

387 '12 Years Later: The War-Affected in the East Struggle On Without Land and Housing' *Groundviews* (15 April 2021) <https://groundviews.org/2021/04/15/12-years-later-the-war-affected-in-the-east-struggle-on-without-land-and-housing/> ප්‍රවේශය 2024 අප්‍රේල් 27.

388 CPA සම්මුඛ සාකච්ඡාව (n 385).

389 නඩු අංක .HCT/Writ/650/20 and No.HCT/Writ/649/20.

390 AHRC (n 376).

ඉඩමක් ද වේ.[391] තෙන්නමරාවාඩි ප්‍රදේශයේ තවත් අක්කර 125ක ඉඩම් ප්‍රමාණයක් නීතිමය ආරවුලකට ලක් ව ඇති අතර, එහි දී දෙමළ ජාතිකයන් සතුව තිබූ ඓතිහාසික ඉඩම් යළි පවරා ගැනීම සඳහා පුද්ගලයින් 24 දෙනෙකු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට එරෙහි ව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේ.[392] මෙම සටහන ලියන අවස්ථාව වන විට, මෙම නීතිමය ක්‍රියාදාමයන් බොහොමයක් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, දෙමළ ගොවීන්ට ආපසු ලබා දී ඇත්තේ ඉඩම් අතුරින් කොටසක් පමණි.[393]

## 2.8. වවුනියාව දිස්ත්‍රික්කය

### 2.8.1. ආණ්ඩිය පුලියන්කුලම

වවුනියාව වෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති ආණ්ඩිය පුලියන්කුලම, යුද්ධයෙන් අනතුරුව යුද හමුදාව රැඳී සිටීම හේතුවෙන් මතභේදයට තුඩු දුන් කෘෂිකාර්මික ඉඩම් අක්කර 160කින් සමන්විත වේ.[394] හමුදාව විසින් මෙම කෘෂිකාර්මික ඉඩම අත්පත් කර ගෙන, ඒ මත කඳවුරු ගණනාවක් ක්‍රියාත්මක කර ඇත.[395] ක්‍රීඩා පිටියක්, පාසලක් සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් වැනි ප්‍රජා පහසුකම් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නම් කරන ලද අක්කර 12ක කොටසකට ද හමුදාව විසින් හිමිකම් කියන අතර ඔවුන් එය සිය භාවිතය සඳහා සලකුණු කර ඇත.[396] 2014 දී ප්‍රදේශයේ දෙමළ ජනතාවගේ විරෝධය නොතකා, එහි මුල් අයිතිකරුවන්ට ඉඩම ආපසු ලබා නොදී හමුදා පාලනය යටතේ තබාගෙන ඇත. මුල් හිමිකරුවන්ට නීතිමය ලියකියවිලි නොමැතිවීම, ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාවන්ට දැනට පවතින ආරවුල් මධ්‍යයේ ඉඩම පවරා ගැනීමට ඉඩ සලසන අතර, එය මෙම ගැටලුවේ සංකීර්ණත්වය වර්ධනය වීමට හේතු වී තිබේ.[397] මෙම තත්ත්වය ආඩිය පුලියන්කුලම් ඉඩමේ අයිතිය සහ පරිහරණය සම්බන්ධයෙන් පවතින අභියෝග සහ නොවිසඳුණු ගැටලු ඉස්මතු කරයි. වෙට්ටිකුලම් ප්‍රදේශයේ රජයේ නිලධාරීන් සහ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂකයන් අතර පැවති සාකච්ඡාවක දී මතභේදයට තුඩු දී ඇති ඉඩම් බොහොමයක් රජයට අයත් බව රජයේ නිලධාරියෙක් ප්‍රකාශ කරන ලදි.[398]

### 2.8.2. කර්කුලම් විෂ්ණු කෝවිල

කර්කුලම් විෂ්ණු කෝවිල වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පරිපාලන බල ප්‍රදේශයට අයත් ආසිකුලම් ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇත. දහම්පාසලක් සහිත වවුනියාවේ කන්දක් මත පිහිටි කර්කුලම් විෂ්ණු කෝවිල [399] හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ 2001 සැප්තැම්බර් 13 වැනි දින නිල වශයෙන් ලියාපදිංචි කරන ලදි.[400] වසර ගණනාවක් පුරා ප්‍රදේශයේ

[391] මෙම ඉඩම පොන්නයියා කනගසබායි (2A), කනගසබයි තුරෛයාපා (2A), නාගප්පර් සින්නයියා (2A) සහ සෙල්ලයියා නවසිවායන් (2A) යන අයට පෞද්ගලික ව අයත් විය.

[392] AHRC (n 376).

[393] ඉහත පාද සටහන.

[394] Seelan, 'Vavuniya Andiapuliankulam People Protest Against Army' *Senbagama* (7 December 2014) <https://senpakam.org/%E0%AE%B5%E0%AE%B5%E0%AF%81%E0%AE%A9%E0%AE%BF%E0%AE%AF%E0%AE%BE-%E0%AE%86%E0%AE%A3%E0%AF%8D%E0%AE%9F%E0%AE%BF%E0%AE%AF%E0%AE%BE%E0%AE%AA%E0%AF%81%E0%AE%B3%E0%AE%BF%E0%AE%AF%E0%AE%99%E0%AF%8D%E0%AE%95/> ප්‍රවේශය 2024 අප්‍රේල් 30.

[395] රජයේ නිලධාරියෙකු සමග CPA සම්මුඛ සාකච්ඡාව (වවුනියා දිස්ත්‍රික්කය, 2024 අප්‍රේල් 10).

[396] ප්‍රාදේශීය ප්‍රජාව සමඟ CPA සම්මුඛ සාකච්ඡාව (වවුනියා දිස්ත්‍රික්කය, 2024 අප්‍රේල් 10).

[397] ඉහත පාද සටහන.

[398] CPA සම්මුඛ සාකච්ඡාව (n 396).

[399] Sunday School Registration No.HA/7/56/08/36.

[400] ලියාපදිංචි අංක. HA/5/VA/217 È දිනය 2001 සැප්තැම්බර් 13.

ජනතාව තම චාරිත්‍ර වාරිත්‍ර ක්‍රියාත්මක කරමින් සිටි බැවින් එම කන්දේ විෂ්ණු කෝවිලක් ඉදි කිරීමට ප්‍රජාව සැලසුම් කර තිබුණි.[401]

සිංහල ජාතිකයකු ඉඩමට ඇතුළු වී කන්ද අසල ගල් කොරියක් ආරම්භ කිරීමත් සමඟ මෙම ක්‍රියාදාමයට බාධා එල්ල වී තිබේ.[402] 2020 දී කඳු පාමුල පුරාවිද්‍යා පුවරුවක් ස්ථාපනය කිරීමට ඔහුගේ පැමිණීම හේතු වූ බවට ජනතාව සැක පළ කරති.[403] කන්දේ හින්දු කෝවිලක් ඉදි කරන ලෙස ප්‍රජාව විසින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට සිදු කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිය නිලධාරීන් යවා ඉඩම පරීක්ෂා කරන ලදි.[404] මෙම ප්‍රදේශය පුරාවිද්‍යාත්මක වැදගත්කමක් උසුලන බව තීරණය කරන ලද අතර, එහි ඓතිහාසික වැදගත්කම හේතුවෙන් එම ඉඩමේ සිදු වන ඕනෑම ඉදිකිරීමකට එරෙහි ව උපදෙස් දීමට දෙපාර්තමේන්තුව, පොළඹවනු ලැබිණි.[405]

ජනතාව වෙනුවෙන් කෝවිල ඉදි කර දෙන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2022 වසරේ දී ඉල්ලීමක් කළ නමුත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් එය ප්‍රතික්ෂේප කර තිබේ.[406] එහි ප්‍රතිඵලයක් වශයෙන්, ප්‍රජාව විසින් කෝවිල සඳහා තවත් තාවකාලික ඉඩමක්, එනම් කන්දක් සහ යාබද ඉඩමක් සොයා ගත් අතර, එහි දී ග්‍රාම සංවර්ධන සමිතිය (ආර්.ඩී.එස්.) පවුල් හතකට ඉඩම් කැබලි ලබා දී ඇත.[407] මෙම විකල්ප ඉඩම්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බල ප්‍රදේශයට අයත් වන නමුත් දැනට එම ප්‍රදේශයේ නව සංවර්ධන කටයුතු සීමා කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටින අතර එම ඉඩම්වලින් ඉවත් වන ලෙස එම පවුල් වෙතින් ඉල්ලා ඇත.[408] මෙම ඉඩම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් වන්නේ ද [409] නැතහොත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වන්නේ ද [410] යන්න තීරණය කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් තොරතුරු දැනගැනීමේ අයදුම්පතක් ගොනු කිරීමට කටයුතු කරන ලදි. 2024 ජූලි මස දී යොමු කරන ලද තොරතුරු දැනගැනීමේ අයදුම්පතට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (යොමු අංක.ARCH/NP/VA/PRO/01/2024) මගින් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (යොමු අංක.RTI/30/2024) මගින් අදාළ ප්‍රදේශය තවමත් 'පුරාවිද්‍යා ස්ථානයක්' හෝ 'වන රක්ෂිතයක්' ලෙස ප්‍රකාශයට පත් කර නොමැති බවට හෙළිදරව් කරන ලදි.

### 2.8.3. වෙඩුක්කුනාරි ආති ලිංගේශ්වරර් කෝවිල



Image Source: CPA Field Visit

වෙඩුක්කුනාරි ආති ලිංගේශ්වරර් කෝවිල පිහිටා ඇත්තේ වවුනියාව දිස්ත්‍රික්කයේ නෙඩුන්කේනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි නයිනයමඩු රක්ෂිතය තුළ ය. වෙඩුක්කුනාරි ආති ලිංගේශ්වරර් කෝවිල නමින් හැඳින්වෙන ස්වයං-සිද්ධ ලිංගයකින් සරසා ඇති පුරාණ ශිවන් කෝවිලක් වෙඩුක්කුනාරි කඳු පාමුල පිහිටා ඇත.[411] වර්තමානය වන විට, කෝවිල පුරා නාග නමස්කාරය පිළිබිඹු කරන සංකේත දක්නට

401 CPA සම්මුඛ සාකච්ඡාව (n 397).
402 ඉහත පාද සටහන .
403 ඉහත පාද සටහන .
404 ඉහත පාද සටහන .
405 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නිකුත් කළ 2022 ඔක්තෝබර් 26 දිනැති ලිපිය..
406 වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට 2022 සැප්තැම්බර් 22 දිනැති ඉල්ලීම් ලිපිය.
407 CPA සම්මුඛ සාකච්ඡාව (n 397).
408 CPA සම්මුඛ සාකච්ඡාව (n 397).
409 RTI ලියාපදිංචි අංක ARCH/INFO/252. ( 2024 ජුනි 04)
410 RTI ලියාපදිංචි අංක RTI/30/2024. (2024 ජූලි 23)
411 'Vedukkunari Hill' *Valvettithurai.Org* (29 March 2023) <https://www.valvettithurai.org/an-article-about-vedukku-nari-malai-sivan-temple-13854.html> ප්‍රවේශය 2024 අප්‍රේල් 30.

ලැබෙන අතර, එමගින් එහි පොහොසත් ඓතිහාසික සම්බන්ධතා අවධාරණය කරයි.[412]

පරම්පරා පහක පමණ කාලයක සිට ප්‍රදේශවාසී ජනතාව මෙම විහාරස්ථානය වන්දනා මාන කරති.[413] ප්‍රදේශ වාසියෙක් මෙන් ම කෝවිල් භාරකාර මණ්ඩලයේ සාමාජිකයෙක් ද වන පූපාලසිංහම් මහතා සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදු කළ සම්මුඛ සාකච්ඡාවක දී ඔහු පැහැදිලි කළේ තම පවුලේ අය පරම්පරා ගණනාවක් තිස්සේ මෙම කෝවිලට පැමිණෙන බවත්, ඔවුන් ගස් මුල්වල එල්ලීමෙන් කඳු මුදුනට නැගුණු බවත් ය.[414] කෙසේ වෙතත්, 'වඩ්ඩමාන පබ්බතය විහාරය' හෝ 'වද්දුනාගල විහාරය' යන නාමයෙන් මෙම විහාරය බුදු දහමට අයත් බව බෞද්ධයන්ගේ විශ්වාසය වී තිබේ.[415] එහි ප්‍රතිඵලයක් ලෙස හා ප්‍රශ්නකාරී ලෙස මෙම ඉඩම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නැවත හඳුනා ගැනීම හේතුවෙන් කෝවිල 'පුරාවිද්‍යා ස්මාරකයක්' ලෙස ගැසට් මගින් ප්‍රකාශ කිරීමට කටයුතු කරන ලදී.[416]

2018 අගෝස්තු 8 වන දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වඩ්ඩමාන පබ්බත විහාරයේ (වෙඩුක්කුනාරි කෝවිල ලෙස ද හැඳින්වේ) ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී. ඓතිහාසික සාක්ෂි මත පදනම් ව, ඔවුන් ශ්‍රී ලංකා හමුදාවේ සහාය ඇති ව වඩ්ඩමාන පබ්බත භූමිය ගවේෂණය කළ අතර හින්දු ආගමික ස්මාරකවල හෝඩුවාවක් නොමැති බවත්, බෞද්ධ ආරාම නටබුන් පමණක් ඇති බවටත් නිරීක්ෂණය කළහ.[417] අනතුරුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂකවරයා විසින් කෝවිලේ ඉදිකිරීම් නවතා දමන ලෙස මහජනතාවට දැනුම් දුන් අතර ඒ පිළිබඳ ව වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වාර්තා කර නැදුන්කේනි පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට ද කටයුතු කරන ලදී.[418] පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රකාශ කළේ වෙඩුක්කුනාරි මලය කන්ද සිය පාලනය යටතේ පවතින බවත් ප්‍රදේශවාසීන්ට එම ප්‍රදේශයට ඇතුළු වීම තහනම් කර ඇති බවත් ය.[419] පන්සල් භූමිය ඇතුළු ව එම ස්ථානයට පිවිසීමට උත්සාහ කරන ඕනෑම අයෙකු අත්අඩංගුවට ගැනීමට සිදු වන බව ද නිලධාරීහු දන්වා සිටියහ.[420]

2018 අගෝස්තු 10 වන දින අධ්‍යාපන, සංස්කෘතික කටයුතු සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් විහාරස්ථානයට මාර්ගයක් ඉදි කිරීම සඳහා රුපියල් ලක්ෂ 4ක් වෙන් කරන ලදී.[421] කෙසේ වෙතත්, කෝවිල් භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් පුරාවස්තු ආඥාපනතට පටහැනි ව ක්‍රියා කර ඇති බවට වන චෝදනාව මත වවුනියාව දිසා අධිකරණයේ අංක බී/2084/19 නඩුව ගොනු කරන ලදී (මෙම ආඥාපනත, මෙම වාර්තාවේ 3.1 පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පදනම වේ). 2019 සැප්තැම්බර් 4 වන දින වෙඩුක්කුනාරි කන්දේ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති

---

412 CPA සම්මුඛ සාකච්ඡාව (n 397), වෙඩුක්කුනාරි කන්ද වන්දනා කිරීමට පැමිණෙන විට, කඳු පාමුල තැන්පත් කර ඇති පිල්ලෙයාර්, මුරුගන්, නාග, වයිරවර් සහ නාටාර් වැනි දේව ප්‍රතිමා දැකිය හැකි බව සොයා ගන්නා ලදී. යමෙකු කඳු මුදුනට නැගෙන විට, ආදි ලිංගේශ්වරර් ලෙස හඳුන්වන ශිවලිංගයක් ද, දෙවඟනක් වැනි පිළිම හා ආදි ලිංගේශ්වරර් නියෝජනය කරන ලිංගයක ස්වරූපයට සමාන සැලකිය යුතු සිරස් ගල් ව්‍යුහයක් ද ඇත.

413 ප්‍රාදේශීය ප්‍රජාව සමඟ පවත්වන ලද CPA සම්මුඛ පරීක්ෂණය (වවුනියා දිස්ත්‍රික්කය, 2023 ජූලි 24).

414 ඉහත පාද සටහන.

415 CPA සම්මුඛ සාකච්ඡාව (n 397).

416 Ama Vanniarachy, 'Vidunnagala Pabbatha Vihara Vandalized' *Ceylon Today* (30 January 2023) <https://uploads.ceylontoday.lk/epapers/files/CT-30-01-2023-CT.pdf> m%fõYh 2024 uehs 30'

417 නඩු අංකය .SCFR133/2023.


418 පැමිණිලි අංකය .MOB/12/18.

419 'Sri Lanka's Archaeology Department Takes Over Tamil Temple Lands in Vavuniya' *Tamil Guardian* (12 August 2018) <https://www.tamilguardian.com/content/sri-lanka%E2%80%99s-archaeology-department-takes-over-tamil-temple-lands-vavuniya> ප්‍රවේශය 2024 ජුනි 2.

420 ඉහත පාද සටහන .

421 2018 අගෝස්තු 10 දිනැති යොමු අංකය.V/DPS/DCC/F.U.

ඉණිමඟක් ඉවත් කර යකඩ පඩිපෙළක් පිහිටුවා ඇති බවට දැක්වෙන අතර, එය පහත සිදුවීම් සඳහා හේතු විය.[422]




2020 සැප්තැම්බර් 17 සිට සැප්තැම්බර් 27 දක්වා කාලය තුළ ලෙන් පිහිටි ගල් සැලැස්මට ගිනි තබා හානි කිරීම සහ පුරාණ ස්මාරකවලට බරපතළ හානි සිදු කළ බවට චෝදනා කරමින් නෙඩුන්කේනි පොලිසිය කෝවිල් භාරකාර මණ්ඩලයට එරෙහි ව නඩු පවරන ලදි.[423] මෙම නඩුව නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඇත.

2023 මාර්තු 26 වන දින, අදිගෘහිත ශිව දේව ප්‍රතිමාව ඇතුළු වෙඩුක්කුනාරි ආති ලිංගේශ්වරර් කෝවිල තුළ තිබූ පිළිම කඩා බිඳ ඒවා ඉවත දැමීමේ සිදුවීමක් මූලස්ථානයට වාර්තා විය.[424] කෝවිලේ ප්‍රධාන දෙවියන් වන ආතිලිංගම් පිළිරුව අමානුෂික ලෙස උදුරා දමා යාබද බස් රථයකට විසි කර තිබිණි.[425] මීට අමතරව, පිල්ලෙයාර්, අම්මාන් සහ වයිරවර් ඇතුළු අනෙකුත් පූජනීය පිළිම ද අතුරුදහන් වී ඇති බවට වාර්තා විය.[426] මෙයට ප්‍රතිචාර වශයෙන්, 2023 මාර්තු 27 වන දින, ආති ලිංගේෂ්වරර් කෝවිල කඩා බිඳ දැමීම සම්බන්ධයෙන් සාධාරණයක් ඉල්ලා කෝවිල් භාරකාර සංගමය මානව හිමිකම් කොමිසන් සභාවේ වවුනියාව කාර්යාලය වෙත විධිමත් පැමිණිල්ලක් ගොනු කරන ලදි.[427]

පසුව පසුගිය මාර්තු මාසයේ දී ආති ලිංගේෂ්වරර් කෝවිලෙහි ගඩොලින් ඉදි කළ කුළුණක් විනාශ කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ සඳහා නෙඩුන්කේනි පොලිසිය විසින් පූජකවරයා සහ විහාරස්ථානයේ සාමාජිකයින් කැඳවීමට කටයුතු කරන ලදි.[428] පසුව ඔවුන් අත්අඩංගුවට ගෙන වවුනියාව මහේස්ත්‍රාත් අධිකරණය වෙත රැගෙන ගිය අතර එහි දී විනිසුරුවරයා ඔවුන් ඇප මත මුදා හැරීමට කටයුතු කරන ලදි.[429] එහි දී මීට පෙර මාධ්‍යවල පළ වූ කරුණුවලට පටහැනිව යමින් කෝවිලේ පූජාවන් සහ බැතිමතුන් සඳහා ආරක්ෂාව සැපයීම පොලිසිය විසින් සිදු කළ යුතු වුව ද, කෝවිල ප්‍රතිසංස්කරණය හෝ වෙනස් කිරීමට කටයුතු නොකළ යුතු බව විනිසුරුවරයා පැහැදිලි කළේ ය.[430]

---

422 CPA සම්මුඛ සාකච්ඡාව (n 414).
423 ඉහත පාද සටහන .
424 'Vedukkunari Malai Idols Subjected to Demolition' *Virakesari* (26 March 2023) <https://www.virakesari.lk/article/151432> ප්‍රවේශය 2024 ජුනි 10.
425 Shritharan (n 77).
426 ඉහත පාද සටහන .
427 පැමිණිලි අංක .HRC/VAV/61/2023.
428 නඩු අංක .B/630/23.
429 ඉහත පාද සටහන .
430 'Athi Lingeswaran Temple Priest and Member Released on Bail Following Arrest by Sri Lankan Police' *Tamil Guardian* (11 May 2023) <https://www.tamilguardian.com/content/athi-lingeswaran-temple-priest-and-member-released-bail-following-arrest-sri-lankan-police> ප්‍රවේශය 2024 ජුනි 11.



2024 පෙබරවාරි 11 වැනි දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ හමුදාව කැටුව භික්ෂූන් වහන්සේලා පිරිසක් වෙඩුක්කුනාරි ආති ශිවන් කෝවිලට වැඩම කළහ2024 පෙබරවාරි 11 වැනි දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ හමුදාව කැටුව භික්ෂූන් වහන්සේලා පිරිසක් වෙඩුක්කුනාරි ආති ශිවන් කෝවිලට වැඩම කළහ.[431] ප්‍රශ්නකාරී ලෙස, මෙම විහාරස්ථානය පිහිටි ප්‍රදේශය තමන්ට අයත් බවට භික්ෂූන් වහන්සේලා ප්‍රකාශ කළ නමුත් තම මුතුන් මිත්තන් මෙම ස්ථානයට වන්දනාමාන කළ බව පවසමින් විහාරාධිකාරිය විසින් එය ප්‍රතික්ෂේප කළහ..

*Image Source: Tamil Guardian*

2024 මාර්තු 8 වන දින, වෙඩුක්කුනාරි හිල් ආති ශිවන් කෝවිලේ ශිව-රාත්‍රී උත්සවය පොලිස් ප්‍රචණ්ඩත්වය හේතුවෙන් කඩාකප්පල් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වන්දනාකරුවන් 8 දෙනෙකු අත්අඩංගුවට ගනු ලැබිණි.[432] මෙම ශිව-රාත්‍රිය ආශ්‍රිත බාධාකාරී සිදුවීම, උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවල නොයෙකුත් විරෝධතා ඇති වීමට හේතු විය. ඒ අනුව, එම ක්‍රියාවන් හෙළාදකිමින් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සුළු ජාතික ආගමික ස්ථානවලට වෙනස් කොට සැලකීමේ මැදිහත්වීම් නතර කරන ලෙස හියුමන් රයිට්ස් වොච් විසින් ඉල්ලා සිටීම වැනි දෑ මෙයට ඇතුළත් විය.[433] ශිව-රාත්‍රී දිනයේ දී අත්අඩංගුවට ගත් දෙමළ ජාතිකයන් 8 දෙනා අධිකරණය විසින් පසුව නිදහස් කරන ලදි.[434]

විවිධ රාජ්‍ය ක්‍රියාකාරීන් සහ ජනවාර්ගිකවාදීන් ආගමික නිදහස උල්ලංඝනය කිරීමට මැදිහත් වන ආකාරය මෙම සිද්ධියෙන් පෙන්නුම් කෙරේ. වාර්තාව ලියන අවස්ථාව වන විට වෙඩුක්කුනාරි ආති ශිවන් කෝවිල ආශ්‍රිත ආරවුල් දිගටම පවතී.

## නිගමනය

සමස්තයක් වශයෙන්, දිස්ත්‍රික්ක 8න් ම වාර්තා වන සිදුවීම් මගින් ඉඩම් අයිතිය, භාවිතය සහ පාලනය කෙරෙහි බලපෑම් කිරීමට භාවිතා කරන බහුවිධ ක්‍රමවේදයන් පිළිබඳ පෙන්නුම් කෙරේ. මෙම ඉඩම් අත්පත් කර ගැනීම් මගින් බලපෑමට ලක් වූ ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ විසම්මුතිය රජයට සහ අනෙකුත් ආයතනවලට රිසි සේ ක්‍රියා කිරීමට බාධාවක් වී ඇතත්, විවිධ උපක්‍රම භාවිතා කරමින් ඉඩම් අත්පත් කර ගැනීමට රජයට සහ අනෙකුත් ක්‍රියාකාරීන්ට හැකි බව පැහැදිලි ය. විපතට පත් ප්‍රජාවන් නීතිමය පිළිසරණ පැතූ නමුත්, දේපල අය කර ගැනීමේ දී කලාතුරකින් සාර්ථක වුව ද, බොහෝ දුරට විසඳුමක් නොමැති ව, විශේෂයෙන් ම රජයේ දෙපාර්තමේන්තු ඉඩම් පවරා ගැනීම සඳහා සක්‍රීයව සහභාගී වී

[431] 'Vedukunarimalai - A Group Including a Buddhist Monk Entered the Adi Lingeswarar Temple Area with Sandals' *Tamil Win* (6 February 2024) <https://tamilwin.com/article/buddhist-suddenly-entered-vedukunarimalai-temple-1707642656> ප්‍රවේශය 2024 ජුනි 12.

[432] 'Sri Lankan Police Unleash Violence in Vedukkunaari During Shivaratri; MP Assaulted; 8 Tamils' *Tamil Guardian* (8 March 2024) <https://www.tamilguardian.com/content/sri-lankan-police-unleash-violence-vedukkunaari-during-shivarathri-mp-assaulted-8-tamils> ප්‍රවේශය 2024 ජුනි 13.

[433] 'Human Rights Watch Calls on Sri Lanka to End Discriminatory Interference' *Tamil Guardian* (20 March 2024) <https://www.tamilguardian.com/content/human-rights-watch-calls-sri-lanka-end-discriminatory-interference> ප්‍රවේශය 2024 ජුනි 13.

[434] 'Complaint lodged at Human Rights Commission over Vedukkunaari arrests' *Tamil Guardian* (2 April 2024) <https://www.tamilguardian.com/content/complaint-lodged-human-rights-commission-over-vedukkunaari-arrests> ප්‍රවේශය 2024 ජුනි 13.

ඇත. එවිට ප්‍රධාන ම ප්‍රශ්නය වන්නේ 'අත්තනෝමතික ලෙස ඉඩම් පවරා ගැනීමට රජයේ බලධාරීන්ට බලය ලබා දෙන නීති මොනවා ද?' යන්න යි. මෙම ප්‍රශ්නය සහ අනෙකුත් ප්‍රශ්න මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ විවේචනාත්මක ව තක්සේරු කර ඇත.

# 3. බණ්ඩනය වූ සහ දෝෂ සහිත රාජ්‍ය ව්‍යුහය

ශ්‍රී ලංකා රාජ්‍යයේ පශ්චාත් යටත් විජිත දැක්ම දේශපාලන ආරක්ෂාව, රාජ්‍ය බලය පාලනය කිරීම සහ වාර්ගික සුළුතරයන්ගෙන් ඇති වන තර්ජන තුරන් කිරීම සඳහා ප්‍රමුඛත්වය දුන් අතර, පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාවේ වාර්ගිකවාදී ස්වභාවය ආමන්ත්‍රණය කිරීම උදෙසා උතුරු හා නැගෙනහිර අන්තවාදී අනුගාමිකයින් කලාපීය ස්වයං පාලනයක් අපේක්ෂා කළහ.[435] මෙම සන්දර්භය තුළ, ඉඩම් ගැටුම් සම්බන්ධ ව, රජයේ කාර්යභාරය නිසි පරිදි ඉෂ්ට කිරීම පිණිස ගැටුම් අවම කිරීම සහ උත්සන්න කිරීම අතර සියුම් සමතුලිතතාවයක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. අවාසනාවකට මෙන්, රාජ්‍ය ව්‍යුහයන් බොහෝ විට ඉඩම් ගැටුම් ස්ථිර කිරීම සඳහා උපක්‍රමශීලී ව සහ ක්‍රියාකාරී ව යොදා ගෙන ඇති බව වර්තමාන පර්යේෂණ තුළින් දක්නට ලැබෙන්නකි. මෙය ඉඩම් හිමිකම, ප්‍රවේශය සහ පාලනය පිළිබඳ ගැටලු උග්‍ර කරනවා පමණක් නොව සමාජ සහජීවනය සහ ප්‍රතිසන්ධානය සඳහා වන ප්‍රයත්නයන් ද අඩපණ කරයි. හමුදාවේ සහ විවිධ රජයේ දෙපාර්තමේන්තුවල සහාය ඇති ව, රාජ්‍යය විසින් ලාභ ඉපයීම යන දෙවන පෙළ අරමුණ ඉදිරියට ගෙන යන අතර ම, තරඟකාරී ඉතිහාසයන් සහිත ඉඩම් 'ප්‍රතිසාධනය' කිරීම සඳහා වාර්ගික න්‍යාය පත්‍ර මගින් මෙහෙයවන ක්‍රියාදාමයන් වේගවත් කිරීමට කටයුතු කරන බව ඒ අනුව කිව හැකි ය.

පවතින රාජ්‍ය ව්‍යුහයන් මගින් ඉඩම් ආශ්‍රිත තත්කාලීන අර්බුද පවත්වාගෙන යාමට හේතු වන ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීම මෙම පරිච්ඡේදයේ මූලික අරමුණ ලෙස පෙන්වා දිය හැකි ය. ඒ උදෙසා, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි මධ්‍යම රජයේ විවිධ පාර්ශවකාර ආයතනවලට ඉඩම් සම්බන්ධ ව බලය දෙනු ලබන තත්කාලීන නීතිමය ව්‍යුහයන් සහ නෛතික ප්‍රතිපාදන පිළිබඳ මෙම පරිච්ඡේදයෙන් ප්‍රථමයෙන් විශ්ලේෂණය කෙරේ. ඉන් අනතුරුව, ශ්‍රී ලංකාවේ වත්මන් රජය විසින් ක්‍රියාත්මක කරන නවතම ඉඩම් අන්සතු කිරීමේ යෝජනා ක්‍රමය, එනම් ඉඩම් හිමිකම සඳහා විවිධ ප්‍රතිවිපාක සහ නව ගැටුම් ඇති විය හැකි 'උරුමය වැඩසටහන' පිළිබඳ ව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පාර්ශවයෙන් කෙටි අදහස් දැක්වීමක් සිදු කරනු ඇත. අවසාන වශයෙන්, මෙම පරිච්ඡේදයෙන් ඉඩම් සම්බන්ධ පළාත් සභා සතු බලතල පිළිබඳ කෙටි විග්‍රහයක් සිදු කරනු ඇත.

## 3.1. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

පර්යේෂණ මගින් හඳුනා ගත් පරිදි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව උරුමයන් සුරැකීමේ මුවාවෙන් ඉඩම් පවරා ගැනීම් සඳහා පහසුකම් සලසා ඇති අතර, බොහෝ විට ඉතිහාසයේ තෝරා ගත් අනුවාදයක් හරහා දේශපාලන ආඛ්‍යාන ඉදිරියට ගෙන යාමට කටයුතු කර තිබේ. පුරාවිද්‍යා ගවේෂණ සහ ස්මාරක සංරක්ෂණ ව්‍යාපෘති වැඩි වැඩියෙන් සමාජ ධූරාවලිය ශක්තිමත් කිරීමටත්, බහුතරය බලගැන්වීමටත්, සුළු ජාතීන් තව දුරටත් කොන් කිරීමටත් උපයෝගී වන මෙවලම් බවට පත් ව ඇත. උරුමයන් 'ප්‍රතිසාධනය' සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රවේශය උතුරු හා නැගෙනහිර ප්‍රජාවන් බල රහිත කිරීමට අඛණ්ඩ ව හේතු වී තිබේ. මුලතිව් හි ප්‍රාදේශීය දෙමළ හින්දු සිද්ධස්ථානයක් වන කුරුන්තූමලෙ ආති අයියනාර් කෝවිල (පරිච්ඡේදය 2.6.1 බලන්න). මතභේදාත්මක පුරාවිද්‍යා කැණීම් සහ ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් මධ්‍යයේ විවිධ ප්‍රජාවන් එය ඔවුන්ගේ උරුමයේ කොටසක් ලෙස ප්‍රකාශ කිරීමත් සමඟ මෙම පුරාවිද්‍යා භූමි වාර්ගික හා ජන කණ්ඩායම් අතර ආතතීන් හි පිළිබිඹුවක් බවට පත් ව ඇත.

[435] Jayadeva Uyangoda, 'Ethnic Conflict in Sri Lanka: Changing Dynamics' (2007) Policy Studies 32 East-West Center Washington <https://www.files.ethz.ch/isn/35338/PS032.pdf> ප්‍රවේශය 2024 මැයි 20.

මධ්‍යම රජය සහ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඇතුළු බහුවිධ ක්‍රියාකාරීන්ගේ මැදිහත් වීම, තත්ත්වයේ සංකීර්ණත්වය තව දුරටත් උත්සන්න කිරීමට හේතු වී තිබේ.

දෙපාර්තමේන්තුව ආරම්භයේ සිට ම ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමයන් හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම, වැඩිදියුණු කිරීම සහ පුරාවස්තු පනත ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.[436] පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව අතර සම්බන්ධීකරණය ද මෙයට ඇතුළත් වේ.[437] පුරාවස්තු පනතට අනුව කිසියම් හඳුනා නොගත් ඉඩමකින් සොයා ගන්නා ලද සියලු ම පුරාවස්තු සහ පුරාණ ස්මාරක, සොයා ගත් තැනැත්තාට හෝ ඉඩම් හිමියාට වන්දි ගෙවීමේ ප්‍රතිපාදනවලට යටත් ව, රජයේ පරම දේපළ ලෙස උපකල්පනය කරයි.[438] කෙසේ වෙතත්, රාජ්‍ය වෙනුවෙන් පුරාවස්තූන් හි භාරකාරත්වය දරන පුරාවිද්‍යා කොමසාරිස්වරයා සමඟ ආරවුල් ඇති වනු බහුල ව දක්නට ලැබේ. එපමණක් නොව, වෙනත් අයෙකුගේ ඉඩමක් කැණීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට පනත මගින් පහසුකම් සලසා තිබීම බැරෑරුම් ලෙස සැලකිය යුතු කරුණකි. කැණීම්වල දී සිදු වන යම් අලාභයක් හෝ හානියක් සම්බන්ධයෙන් රජය වගකීමෙන් නිදහස් වන අතර, කැණීම් සම්බන්ධ ව තීරණ ගැනීමේ බලය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ වගකීමට යටත් කර, බලපෑමට ලක් වූ පුද්ගලයින් සඳහා සීමිත සහන ලබා දිය හැකි ප්‍රතිපාදන සලස්වා තිබේ.[439] මෙය ජනවාර්ගික පක්ෂග්‍රාහීත්වය විසින් අභිප්‍රේරණය කරන ලද ඉඩම් අත්පත් කර ගැනීම්වලට තුඩු දිය හැකි අසමාන බල ගතිකත්වයන් පිළිබඳ භීතිය මෙන් ම හැඟීමක් ද ජන මනස තුළ ඇති කිරීමට හේතු විය හැකි ය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද සම්මුඛ සාකච්ඡාවන් මගින් හෙළි වූ පරිදි දෙපාර්තමේන්තුව ඉඩම් අත්පත් කර ගැනීම එහි ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක වැදගත්කම මත පමණක් පදනම් වන අතර, විශේෂයෙන් පන්සල්, මුස්ලිම් පල්ලි සහ බෞද්ධ විහාරස්ථාන ඇතුළු රජයේ සහ පෞද්ගලික ඉඩම් දෙකෙහි ම දක්නට ලැබෙන පුරාණ ස්මාරකවලට අදාළ වේ.[440] පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය කිරීමේ වැදගත්කමට සාපේක්ෂව ඉඩමේ අයිතියට හිමි වනුයේ ද්විතීයික වැදගත්කමකි. නීතිය යටතේ, දෙපාර්තමේන්තුවට ස්මාරක සහිත ඉඩමක් අත්පත් කර ගත හැකි අතර, ඇතැම් අවස්ථාවල දී මීටර් 400ක ආරක්ෂිත කලාපයක් බලාත්මක කළ හැකි ය. එමෙන් ම ස්මාරක සහිත පුද්ගලික ඉඩමක් ද අත්පත් කර ගත හැකි අතර, බලපෑමට ලක් නොවන ප්‍රදේශ රඳවා තබා ගැනීමට ඉඩම් හිමියන්ට ඉඩ සලසන අතර ම වන්දි ගෙවීම සහතික කෙරේ. යාන් ඔය වැනි ව්‍යාපෘතිවල දී පුරාවිද්‍යා ස්ථාන 20ත් 30ත් අතර ප්‍රමාණයක් රජයේ ඉඩම්වල කළමනාකරණය කරන ලද අතර, විපතට පත් පුද්ගලයින් හට විකල්ප නවාතැන් සඳහා ප්‍රතිපාදන ලබා දී වෙනත් ස්ථාන වෙත යොමු කරන ලදි.[441]

ප්‍රතිසංස්කරණ සහ උරුම සංරක්ෂණ ක්‍රියාවලීන් එක් ජනවර්ගයකින් තවත් ජනවර්ගයක් වෙත හිංසා පීඩා සිදු කිරීම පිණිස දිගින් දිගටම උපකාර වන මෙවලම් බවට පත් විය හැකි ය. 2020 දී එවකට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් උතුරු නැගෙනහිර ස්ථාන සමීක්ෂණය කර සංරක්ෂණය කිරීම සඳහා දැනට අක්‍රීය ව පවතින පුරාවිද්‍යාව සම්බන්ධ ජනාධිපති විශේෂ කාර්යය සාධක බළකායක් පිහිටු වීමත් සමඟ එය මනාව පැහැදිලි විය.[442] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කලින් සඳහන් කළ පරිදි, කාර්යය සාධක බලකාය මුල දී ඒක-වාර්ගික වූ අතර, නැගෙනහිර පළාතේ ජන වාර්ගික විවිධත්වය සහ සංකීර්ණ ගැටලු තිබියදීත්, එහි සියලු ම පූජකවරුන් තනි ආගමක් නියෝජනය කළහ.[443] මෙම

---

436 'Vision and Mission' (*Department of Archaeology*) <https://www.archaeology.gov.lk/index.php/about/vision-mission> ප්‍රවේශය 2024 අගෝස්තු 1.

437 'Law Section' (*Department of Archaeology*) <https://www.archaeology.gov.lk/index.php/about/sections/law> ප්‍රවේශය 2024 අගෝස්තු 1.

438 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනත, 3 වගන්තිය.

439 ඉහත පාද සටහන , 13 වන වගන්තිය .

440 රජයේ නිලධාරීන් සමඟ පැවැත් වූ ක්ෂ් සම්මුඛ සාකච්ඡාව (කොළඹ දිස්ත්‍රික්කය, 2024 ජූලි 4).

441 ඉහත පාද සටහන.

442 'Statement on the Presidential Task Forces' (*Centre for Policy Alternatives*, 2020 ජූනි 15) <https://www.cpalanka.org/statement-on-the-presidential-task-forces/> ප්‍රවේශය 2024 ජූලි 31.

443 Statement on 'The Appointment of two Presidential Task Forces' (*Centre for Policy Alternatives*, 5 June 2020) <https://www.cpalanka.org/the-appointment-of-two-presidential-task-forces/ > ප්‍රවේශය 2024 ජූලි 30.

තරඟකාරී සහ සංවේදී සන්දර්භය තුළ, විශ්‍රාමික මේජර් ජෙනරාල්වරයෙකුගේ නායකත්වයෙන් යුත් ප්‍රධාන වශයෙන් සිංහල කාර්යය සාධක බලකායක්, අනන්‍යතා දේශපාලනය, ජන විකාශ, ඉඩම් පාලනය සහ භාවිතය සහ ප්‍රතිසන්ධානය සඳහා සැලකිය යුතු ලෙස බලපෑ හැකි ප්‍රතිපත්ති සැකසීමට පුළුල් අධිකාරියක් ලබා දීම අතිශය බැරෑරුම් වේ.[444]

### 3.2. නාගරික සංවර්ධන අධිකාරිය

'සංවර්ධනය' නාමයෙන් පුද්ගලයන් උන් හිටි තැන්වලින් ඉවත් කිරීම පෙන්වා දිය හැක්කේ සමාජ ආර්ථික, වාර්ගික සහ ආගමික අසමානතාවයන් ස්ථිර කරන සහ විස්තාරණය කරන බලගතු ආකාරයක් වශයෙනි. කන්කසන්තුරේ ජනාධිපති මන්දිරය ආශ්‍රිත තත්ත්වය (පරිච්ඡේදය 2.3.5 බලන්න) වැනි උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ඓතිහාසික වශයෙන් ප්‍රජාවන්ට අයත් ඉඩම් නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරී (යූ. ඩී. ඒ.) නීතිය රාජ්‍ය විසින් භාවිතා කරන බවට මෙම පර්යේෂණය සාක්ෂි දරයි. එවැනි පුළුල් යෝජනා ක්‍රම මගින් බලපෑමට ලක් ව සිටින ප්‍රජාවන්ගේ අවධානම් සහගත ස්වභාවය සහ භූමියේ ඉතිහාසය නොසලකා හරින අතර, බොහෝ දෙනෙකු නෙරපා හැරීමට ඉඩ සලසයි.

'නාගරික සංවර්ධන ප්‍රදේශ' ලෙස ප්‍රකාශයට පත් කර ඇති ඇතැම් ප්‍රදේශවල ආර්ථික, සමාජීය සහ භෞතික සංවර්ධනය ඒකාබද්ධ ලෙස සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය උත්සාහ ගනී.[445] මෙම නීතිය කාලයාගේ ඇවෑමෙන් විවිධ සංශෝධනවලට ලක් ව තිබේ.[446] සංවර්ධනය සඳහා යෝග්‍ය යැයි අමාත්‍යවරයාට හැන ඕනෑම ප්‍රදේශයක් මේ යටතේ ප්‍රකාශයට පත් කළ හැකි අතර,[447] අවශ්‍ය යැයි හැගෙන අවස්ථාවන් හි දී, ගැසට් මගින් පල කෙරෙන නියෝගයක් මගින් ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට පැවරිය හැකි ය.[448] 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඉඩම අත්පත් කර ගත හැකි අතර, එම පනතට ම අනන්‍ය අඩුපාඩු පවතී (පරිච්ඡේදය 3.3 බලන්න).

නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමග විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවක දී ශ්‍රී ලංකාවේ සමස්ත භූමි භාගයෙන් 39 %ක් පමණ නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති බව පෙන්වා දෙන ලදි.[449] මෙසේ කිසියම් ප්‍රදේශයක් නම් කළ පසු නාගරික සංවර්ධන අධිකාරිය සංවර්ධන ව්‍යාපෘති භාර ගනු ලබන අතර පසුව පළාත් පාලන ආයතනවලට අනුමැතිය ලබා දීම සඳහා නිලධාරියෙකු පත් කරන බව මෙම නිලධාරීන් පැහැදිලි කළහ. තවද, මෙම නිලධාරීන්, අධිකාරිය අනුගමනය කරන කාර්යය පටිපාටිය වෙනුවෙන් පෙනී සිටි අතර, සංවර්ධන ව්‍යාපෘතියක් අවශ්‍ය යැයි සලකන්නේ නම්, සාමාන්‍යයෙන් රජයේ ඉඩම් අත්පත් කරගනු ලබන බවත්, සුවිශේෂී අවස්ථාවන්හි දී පමණක් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පෞද්ගලික ඉඩම් අත්පත් කරගනු ලබන බවත් සඳහන් කළහ.[450]

කෙසේ වෙතත්, උතුරු නැගෙනහිර ප්‍රාදේශීය ප්‍රජාවන් සහ අත්තනෝමතික ප්‍රඥප්තිවලින් බලගැන් වූ රජය අතර පැහැදිලි බල අසමතුලිතතාවයක් පවතී. රාජ්‍ය සහ තනි පුද්ගලයින් අතර මෙම බල අසමතුලිතතාවය නාගරික සංවර්ධන අධිකාරී ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය මගින් පෙන්නුම් කරයි.[451] ඒ අනුව, අමාත්‍යවරයාගේ නිර්දේශය මත"ජනතාවගේ පොදු සුභසාධනය සහ යුක්ති සහගත අවශ්‍යතා සපුරාලීම" උදෙසා නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ඉදි කිරීම පිණිස

---

[444] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (n 443).
[445] 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත.
[446] 'UDA Acts and Amendments' (*Urban Development Authority of Sri Lanka*) <https://www.uda.gov.lk/uda-acts-and-amendments_2021.html> ප්‍රවේශය 2024 ජනවාරි 27.
[447] UDA Law (n 446), 3 වගන්තිය .
[448] ඉහත පාද සටහන , 15 වගන්තිය.
[449] රජයේ නිලධාරීන් සමග විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව (කොළඹ දිස්ත්‍රික්කය, 2024 ජූලි 11),
[450] ඉහත පාද සටහන.
[451] 1980 අංක 2 දරන නාගරික සංවර්ධන අධිකාරී ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත, 2 වගන්තිය.

කිසියම් ඉඩමක් කඩිනමින් අවශ්‍ය යැයි ජනාධිපතිවරයා විසින් සලකනු ලබන්නේ නම්, එම ඉඩම අවශ්‍ය බව ජනාධිපතිවරයා විසින් ගැසට් නියෝගයක් මගින් ප්‍රකාශයට පත් කළ හැකි බව මෙම වගන්තියේ සඳහන් වේ. එහෙත් මෙහි 'හදිසි' හෝ යුක්ති සහගත යනු කුමක් ද යන්න නිර්වචනය කර නොමැත. එම පනතේ ම 3 වැනි වගන්තිය මගින් අගතියට පත් කිසියම් පුද්ගලයකුට කිසිදු පිළියමක්, ස්ථිර හෝ අතුරු තහනම් නියෝගයක් හෝ එවැනි ඉඩමක් අත්පත් කර ගැනීම වළක්වන නියෝගයක් ලබා ගැනීමට අයිතියක් නොමැති බව ප්‍රකාශ කිරීමෙන් වගකීමෙන් මුක්ත වීමට රජයට ඉඩ සලසයි. ඒ අනුව, මෙම පනතින් අගතියට පත් පාර්ශවයන්ට තම දේපළ අත්පත් කර ගැනීමට එරෙහි ව අභියාචනා කිරීමට ප්‍රමාණවත් පිළියම් ලබා නොදෙන අතර, රජයට පුළුල් බලතල ලබා දී තිබේ. නාගරික සංවර්ධන අධිකාරී පනත මගින් අපයෝජනය වැළැක්වීම සඳහා බලය කිසිදු ලෙසකින් පරීක්ෂා කිරීමකට හෝ සීමා කිරීමට උත්සාහ නොකරන අතර සුදුසු ඉඩමක් තෝරාගැනීම සඳහා රජයට පුළුල් අභිමතය ලබා දේ.

### 3.3 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත

ඉඩම් සහ දේපළ අයිතිය ශ්‍රී ලංකාව තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගත් මූලික අයිතිවාසිකමක් නො වූව ද, අතීතයේ සිට ම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන්හි දී එය මූලික අයිතිවාසිකමක තත්ත්වයට උසස් කිරීම පිණිස දැඩි පෙළඹීමක් පැවතුණි.[452] ඉඩම් පාලනයට අදාළ නීති රාමුව අතිශය සංකීර්ණ වූවකි. බොහෝ නීති, දශක කිහිපයකට පෙර පනවන ලද ඒවා වන අතර අයිතිවාසිකම් පදනම් කර ගත් ප්‍රවේශයක් මත කෙටුම්පත් කර නැත. එබැවින්, මෙම නීති බොහොමයක් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් හා බැඳීම්වලට අනුකූල නොවන බව ද වටහා ගැනීම වැදගත් වේ.[453] 'පොදු අරමුණක්' සඳහා පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමට අවශ්‍ය අවස්ථාවන් හි දී 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (එල්. ඒ. ඒ.) මගින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර, වන්දි ගෙවීමෙන් පසු නිශ්චිත ක්‍රියා පටිපාටියකට අනුව පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමට එමගින් හැකියාව පවතී.

රාජ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා අවස්ථා කිහිපයක දී පනත සංශෝධනය කර ඇති නමුත් පීඩාවට පත් වූවන්ට කල් පවත්නා විසඳුම් ලබා දීමට පනත අසමත් ව ඇත.[454] පනතේ 2 වැනි වගන්තිය අනුව, තම අභිමතය පරිදි ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් තීරණය කිරීමට අමාත්‍යවරයාට බලය ඇති අතර එවිට එසේ අත්පත් කර ගන්නා ඉඩම් පිළිබඳ ප්‍රසිද්ධියේ දැනුම්දීමට, (කැපී පෙනෙන ස්ථානවල ප්‍රදර්ශනය කිරීම මගින්), සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන තිල භාෂා ත්‍රිත්වයෙන් ම එකී දැන්වීම ප්‍රදර්ශනය කිරීමටත් කටයුතු කළ යුතු ය.[455] 4 වන වගන්තිය මෙයට ඌන පූරණයක් සපයන අතර, ඒ අනුව අදාළ ඉඩම පොදු අවශ්‍යතා සඳහා යෝග්‍ය වන්නේ නම්, අමාත්‍යවරයා විසින් අත්පත් කර ගැනීමේ නිලධාරියා මගින් එකී අත්පත් කර ගැනීම පිළිබඳ ඉඩමේ හිමිකරුට/හිමිකරුවන්ට දැනුම් දිය හැකි ය. මෙම ප්‍රතිපාදන දෙකම, විශේෂයෙන් ම, 'පොදු අරමුණ' යනු කුමක් ද යන්නට ව්‍යවස්ථාපිත නිර්වචනයක් සපයා නොමැති හෙයින් ඒ පිළිබඳ බැරෑරුම් ගැටලු ඉස්මතු කරයි.[456]

මීට පෙර ශ්‍රී ලංකාවේ අධිකරණ 'පොදු අරමුණ යන යෙදුම අර්ථකථනය කර ඇති ආකාරය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් විමසීමට ලක් කළ අතර,[457] ඒ අනුව ඕනෑම ඉඩම් අත්පත් කර ගැනීමක් මහජන උපයෝගිතාවකට සේවය කරන බව සහතික කිරීම සහ ඉඩම් හිමියන්ගේ අයිතිවාසිකම්

[452] 2000 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතට සහ 2009 අයිතිවාසිකම් පනත් කෙටුම්පතට ඉඩම් සහ දේපළ අයිතිය ඇතුළත් කිරීමට උත්සාහ කර ඇත. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන පිළිබඳ ජනාධිපති කොමිසන් සභාවේ (2011) නිර්දේශ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සම්බන්ධ මහජන නියෝජනය පිළිබඳ වාර්තාව (2016) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉඩම් අයිතිය ආරක්ෂා කළ යුතු බවට නිර්දේශ කර ඇත.

[453] Pubudini Wickramaratne, '*Securing Land Rights of Displaced and Evicted Communities in Northern And Eastern Sri Lanka*' (Oxfam 2020).

[454] Fonseka and Jegatheeswaran (49 වන පාද සටහන).

[455] 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත, 2(1) වගන්තිය.

[456] Fonseka and Jegatheeswaran (49 වන පාද සටහන).

[457] Bhavani Fonseka and Nivedha Jayaseelan, 'Rights over Land vs National Security: Examining the Impact of Public Interest Litigation' in Bhavani Fonseka and Luwie Ganeshathasan (eds) *Salient Aspects of Public Interest Litigation Jurisprudence in Sri Lanka* (CPA 2023).

ආරක්ෂා කෙරෙන බවට තහවුරු කිරීම පිණිස අධිකරණය එහි දී මහජන භාරකාරත්වය පිළිබඳ මූලධර්මය උපයෝගී කර ගෙන තිබේ. ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීමේ දී එය අවශ්‍ය බව පමණක් සඳහන් නොකොට පොදු අරමුණ කුමක් ද යන්න හෙළිදරව් කිරීම වඩාත් සුදුසු බව නඩු තීන්දුවල බර අනුව දක්නට ලැබෙන්නකි.[458] *මෙන්ඩිස් සහ තවත් අය එදිරිව. පෙරේරා සහ තවත් අය,* යන නඩුවේ දී "පොදු අරමුණ" යන පදයට වඩාත් පැහැදිලි නිර්වචනයක් ලබා දී තිබේ. ඒ අනුව, පනත මගින් අත්පත් කර ගැනීමේ මූලික පරමාර්ථය "මහජන උපයෝගීතාව සහ සමස්ත ප්‍රජාවගේ ප්‍රතිලාභය" පිණිස හේතු වීම යන්න නිරූපණය වන අතර "ප්‍රතිලාභයක් පිළිබඳ අදහස ප්‍රමාණවත් තරම් ඍජු ස්වභාවයකින් පැවතිය යුතු ය". [459]

පුද්ගලික දේපළ අත්පත් කර ගැනීමේ සන්දර්භය තුළ නියමිත ක්‍රියාවලියට අදාළ කිසිදු ව්‍යවස්ථාදායක හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන්, අමාත්‍යවරයෙකු සිදු කරන එවැනි ප්‍රකාශයක (ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය බව) ආර්ථික බලපෑමට ලක් වූ තැනැත්තාට, එනම් හිමිකරුට ඇති වන ආර්ථික බලපෑම විසඳීමට අසමත් වී ඇත. ඉඩම සම්බන්ධ එවැනි ප්‍රකාශයක් ඔහුගේ/ඇයගේ දේපළවල අනාගත භාවිතය සම්බන්ධයෙන් ඔහුගේ/ඇයගේ නීත්‍යානුකූල අපේක්ෂාවන් මත පදනම් ව ඔහුගේ දේපළවල ආරක්ෂාව පිළිබඳ ආයෝජනවලට බාධා කරන ප්‍රමාණය විමසා බැලිය යුතුය. මේ සම්බන්ධයෙන්, මානෙල් ප්‍රනාන්දු එදිරිව ජයරත්න, යන නඩුවේ දී මාර්ක් ප්‍රනාන්දු විනිසුරුතුමා විසින් විමසන ලද අතර, පෞද්ගලික හිමිකරුවෙකුගේ ඉඩමක් රජයට පවරා ගැනීමට කටයුතු කිරීමේ දී පොදු කටයුත්තක් සඳහා ඉඩමක් අවශ්‍ය වන්නේ ද සහ එම අරමුණ කුමක් ද යන්න අමාත්‍යවරයා හෙළි කළ යුතු යග[460] විශේෂයෙන් ම හොරණ වැවිලි සමාගම එදිරිව. කෘෂිකර්ම අමාත්‍යවරයා සහ තවත් අය, යන නඩුවේ දී අදාළ අරමුණ දෙවන පෙළ අරමුණක් වන අවස්ථාවක දී මානෙල් ප්‍රනාන්දු නඩුවේ දක්වා ඇති අවශ්‍යතාවය සපුරාලීමක් සිදු නොවන බව තීරණය කිරීමෙන් මෙම කරුණ තව දුරටත් පැහැදිලි විය.[461] වඩ වඩාත් දේශපාලනීකරණය වූ අධිකරණයක නූතන සන්දර්භය තුළ මෙම තීරණ කෙතරම් දුරට පිළිපදින්නේ ද යන්න ප්‍රශ්නාර්ථයකි. බොහෝ රාජ්‍ය දෙපාර්තමේන්තු දේපල අත්පත් කර ගැනීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත භාවිතා කරන බැවින් මෙකී පනත වටා ඇති අර්බුදකාරී ස්වභාවය නැවත නැවතත් අවධාරණය කළ යුතු ය.[462]

පනතේ අත්තනෝමතික ස්වභාවය 38 වැනි වගන්තිය මගින් මනාව පැහැදිලි කෙරෙන අතර එමගින් 'හදිසි අවශ්‍යතා' මත ඕනෑම ඉඩමක් වහාම රජයට පවරා ගැනීමට ඉඩ සලසයි. 38 වගන්තිය මෙයට ඌන පූරණයක් සිදු කරමින් යම් ඉඩමක් පළාත් පාලන ආයතනයක් සඳහා අත්පත් කර ගන්නා අවස්ථාවක සහ රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් එම ඉඩමෙහි මූලික තක්සේරුව නිශ්චිත මුදල නො ඉක්මවන බව තීරණය කරන අවස්ථාවක, එම ඉඩම වහාම සන්තකයට පවරා ගැනීම හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකනු ලැබේ. ව්‍යවස්ථාව මගින් 'හදිසි අවශ්‍යතාව' යනු කුමක්දැ යි සඳහන් කිරීමෙන් වැළකී සිටිය ද, මාරි ඉන්දිරා ප්‍රනාන්දුපුල්ලේ එදිරිව ඊ. එල්. සේනානායක නඩුවේ දී අධිකරණය සඳහන් කළේ 'හදිසි බව' යන්න තහවුරු කිරීම සහ ඒ බව ඔප්පු කිරීමේ භාරය රජය වෙත පවතින බව යි.[463] එසේ වුව ද, හදිසි හේතූන් පිළිබඳ පැහැදිලි භාවයකින් තොරව, අහිංසක ඉඩම් හිමියන්ගෙන් තමන්ගේ ම ආක්‍රමණශීලී අරමුණු සඳහා පුද්ගලික ඉඩම් අභිමතය පරිදි අත්පත් කර ගැනීම පිණිස මෙම විධිවිධානය අවභාවිතා කිරීමට රජයට හැකියාව පවතී. ඉඩම් අත්පත් කර ගැනීම

[458] 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාරව ඉතා මැනවින් හෙළිදරව් කළ යුතු පනත යටතේ 'පුද්ගලික ඉඩම් පොදු අරමුණු සඳහා පමණක් අත්පත් කර ගත හැකි ය, යන්න අධිකරණ තීන්දු මගින් තහවුරු කර තිබේ.

[459] *Mendis and others v Perera and others* [2007] SC (FR) 352.

[460] *Manel Fernando v D.M.Jayaratne, Minister of Agriculture and Lands and others* (2000) S.L.R. 112.

[461] *Horana Plantations Ltd. v Minister of Agriculture and others* (2009) SC Appeal No.06.

[462] මෙයට නාගරික සංවර්ධන අධිකාරී පනත (446 වන පාද සටහන), 2005 අංක 38 දරන සංචාරක පනත, 2007 අංක 35 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත, 1992 අංක 33 දරන පතල් හා ඛනිජ සම්පත් පනත, 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනත, 1979 අංක 23 දරන  මහවැලි අධිකාරිය පනත, 1946 අංක 13 දරන නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත.

[463] *Marie Indira Fernandopulle and Another v E.L.Senanayake, Minister of Lands, and Agriculture* 79 (II) N.L.R. 115.

සඳහා වන 'පොදු අරමුණු' හඳුනා ගත හැකි නිර්ණායක නොමැතිකම සහ එවැනි ඉඩම් අත්පත් කර ගැනීම්වල බලපෑම තක්සේරු නොකිරීම හේතුවෙන් මෙම හැකියාව වර්ධනය වී තිබේ.[464]

ඉඩම් අත්පත් කර ගැනීම සඳහා පොදු අරමුණු ප්‍රවාහනය, වරාය, ගුවන් සේවා සහ කෘෂිකර්මය වැනි අංශ හරහා විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන විසින් ආරම්භ කරන ලද සංවර්ධන වැඩසටහන්වලින් පැන නැගිය හැක. ජාතික ආරක්ෂාව සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ දී ඒවා බොහෝ විට අධි ආරක්ෂිත කලාප ලෙස නම් කෙරේ.[465] ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 2 වන වගන්තියේ පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියා පටිපාටිය දක්වා ඇතත්, ඉඩම් අධි ආරක්ෂිත කලාප ලෙස ප්‍රකාශ කිරීම බොහෝ විට සිදු වන්නේ විධායකය විසින් ගැසට් නිවේදන හරහා නිකුත් කරන හදිසි රෙගුලාසි මගිනි.[466] තවද, ජාතික ආරක්ෂාවට මුවා වෙමින් ඉඩම් පවරා ගැනීමට හෝ අත්පත් කර ගැනීමට ගත් උත්සාහයන් අභියෝගයට ලක් කරමින් ඉහළ අධිකරණවල ගොනු කර ඇති නඩු කිහිපයක් මගින් මෙම ඉඩම්වලින් සමහරක් අවසානයේ ආර්ථික කටයුතු සහ සංචාරක සංවර්ධනය සඳහා භාවිතා කළ බව හෙළි කරන ලදි.[467] මේ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සඳහා 'ජාතික ආරක්ෂාව' සාධාරණීකරණය කිරීම මුළුමනින් ම මිලිටරි අරමුණුවලින් වියුක්ත වෙමින් ආර්ථික අවශ්‍යතා අන්තර්ගත කර ගත් අරමුණු වෙත මාරු වී ඇත.[468]

'2011 නොවැම්බර් මාසයේ දී මිලිටරිය විසින් අෂ්රෆ් නගර් ගම්වැසියන් ඔවුන්ගේ ඉඩම්වලින් බලහත්කාරයෙන් අවතැන් කර ඔවුන්ගේ දේපළ වාණිජ අරමුණු සඳහා ආක්‍රමණය කිරීමට ආරම්භ කළ අතර මෙය ඉඩම් මංකොල්ලයක්' වශයෙන් පෙන්වා දිය හැකි ය.[469] ඊට ප්‍රතිචාර වශයෙන්, මෙකී අත් කර ගැනීම අභියෝගයට ලක් කරමින්, කසංකේනි ගම්මානයේ පදිංචිකරුවන් දෙදෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කළ අතර, ඒ අනුව, එම ඉඩමේ ඉදිරි සංවර්ධන කටයුතු නතර කරන ලෙසට අධිකරණය අතුරු නියෝගයක් නිකුත් කරන ලදි..[470]

ඉඩම් පාලනය කිරීමට මෙන් ම මිනිසුන් තම දේපළ වෙතින් බලහත්කාරයෙන් ඉවත් කිරීමට පියවර ගැනීම සඳහා චක්‍රලේඛ ද යොදා ගෙන ඇත. නිදසුනක් වශයෙන්, අංක 2011/04 ඉඩම් චක්‍රලේඛය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන මෙන් ම නෛතික ආරක්ෂාව මග හැරීම සම්බන්ධයෙන් විවේචනයට ලක් ව තිබේ.[471] මෙම චක්‍රලේඛයට එරෙහි ව ශ්‍රේෂ්ඨාධිකරණයේ රිට් අයදුම්පතක් සහ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ද ඉදිරිපත් විය. අනෙකුත් විධිවිධාන අතර, ජාතික ආරක්ෂාවට හෝ විශේෂ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ ඒවා හැර ඉඩම් නිදහස් කිරීම් චක්‍රලේඛය අත්හිටුවා ඇත. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 සහ 14 වැනි වගන්ති ඇතුළු ව හරයාත්මක සහ කාර්යය පටිපාටික යන දෙඅංශයෙන් ම විවිධ ව්‍යවස්ථාමය සහ නීතිමය විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් එය අභියෝගයට ලක් විය..[472]

එබැවින්, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත තුළ ම 'පොදු අරමුණ' යනු කුමක් ද යන්න නිර්වචනය කිරීම අවශ්‍ය වේ. එවැනි නිර්වචනයක් සඳහා මාර්ගෝපදේශ වෙනත් විවිධ අධිකරණ බල ප්‍රදේශවලින්

---

464 Fonseka and Jegatheeswaran (49 වන පාද සටහන).
465 Fonseka and Jayaseelan (458 වන පාද සටහන).
466 ඉහත පාද සටහන.
467 ඉහත පාද සටහන.
468 Fonseka and Jayaseelan (458 වන පාද සටහන).
469 'Sri Lanka: Government Slow to Return Land' *Human Rights Watch* (9 October 2018) <https://www.hrw.org/news/2018/10/09/sri-lanka-government-slow-return-land> ප්‍රවේශය 2024 ජනවාරි 25.
470 Women's Action Network, 'Ashraf Nagar: The Courageous Struggle of Peasants against the Forcible Land Acquisition in Ampara District' *Groundviews* (19 January 2013) <https://groundviews.org/2013/01/19/ashraf-nagar-the-courageous-struggle-of-peasants-against-the-forcible-land-acquisition-in-ampara-district/> ප්‍රවේශය 2023 දෙසැම්බර් 31.
471 Bhavani Fonseka and Mirak Raheem, 'A Short Guide to 'Regulating the Activities Regarding Management of Lands in the Northern and Eastern Provinces' Circular: Issues & Implications' (2011) Centre for Policy Alternatives <https://www.cpalanka.org/a-short-guide-to-%E2%80%98regulating-the-activities-regarding-management-of-lands-in-the-northern-and-eastern-provinces%E2%80%99-circular-issues-implications/> ප්‍රවේශය 2024 පෙබරවාරි 25.
472 CA (Writ) No.620/2011.

සොයා ගත හැකි ය. උදාහරණයක් ලෙස, ඉන්දියාවේ 2013 අංක 30 දරන ඉඩම් අත්පත් කර ගැනීම, පුනරුත්ථාපනය කිරීම සහ නැවත පදිංචි කිරීමේ පනතේ 2(1) වගන්තිය 'සමානුපාතික මූලධර්මය' මත පදනම් ව පොදු අරමුණ නිර්වචනය කරයි. කැනඩාවේ ෆෙඩරල් 'එක්සත් කිරීමේ පනත' වෙනස් ප්‍රවේශයක් අනුගමනය කරන අතර රජය විසින් අදාළ ප්‍රදේශයේ ජනතාවට සැලසි යයුතු 'විශ්වාසනීය රාජකාරිය' කෙරෙහි අවධානය යොමු කරයි. මෙම නීති සියල්ල හොඳින් සලකා බැලීමෙන් පසුව, එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් නම්‍යශීලී වීමට ඉඩ සලසන විවෘත වගන්තියක් සමඟ අවසර ලත් අරමුණු ලැයිස්තුවක් අඩංගු පොදු අරමුණු නිර්වචනය කිරීමේ පෝලන්ත ක්‍රමය අනුගමනය කිරීමට නිර්දේශ කර ඇත.[473]

### 3.4. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

1979 අංක 23 දරන මහවැලි අධිකාරී පනත මගින් මහවැලි ගංගා යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ එම සංවර්ධනයට සහාය වීම පිණිස සංස්ථා පිහිටු වීම උදෙසා මහවැලි අධිකාරිය පිහිටු වන ලදි.[474] අධිකාරිය ඉඩම් පරිහරණ සැලසුම් අංශයකින් සමන්විත වන අතර, අනෙකුත් කාර්යභාරයන් අතර, සංවර්ධනය සඳහා ඉඩම් ප්‍රදේශ තව දුරටත් හඳුනා ගැනීම, නැවත පදිංචි කිරීමේ සැලසුම් සකස් කිරීම සහ පාරිසරික සංවේදී මායිම් නිර්ණය කිරීම සිදු කරයි.[475] දැනට මුලතිව් දිස්ත්‍රික්කයේ කොටසක් වන වැලි ඔය ප්‍රදේශයේ මහවැලි එල් යෝජනා ක්‍රමය යටතේ ඉඩම් අන්සතු කිරීම සම්බන්ධයෙන් මහවැලි අධිකාරියේ කාර්යභාරය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මීට පෙර ලේඛනගත කර ඇත.[476] ඉඩම් අත්පත් කර ගැනීම් පෞද්ගලික ඉඩම්වලට අදාළ වන අතර, ඉඩමේ සැබෑ තත්ත්වය වටා ඇති සංකීර්ණත්වය සහ ව්‍යාකුලත්වය වැලි ඔය ආශ්‍රිත සිදුවීමෙන් පැහැදිලි වේ.[477] මෙසේ ඉඩම් අන්සතු කිරීමට රජයට නීත්‍යානුකූලව හැකියාවක් තිබේ ද යන්න සහ මෙම ප්‍රශ්නකාරී භාවිතයන් ඉඩම් අත්පත් කර ගැනීමක් ද යන්න පිළිබඳ ව මෙයින් ප්‍රශ්න මතු වේ. ඉඩම් අන්සතු කිරීම ප්‍රධාන වශයෙන් බහුතර ප්‍රජාවට ප්‍රතිලාභ අත්කර දීමෙන් ඉඩම් ගැටලු ජනවාර්ගිකකරණය වීමට ඉඩ සලසන අතර, විශේෂයෙන් ඉඩම් නිරවුල් කිරීමේ යෝජනා ක්‍රම හරහා ජනවිකාශ වෙනස්කම් ඇති විය හැක.

අමාත්‍යවරයාගේ මතය අනුව මහවැලි ගඟේ හෝ ඕනෑම ප්‍රධාන ගංගාවක ජල සම්පතකින් සංවර්ධනය කළ හැකි ඕනෑම ප්‍රදේශයක් 'විශේෂ ප්‍රදේශයක්' ලෙස ජනාධිපතිවරයාගේ අනුමැතිය ඇති ව අමාත්‍යවරයාට ප්‍රකාශයට පත් කළ හැකි බව මහවැලි අධිකාරී පනතේ 3 වැනි වගන්තියේ දක්වා ඇත. ඒ අනුව, අධිකාරියේ කටයුතු සඳහා සුදුසු ඉඩම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අමාත්‍යවරයාගේ අභිමතය ප්‍රමාණවත් බැවින් ක්‍රියාවලියේ ආරම්භයේ සිට ම අඩුවක් පවතී.

23 වැනි වගන්තිය පසුව දක්වන අන්දමට යම්කිසි විශේෂ ප්‍රදේශයක එහි ඇති ඕනෑම ඉඩමක් හෝ ප්‍රතිලාභයක් අධිකාරියට කිසියම් අරමුණක් ළඟා කර ගැනීම පිණිස අවශ්‍ය වන්නේ නම්, එම ඉඩම හෝ ප්‍රතිලාභය රජය විසින් අධිකාරිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පවරා ගත හැකි ය. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට ම අනන්‍ය වූ සන්ධිස්ථානයක් පවතින බැවින් මෙයම ගැටලු සහගත වේ. විකල්පයක් ලෙස, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත භාවිතයෙන් තොරව අධිකාරියට ඉඩම් පවරා ගත හැකි බව මහවැලි අධිකාරී පනතේ 24 වගන්තියේ සඳහන් වේ.

පනතේ 25 වැනි වගන්තිය අනුව අධිකාරිය විසින් ඉඩම අත්පත් කර ගත් පසු, එය සියලු බැරකම්වලින් නිදහස් ව, සම්පූර්ණයෙන් ම අධිකාරියට පැවරෙන බව සඳහන් වේ. ඉඩම පිළිබඳ අයිතියක් හෝ උනන්දුවක් ඇති ඕනෑම අයෙකුට අධිකාරියට එරෙහි ව නිසි අධිකරණයක පියවර ගැනීමට හෝ එම

473 Simon Keith, Patrick McAuslan, Rachael Knight, Jonathon Lindsay, Paul Munro-Faure and David Palmer, 'Compulsory acquisition of land and compensation' (2009) FAO Land Tenure Studies Rome <http://www.fao.org/tenure/resources/collections/landtenurestudies/en/> ප්‍රවේශය 2024 ජනවාරි 25.

474 'ප්‍රධාන සැලැස්ම (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය) <https://mahaweli.gov.lk/master%20plan.html> ප්‍රවේශය 2024 ජනවාරි 26.

475 'ඉඩම් පරිහරණ සැලසුම් අංශය (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය) <https://mahaweli.gov.lk/land%20use%20planning.html> ප්‍රවේශය 2024 ජනවාරි 26.

476 Fonseka and Raheem (91 වන පාද සටහන).

477 ඉහත පාද සටහන.

ඉඩම සඳහා අධිකාරියෙන් වන්දි ඉල්ලා සිටීමට හැකියාව පවතී.[478] මෙකී පනත තුළ ම පැහැදිලි බල අසමතුලිතතාවයක් පවතී. මේ අනුව, ඉඩමක් අත් කර ගත් බවට දැනුම් දීමේ අවශ්‍යතාවය සහ ඉඩම සන්තකයේ තබා ගැනීම සහ භාවිතය ආරම්භ වූ පසු අභියෝග කිරීමේ හැකියාව හැර මෙහි දී මහවැලි අධිකාරියට අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම හෝ සන්තකයේ තබා ගැනීම වැළැක්වීමට සැබෑ බාධාවක් නොමැත.[479] මෙම විධිවිධානවලින් පැන නගින ක්‍රියාකාරකම් පිළිබඳ මහජන විවාදයක් හෝ දැනුම්වත්භාවයක් නොමැති වීම රජය විසින් බලගන්වනු ලබන මානව හිමිකම් උල්ලංඝනයන් සඳහා පහසුකම් සපයයි. මෙම ගැටලු ඉදිරිපත් කිරීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ සම්බන්ධ වීමට කටයුතු කළ ද, සාකච්ඡාවක් සූදානම් කිරීමට නිලධාරීන්ට නොහැකි විය.

## 3.5. මධ්‍යම පරිසර අධිකාරිය

මධ්‍යම පරිසර අධිකාරිය (සී. ඊ. ඒ.) පිහිටු වන ලද්දේ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගිනි. 2001 දී පරිසරය පිළිබඳ ඇගයුම් ජාතික සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ කිරීමේ අරමුණින් පරිසර අමාත්‍යාංශය පිහිටු වන ලද අතර එමගින් මධ්‍යම පරිසර අධිකාරියේ පාලනය අමාත්‍යාංශයට හිමි විය. ජාතික පාරිසරික පනත මගින් නිර්මාණය කරන ලද ක්‍රියාවලියේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ප්‍රමාණවත් පිරික්සීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇති අතර ප්‍රවීණයන්ගේ මෙන් ම මහජනතාවගේ ද අදහස් විමසීමෙන් මෙය වැඩිදියුණු කරනු ලබයි.[480] විජේරත්න සහ අබේනායක පවසන පරිදි, පාරිසරික බලපෑම් තක්සේරු (ඊ. අයි. ඒ.) ක්‍රියාවලියට බාහිර දේශපාලනයේ බලපෑම, ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිතායතනයක් පරිපාලනය කිරීමට අරමුදල් ප්‍රමාණවත් නොවීම සහ ඊ. අයි. ඒ උපදේශකයින් සමඟ වෘත්තීය ආචාර ධර්ම නොමැතිකම වැනි කරුණු ඇතැම් ප්‍රධාන උත්සුකයන් සම්බන්ධයෙන් ප්‍රායෝගික කනස්සල්ලක් මතු කිරීමට හේතු වී තිබේ.[481] මෙම ගැටලු නිසැකව ම පරිසරයට අහිතකර බලපෑම් මාලාවකට තුඩු දෙන ඕනෑම බලපෑම් තක්සේරු වාර්තාවක විශ්වසනීයත්වය ප්‍රශ්න කිරීමට හේතු විය හැකි ය.

අදානි ග්‍රීන් එනර්ජි සුළං බල ව්‍යාපෘතිය (පරිච්ඡේදය 2.5.1 බලන්න) වැනි ශ්‍රී ලංකාවේ උතුරේ සංවර්ධන ව්‍යාපෘතිවල නැගීම හේතුවෙන් ජාතික පාරිසරික පනත තීරණාත්මක වේ. මෙම ව්‍යාපෘති ඉඩම්, ජීවනෝපාය සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ට බලපාන අතර, ප්‍රතිසන්ධාන කාලය තුළ භීතිය සහ ගැටුම් අවුලුවාලීමට හේතු විය හැකි ය. එපමණක් නොව, දේශගුණික විපර්යාස, ආර්ථික ඇගයුම් සහ අවිනිශ්චිතතාවය අතර අන්තර් සම්බන්ධතාවය මාර්ග කිහිපයකින් ප්‍රකාශ වනු ද දක්නට ලැබෙන්නකි. මෙම මතභේදාත්මක ව්‍යාපෘතිය සඳහා වන පාරිසරික බලපෑම් තක්සේරුවේ අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් පවතී.[482] යෝජිත මන්නාරම සුළං බල ව්‍යාපෘතියේ ( II අදියර) සුළං ටර්බයින 52කින් සමන්විත වන අතර ඒ තම්බපවනි සුළං බලාගාරය ( I අදියර) යටතේ දැනට පවතින සුළං ටර්බයින 30ට අමතරව ය.[483] මෙහි අතිරේක දිගුවක් ලෙස ( III අදියර) මන්නාරම දූපතේ පළල හරහා තවත් ටර්බයින 21ක් යෝජනා කරන අතර එය අක්කර 15,000ක් පමණ හෝ දිවයිනේ භූමි ප්‍රමාණයෙන් 40% ක් ආවරණය කරයි.[484] සියලු ම අදියරයන් ඉදිරියට ගියහොත්, දිවයින පුරා ටර්බයින

---

[478] මහවැලි පනත (463 වන පාද සටහන, 25(3) වගන්තිය).

[479] ඉහත පාද සටහන.

[480] බලන්න 'පාරිසරික බලපෑම් තක්සේරු ක්‍රියාවලියේ පියවර' (මධ්‍යම පරිසර අධිකාරිය).<https://www.cea.lk/web/steps-in-eia-process> ප්‍රවේශය 2024 පෙබරවාරි 1.

[481] B.V.M.K. Wijerathna and M.D.T.E. Abeynayake, 'Challenges and Issues of Environmental Protection Instruments Related to Infrastructure Development Projects in Sri Lanka' in Y.G. Sandanayake, S. Gunatilake and K.G.A.S. Waidyasekara (eds), *Proceedings of the 9th World Construction Symposium* (2021), 171-182.

[482] Consulting Engineers and Architects Associated Pvt Ltd, 'Environmental Impact Assessment for the proposed 250 MW Mannar Wind Power Project Phase II Final Report' (*Sri Lanka Sustainable Energy Authority*, January 2024) <EIA for the proposed 250 MW Mannar Wind Power Project (Phase II)> ප්‍රවේශය 2024 පෙබරවාරි 10.

[483] ඉහත පාද සටහන.

[484] ඉහත පාද සටහන.

103ක් ඉදිවන අතර, මෙය දූපතේ භූ විෂමතාවය සහ ජෛව විවිධත්වය ආපසු හැරවිය නොහැකි ලෙස වෙනස් කිරීමේ අවදානමක් පවතී. එක්සත් ජාතීන්ගේ සංක්‍රමණික විශේෂ පිළිබඳ සම්මුතිය (සී. එම්. එස්. ) විසින් පිළිගත් ප්‍රධාන ගෝලීය භූමිෂ්ඨ ගුවන් මාර්ග පද්ධති හතරෙන් එකක් ප්‍රධාන පක්ෂි සංක්‍රමණික කොරිඩෝවක් වන මධ්‍යම ආසියානු පියාසර මාර්ගයේ (සී. ඒ. එෆ්.) තුළ ස්ථානගත කිරීම හේතුවෙන් පුළුල් විවේචන තිබියදීත්, ව්‍යාපෘතියට ඉදිරියට යාමට අවසර දී තිබේ.[485] මන්නාරම ප්‍රදේශයේ අනෙකුත් බලශක්ති ව්‍යාපෘති තුළින් ද සත්ව විශේෂ කෙරෙහි ඍණාත්මක බලපෑම් ඇති වන බවට වාර්තාගත සාක්ෂි පවතී.[486] එපමණක් ද නොව, පාරිසරික බලපෑම් තක්සේරුව සිදු කිරීමට පෙර සිට ම මෙම ව්‍යාපෘතිය අදානි ග්‍රීන් එනර්ජි සමාගමට ලබා දී තිබූ බවට හෙළි දරවු වූ අතර, ඒ අනුව පාරිසරික බලපෑම් තක්සේරුව යනු හුදු කොළ එළි දැල්වීමක් පමණක් බව පැහැදිලි වන්නකි.

අදානි ග්‍රීන් එනර්ජි සමාගම වසරක ක්ෂේත්‍ර අධ්‍යයනයක් මෙන් ම ලංකා කුරුලු සමාජය, ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා සමූහය සහ රැම්සා වෙතින් දත්ත උපුටා දක්වමින් නවීන තාක්ෂණය පාරිසරික බලපෑම අවම කරන බව ප්‍රකාශ කරමින් සිය ක්‍රියාවලිය වෙනුවෙන් පෙනී සිටිනු දක්නට ලැබෙන්නකි.[487] කෙසේ වෙතත්, විශේෂඥයින් ප්‍රමාණය අවම වීම මෙන් ම මහජන උපදේශනයන් නොමැති වීම මෙම ක්‍රියාවලිය අභිරහසක සඟවාලීමට හේතු වී තිබේ. මධ්‍යම පරිසර අධිකාරියේ සහ ජාතික පාරිසරික පනතේ සඵලතාවය පිළිබඳ ප්‍රශ්න මතු කරමින්, මෙම ක්‍රියාකාරකම් කෙරෙහි රජය මුනිවත රකිමින් සිටිනු ද දක්නට ලැබෙන්නකි. පාරිසරික බලපෑම් තක්සේරුව යනු හුදු පාරිසරික අනුමැතියක් මිස ව්‍යාපෘති අනුමැතියක් නොවන අතර එය සංවර්ධනයට සැබෑ බාධාවක් ඉදිරිපත් නොකරයි.[488] සංවර්ධන සැලසුම් සහ බෙදා හැරීම සඳහා බණ්ඩනය වූ ප්‍රවේශය වෙත පරිවර්තනයවීමේ හදිසි අවශ්‍යතාවයක් පවතී. ආර්ථික ඉලක්කවලට අනතුරක් නොවන පරිදි පාරිසරික ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමට ශ්‍රී ලංකාව යොමු විය යුතු ය. මේ සඳහා මානව සහ පාරිසරික යහපැවැත්ම ඵලදායී ලෙස සමතුලිත කිරීම සඳහා හැකියාවන්, සම්පත් සහ ආයතන වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.

### 3.6. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

මීට පෙර නගර සහ ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව ලෙස හැඳින්වූ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ජාතික භෞතික සැලැස්ම මත පදනම් ව ජාතික මට්ටමේ සැලසුම් සහ කලාපීය සහ ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් කෙරෙහි අවධානය යොමු කරයි.[489] දෙපාර්තමේන්තුව 1946 අංක 13 දරන නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනතේ විධිවිධාන අනුගමනය කරමින් 'පූජනීය භූමි' සැලසුම් සහ ඇතැම් සංවර්ධන කටයුතුවල නිරත වෙමින් සිටී.[490] විශේෂයෙන් ම මුහුදු මහා විහාරය (අම්පාර), සංකමලේ පුරාණ රජමහා විහාරය (ත්‍රිකුණාමලය), ශ්‍රී සද්ධර්ම යුක්තික වන සෙනසුන විහාරය (ත්‍රිකුණාමලය) වැනි උතුරු නැගෙනහිර බෞද්ධ විහාරස්ථාන මෙන් ම විවිධ පෞද්ගලික ඉඩම් සඳහා මෙම පනතේ විධිවිධාන අදාළ කර ඇත.

එවැනි ඉඩම් අත්පත් කර ගැනීම් වලංගු කිරීම පිණිස මෙම ප්‍රඥප්ති යටතේ එන මූලික විධිවිධාන අතරට, ගැසට් පත්‍රයේ පළ කරන නියෝගයක් මගින් ඕනෑම නගරයක් හෝ ප්‍රදේශයක් 'නාගරික සංවර්ධන ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යවරයාට ඇති බලයට ඇතුළත් වේ.[491] ඒ අනුව, ඕනෑම ප්‍රධාන මාර්ගයක දෙපස නිශ්චිත දුරක් ඇතුළත ඕනෑම ප්‍රදේශයක් 'කඳ මාර්ග සංවර්ධන

---

485 Professor Sampath Seneviratne, 'Proposed Wind Farm in Mannar is a Death Trap for Migratory Birds' *Groundviews* (2 February 2024) <https://groundviews.org/2024/02/09/wind-farm-in-mannar-is-a-death-trap-for-migratory-birds/> ප්‍රවේශය 2024 පෙබරවාරි 10.
486 Consulting Engineers and Architects Associated Pvt Ltd (483 වන පාද සටහන).
487 *The Sunday Times* (168 වන පාද සටහන).
488 Kanthi de Silva, 'Environmental Impact Assessment (EIA) Process in Sri Lanka' (University of Peradeniya, 7 October 2023).
489 'දළ විශ්ලේෂණය (ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව) <https://nppd.gov.lk/index.php?option=com_content&view=article&id=15&Itemid=114&lang=en> ප්‍රවේශය 2024 ජූලි 15.
490 ඉහත පාද සටහන.
491 නගර හා ග්‍රාම නිර්මාණ පනත (463 වන පාද සටහන), 6 වන වගන්තිය.

ප්‍රදේශයක්' ලෙසත්,[492] 'ඕනෑම ප්‍රදේශයක් ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදේශයකී ලෙසත්,[493] නම් කළ හැකි ය. එවැනි නියෝගයක් ලබා දීමෙන් පසු, ආඥාපනතේ 47 වැනි වගන්තිය යටතේ ඉඩම් සීමා කිරීම් මාලාවක් ක්‍රියාත්මක වේ.[494] මෙම සීමාවන් අනුව අනවසර පුද්ගලයින්ට:

*"(අ) එම ප්‍රදේශයේ කිසියම් ව්‍යුහයක් ඉදි කිරීම, නැවත ඉදි කිරීම, කඩා දැමීම, වෙනස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම; හෝ*

*(ආ) එම ප්‍රදේශයේ කිසියම් මාර්ගයක් තැබීම, ඉදි කිරීම, පුළුල් කිරීම, දිගු කිරීම හෝ වසා දැමීම හෝ තැබීමට, ඉදි කිරීමට, පුළුල් කිරීමට, දිගු කිරීමට හෝ වසා දැමීමට උත්සාහ කිරීම; හෝ*

*(ඇ) එම ප්‍රදේශයේ කිසියම් ඉඩමක් සංවර්ධනය කිරීම, හෝ එම ඉඩමේ යම් කොටසක් වෙනම හිමිකමක් ලෙසින් සමන්විත වන පරිදි බෙදා දීම, පැවරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම හෝ ගනුදෙනු කිරීම..." තහනම් වේ.*[495]

මෙම නියෝග ක්‍රියාත්මක කිරීමේ දී, දේපල හිමිකර ගැනීම සඳහා රජයට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ විධිවිධාන භාවිතා කළ හැකි ය. පෙර සඳහන් කළ පරිදි, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ අපැහැදිලි විධිවිධාන අඩංගු වන අතර,[496] විවිධ රජයේ දෙපාර්තමේන්තු විසින් එය විවිධ අයුරින් යොදා ගෙන ඇති බව සැලකිය යුත්තකි. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ගත් කල, මුහුදු මහා විහාරය සම්බන්ධ සිදුවීමෙන් (පරිච්ඡේදය 2.1.3 බලන්න) [497] පැහැදිලි වන පරිදි 6(2)(b) වගන්තිය යටතේ 'පොදු අරමුණු' සඳහා අත්පත් කර ගත් ඉඩම 'පූජනීය ප්‍රදේශයක්' ලෙස ගැසට් කර ඇත. 'නාගරික සංවර්ධන ප්‍රදේශය' යන නෛතික යෙදුම 'පූජනීය ප්‍රදේශය' යන්නට මාරුවෙන් මාරුවට භාවිත වන බව දක්නට ලැබෙන අතර අමාත්‍යවරයාගේ ප්‍රකාශයන් හුදු සංවර්ධනාත්මක ප්‍රකාශයකට වඩා ආගමික චේතනාවෙන් යුක්ත ඒවා බව ඒ අනුව වටහා ගත හැකි ය. අපැහැදිලි කලාපකරණ පාරිභාෂිතය සහ විශේෂඥ උපදේශන හෝ බලපෑම් තක්සේරුවකින් තොරව ඉඩම් 'නාගරික සංවර්ධන ප්‍රදේශයක්', 'කඳු මාර්ග සංවර්ධන ප්‍රදේශයක්' හෝ 'ප්‍රාදේශීය සංවර්ධන ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශ කිරීමේ නිසි ක්‍රියාවලීන් නොමැතිකම ප්‍රජාතන්ත්‍ර විරෝධී ඉඩම් අත්පත් කර ගැනීම් පිළිබඳ කනස්සල්ලට හේතු වේ.

### 3.7. වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මුතුර්හි කංගුවේලි වැව වැනි භූදකලා සිද්ධීන් සඳහා දැඩි ලෙස සම්බන්ධ වී තිබේ (පරිච්ඡේදය 2.7.4 බලන්න). දෙපාර්තමේන්තුව සිය මෙහෙවර ලෙස "රටේ ජල සම්පත් සහ එහි එලයන් ප්‍රයෝජනයට ගැනීම, සංවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම, නියාමනය කිරීම, වෙන් කිරීම සහ කළමනාකරණය කිරීමට කටයුතු කරයි. එමගින් සෘජුව ම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සහ වක්‍ර ලෙස අනෙකුත් සංවිධාන සමග සහයෝගයෙන් යුක්ත ව පාරිසරික, දේශීය, කාර්මික සහ බලශක්ති යන ක්ෂේත්‍රයන් හි කටයුතු කරයි.[498] මෙයට, ජල සංරක්ෂණය හා බෙදා හැරීම සඳහා වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘති ඉදි කිරීම සහ ආහාර බෝග නිෂ්පාදනය සඳහා වගා කළ හැකි ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ජලාපවහනය, ගංවතුර ආරක්ෂණ සහ ලවණ ජලය බැහැර කිරීමේ ව්‍යාපෘති වැනි කාර්යයන් ඇතුළත් වේ.[499]

---

[492] ඉහත පාද සටහන, 7 වන වගන්තිය.

[493] ඉහත පාද සටහන, 8 වන වගන්තිය.

[494] ඉහත පාද සටහන, 6 වන වගන්තිය.

[495] ඉහත පාද සටහන, 47 වන වගන්තිය.

[496] ඉහත පාද සටහන, 58 වන වගන්තිය.

[497] 2023 අගෝස්තු 15 දිනැති අංක 2345/37 දරන ගැසට් පත්‍රය.

[498] 'දළ විශ්ලේෂණයී (ශ්‍රී ලංකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව) <https://www.irrigation.gov.lk/web/index.php?option=com_content&view=article&id=15&Itemid=114&lang=en> ප්‍රවේශය 2024 ජනවාරි 30.

[499] ඉහත පාද සටහන.

ආඥාපනත යටතේ නිලධාරීන්ගේ වගකීම් ක්‍රියාත්මක කිරීමේ දී ඔවුන්ගේ සාමාන්‍ය අධීක්ෂණය සහ පාලනය සඳහා කොමසාරිස්වරයා වගකිව යුතු ය.[500] නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ උපදෙස් නිකුත් කිරීමට කොමසාරිස්වරයාට බලය ඇති අතර මෙම රාජකාරිවලට අදාළ ඕනෑම සැකයක් හෝ දුෂ්කරතා නිරාකරණය කළ හැකි ය.[501] රජයේ සියලු ම නිලධාරීන් කොමසාරිස්වරයා විසින් ගනු ලබන ඕනෑම උපදෙස් හෝ තීරණවලට අනුකූල විය යුතු ය.[502] කොමසාරිස්වරයා අමාත්‍යවරයාගේ මඟ පෙන්වීමට සහ පාලනයට යටත් වුව ද, කොමසාරිස්වරයාගේ බලතලයන් හි පුළුල් ස්වභාවය අනුව නිලධාරීන්ට ඒවා පිළිපැදිය යුතු බවට විස්තීර්ණ උපදෙස් ලබා දීමට ඉඩ සලසන බව නිරීක්ෂණය කළ හැකි ය. මෙම අධිකාරිය 113 වගන්තිය මගින් තව දුරටත් ශක්තිමත් කරන අතර, එය ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ 'පොදු අරමුණක්' සඳහා අවශ්‍ය ඉඩමක් යන නිර්වචනයට ආඥාපනතේ අරමුණු සඳහා අවශ්‍ය ඉඩම් ද ඇතුළත් කර තිබේ.

ආඥාපනතෙහි සඳහන් වැරදි අතරට ඇළ මාර්ග අවහිර කිරීම හෝ ආක්‍රමණය කිරීම, ඇළ මාර්ගයක කොටසක් කැපීම, සංරක්ෂිත ජලය අපතේ යැවීම සහ පුද්ගලික භාවිතය සඳහා ජලය හරවා යැවීම වැනි වාරිමාර්ග කටයුතුවලට බාධා පමුණුවන හෝ අයථා පරිහරණය කිරීම සඳහා උපකාරී වන කරුණු ඇතුළත් වේ.[503] මෙකී විධිවිධාන, විශේෂයෙන් දඩ මුදල සම්බන්ධයෙන්, යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වන නමුදු, එය අර්ථකථන දෝෂ සහිත නොවේ. මෙම වැරදි තෝරා බේරා, බලාත්මක කිරීම කෙරෙහි මෙහි දී මූලික අවධානය යොමු විය යුතු ය. උදාහරණයක් ලෙස, කංගුවේලි වැව සම්බන්ධ සිදුවීමේ දී, සිංහල ගොවීන් ජලය හරවා යැවූ අතර එතුළින් දෙමළ ගොවීන් අවාසි සහගත තත්ත්වයට පත් කල ද, සිංහල ගොවීන්ට 93 වගන්තිය යටතේ සාපරාධී වගකීමක් පනවනු ලැබුවේ නැත. මෙම ප්‍රශ්නය වාරිමාර්ග ආඥාපනතෙන් ඔබ්බට විහිදෙන අතර ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය පිළිබඳ පුළුල් ඇගයීමක අවශ්‍යතාවය අවධාරණය කරයි.

### 3.8. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වන හා වනජීවී සංරක්ෂණ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන අතර, 1907 අංක 16 දරන වන ආඥාපනත සහ 1988 අංක 03 දරන ජාතික උරුමයන් සහ වනජීවී ප්‍රදේශ පනත මගින් ඵලදායී වන සංරක්ෂණය සහ කළමනාකරණය සහතික කිරීම සඳහා කටයුතු කරයි.[504] මයිලත්තමඩු (පරිච්ඡේදය 2.2.1 බලන්න) සහ තෙන්නමරවාඩි (පරිච්ඡේදය 2.7.5.1 බලන්න) වැනි ඉඩම් සම්බන්ධ ගැටුම්කාරී අවස්ථාවල දී වන ආඥාපනත ක්‍රියාත්මක කර ඇති ආකාරය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබේ. ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ කිසියම් ඉඩමක් 'රක්ෂිත වනාන්තරයක්' ලෙස ප්‍රකාශයට පත් කිරීමට රජයට ඇති හැකියාව තුළ මෙම ප්‍රශ්න මුල් බැස ඇත.

අමාත්‍යවරයා විසින් ගැසට් නියෝගයක් මගින් රජයේ ඉඩම්වල නිශ්චිත ප්‍රදේශයක් හෝ ඕනෑම රක්ෂිත වනාන්තරයක සම්පූර්ණ/කොටසක් 'සංරක්ෂිත වනාන්තරයක්' ලෙස ප්‍රකාශයට පත් කළ හැකි බව 3, වගන්තියේ සඳහන් වේ. විවිධ හේතු නිසා එවැනි ප්‍රකාශයක් කළ හැකි ය. මෙම ප්‍රදේශයට අනන්‍ය පරිසර පද්ධතියක් හෝ ප්‍රවේණි සම්පත් පැවතීම, එම ප්‍රදේශය දුර්ලභ ශාක, සත්ව හා ක්ෂුද්‍ර ජීවීන් සහ වඳවීමේ තර්ජනයට ලක් ව ඇති විශේෂවල වාසස්ථානයක් වීම, ලවණීකරණය වැළැක්වීමෙන් හෝ වියළීම වැළැක්වීමෙන් පාරිසරික සමතුලිතතාවය ළඟා කර ගැනීමට ප්‍රදේශය ආරක්ෂා කර ගැනීම, ගංගා ඉහත්තාවට ප්‍රමාණවත් වර්ෂාපතනයක් සහතික කිරීම හෝ මිනිස් ජීවිතයට අනතුරුදායක නායයෑම් සහ ලැව්ගිනි වැළැක්වීම, ඊට ඇතුළත් විය හැකි ය.[505]

---

500 වාරිමාර්ග ආඥාපනත (463 වන පාද සටහන), 1(අ) වගන්තිය.
501 ඉහත පාද සටහන.
502 ඉහත පාද සටහන.
503 ඉහත පාද සටහන.93 වන වගන්තිය.
504 'About Us' (*Forest Department Sri Lanka*) <http://www.forestdept.gov.lk/index.php/en/> ප්‍රවේශය 2024 මැයි 20.
505 ඉහත පාද සටහන.

ප්‍රකාශිත ඉඩම වන සංරක්ෂක ජනරාල්වරයාගේ පාලනය යටතේ පවතින අතර, මෙය සංරක්ෂක ජනරාල්වරයාගෙන් බලපත්‍රයක් ලබා ගන්නේ නම් මිස සීමා මාලාවකට යටත් වේ. නිදසුනක් ලෙස 6 වැනි වගන්තිය සංරක්ෂිත වනාන්තරයකට ඇතුළු වීම වැළැක්වීම පිළිබඳ දක්වා තිබේ. කිසියම් ඉඩමක ස්වභාවය තම හුදු අභිමතය පරිදි ප්‍රකාශ කිරීමට අමාත්‍යවරයාට බලතල ලැබෙනුයේ ආඥාපනතේ 12 වැනි වගන්තිය මගිනි. අමාත්‍යවරයාට ඕනෑම ග්‍රාමීය ප්‍රජාවකගේ හෝ ප්‍රජාවන්ගේ ප්‍රයෝජනය සඳහා වනයේ ඕනෑම කොටසක් ග්‍රාමීය වනාන්තරයක් බවට පත් කළ හැකි බවත්, එවැනි ඕනෑම නියෝගයක් වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට පවා හැකි බවත් මෙයින් දක්වා තිබේ. කිසියම් ඉඩමක ස්වභාවය ප්‍රකාශ කිරීමෙහි ලා අමාත්‍යවරයා සතු බලය අත්තනෝමතික ලෙස ක්‍රියාත්මක කිරීම මැඩපැවැත්වීම සඳහා ආරක්ෂාවක් නොමැති බව දක්නට ලැබෙන්නකි.

එවැනි ප්‍රකාශයන් කිසිදු පුද්ගලයෙකුගේ කිසිදු අයිතියකට බලපාන්නේ නැති බව 16 වැනි වගන්තිය පැහැදිලි කර ඇතත්, තම ජීවනෝපාය සඳහා භූමිය මත යැපෙන සහ එහි සංස්කෘතික හා ආගමික වැදගත්කම අගය කරන ප්‍රජාවන්ගේ ප්‍රායෝගික අවශ්‍යතා එමගින් නොසලකා හැර තිබේ. තරඟකාරී හිමිකම් පෑමේ ප්‍රතිඵලයක් ලෙස හිමිකාරිත්වය සනාථ කිරීම සඳහා ලියකියවිලි නොමැතිකම හේතුවෙන් මෙම ගැටලු සංකීර්ණ වේ.[506]

වනාන්තර ආඥාපනතේ 46 වැනි වගන්තිය අතිරේක අභියෝගයක් වන්නේ, ආඥාපනත යටතේ කිසියම් දේපලක් අනවශ්‍ය ලෙස අත්පත් කර ගන්නා ඕනෑම වන නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකුට වසරක් නොඉක්මවන සිරදඬුවමකට හෝ රුපියල් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ දෙකෙන් ම දඬුවම් කිරීම යන සරල දඬුවම පනවා තිබීමෙනි. වෛෂයික ව, මෙය නීති විරෝධී ලෙස පුද්ගලයන් දේපලකින් ඉවත් කර වින්දිතයාගේ ආගමට, ඔවුන්ගේ නිවසට සහ ඔවුන්ගේ ආදායම් මාර්ගවලට පවා ප්‍රවේශය අහිමි කළ හැකි අතර, ඒ අතින් ගත් කල සාපේක්ෂ ව මෙතුළින් නිලධාරීන්ට හිමිවනුයේ දුර්වල දඬුවමකි (විශේෂයෙන් උපරිම දඩ මුදල). මේ අනුව, ආඥාපනත සමකාලීන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධන අවශ්‍ය වේ.

විශේෂයෙන්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවල දී විශේෂිත වනාන්තර ඉවත් කිරීමට දෙපාර්තමේන්තුව උත්සාහ ගනිමින් සිටින බව අනාවරණය විය.[507] එසේ වුව ද, මෙම සහන මගින් රජයේ නිලධාරීන් අත්තනෝමතික ලෙස ඉඩම් අත්පත් කර ගැනීමේ හැකියාවෙන් සන්නද්ධ කෙරෙන නීතියේ ව්‍යුහාත්මක කරුණු නොසලකා හැර තිබේ.

### 3.9. සංචාරක අංශය

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය 2020 අගෝස්තු 9 වැනි දින අංක 2187/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය යටතේ ස්ථාපිත කරන ලද අතර 2020 ඔක්තෝබර් 6 වැනි දින අංක 2196/27 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් එහි විෂය පථය සංශෝධනය කරන ලදි. අමාත්‍යාංශය විසින් සංචාරක අංශය සහ ඉඩම් අංශය යනුවෙන් වෙන් කර ඇති අතර, එක් එක් අංශය යටතේ විශාල ආයතන ප්‍රමාණයක් අධීක්ෂණය කරයි.[508]

දේශීය/විදේශීය සංචාරකයින් සඳහා නව ආකර්ෂණීය ගමනාන්ත හඳුනා ගැනීම සහ සංචාරක කර්මාන්තයේ දියුණුව සඳහා පුද්ගලික අංශයට ආයෝජන සහ අනෙකුත් පහසුකම් ලබා දීම වැනි ඉටු

[506]විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (396 වන පාද සටහන).

[507] CPA විසින් රාජ්‍ය නිලධාරීන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (කොළඹ දිස්ත්‍රික්කය, 2024 ජූලි 5).

[508] 'About the Ministry of Tourism and Lands (Lands Section)' (*Ministry of Tourism and Lands: Lands Section*) <https://landmin.gov.lk/web/en/about-the-ministry/> ප්‍රවේශය 2024 අගෝස්තු 1 ; තව දුරටත් බලන්න 'Overview of the Ministry' (*Ministry of Tourism and Lands*) <https://www.tourismmin.gov.lk/web/index.php/en/about-us/overview-of-the-ministry> ප්‍රවේශය 2024 ජනවාරි 31.

කළ යුතු විශේෂ ප්‍රමුඛතා කිහිපයක් අමාත්‍යාංශය විසින් ම හඳුනා ගෙන ඇත.[509] එහි බොහෝ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, අමාත්‍යාංශයේ සංචාරක අංශය විසින් භාවිතා කරන මූලික නීතිය 2005 අංක 38 දරන සංචාරක පනත මත පදනම් වේ. මෙම ව්‍යවස්ථාව සංචාරක අංශයේ විෂය පථය තුළ ඇති විවිධ ආයතන සඳහා පදනම සපයයි. විශේෂයෙන්, විශේෂිත ඉඩම් ගැටුම් අවස්ථා (කන්කසන්තුරේ ජනාධිපති මන්දිරය වැනි) තුළ අපරාධකරුවන් විසින් සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීමේ අරමුණ කලාතුරකින් හුවා දක්වා ඇති බැවින්, මෙම වාර්තාවේ ප්‍රධාන අවධානයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත යොමු විය.

පනතේ 12 වැනි වගන්තිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ (එස්. එල්. ටී. ඩී. ඒ.) බලතල, යුතුකම් සහ කාර්යයන් ගෙනහැර දක්වයි. සංචාරක පහසුකම් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාව ප්‍රමුඛ සංචාරක ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම ඊට ඇතුළත් ය.[510] අවශ්‍ය පරිදි චංචල හෝ නිශ්චල දේපළ අත්පත් කර ගැනීමට, රඳවා ගැනීමට, බදු දීමට, කුලියට දීමට, ඇප දීමට හෝ බැහැර කිරීමට එස්. එල්. ටී. ඩී. ඒ වෙත බලය පවතී.[511] මීට අමතරව, අධිකාරියට අවශ්‍ය විටෙක පළාත් අධිකාරීන් සමඟ සම්බන්ධවීමේ වගකීම ද ඇති අතර,[512] එයට තමා විසින් සපයන සේවා, පහසුකම් හෝ උපකරණ සඳහා අයබදු හෝ ගාස්තු අය කිරීමට බලය පවතී.[513]

26 වැනි වගන්තිය අනුව, ගැසට් නියෝගයක් මගින් ඕනෑම ප්‍රදේශයක් 'සංචාරක සංවර්ධන ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කිරීමට අධිකාරිය විසින් අමාත්‍යවරයාට නිර්දේශ කළ හැකි ය. එවැනි නිර්දේශයක් කිරීමට පෙර අධිකාරියට මහජන සාක්ෂි විමසීමක් පැවැත්විය හැකි අතර අමාත්‍යවරයාට අදාළ කලාපයන් සඳහා රෙගුලාසි නියම කළ හැකි ය. එසේ වුව ද, [514] මෙකී ක්‍රියාවලියට අනිවාර්ය නිර්ණායක අනුගමනය කිරීම හෝ විනිවිදභාවය පවත්වාගෙන යාම ඇතුළත් නොවේ. මෙමගින් එම ප්‍රදේශ තුළ හෝ ඒ අවට ජීවත් වන පුද්ගලයන්ට හානියක් වන අත්තනෝමතික ප්‍රකාශයන් කිරීම් සිදු විය හැකි ය. පනතේ 70 වන වගන්තිය මගින් සම්බන්ධක විධිවිධාන දක්වන අතර, අධිකාරිය විසින් එහි යම් අරමුණක් සඳහා යම් ඉඩමක් හෝ ප්‍රතිලාභයක් අවශ්‍ය වන විට, එම ඉඩම හෝ ප්‍රතිලාභය අධිකාරිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ රජය මගින් අත්පත් කර ගත හැකි බව දක්වා තිබේ.

### 3.10. 'උරුමය වැඩසටහන'

උරුමය වැඩසටහන යනු 2024 මුල දී දියත් කරන ලද මෑත කාලීන රාජ්‍ය ප්‍රතිපත්තියක් වන අතර එය ඉඩම් පමණක් හිමි ඉඩම් බලපත්‍රලාභීන්ට සින්නක්කර ඔප්පු ලබා දීම හරහා ඉඩම් අයිතිය පිළිබඳ අවිනිශ්චිතතා විසඳීම අරමුණු කරයි. මෙම බලපත්‍ර මේ වන විට රන් භූමි, ජය භූමි සහ ස්වර්ණ භූමි වැනි ආයතන යටතේ පවතී.[515] 2024 ජූනි මස වන විට ශ්‍රී ලංකාවේ විවිධ කලාපවල ජීවත් වන පුද්ගලයන්ට මෙම වැඩසටහන යටතේ සින්නක්කර ඉඩම් ඔප්පු ලබා දී ඇති අතර, 2024 ජූනි මස 17 වන දින වලව ප්‍රදේශයේ මහවැලි ඉඩම් ඔප්පු 1524ක් [516] සහ 2024 ජූනි 30 වන දින මොණරාගල දිස්ත්‍රික්කයේ 600කට ආසන්න ඔප්පු ප්‍රමාණයක් ප්‍රදානය කිරීමට [517] කටයුතු කර තිබේ. උරුමය වැඩසටහන ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ද ක්‍රියාත්මක වී ඇති අතර 2024 මාර්තු

[509] ඉහත පාද සටහන.
[510] සංචාරක පනත (463 වන පාද සටහන), 12(ආ) වගන්තිය.
[511] ඉහත පාද සටහන, 12(ඊ) වගන්තිය.
[512] ඉහත පාද සටහන, 12(ඌ) වගන්තිය.
[513] ඉහත පාද සටහන, 12(ජ) වගන්තිය.
[514] ඉහත පාද සටහන, 26 වගන්තිය.
[515] 'Urumaya Program to Solve Land Issues for 2 Mn. People' *Daily News* (31 January 2024) <https://www.dailynews.lk/2024/01/31/admin-catagories/breaking-news/376561/urumaya-program-to-solve-land-issues-for-2-mn-people/> ප්‍රවේශය 2024 පෙබරවාරි 20.
[516] 'Urumaya land deeds within 2 months to all who are eligible - President Ranil assures' *Lankasara* (17 June 2024) <https://lankasara.com/news/urumaya-land-deed-to-all-who-are-eligible/> ප්‍රවේශය 2024 ජූනි 30.
[517] ''Urumaya': Over 41,000 land deeds granted to Monaragala District residents' *Adaderana* (30 June 2024) <https://www.adaderana.lk/news/100198/urumaya-over-41000-land-deeds-granted-to-monaragala-district-residents-> ප්‍රවේශය 2024 ජූලි 30.

22 වන දින යාපනයේ පුද්ගලයන් 408ක් වෙත සින්නක්කර ඔප්පු ඒ යටතේ ප්‍රදානය කර තිබේ.[518] එම වැඩසටහනේ දිගුකාලීන ක්‍රියාත්මක කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලු කෙරෙහි ඇති බලපෑම තව දුරටත් දැක ගත හැකි ය. රජය විසින් මීට පෙර දියත් කළ ඉඩම් අන්සතු කිරීමේ යෝජනාක්‍රමවල සන්දර්භය තුළ, [519] උරුමය වැඩසටහන උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයන්ට බොහෝ ගැටලු මතු කර ඇත.[520] මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගැනීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළ ද ප්‍රතිචාරයක් නොවී ය.

රජයේ ඉඩම් ක්‍රමානුකූලව අන්සතු කිරීමේ ක්‍රියාවලිය, 1935 ඉඩම් සංවර්ධන ආඥාපනත ගෙන ඒමත් සමඟ ආරම්භ වූ අතර රජයේ ඉඩම් සංවර්ධනය කිරීම සහ ග්‍රාමීය ගොවි ජනතාව අතර පැවති ඉඩම් හිඟය විසඳීම එහි අරමුණ විය. උරුමය රාජ්‍ය ප්‍රතිපත්තිය මගින් ඉඩම් සහ කෘෂිකර්මාන්තය ඒකාබද්ධ කිරීමෙන් ග්‍රාමීය ප්‍රජාවන් නගා සිටුවීමට අපේක්ෂා කරන නමුත්, එවැනි ක්‍රියාමාර්ග විනිවිදභාවයෙන් යුක්ත වීම සහ ව්‍යවස්ථාපිත හා නෛතික රාමුවට අනුකූල වීම සහතික කිරීම සඳහා නියමිත කාර්යයපටිපාටික ආරක්ෂණයන් ඇතුළත් කිරීම ඉතා වැදගත් වේ. 1840 අංක 12 දරන රජයේ ඉඩම් ආඥාපනත සහ 1897 අංක 1 දරන මුඩුබිම් ආඥාපනත වැනි පූර්ව නීති මගින් බ්‍රිතාන්‍ය කිරීටයට හිමි ව නොතිබූ ඉඩම්වලට හිමිකම් පෑමට ඉඩ සැලසූ අතර එය ජනතාව තම ඉඩම්වලින් ඉවත් කිරීමට හේතු විය.[521] 1927 දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ඉඩම් නොමැති අයට ආධාර කිරීම සඳහා රජයේ ඉඩම් ලබා දීම ආරම්භ කළ අතර, ඉඩම් සංවර්ධන ආඥාපනත මගින් ඉඩම් විකිණීම හෝ පැවරීම සීමා කරමින් ඉඩම් වෙන් කිරීමට පහසුකම් සැලසූ අතර එමගින් ඉඩම් මෙන් ම ගොවීන් ද ආරක්ෂා විය.[522] විශේෂයෙන් ම, උරුමය වැඩසටහන ජනාධිපතිවරණ වසරක් තුළ දියත් කරන ලද අතර, වැඩසටහන ක්‍රියාත්මක කිරීම මෙන් ම දේශපාලන පරිසරයට ද සංකීර්ණ බවක් එක් කිරීමට එය හේතු විය.

### 3.11 පළාත් සභා

1987 ඉන්දු ලංකා ගිවිසුමෙන් [523] පසුව පනවන ලද 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය මගින් මධ්‍යම රජයේ සිට පළාත් සභාවලට බලය විමධ්‍යගත කිරීම හඳුන්වා දෙන ලදි.[524] මෙම සංශෝධනය බොහෝ දෙමළ දේශපාලන පක්ෂවල විවේචනයට ලක් වූ අතර, විමධ්‍යගත කිරීමේ රාමුව ඔවුන්ගේ ඉල්ලීම් සහ අභිලාෂයන්ට වඩා පහළ මට්ටමක පැවතීම ඊට හේතු විය. මධ්‍යම සහ පළාත් අතර බලය බෙදීම අපැහැදිලි ය. මධ්‍යම රජයට ඒකපාර්ශ්විකව ක්‍රියා කිරීම මගින් පළාත් සභා පාලනය කිරීමට හෝ ඒවායේ බලතල අඩු කිරීමට හැකි අතර තව දුරටත්, පළාත් සභාවලට තනි හා අනන්‍ය

518 ‘Sri Lankan President Ranil Wickremesinghe releases 234 acres of land in Jaffna for farmers' use’ *The Hindu* (22 March 2024) <https://www.thehindu.com/news/international/sri-lankan-president-ranil-wickremesinghe-releases-234-acres-of-land-in-jaffna-for-farmers-use/article67980134.ece> ප්‍රවේශය 2024 ජූලි 15.

519 N.C. Wickramaarachchi and T.Rathnamalala, ‘Consequences of the State Land Alienation Programme in Sri Lanka’ (2021) 7(4) Journal of Social Sciences and Humanities Review, 248.

520 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිවිල් සමාජ සංවිධාන සහ සමාජ ක්‍රියාකාරීන් සමඟ සිදුකල සම්මුක සාකච්ඡා (ගම්පහ දිස්ත්‍රික්කය, 2024 ජුනි 20).

521 ‘British-inspired land laws that deprived Kandyans of their right to land’ *Daily FT* (20 September 2019) <https://www.ft.lk/Opinion-and-Issues/British-inspired-land-laws-that-deprived-Kandyans-of-their-right-to-land/14-686027c> ප්‍රවේශය 2024 ජූලි 25.

522 Dinusha Rathnayake and others, ‘Land Development Ordinance in Action: Achievements and Prospects of Highland Alienation’ (2021) Hector Kobbekaduwa Agrarian Research and Training Institute <https://www.harti.gov.lk/images/download/reasearch_report/new/report_for_web_244.pdf> ප්‍රවේශය 2024 ජූලි 24.

523 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන්, නව එකඟතාවයකට අදාළ පුළුල් මූලධර්ම ඇතුළත් ඒකාබද්ධ ප්‍රකාශයක් එහි අඩංගු වූ අතර, පළාත් සභාවලට බලය බෙදා හැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීමට එතුළින් ශ්‍රී ලංකාවේ කැපවීම ප්‍රදර්ශනය කර ඇත.

524 Asanga Welikala, ‘Devolution Under The Thirteenth Amendment: Extent, Limits, And Avenues for Reform’ (2023) Centre for Policy Alternatives <http://constitutionalreforms.org/wp-content/uploads/2016/06/Working-Paper-10.pdf> ප්‍රවේශය 2024 මැයි 10.

බලතල හෝ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමට හිමිකම් කිව හැකි විෂයක් නොමැත.[525] පැහැදිලිව ම, නීති සම්පාදනය පිළිබඳ අධිකරණ සමාලෝචනය සම්බන්ධයෙන් ව්‍යවස්ථාමය සීමාවක් පනවා ඇති අතර මධ්‍යය තුළ පළාත් නියෝජනය කිරීමට පහසුකම් සැලසීම සඳහා ස්වාධීන රාජ්‍ය සේවයක් හෝ දෙවන සභාවක් නොමැත.[526] 13 වැනි සංශෝධනය මගින් පොලිස් සහ ඉඩම් බලතල සම්බන්ධ ව කටයුතු කරන වැදගත් ප්‍රතිපාදන ක්‍රියාත්මක නොකර සිටීමට ඉඩ සලසයි.[527] මෙම දෙමුහුන් ක්‍රමය ස්වයං පාලනය සඳහා ඇති දේශීය ඉල්ලුමට සරිලන පරිදි ප්‍රමාණවත් නොවේ. ඓතිහාසික වශයෙන්, මධ්‍යම රජය විසින් සෑම පොරොන්දුවක් ම පැහැර හරින ලද බැවින් දෙපාර්ශවය අතර පරතරය සැලකිය යුතු ලෙස පුළුල් වූ අතර තවමත් ගැටුම් උත්සන්න වීමට දායක වනවාත් සමඟ ම ගැටුම් නිරාකරණයට විශාල බාධාවක් වී ඇත.[528]

13 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවලට නීති සම්පාදනය කිරීමේ බලය ඇත්තේ කවර කරුණු සම්බන්ධයෙන් ද යන්න සඳහන් වේ.[529] පරිශිෂ්ට II හි 18 වැනි අයිතමය විස්තර කර ඇති පරිදි ඉඩම් අයිතිය, ඉඩම් පැවරීම සහ අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම් නිරවුල් කිරීම සහ ඉඩම් වැඩිදියුණු කිරීම පිළිබඳ නීති සම්පාදනය කිරීමට පළාත් සභාවලට ඉඩ සලසයි.[530] කෙසේ වුව ද, II වන උපලේඛනය මගින් රජයේ ඉඩම්, ජනරජයේ පාලනය යටතේ පවතින බවත් 33(ඈ) ව්‍යවස්ථාව සහ අදාළ නීති මගින් පාලනය වන බවත් ප්‍රකාශ කරමින් පළාත් සභාවල බලය සීමා කර තිබේ.[531]

පළාත් සභාවලට කෙතරම් දුරට ඉඩම් බලතල බෙදා තිබුණේ ද සහ එය කොපමණ ප්‍රමාණයකට මධ්‍යම රජය විසින් රඳවාගෙන ඇත්තේ ද යන්න ස්ටැෆර්ඩ් වතු අධිකාරී එදිරිව සෝලෙයිමුතු රාසා නඩුවේ දී ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ප්‍රශ්නගත විය.[532] ඉඩම් බලතල දිගටම මධ්‍යම රජයට පවරා ඇති බව විනිසුරු මොහාන් පීරිස්ගේ විශ්ලේෂණාත්මක නිගමනය විය.[533] රජය සහ පළාත් සභා අතර ඉඩම් බලය සීමා කිරීම සම්බන්ධයෙන් ඔහුගේ මතය දෙයාකාර විය.[534] පළමුව, මධ්‍යම රජයට යම් පළාතක රජයේ ඉඩම් අවශ්‍ය වූ විට, අදාළ පළාත් සභාව සමඟ සාකච්ඡා කිරීම යන්නෙන් සභාවේ එකඟතාව අදහස් නොවේ. ඉන් අදහස් වනුයේ මධ්‍යම රජය සහ පළාත් සභාව අතර ගිවිසුමකට අනුව කටයුතු කිරීමට සාකච්ඡා කිරීමක් පමණි. දෙවනුව, නවවන උපලේඛනයේ (පළාත් සභා ලැයිස්තුව) 1 වැනි ලැයිස්තුවේ 18 වැනි අයිතමයේ සඳහන් වන 'උපදෙස්' යන යෙදුම II වන ඇමුණුමේ සඳහන් වන පරිදි, "පළාතක් තුළ රජයේ ඉඩම් ඕනෑම පුරවැසියෙකුට හෝ කිසියම් සංවිධානයකට අන්සතු කිරීම හෝ බැහැර කිරීම මෙම කාරණය පාලනය කරන නීතිවලට අනුකූලව අදාළ පළාත් සභාවේ උපදෙස් මත ජනාධිපතිවරයා විසින්" (II ඇමුණුමේ හි 1(3 වගන්තිය) [535] මගින් නොබැඳෙන ලෙස අර්ථකථනය කරන ලදි. "අදාළ පළාත් සභාවේ උපදෙස් මත" යන වාක්‍ය ඛණ්ඩයට පෙර 'පමණක්' යන වචනය ඇතුළත් කිරීම මඟ හැරීමෙන් එම උපදෙස් අනිවාර්යය නොවන බවට අදහස් වන්නේ ය යන්න අධිකරණයේ මතය විය.[536] කෙසේ වෙතත්, මෙම තීරණය පෙර පැවති නඩු නීතියෙන් බැහැර වීමක්

---

[525] ඉහත පාද සටහන.
[526] ඉහත පාද සටහන.
[527] Luwie Ganeshathasan and Michael Mendis, 'A Policy Brief: Devolution in the Northern Province: September 2013 – February 2015' (March 2015) Centre for Policy Alternatives <https://www.cpalanka.org/wp-content/uploads/2024/02/CPA-Devolution-in-the-Northern-Province.pdf> ප්‍රවේශය 2024 ජූලි 25. 51.
[528] Rohan Edrisinha, 'Multinatination Federalism and Minority Rights in Sri Lanka' in Will Kymlicka and Baogang He (eds.), *Multiculturalism in Asia* (OUP 2005), 245.
[529] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978" නවවන උපලේඛනයේ 1 ලැයිස්තුව (පළාත් සභා ලැයිස්තුව).
[530] ඉහත පාද සටහන, ඇමුණුම II - ඉඩම් සහ ඉඩම් නිරවුල් කිරීම.
[531] ඉහත පාද සටහන.
[532] *The Superintendent, Stafford Estate v Solaimuthu Rasa* (2013) SC Appeal 21.
[533] ඉහත පාද සටහන, the Judgment of Chief Justice Mohan Peiris in this case is available at <https://www.colombotelegraph.com/wp-content/uploads/2013/09/Supreme-Court-29-09.pdf> ප්‍රවේශය 2024 අගෝස්තු 2.
[534] ඉහත පාද සටහන
[535] ඇමුණුම II (530 වන පාද සටහන), ඡේදය 1(3.
[536] Ganeshathasan and Mendis (528 වන පාද සටහන).

වන අතර පළාත් සභා වෙත පවරා ඇති ඉඩම් බලතලවල ස්වභාවය සහ විෂය පථය සම්බන්ධයෙන් අවිනිශ්චිතතාවයක් ඇති කර තිබේ.[537]

ඉඩම් සහ ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ I ලැයිස්තුවේ II වන උපලේඛනයේ 3 වන අයිතමය, රජයේ ඉඩම් පරිහරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සැකසීම සඳහා වගකිව යුතු ජාතික ඉඩම් කොමිෂන් සභාවක් ස්ථාපිත කරයි. ජාතික ඉඩම් කොමිෂන් සභාවට පළාත් සභා නියෝජිතයන් ඇතුළත් කළ යුතු වුව ද, [538] එය ක්‍රියාත්මක කළහොත් එය ප්‍රධාන වශයෙන් රාජ්‍ය පාලනය යටතේ පවතිනු ඇත. අග විනිසුරු පීරිස්, II වන උපලේඛනය හි 3 වැනි ඡේදය සඳහන් කරමින් ඔහුගේ තීන්දුවේ මෙය ඉස්මතු කරයි: "ජාතික ඉඩම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද උපදෙස් පළාත් සභා විසින් අනුගමනය කළ යුතු බව පැහැදිලි ය. ඒ අනුව, රජයේ ඉඩම් යටත් වනුයේ මධ්‍යම රජයේ අධිකාරියට මිස පළාත් සභාවන්ට නොවේ යන තර්කයට තව දුරටත් සහාය හිමි විය." [539]

බලය බෙදීමේ රාමුව තිබියදීත්, පළාත් සභා ක්‍රියාපටිපාටිය සඳහා ජනාධිපති අනුමැතිය අවශ්‍ය වීම වැනි පළාත් කටයුතුවලට මැදිහත් වීමට ඉඩ සලසන බලතල මධ්‍යගත රජය සතුව පවතින බව සැලකිල්ලට ගැනීම වැදගත් ය.[540] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගෙන ඇති ව්‍යවස්ථාදායක ධුරාවලිය තුළ ප්‍රඥප්ති සඳහා දෙවන පෙළ තත්ත්වයක් හිමි ව තිබීම සහ ප්‍රඥප්ති සම්මත කිරීමට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය අවශ්‍ය වීම නිසා පළාත් සභාවල ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට පවා බාධා එල්ල වී තිබේ.[541] ඉඩම් ගැටුම්වල දී අත්තනෝමතික මධ්‍යම ආයතනික අධීක්ෂණයට පළාත් සභා මගින් පිළිසරණක් ලැබෙනු ඇතැ යි යන බලාපොරොත්තුව තරමක් දුරට ගිලිහී යාමට මේ තත්ත්වය හේතු වී තිබේ.

බලය බෙදීමට පෙර යටත් විජිත ව්‍යුහයන්ගේ පැවැත්ම සහ ක්‍රියාත්මක වීම මෙන් ම දිස්ත්‍රික්ක සහ උප දිස්ත්‍රික් මට්ටමින් නව ආයතන ඇති කිරීම ද පළාත් සභාවල අධිකාරීත්වය හැල්ලු වීමට හේතු වී තිබේ. මෙම ගැටලුවට නිදසුනක් ලෙස, ජනාධිපති බලතලවල දිගුවක් ලෙස 1992 දී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආරම්භ කිරීම[542] පළාත් සභා පාලන බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන නමුත් පළාත් සභාවලට වග නොකියන තත්ත්වයට ඒවා පත් කිරීම දැක්විය හැකි ය.[543] මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ තරඟකාරී පරිපාලන ව්‍යුහයන්, ඉඩම් ගැටුම් ඇතුළු ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ ගැටලු නියෝජනය කිරීම සඳහා තම ව්‍යවස්ථාදායක සහ විධායක බලතල ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පළාත් සභාවලට නොහැකි වීම යි. බලය බෙදා ගැනීම සඳහා වූ සෑම යෝජනාවක් ම ඊට කිසි සෙත් උපකාරී නොවන බව ඔප්පු වී ඇති විකල්ප යෝජනා මගින් දියාරු කර ඇත.[544] මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ තරඟකාරී පරිපාලන ව්‍යුහයන්, ඉඩම් ගැටුම් ඇතුළු ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ ගැටලු නියෝජනය කිරීම සඳහා තම ව්‍යවස්ථාදායක සහ විධායක බලතල ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පළාත් සභාවලට නොහැකි වීම යි. බලය බෙදා ගැනීම සඳහා වූ සෑම යෝජනාවක් ම ඊට කිසි සෙත් උපකාරී නොවන බව ඔප්පු වී ඇති විකල්ප යෝජනා මගින් දියාරු කර ඇත.

---

[537] බලන්න *Re the Land Ownership Bill* (2003) SC. SD. No.26/2003-36/2003; තව දුරටත් බලන්න *Vasudeva Nanayakkara v K.N. Choksy and Others* (2008) I S.L.R 134.

[538] Fonseka and Jegatheeswaran (49 වන පාද සටහන).

[539] ඇමුණුම II (530 වන පාද සටහන).

[540] Lionel Guruge and Asanga Welikala, 'Devolution in the Eastern Province: Implementation of the Thirteenth Amendment and Public Perceptions' (2008-2010) Centre for Policy Alternatives <https://www.cpalanka.org/wp-content/uploads/2023/08/Devolution-in-the-EPC_English.pdf> ප්‍රවේශය 2024 මැයි 5.

[541] ඉහත පාද සටහන

[542] 1992 අංක 58 දරන බලතල පැවරීමේ (ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත) පනත.

[543] Guruge and Welikala (541 වන පාද සටහන).

[544] Minna Thaheer, Pradeep Peiris and Kasun Pathiraja, '*Reconciliation In Sri Lanka: Voices From Former War Zones*' (International Centre for Ethnic Studies 2013).

නිගමනය

වාර්ගික දේශපාලන න්‍යාය පත්‍රවලට සේවය කිරීම සඳහා බොහෝ විට ඒවා හසුරුවන පුළුල් ජනවරම සමඟ ක්‍රියාත්මක වන විවිධ රාජ්‍ය ව්‍යුහයන් පවතින බව පර්යේෂණය ඉස්මතු කරයි. උද්දීපනය කරන ලද ගැටලු සලකා බැලීමේ දී, මෙම අභියෝග සාකල්‍ය ලෙස විසඳීමට බරපතළ කැපවීමකින් සහය වන පුළුල් නීති සහ රෙගුලාසි අවශ්‍ය වේ. එවැනි වෙනසක් ඉදිරියේ දී සිදුවේ ද යන්න ප්‍රශ්නාර්ථයකි.

අවසාන වශයෙන්, මෙම පරිච්ඡේදයේ ගවේෂණය කරන ලද නීතිමය සන්දර්භය උතුරු නැගෙනහිර සිදු වූ අපයෝජනයන් සඳහා අඩිතාලම දැමීමත් සමඟ, මෙම රාජ්‍ය ක්‍රියාකාරීන් සිංහල-බෞද්ධ ජාතිකවාදීන්, ත්‍රිවිධ හමුදාව මෙන් ම සංවර්ධන න්‍යාය පත්‍රයක් සහිත පුද්ගලික සංස්ථා වැනි ඉඩම් අත්පත් කර ගැනීම්වලට සම්බන්ධ අනෙකුත් යෝජකයින් සමඟ අඛණ්ඩ ව සම්බන්ධ වන බව හඳුනාගත හැකි ය. පහත දැක්වෙන පරිච්ඡේදය මෙම වර්ධනය වන මර්දනකාරී ප්‍රවණතා සහ විවිධ අපරාදකාරී පාර්ශවයන් අතර ඡේදනය වන සහයෝගීතාවය ඇගයීමට ලක් කරනු ඇත.

# 4. ඉඩම් අර්බුදයන් හි අන්තර් ඡේදනීය ප්‍රවණතා

ඉහත 2 වන පරිච්ඡේදයේ පැහැදිලි කර ඇති සිදුවීම් මෙන් ම 3 වන පරිච්ඡේදයේ පැහැදිලි කර ඇති මෙම ගැටුම් පවත්වාගෙන යාමට උපකාරී වන ව්‍යවස්ථාපිත රාමුව තව දුරටත් විශ්ලේෂණය කිරීම හරහා, අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් රාශිය අතර ප්‍රධාන අන්තර් සම්බන්ධිත ප්‍රවණතා මාලාවක් හඳුනා ගැනීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට හැකි විය. ඒ අනුව, වාර්ගිකත්වය, අඛණ්ඩ රජයේ අධිකාරී මැදිහත් වීම, මිලිටරි ව්‍යාප්තිය සහ පුද්ගලික ආයතනවල ලාභ ඉපැයීමේ අරමුණු මෙකී ප්‍රවණතා අතර වේ.

සෑම ප්‍රවණතාවක් ම ක්‍රියාත්මක වන්නේ 'වාර්ගික ජාතික' ආඛ්‍යානයක් පතුරුවා හැරීම සඳහා නැගී එන දේශපාලන කැමැත්තේ පුළුල් ඡත්‍රය යටතේ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පෙන්වා දෙන අතර අනෙකුත් හානිකර අභිප්‍රේරණ එම සමස්ත න්‍යාය පත්‍රය සමඟ සහසම්බන්ධ වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස සිදු වන ඉඩම් අහිමි වීම ඊට ගොදුරු වන පුද්ගලයන්ගේ ජීවනෝපාය, ආගම, සංස්කෘතිය සහ පරිසරය මුලිනුපුටා දැමීමට හේතු වන අතර, එවැනි හානි පිළිබඳ බොහෝ විට ප්‍රධාන ධාරාවේ මාධ්‍යවලින් ද වාර්තා නොවේ. ඒ අතරම, බලපෑමට ලක් වූ පාර්ශවයන් මෙම යෝජනා ක්‍රමවලට සිය ප්‍රතිරෝධය දිගටම ප්‍රදර්ශනය කරමින් සිටීමට හෝ මිශ්‍ර ප්‍රතිචාර දැක්වීමට කටයුතු කරයි. පෙර පරිච්ඡේදවල සඳහන් කළ පරිදි, නීතිමය ව්‍යුහයන් සහ රාජ්‍ය පාර්ශවකරුවන් උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල වාර්ගික හා ආගමික ආතතීන් ඇති කිරීමට මෙවැනි යාන්ත්‍රණයන් හේතු වන අතර, එය බෙදීම් වැඩි වීමට පදනම දැමීම ඔස්සේ අනාගත ගැටුම්වලට පවා හේතු විය හැකි ය. මෙම ගැටුම් සමනය කිරීමට ඇති වගකීම නොසලකා හරිමින්, උතුරු හා නැගෙනහිර මිලිටරිකරණය කිරීමත්, වඩාත් මෑතක දී, බහුජාතික සමාගම්වලට මෙම කලාපවල ස්වභාවික සම්පත් නිස්සාරණය කිරීමට සහ වෙළඳ භාණ්ඩ බවට පත් කිරීමට අවසර ලබා දීමත් සමඟ රජය විසින් මෙම තත්ත්වය තවත් උග්‍ර කර ඇත.

ප්‍රථමයෙන් ඉඩම් ගැටුම් නිසා උග්‍ර වන උතුරු නැගෙනහිර 'වාර්ගික' හැඟීම් වර්ධනය වීම සහ ඒවා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් මෙහෙයවනු ලබන ආකාරය ගවේෂණය කිරීමෙන් මෙම පරිච්ඡේදය ආරම්භ වේ. දෙවනුව, මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ දක්වා ඇති නෛතික ව්‍යුහයන් මත පුරෝකථනය කරන ලද, මෙම කලාපවල මෙම ආඛ්‍යාන ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතනික ව්‍යුහයන් විසින් භාවිතා කරන විවිධ ක්‍රමවේදයන් පිළිබඳ ව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පුළුල් ව විමසා බලයි. තෙවනුව, වාර්තාව විවිධ මිලිටරි යෝජකයින් හරහා ඉදිරිපත් කරන ලද යටිබිම්ගත සමගාමී චේතනාවන් පිළිබඳ ව අවධානය යොමු කරනු ලබයි. අවසාන වශයෙන්, එවැනි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් භාවිතා කරන සංකීර්ණ ව්‍යුහයන් හේතුවෙන් බොහෝ විට

අවදානයට ලක් නොවන ඉඩම් ගැටුමේ පැතිකඩ කෙරෙහි ද අවදානය යොමු කරමින් 'සංවර්ධන' න්‍යාය පත්‍රයේ මෑත කාලීන ප්‍රවණතා සාකච්ඡා කරයි.

### 4.1. වාර්ගිකවාදී ආඛ්‍යාන

සිවිල් යුද්ධයෙන් පසු සංහිඳියාව මෙන් ම සාමය ගොඩනැගීමට 'වාර්ගික ජාතිකවාදය' භයානක අභියෝගයක් බව ඔප්පු වී තිබේ.[545] කිසියම් ජාතියක් ජනවාර්ගිකවාදය මත පුරෝකථනය කළ විට එක් ජනවාර්ගික ප්‍රජාවක් රාජ්‍යයක අන් සියල්ලන්ට වඩා උසස් ස්ථානයක රැඳවීම අවශ්‍ය වන අතර, මෙය අනෙක් සියලු ම සුළු ජාතීන් කොන් කිරීමට හේතු වන අතර මිනිසුන්ගේ ජීවත්වීමේ හැකියාවට සෘජුවම බලපෑ හැකි පරිදි බහුවිධ අයිතිවාසිකම් කඩවීම් සහ ප්‍රතිපත්ති සහ නීති සම්මත කිරීම ද එමගින් සිදුවිය හැකි ය.[546] මෙය උතුර සහ නැගෙනහිර බොහෝ දෙනෙකුගේ අත්දැකීම් බවට පත් ව ඇති අතර දශක ගණනාවක් පුරා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ලේඛනගත කර තිබේ. සාම්පූර් [547] වැනි අවස්ථා මීට කදිම නිදසුනකි. වාර්ගික සුළු ජාතීන්ට තම ඉඩම් අහිමිවීමේ හදිසි හා අත්තනෝමතික ස්වභාවය ශත වර්ෂ ගණනාවක් පැරණි පූජනීය ස්ථානවල සිය ආගම ඇදහීමේ අයිතිය අහිමි වන බවටත්, තම ඉඩම්වල දුර්ලභ වෘක්ෂලතා වගා කිරීමට හෝ ගවයන් ඇති කිරීමට නොහැකි වන බවටත්, ඇඟවුම් ලබා දෙයි. මෙය ශ්‍රී ලංකාවේ බිදෙනසුළු ආර්ථික සන්දර්භය තුළ දරිද්‍රතාවය පිරී ගිය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ඔවුන් වැඩි වශයෙන් ප්‍රවේශ කිරීමට  සෘජුව ම හේතු වී තිබේ. රාජ්‍ය අධිකාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ඔස්සේ බොහෝ ඉඩම් ගැටුම්වල දී සුළු ජාතීන් මර්දනය කිරීමෙහි ලා ප්‍රධාන භූමිකාවක් ඉටු කළ[548] සිංහල-බෞද්ධ යෝජකයින් විසින් වාර්ගික බහුතරවාදී ආඛ්‍යානයේ සැලකිය යුතු කොටසක් පෝෂණය කරනු ලැබුව ද, ජනවාර්ගිකවාදය ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම් අතුරින් පැන නගින විෂ ම වූ සංකල්පයක් ලෙස සැලකිය යුතු ය. උතුරු නැගෙනහිර සමකාලීන ඉඩම් ගැටුම් ඇගයීමේ දී සිංහල  ජනවාර්ගිකත්වය රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන විසින් සිංහල-බෞද්ධකරණය කිරීමේ උත්සාහයන් තුළින් පැන නගින බවත්, ප්‍රාදේශීය ව ක්‍රියාත්මක 'හින්දුත්ව' ජාතිකවාදී ව්‍යාපාරය විසින් හින්දු වාර්ගිකත්වය උත්සන්න කෙරෙන බවත් දක්නට ලැබෙන්නකි.

'සිංහල-බෞද්ධකරණයෙන්' ආරම්භ වී,[549] රජය විසින් සිංහල වාර්ගිකත්වයට සහ බෞද්ධ ආගමට ප්‍රමුඛත්වය ලබා දී ඇති ආකාරය විවිධ මූලාශ්‍ර මගින් මනාව ලේඛනගත කර ඇත.[550] ඓතිහාසික වශයෙන්, මෙම වාර්ගික-බහුතරවාදී ප්‍රවේශය ප්‍රජාවන් තුළ බෙදීම් ඇති කළ අතර,  දශක ගණනාවක් පුරා මෙම ජනවාර්ගික හා ආගමික ආතතීන්ගේ අග්‍ර ඵලය ලෙස 26 වසරක සිවිල් යුද්ධය පෙන්වා දිය හැකි ය.[551] 2 වන පරිච්ඡේදයේ හඳුනා ගත් ඉඩම් ගැටුම්වල දී, ප්‍රධාන වශයෙන් අඩු වරප්‍රසාද ලත් සුළු

---

[545] Michael D. Levin, 'Introduction' in Michael D. Levin (eds) *Ethnicity and Aboriginality: Case Studies in Ethnonationalism* (UOT Press 1993) defines ethnonationalism as an "extreme political expression of ethnicity".

[546] Ayesha Zuhair,  'Dynamics of Sinhala-Buddhist Ethnonationalism in Post War Sri Lanka' (April 2016) Centre for Policy Alternatives, <https://www.cpalanka.org/wp-content/uploads/2016/04/Dynamics-of-Sinhala-Buddhist-Ethno-Nationalism-in-Post-War-Sri-Lanka.pdf> ප්‍රවේශය 2024 ජනවාරි 25.

[547] Centre for Policy Alternatives ( 1 වන පාද සටහන).

[548] Fonseka and Dissanayake (48 වන පාද සටහන).

[549] Neil DeVotta, 'Sinhalese Buddhist Nationalist Ideology: Implications for Politics and Conflict Resolution in Sri Lanka' (2007), 'සිංහල-බෞද්ධකරණයී යන්න නිර්වචනය කරන්නේ "සිංහල-බෞද්ධ අධිපතිකරණයට වරප්‍රසාද ලබා දෙන, සුළු ජාතීන් යටත් කිරීම සාධාරණීකරණය කරන සහ අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට අයත් අය ශ්‍රී ලංකාවේ ජීවත් වන්නේ සිංහල-බෞද්ධ ජනතාවට දුක් වේදනා ඇති කිරීම උදෙසා පමණක් යැයි යෝජනා කරන" සංකල්පයක් ලෙස ය.".

[550] Thomas K. Gugler, 'Buddhist Zion: Sri Lanka's Sinhalisation Politics toward its Muslim Minority' (January 2013); PEARL, 'State Sponsored Sinhalisation of the North-East' (March 2022) <https://pearlaction.org/wp-content/uploads/2022/03/State-Sponsored-Sinhalization-of-the-North-East-March-2022.pdf> ප්‍රවේශය 2024 ජුනි  30" this interprets the revival of the Buddhist culture and religion as being a "return to Sinhala".

[551] A.R.M. Imtiyaz, 'Buddhism and Electoral Politics in Sri Lanka: Politicization, Tensions and Depoliticization of Buddhism' (2013) Journal of Asian and African Studies

ජාතීන්ගෙන් ඉඩම් හිමිකර ගැනීම සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් සිංහල වාර්ගිකත්වය සහ බෞද්ධ ආගම සන්නද්ධ කොට ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හඳුනා ගනු ලැබ තිබේ.[552] ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද සන්දර්භය තුළ, ඉඩම් ගැටුම් හරහා නැවත වරක් වාර්ගික ආතතීන් රජය විසින් අවුලුවාලීම කනස්සල්ලට හේතුවකි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මයිලතමඩු හි ඉඩම් ගැටුම් ආශ්‍රිත ව සිදු කළ පර්යේෂණයේ දී වාර්ගික ජාතිකවාදී ආඛ්‍යාන සදාකාලික කිරීමේ භූමිකාවක රජය නිරත වන බවට හඳුනා ගැනිණි (පරිච්ඡේදය 2.2.1 බලන්න). එහි දී, එවකට නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරියගේ අනුග්‍රහය ඇති ව, වර්තමාන 'මහවැලි බී යෝජනා ක්‍රමයී තුළ සිංහල ජනාවාස මාලාවක් ස්ථාපනය කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම භූමිය තුළ කිරි ගොවිතැන සිදු කරන ප්‍රාදේශීය දෙමළ ප්‍රජාවන්ට සිය ජීවනෝපාය අහිමි විය.[553] මෙම ජනාවාසවලින් අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවල දක්වනු ලබන මැලිකම හරහා රාජ්‍ය අනුග්‍රහය සහිත ව ම වාර්ගික සුළුතරයන් අවතැන් කෙරෙන බව දක්නට ලැබෙන්නකි.

බෞද්ධ ආගම සමඟ සිංහල අනන්‍යතාවය අන්තර් ඡේදනය වන ආකාරය කුච්චවේලි විහාරස්ථාන 32 ආශ්‍රිත ගැටුම් පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ පර්යේෂණයන් හි පැහැදිලි වේ. (පරිච්ඡේදය 2.7.5 බලන්න. ) එහි දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 'ජාතික උරුමයන්' සංරක්ෂණය කිරීම නිදහසට කරුණක් ලෙස භාවිතා කර ඇත. එහි දී කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ගෙන් රජය විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගත් පෞද්ගලික ඉඩම් අක්කර 2500කට අධික ප්‍රමාණයක විහාරස්ථාන 32ක් ඉදි කිරීම ආරම්භ විය.[554] චේත්තියගිරි පුරාණ රජ මහා විහාරය ඉදි කිරීම බැහැර කළ නොහැකි උදාහරණයකි (පරිච්ඡේදය 2.7.5 බලන්න), එමගින් 'වෙම්බේස්වරර්' නම් පැරණි හින්දු ශිවන් කෝවිල විනාශ කර ඒ වෙනුවට පෞද්ගලික සහ පොදු ඉඩම් හෙක්ටයාර 50කට වැඩි ප්‍රමාණයකට ලියාපදිංචි අයිතිය ද සමඟින් බෞද්ධ විහාරස්ථානයක් ස්ථාපිත කරන ලදි.[555] මෙම සියලු සිදුවීම්වල දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් රජයේ ජනවාර්ගික-බහුතරවාදී න්‍යාය පත්‍රය සාමාන්‍යකරණය කරමින් විහාරය ඉදි කිරීම සඳහා ඉඩම් ලියාපදිංචි කිරීම සහතික කරන ලදි. මෙම විවිධ අවස්ථාවල දී රාජ්‍ය පාර්ශවකරුවන් යොදා ගැනීම, නීතිය සහ ප්‍රතිපත්ති වාර්ගික සුළු ජාතීන්ට එරෙහි ව ආයුධ වශයෙන් භාවිතා කිරීම සහ උතුරු නැගෙනහිර ජනවාර්ගික ආඛ්‍යානයක් ප්‍රචාරණය කිරීම සඳහා රජයේ අනුක්‍රමික වැඩසටහන් පවතින බව මේ ඔස්සේ ප්‍රදර්ශනය වේ.

කෙසේ වෙතත්, සෑම අවස්ථාවක ම එවැනි කටයුතු රාජ්‍ය ක්‍රියාකාරීන් විසින් ආරම්භ නොකරන බව ද පිළිගත යුත්තකි. රාජ්‍ය පාර්ශවයන් පමණක් නොව පෞද්ගලික පාර්ශවකරුවන් විසින් ද සිංහල-බෞද්ධකරණයේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන බව දක්නට ලැබෙන්නකි. චූලිපුරම් පරලෛ මුරුගන් කෝවිල ආශ්‍රිත සිදුවීම් මාලාව තුළින් මේ බව දැක ගත හැකි අතර, (පරිච්ඡේදය 2.3.1 බලන්න) ඒ අනුව 2022 වසරේ දී බෞද්ධ භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකු හින්දු කෝවිලේ බෝධීන් වහන්සේ අබියස බෞද්ධ ප්‍රතිමාවක් තැබීමට උත්සාහ කළ අතර එයට රාජ්‍ය ආයතනවල සහාය හිමි විය.[556] මෙකී බොහෝ සිදුවීම් අතර පොදු ලක්ෂණයක් වන්නේ දෙමළ-හින්දු සහ මුස්ලිම් අවශ්‍යතාවන්ට එරෙහි ව සිංහල-බෞද්ධ න්‍යාය පත්‍රයක් පැතිර වීමට රාජ්‍ය ආයතන විසින් රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ට සහයෝගය ලබා දීමයි.

එසේ වුව ද, බෙදීමේ විවිධ පැති නියෝජනය කරන විවිධ ජාතිකවාදීන් වෙතින් සංහිඳියාවට අභියෝග පමුණුවන බව පිළිගත යුතු ය.[557] මෑතක සිට ඉඩම් ගැටුම් උත්සන්න වීම රජය විසින් පමණක් නොව උතුරු හා නැගෙනහිර අන්තවාදී හින්දු ජාතිකවාදී කතිකාවන්ගේ නැගීම මගින් ද අවුලුවා ඇති අතර,

<https://www.researchgate.net/publication/228275661_Politicization_of_Buddhism_and_Electoral_Politics_in_Sri_Lanka> ප්‍රවේශය 2024 මාර්තු 3.

[552] K.M. De Silva, '*Ethnic Conflict in Buddhist Societies: Sri Lanka, Thailand, and Burma*' (LP 1988).

[553] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (41 වන පාද සටහන).

[554] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (310 වන පාද සටහන).

[555] *N.K.S. Thiruchelvam* (310 වන පාද සටහන).

[556] *Virakesari* (61 වන පාද සටහන).

[557] Zuhair (547 වන පාද සටහන).

එය අඩුවෙන් වාර්තා වී ඇති ප්‍රශ්නයක් වීම තැතිගන්වනසුළු ය. මෙම හැඟීම් අවුලුවාලීම හින්දුත්ව ව්‍යාපාරයේ[558] බලපෑමෙන් සිදු වන අතර, මෙරට තුළ හින්දු 'සිව සේනායි' ව්‍යාපාරය පිහිටු වීම[559] ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ වැඩි කනස්සල්ලට හේතු වී තිබේ.[560] මෙම ව්‍යාපාරයේ ප්‍රධාන සංවිධායක මරවන්පුලවු සච්චිතානන්දන් ප්‍රකාශ කර ඇත්තේ "හින්දු කෝවිල් අන්‍ය ආගමිකයන්ගේ ආක්‍රමණයන්ගෙන්" ආරක්ෂා කිරීමටත් හින්දු භක්තිකයන්ට වෙනත් ආගම්වලින් එල්ල වන " තර්ජනවලට" මුහුණ දීමටත් මෙම කණ්ඩායම අපේක්ෂා කරන බව යි. එවැනි බලපෑමක් දැනටමත් ගොඩනැගී ඇති ආතතීන් වැඩි කළ හැකි බවට දෙමළ පක්ෂ බිය පළ කරති.[561] ඒ අනුව, ආගමික ජාතිකවාදය, වාර්ගිකවාදයෙන් වෙන්වීමක් ද මෙයින් දක්නට ලැබෙන්නකි.[562]

ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවල දී, හින්දු ජාතිකවාදී කතිකාවන් ද මේ වන විට 2 වන පරිච්ඡේදයේ දක්වා ඇති ඉඩම් ආශ්‍රිත ගැටලුවල දී සමාන අයුරින් ප්‍රකාශ වීමට පටන්ගෙන ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හඳුනා ගෙන තිබේ. මේ සඳහා ප්‍රධානතම උදාහරණයක් ලෙස මුලතිව් කුරුන්තුමලෛ ආති අයියනාර් කෝවිල ආශ්‍රිත ව සිදුවීම් හඳුනා ගත හැකි ය (පරිච්ඡේදය 2.6.1 බලන්න). මෙහි දී, අදාළ ඉඩම 'පුරාවිද්‍යා රක්ෂිතයක්' ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, ඓතිහාසික මූලාරම්භය මතභේදයට තුඩු දී තිබේ. ඒ අනුව, සිංහල-බෞද්ධ ප්‍රජාව එය "කුරුන්දි විහාරය" ලෙස හැඳින් වූ අතර හින්දූන් එය "කුරුන්තුමලෛ" ලෙස හඳුන්වමින් සිටී.[563] කෙසේ වෙතත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 2020 වසරේ සිට මෙම ඉඩමට අයිතිය කියා පෑම ආරම්භ කළ අතර, බොහෝ අවස්ථාවන් හි අනුගමනය කළ ප්‍රවණතාව මෙන් ම, වසංගත අගුලු දැමීම් අතරතුර මෙම භූමියේ ස්තූපයක් ඉදි කරන ලදි.[564] මෙය ජනවාර්ගික හා ආගමික ආතතීන් ඉහළ යාමට හේතු වූ අතර, එමගින් සිංහල-බෞද්ධ පාර්ශවයන්ට ප්‍රාදේශීය ප්‍රජාවන්ගෙන් දැඩි විරෝධයක් එල්ල විය. ඔවුන් කියා සිටියේ භූමිය තුළ පිහිටා ඇති බෞද්ධ ස්මාරක හින්දු පිළිවෙත පිළිබඳ සාක්ෂි ද හෙළි කරන බව යි.[565] ඉහත කී 'සිවසේනයි' ප්‍රධාන සංවිධායකවරයා එම ස්ථානයට හිමිකම් කියමින් කුරුන්තුමලේ ආති

558 'What is Hindutva and why does it matter? *Middle East Eye* (27 June 2024) <https://www.middleeasteye.net/explainers/what-hindutva-india-rss-bjp-modi> ප්‍රවේශය 2024 මැයි 3" නූතනයේ වර්ධනය වන හින්දුත්ව බලපෑම ඉන්දියාව තුළ හින්දු ආදිපත්‍ය වෙනුවෙන් පෙනී සිටින බව මෙයින් ප්‍රකාශ විය. එය ඉන්දියාවේ ඝී වැනි පාර්ලිමේන්තු කණ්ඩායම් විසින් භාවිතා කරන ලද මතභේදාත්මක ව්‍යාපාරයක් වන අතර එමගින් ඉන්දියාවේ මුස්ලිම් පල්ලි ගිනි තැබීමට සහ කෝලාහලවලට සම්බන්ධ බවට එවැනි සංවිධානවලට එරෙහි ව චෝදනා එල්ල වී ඇත; තව දුරටත් බලන්න 'What is Hindutva, the ideology of India's ruling party?' *The Economist* (7 March 2024) <https://www.economist.com/the-economist-explains/2024/03/07/what-is-hindutva-the-ideology-of-indias-ruling-party> ප්‍රවේශය 2024 මැයි 7; Virendra Prakash, 'Hindutva' Demystified' (New Delhi VP, 2002).

559 Maneshka Borham, 'Rising Hindutva Influence: Social Media Divide in Sri Lanka's North and East' *Hashtag Generation* (27 March 2024) <https://hashtaggeneration.org/rising-hindutva-influence-social-media-divide-in-sri-lankas-north-and-east/> ප්‍රවේශය 2024 මැයි 20; Ama Koralage, 'How Social Media is Fuelling Sri Lanka's Ethnoreligious Issues' *Groundviews* (2 May 2024) <https://groundviews.org/2024/05/02/how-social-media-is-fuelling-sri-lankas-ethnoreligious-issues/#:~:text=It%20is%20widely%20believed%20that,conflict%20encountered%20in%20Sri%20Lanka> ප්‍රවේශය 2024 මැයි 25.

560 Lakmal Harischandra, 'Siva Senai's Anti-Muslim Tirade – Buddhists & Hindus Should Be Careful' *Colombo Telegraph* (4 June 2018) <https://www.colombotelegraph.com/index.php/siva-senais-anti-muslim-tirade-buddhists-hindus-should-be-careful/> ප්‍රවේශය 2024 ජනවාරි 30.

561 P.K. Balachandran, ''Siva Senai' formed in Sri Lanka to enable Hindus to face threats from other religions' *The New Indian Express* (13 October 2016) <https://www.newindianexpress.com/world/2016/Oct/12/siva-senai-formed-in-sri-lanka-to-enable-hindus-to-face-threats-from-other-religions-1527283.html> ප්‍රවේශය 2024 ජනවාරි 30.

562 'Siva Senai in Sri Lanka gets Shiva Sena Support, Colombo Worried' *Adaderana* (14 October 2016) <https://www.adaderana.lk/news.php?nid=37389> ප්‍රවේශය 2024 ජනවාරි 30.

563 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාව 245 වන පාද සටහන.

564 *Virakesari* (255 වන පාද සටහන).

565 'Sri Lankans are squabbling over monuments' *The Economist* (30 November 2023) <https://www.economist.com/asia/2023/11/30/sri-lankans-are-squabbling-over-monuments> ප්‍රවේශය 2024 ජනවාරි 20.

අයියනාර් විහාරස්ථානයට පැමිණි භික්ෂූන් වහන්සේලා සමඟ සාකච්ඡා කිරීම තුළින් මෙම සාකච්ඡා තුළ පවතින හින්දු ජාතිකවාදී බලපෑම පැහැදිලි වේ.[566]

අනාගත ගැටුම් සඳහා අඩිතාලම දමමින්, හින්දු ජාතිකවාදීන්ගේ අන්තවාදී පුරසාරම් සමඟ රාජ්‍ය අනුග්‍රහය ලබන වාර්ගිකවාදය බද්ධ වීම හේතුවෙන් අවිනිශ්චිත තත්ත්වයක් මතුවීමට පටන් ගෙන තිබේ. රාජ්‍ය ආයතන විසින් මෙම විභවතාවන් අවම කිරීමට සක්‍රීය ව මැදිහත් වනු ඇතැයි බලාපොරොත්තු වන නමුත්, රජයේ මැදිහත්වීම්වලට ආවේණික වූ වාර්ගික ආගමික වෙනස් කොට සැලකීම් ඉඩම් ආශ්‍රිත ගැටුම් උග්‍ර කිරීමට හේතු වී තිබේ.

4.2. රජයේ අධිකාරීන්ගේ මැදිහත් වීම

විවිධාකාර වූ ඉඩම් ආශ්‍රිත ගැටුම් වාර්ගිකවාදී හැඟීම්වලින් ආවරණය වී තිබුණ ද, මෙම ආඛ්‍යාන සුළු ගැන්වීමට විවිධ ක්‍රියාකාරීන් දායක වන අතර, රාජ්‍ය ආයතන එහි මූලික වරදකාරී පාර්ශවයක් වන බව දක්නට ලැබෙන්නකි. මුල දී, ඉඩම් අයිතිය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රධාන අවධානයට ලක් වූ අතර එහි දී ඉඩම් පිළිබඳ අධික පාලනය සම්බන්ධ ලක්ෂණය රජය විසින් ප්‍රදර්ශනය කරන ලදි. [567] මෙම අධික පාලනය අද වන විට මතභේදයට තුඩු දී ඇති හෝ පෞද්ගලික ඉඩම් දක්වා ව්‍යාප්ත වී ඇති අතර, විවිධ රජයේ ක්‍රියාකාරීන්ගේ මැදිහත් වීමෙන් 'රාජ්‍ය' ඉඩම් බවට පරිවර්තනය කෙරෙන තත්ත්වයක් නිර්මාණය වී තිබේ. රජයේ මෙම 'ප්‍රමුඛ ක්‍රියාවලිය යටතේ වාර්ගිකවාදී ආඛ්‍යාන ස්ථාපිත කිරීමට, මිලිටරිමය සංවර්ධනය ඉදිරියට ගෙන යාමට සහ ඉඩම්, වෙළඳ භාණ්ඩ බවට පත් කිරීම උදෙසා පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීමට පියවර ගෙන ඇති අතර, ඒ සියල්ල ම "මහජන යහපත" ඉදිරියට දමමින් සිදු කරන බව ද දක්නට ලැබෙන්නකි. [568]

අද වන විට, දෙපාර්තමේන්තු කිහිපයක් මෙම ක්‍රියාවලියට සහභාගී වී ඇති අතර, 2 වන පරිච්ඡේදයේ පැහැදිලි කර ඇති පරිදි, ඇතැම් අවස්ථාවල දී, ඉඩම් ගැටුම් අවුලුවා ඇති අතර, 3 වන පරිච්ඡේදය තුළ විස්තර කර ඇති පරිදි, ව්‍යවස්ථාපිත රාමුව තුළ ඉඩම් බාධාවකින් තොරව අත්පත් කර ගැනීමට හැකියාව පවතී. විවිධ අවස්ථාවන්හි දී, මෙම බලධාරීන් ඉඩම් පිළිබඳ ඔවුන්ගේ පාලනය පුළුල් කිරීම පිණිස එකිනෙකට වෙනස් තර්ක සහ ක්‍රමවේදයන් භාවිත කරන බව පැහැදිලි වන්නකි. නිදසුනක් වශයෙන්, පහත සඳහන් පරිදි පුරාවස්තු පනත භාවිතයෙන් ඉඩම් අත්පත් කර ගැනීම් සිදු කරන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හැඳින්විය හැක්කේ නිරන්තර චෝදනාවට ලක් වන ආයතනයක් වශයෙනි.

1. පළමුව, අම්පාරේ මුල්ලිකුලම් මලෙෙ ප්‍රදේශය ආශ්‍රිත සිදුවීමේ දී පෙන්නුම් කළ පරිදි, පනතේ 33 වැනි වගන්තියට අනුව දෙපාර්තමේන්තුවට කිසියම් නිශ්චිත භූමි ප්‍රදේශයක් 'පුරාවිද්‍යා රක්ෂිතයක්' බවට ප්‍රකාශ කළ හැකි ය (පරිච්ඡේදය 2.1.2 බලන්න).[569]

---

566 'Sachidanandan visited Kurundur Hill Buddhist Vihara' *Tamil Win (2023)* <https://tamilwin.com/article/maravanpulau-sachithanandam-at-kurundur-hill-1690153908> ප්‍රවේශය 2024 අගෝස්තු 4 ; තව දුරටත් බලන්න 'An Attempt to ward off international pressure? Clandestine meeting between Buddhist monks and Shiv Sena in Kurunthurmalai' *Tamil Guardian* (18 January 2024) <https://www.tamilguardian.com/content/attempt-ward-international-pressure-clandestine-meeting-between-buddhist-monks-and-shiv-sena > ප්‍රවේශය 2024 අගෝස්තු 3.

567 Kavindra Paranage, 'The consequences of restricting rights to land: understanding the impact of state-land tenure policies in Sri Lanka' (2019) Taylor and Francis Online <https://www.tandfonline.com/doi/full/10.1080/15487733.2018.1545556> ප්‍රවේශය 2024 මැයි 20.

568 Iromi Perera, Deanne Uyangoda and Ermiza Tegal , 'The Making of a World Class City: Displacement & Land Acquisition in Colombo' (January 2017) Centre for Policy Alternatives <https://www.cpalanka.org/the-making-of-a-world-class-city-displacement-and-land-acquisition-in-colombo/#:~:text=1%20February%202017%2C%20Colombo%2C%20Sri,continuity%20under%20the%20yahapalanaya%20government> ප්‍රවේශය 2024 අප්‍රේල් 28.

569 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1884 දරන ගැසට් පත්‍රය.

2. දෙවනුව, යාපනයේ නිලවරායි ප්‍රදේශයේ දක්නට ලැබෙන පරිදි, පුරාවිද්‍යා කොමසාරිස්වරයාගෙන් බලපත්‍රයක් ලබා ගත් පසු, පුරාවස්තු පනත භාවිතයෙන් ඕනෑම ඉඩමක කැණීම් සිදු කිරීමට දෙපාර්තමේන්තුවට කටයුතු කළ හැකි ය.[570]

3. තෙවනුව, අම්පාරේ මානික්කමඩු ප්‍රදේශයේ දක්නට ලැබෙන පරිදි එම ඉඩම සඳහා ඉඩම් මැනීමක් අවශ්‍යය යන ව්‍යාජ තර්කය යටතේ දෙපාර්තමේන්තුව කලාතුරකින් ඉඩම් අත්පත් කර ගෙන ඇත (2.1.1 පරිච්ඡේදය බලන්න).[571]

මෙම අවස්ථාවල දී ඉස්මතු වන විශ්ලේෂණාත්මක කරුණක් වන්නේ, බොහෝ රාජ්‍ය ක්‍රියාකාරීන් හින්දු ආගමේ සහ දෙමළ සංස්කෘතියේ වැය බරින් බෞද්ධ සහ සිංහල සංස්කෘතිය/උරුමය ආරක්ෂා කිරීමට ප්‍රමුඛස්ථානය දෙන බව දක්නට ලැබීමයි. 'ජාතික උරුමයන්' පවත්වාගෙන යාම යන්න නිදහසට කරුණක් ලෙස උපයෝගී කරගනිමින් මෙලෙස ජනවාර්ගික ආඛ්‍යානයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරයි. නිදසුනක් ලෙස, වෙඩුක්කුනාරි කන්දේ ආති ලිංගේෂ්වරර් කෝවිල සම්බන්ධ සිදුවීම (පරිච්ඡේදය 2.8.3 බලන්න), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා හමුදාවේ සහාය ඇති ව මතභේදයට තුඩු දී ඇති පුරාවිද්‍යා භූමිය පිළිබඳ සමීක්ෂණයක් සහ ගවේෂණයක් සිදු කළ අතර, එම ස්ථානයේ හින්දු ආගමික ස්මාරක හෝ නටබුන් පිළිබඳ කිසිදු හෝඩුවාවක් නොමැති බවට නිගමනය කෙරිණි. කඳු පාමුල හින්දු දෙවිවරුන්ගේ ධාතු ඇති බවට වන විශ්වාසයන් මෙහි දී කිසිදු සැලකිල්ලකට ගෙන නො තිබිණි. [572] තවද, ඇතැම් අවස්ථාවල දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 'පුරාවිද්‍යා භූමියක්' ප්‍රකාශයට පත් කර ඇති විට, ප්‍රකාශිත ඉඩම අල්ලාගෙන සිටින බෞද්ධ භික්ෂූන් වැනි පුද්ගලික ක්‍රියාකාරීන් විසින් බුද්ධ ප්‍රතිමාවක් තැබීමට හෝ බෞද්ධ විහාරයක් ඉදි කිරීමට කටයුතු කරන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නිරීක්ෂණයට ලක් විය. උදාහරණයක් ලෙස, අම්පාරේ මානික්කමඩු හි (පරිච්ඡේදය 2.1.1 බලන්න), බෞද්ධ භික්ෂූන් වහන්සේලා එම ස්ථානය පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස නම් කර තිබියදීත්, බුද්ධ ප්‍රතිමාවක් ස්ථාපනය කිරීමට උත්සාහ කළහ. [573] බෞද්ධ භික්ෂූන් වහන්සේලාට එරෙහි ව නීති ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය යාන්ත්‍රණ අසමත් වීම, බෞද්ධ හා හින්දු ආගම් අතර සංස්කෘතික උරුමයන් නීතිමය වශයෙන් ක්‍රියාත්මක කිරීමේ සහ ආරක්ෂා කිරීමේ විෂමතාවයන් අවධාරණය කරන අතර මෙය පක්ෂග්‍රාහී රාජ්‍ය මැදිහත්වීම් පිළිබඳ කනස්සල්ල මතු කරන්නකි.

මෙම ජනවාර්ගික සිංහල-බෞද්ධ න්‍යාය පත්‍රයේ ප්‍රචාරණය නගර සහ ග්‍රාම නිර්මාණ ආඥාපනත හරහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ක්‍රියා කලාපය දක්වා ද විහිදෙන්නකි. ශ්‍රී සද්ධර්ම යුක්තික වන සෙනසුන, ආසිරිකාන්ත පුරාණ රජ මහා විහාරය, මුහුදු මහා විහාරය යනාදී බෞද්ධ පුදබිම් සම්බන්ධයෙන් මෙම පනත අදාළ කර ගෙන තිබේ (පරිච්ඡේදය 2.1.3 බලන්න). 2 වන පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති අන්දමට ආඥාපනතේ 6 වගන්තිය යටතේ හින්දු/මුස්ලිම් ඉඩම් 'පූජනීය ප්‍රදේශ' ලෙස ප්‍රකාශයට පත් කිරීමට මෙහි දී කටයුතු කර තිබේ. [574] පනතේ 6 වැනි වගන්තියේ 'නාගරික සංවර්ධන ප්‍රදේශ' ගැන පමණක් සඳහන් වුව ද, රජයේ දෙපාර්තමේන්තුව පනත අර්ථ දැක්වීමේ දී එකිනෙකට වෙනස් යෙදුම් දෙකක් භාවිත කරන බව දක්නට ලැබෙන්නකි. නාගරික සංවර්ධනය යන්න එකිනෙකට වෙනස් යෙදුම් දෙකක් ලෙස භාවිත කිරීමෙන් බහුතර ජනගහනය (දෙමළ සහ මුස්ලිම් පුද්ගලයින්) සුළුතර ආගම්වලින් (හින්දු ආගම සහ ඉස්ලාම්) සමන්විත වන ප්‍රදේශවල වාර්ගික-ආගමික යටත් විජිතයක් තව දුරටත් පවත්වාගෙන යාම වඩාත් සැඟවුණු න්‍යාය පත්‍රයක් ලෙස හඳුනාගත හැකි ය. දිගුකාලීන වශයෙන් රටේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල මැතිවරණ සංයුතියේ වෙනස්කම් සිදු කිරීම මගින් වාර්ගික බහුතරය (සිංහල-බෞද්ධ) විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන රජයකට වාසිදායක වන පරිදි සියල්ල තීරණය කිරීම බව ඒ අනුව පැහැදිලි වේ.

---

570 *Virakesari* (73 වන පාද සටහන).
571 Marikar (6 වන පාද සටහන).
572 Vanniarachy (417 වන පාද සටහන).
573 Marikar (6 වන පාද සටහන).
574 AHRC (376 වන පාද සටහන).

වින්දිතයන් හා සසඳන විට රාජ්‍ය බලධාරීන් උදෙසා පැහැදිලිව ම දණ්ඩමුක්තියක් ක්‍රියාත්මක වන අතර එය සුළුතර ප්‍රජාවන් අත් විඳින අසාධාරණ සැලකිලිවලට හේතු වී තිබේ. වින්දිතයන් හා සසඳන විට රාජ්‍ය බලධාරීන් උදෙසා පැහැදිලිව ම දණ්ඩමුක්තියක් ක්‍රියාත්මක වන අතර එය සුළුතර ප්‍රජාවන් අත් විඳින අසාධාරණ සැලකිලිවලට හේතු වී තිබේ.[575] පශ්චාත් යුද සමය තුළ ජනතාව නැවත සිය ඉඩම් වෙත පැමිණි විට මෙම ප්‍රදේශ බොහොමයක් වනාන්තර බවට පත් ව ඇති බව සොයා ගත් අතර ඔවුන්ගේ ඉඩම් එළි පෙහෙළි කර භාවිතයට ගැනීමට උත්සාහ කිරීමේ දී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුල් ඉඩම් හිමියන්ට නැවත ඇතුළු වීම සහ සිය ඉඩම් භාවිතා කිරීම තහනම් කරන ලදි. මෙම ගැටලු පැහැදිලි කර ගැනීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡාවක් පවත්වන ලදි. ඉතා වැදගත් කරුණක් නම්, 2009 සිවිල් යුද්ධයෙන් ඉක්බිති ව, විවිධ රාජ්‍ය ආයතන බොහෝමයක් නියමිත ක්‍රියාවලියට අනුගත නොවී ඉඩම් සන්තකයේ තබාගෙන 'සංවර්ධන' ව්‍යාපෘතිවල පදනම මත වන විනාශ කිරීමේ ක්‍රියාවලියක පවා නිරත වූ බව මෙම නිලධාරීන් තහවුරු කිරීම ය. [576] කෙසේ වෙතත්, 'ඉඩම් කොල්ලකෑම්' හෝ ප්‍රාදේශීය ප්‍රජාවන්ට හානි කිරීමේ ක්‍රියාවලීන් සඳහා තමාගේ කිසිදු සම්බන්ධයක් පවතින බව දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කළ අතර, ඒ වෙනුවට, 2012 සිට, ජී පී එස් තාක්ෂණය භාවිත කරමින්, දෙපාර්තමේන්තුව වනාන්තරවල ආරක්ෂාව සහතික කිරීම සඳහා වනාන්තර කිහිපයක් ගැසට් මගින් ප්‍රකාශයට පත් කළ බව සඳහන් කළේ ය..[577] වත්මන් ජනාධිපතිවරයාගේ උපදෙස් පරිදි අත්පත් කර ගත් ඉඩම් නිදහස් කිරීමට සාකච්ඡා සිදුවෙමින් පවතින නමුත් එය නිදහස් කිරීමට අවශ්‍ය ක්‍රියාදාමයන් අසම්පූර්ණ බව නිලධාරීහු තහවුරු කළහ. [578]

උතුරු නැගෙනහිර ඓතිහාසික වශයෙන් හින්දු සහ මුස්ලිම් ප්‍රදේශවල ආඛ්‍යානය සිංහල-බෞද්ධත්වයට පරිවර්තනය කිරීම රාජ්‍ය බලධාරීන්ගේ මූලික අරමුණ වී ඇති බව සත්‍යයක් විය හැකි නමුත්, 2022 වසරේ පැමිණි ආර්ථික අර්බුදයත් සමඟ මෙම අභිප්‍රේරණ ආර්ථික ක්‍රම අනුගමනය කරමින් ලාභ ඉපැයීමේ අවශ්‍යතා සමඟ ගැටගැසී ඇත.[579] අර්බුදයට පිළියම් යෙදීම සඳහා සෘජු විදේශ ආයෝජන වැඩි කිරීම මීට එක් විසඳුමක් ලෙස රජය විසින් අනුගමනය කළ අතර,[580] දරුණු ආර්ථික අර්බුදයට මුහුණ දීම සඳහා විශාල ඉඩම් කට්ටි අත්පත් කර ගැනීමට ආයෝජකයන්ට ඉඩ දෙන ලදි. අවධානයට ලක්විය යුතු කරුණ නම්, ආයෝජනය කිරීමට උත්සාහ කරන බහුජාතික සමාගම් අවට ප්‍රදේශවල සිටින පුද්ගලයන්ට එල්ල වන අවදානම් වළක්වා ගැනීමට අවශ්‍ය ආයෝජනය කිරීමේ දී සැබෑ රාජ්‍ය බාධකවලට මුහුණ නොදීම යි. ජනවාර්ගික න්‍යාය පත්‍රය මේ අවස්ථාවේ දී ද හිස ඔසවන අතර, උතුරේ විශේෂයෙන් අවදානමට ලක් විය හැකි ප්‍රජාවන්ගේ ඉඩම් මෙම 'සංවර්ධන' න්‍යාය පත්‍රය සඳහා රජය විසින් ඉලක්ක කර ඇති බව ඒ අනුව දක්නට ලැබෙන්නකි. කෙසේ වුව ද, ආයෝජන නිසි ලෙස අධීක්ෂණය කිරීමට සහ පවතින සම්පත් ආරක්ෂා කිරීමට අපොහොසත් වී ඇති බැවින් රජයට තව දුරටත් වගකීම පැවරේ.

එමෙන් ම, පාරිසරික බලපෑම් තක්සේරුවට අදාළ ව අනවශ්‍ය ලංසු තැබීමේ ක්‍රියාවලීන් මෙන් ම පවතින කාර්යය පටිපාටිය ප්‍රමාණවත් නොවීම පිළිබඳ ගැටලු අදානි ග්‍රීන් එනර්ජි සුළං බල ව්‍යාපෘතිය ආශ්‍රිත ව මතු විය (පරිච්ඡේදය 2.5.1 බලන්න), එනම් පක්ෂි සහ මත්ස්‍ය පරිසර විද්‍යාව, බලශක්ති ස්වෛරීභාවය සහ වාසයට සුදුසු ඉඩම් කෙරෙහි ව්‍යසනකාරී බලපෑම් ඇති කරන සංවර්ධන

---

[575] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (508 වන පාද සටහන).
[576] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (508 වන පාද සටහන).
[577] ඉහත පාද සටහන.
[578] ඉහත පාද සටහන.
[579] 'Economic conditions in debt-stricken Sri Lanka improving, IMF says' *Al Jazeera* (22 March 2024) <https://www.aljazeera.com/economy/2024/3/22/economic-conditions-in-debt-stricken-sri-lanka-improving-imf-says#:~:text=The%20Indian%20Ocean%20island%20nation,a%20bailout%20package%20last%20year> ප්‍රවේශය 2024 මැයි 24.
[580] 'Govt. confident of attracting USD 2.3 by end of 2023' *The Island* (18 December 2023) <https://island.lk/govt-confident-of-attracting-usd-2-3-by-end-of-2023/> ප්‍රවේශය 2024 මැයි 20; 'Sri Lanka strongly expects to sign up US$3.0 FDI in 2024, with China refinery' *Economy Next* (12 May 2024) <https://economynext.com/sri-lanka-strongly-expects-to-sign-up-us3-0-fdi-in-2024-with-china-refinery-162667/> ප්‍රවේශය 2024 මැයි 24..

වැඩසටහනකට කදිම නිදසුනකි. මෙහි ඇති පාරිසරික බලපෑම් හඳුනාගැනීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරියට පැවරී ඇති නමුත්, ව්‍යාපෘතිය තුළින් කිසිදු සැලකිය යුතු හානියක් සිදු නොවන බවට දක්වා ඊට අවසර දී තිබේ. ඉඩම් ගැටලුවට අදාළ සන්දර්භය විමසා බැලීමේ දී, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඉඩම 'බලශක්ති සංවර්ධන ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, එම අධිකාරිය අදානි ව්‍යාපෘතියේ රාජ්‍ය අනුග්‍රාහකයා ලෙස හැඳින්වීම නිවැරදි ය. ව්‍යාපෘතිය සඳහා 2023 ජුනි මාසයේ දී ඉඩම් අත්පත් කර ගැනීමේ දැන්වීම් නිකුත් කර ඇති බව වාර්තා වන නමුත් එමෙන් ම, පාරිසරික බලපෑම් තක්සේරුවට අදාළ ව අනවශ්‍ය ලංසු තැබීමේ ක්‍රියාවලීන් මෙන් ම පවතින කාර්යය පටිපාටිය ප්‍රමාණවත් නොවීම පිළිබඳ ගැටලු අදානි ග්‍රීන් එනර්ජි සුළං බල ව්‍යාපෘතිය ආශ්‍රිත ව මතු විය (පරිච්ඡේදය 2.5.1 බලන්න), එනම් පක්ෂි සහ මත්ස්‍ය පරිසර විද්‍යාව, බලශක්ති ස්වෛරීභාවය සහ වාසයට සුදුසු ඉඩම් කෙරෙහි ව්‍යසනකාරී බලපෑම් ඇති කරන සංවර්ධන වැඩසටහනකට කදිම නිදසුනකි. මෙහි ඇති පාරිසරික බලපෑම් හඳුනාගැනීමේ වගකීම මධ්‍යම පරිසර අධිකාරියට පැවරී ඇති නමුත්, ව්‍යාපෘතිය තුළින් කිසිදු සැලකිය යුතු හානියක් සිදු නොවන බවට දක්වා ඊට අවසර දී තිබේ. ඉඩම් ගැටලුවට අදාළ සන්දර්භය විමසා බැලීමේ දී, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඉඩම 'බලශක්ති සංවර්ධන ප්‍රදේශයක්' ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, එම අධිකාරිය අදානි ව්‍යාපෘතියේ රාජ්‍ය අනුග්‍රාහකයා ලෙස හැඳින්වීම නිවැරදි ය. ව්‍යාපෘතිය සඳහා 2023 ජුනි මාසයේ දී ඉඩම් අත්පත් කර ගැනීමේ දැන්වීම් නිකුත් කර ඇති බව වාර්තා වන නමුත්[581] විමර්ශනය අඩු කොට අදානි සමූහයට ව්‍යාපෘති අනුමැතියට අදාළ සියලු කඩුලු පහසුවෙන් පැන ගැනීමට ඉඩ හසර ලබා දෙනු පිණිස අනුමත කිරීමේ ක්‍රියාවලියෙන් බොහෝ කොටසක් ඉතා රහසිගත ව සිදු කොට ඇති බව දක්නට ලැබෙන්නකි. ව්‍යාපෘතිය වටා ඇති ප්‍රශ්න ව්‍යාපෘතිය අනුමත කරන්නන්ට එරෙහි ව සාපරාධී චෝදනා පවා ගොනු කිරීමට වුව ද ප්‍රමාණවත් බව කිව හැකි ය..[582] රජයේ ඇතැම් ආයතන වෙතින් අනුමැතිය ලබා ගැනීමට පවා ඉතිරි ව තිබුණ දල[583] රජයේ බලධාරීන් විසින් සිදු කරන පසු කාලීන බියගැන්වීම් පිළිබඳ අතීත අත්දැකීම් මෙන් ම ක්‍රියාවලිය පිළිබඳ නිසි දැනුම්වත්කමක් අවට ප්‍රදේශවල පදිංචිකරුවන් සතුව නොමැතිකම සැලකිය යුතු ප්‍රජා විරෝධයකින් තොරව ව්‍යාපෘතිය වෙත කොළ එළි දැල්වීමට හේතු වූ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සොයා ගනු ලැබී ය.[584] සාර්ව-ආර්ථික වර්ධනය දිරිගැන්වීමේ ප්‍රයත්නයේ දී, සමාජීය වශයෙන් අවදානමට ලක් විය හැකි පුද්ගලයින්ට සහ ප්‍රජාවන්ට හානි සිදුවී ඇති අතර, එවැනි ප්‍රතිවිපාක ඇති කිරීමට රජය ද වග කිව යුතු ය.

යාපනයේ ජනාධිපති මන්දිරය අවට ඉඩම් සංචාරක සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට කටයුතු කළ උතුරු නැගෙනහිර සංචාරක හා කෘෂිකර්මය නියෝජනය කරන රාජ්‍ය දෙපාර්තමේන්තු සහ හමුදාමය මැදිහත්වීම් තුළින් ද මූල්‍යමය අවශ්‍යතා හඹා යාම පැහැදිලි ව දක්නට ලැබෙන්නකි (පරිච්ඡේදය 2.3.5 බලන්න). [585] අත්තනෝමතික ලෙස ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා රාජ්‍ය බලධාරීන් නැවත නැවතත් හවුල් වීම, ලාභය සඳහා දායක වන ආකාරය මෙම සිදුවීමෙන් පෙන්නුම් කරන අතර පොලිසිය සහ හමුදාව එකී අරමුණු බලාත්මක කිරීමේ මෙවලම් ලෙස උපයෝගී වන ආකාරය ද එතුළින් නිරූපණය කෙරේ.

ඊට අමතරව උතුරු නැගෙනහිර පළාත් සභාවලට එම ක්‍රියාවලිය අඩාල කිරීමට ඇති නොහැකියාව ද පැහැදිලි ව දැක ගත හැකි ය. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් ඉඩම් පිළිබඳ බලතල පළාත් සභාවලට බෙදා හැරීම අරමුණු වුව ද, ප්‍රායෝගිකව මෙම බලතල සීමා කර ඇත්තේ මධ්‍යම රජය විසින් පළාත් සභා ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම මගිනි. බිඳී ගිය දිස්ත්‍රික් ක්‍රමය (පරිච්ඡේදය 3.11 බලන්න) ගැටලුවට එක් කිරීමත් සමග, කලාපීය ආරවුල් විසඳනු ලබන්නේ මධ්‍යම රජයේ වාර්ගික අවශ්‍යතා මනසේ තබා ගනිමින් වන අතර, අවදානමට ලක් විය හැකි ප්‍රාදේශීය

[581] Vibuda Wijebandara, 'Concerns raised over Adani Group's engagement in wind power project' *Centre for Environmental Justice* (10 February 2023) <https://news.ejustice.lk/concerns-raised-over-adani-groups-engagement-in-wind-power-project/> ප්‍රවේශය 2024 ජනවාරි 26.
[582] 'Adani power project in SL: SJB accuses of financial fraud' *Newswire* (27 June 2024) <https://www.newswire.lk/2024/06/27/adani-power-project-in-sl-sjb-accuses-of-financial-fraud/> ප්‍රවේශය 2024 ජූලි 26.
[583] Wijedasa (170 වන පාද සටහන)
[584] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (145 වන පාද සටහන).
[585] *BBC News Tamil* (114 වන පාද සටහන).

ප්‍රජාවන්ට ඔවුන්ගේ ප්‍රාදේශීය සභාව මත විශ්වාසය තැබීමට නොහැකි වන අයුරිනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම මෙම සන්දර්භය තුළ අත්‍යවශ්‍ය වන අතර මෙම ඉඩම් ගැටුම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලෙස කටයුතු කිරීම සඳහා ඉඩම් පිළිබඳ බලතල ඉඩම් කොමිෂන් සභාවක් හරහා පළාත් වෙත ලබා දීම අත්‍යවශ්‍ය වේ. එවැනි ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ගයක් ඉදිරියේ දී සිදුවේ ද යන්න ප්‍රශ්නාර්ථයකි.

සමස්තයක් වශයෙන්, අත්තනෝමතික ව්‍යවස්ථාපිත නීති, හමුදා නිලධාරීන් සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන රාජ්‍ය බලධාරීන් විසින් ප්‍රධාන වශයෙන් වාර්ගික ආගමික අරමුණක් සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ඵලදායී මෙවලම් ලෙස භාවිතා කරන අතර, මූල්‍ය අවශ්‍යතා ද මේ සඳහා කලාතුරකින් සම්බන්ධ වනු දැකිය හැකි ය. මෙහි පුළුල් චිත්‍රය දෙස බලන විට, රාජ්‍ය ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය වන්නේ, බොහෝ අහිංසක මිනිසුන්ගේ ජීවිතවලට හානි කරමින් සුළුතර ප්‍රජාවන් අඛණ්ඩ ව සමාජයේ කෙළවර වෙත තල්ලු කිරීම වන අතර, මෙමගින් දෙමළ-හින්දු සහ මුස්ලිම් ප්‍රජාවන් තුළ වාර්ගික හා ආගමික අන්තවාදය වැපිරිය හැකි සරු පසක් නිර්මාණය කළ හැකි ය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමකාලීන ඉඩම් ගැටුම්වල දී, නූතන රාජ්‍යය පසුගිය පාලන තන්ත්‍රවල වැරදි නැවත නැවතත් සිදු කරනු දක්නට ලැබේ. ත්‍රිවිධ හමුදාව දිගින් දිගටම මෙම කලාපවල සිටීමෙන් මෙම වැරදි උග්‍ර කරන්නේ කෙසේ ද යන්න මීළඟට විග්‍රහ කෙරේ.

## 4.3. හමුදාකරණය

සිවිල් යුද්ධය අවසන් වී වසර 15ක් ගත වී තිබියදීත්, උතුරු නැගෙනහිර මිලිටරිකරණය වූ රාජ්‍යයක් පවත්වාගෙන යාමේ මානසිකත්වය, පශ්චාත් ගැටුම් සන්දර්භයකට මාරු වීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාවට බාධා පමුනුවන්නකි. පෙර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ ප්‍රකාශනවල හඳුනා ගත් පරිදි,[586] ත්‍රිවිධ හමුදාව, උතුරු හා නැගෙනහිර ප්‍රදේශය පුරා ඉඩම් ගැටුම් සම්බන්ධයෙන් නිරන්තර මැදිහත්වීම් සිදු කර ඇති අතර, මෙම මැදිහත්වීම් නිතර එකිනෙකට සම්බන්ධ ක්‍රම දෙකකින් සිදු වේ; පළමුව, 'ජාතික ආරක්ෂාව' මුවාවෙන් හමුදාව වෙනුවෙන් රජය ඉඩම් අත්පත් කර ගන්නා අතර, දෙවනුව, හමුදාව සිංහල-බෞද්ධ ජාතිකවාදීන් වෙනුවෙන්, විශේෂයෙන් 'ජාතික උරුමයී පිළිබඳ අදහසක් අනුගමනය කරමින් සහායක භූමිකාවක් ඉටු කරයි.

ප්‍රධාන වශයෙන්, 'මිලිටරිකරණය' සඳහා වූ ප්‍රවණතාවය විශේෂයෙන් සිංහල-බෞද්ධ කල්පිතයක් සහිත ව උතුරු නැගෙනහිර සිවිල් යුද්ධයේ දී විස්තාරණය කළ අතර,[587] ඒ ඔස්සේ හමුදාව විසින් අධි ආරක්ෂිත කලාප ගණනාවක් ඉදි කිරීමටත්, විවිධ හමුදා මූලස්ථාන ගොඩනැගීමටත්, විවිධ ස්ථානවල මුරපොලවල් ඉදි කිරීමටත්, කටයුතු කරන ලදි.[588] හමුදාකරණය වූ රාජ්‍යයක මානසිකත්වය දිගට ම පවතින අතර, ශ්‍රී ලංකා නාවික හමුදාව, ගුවන් හමුදාව සහ පාබල හමුදාව විසින් පෞද්ගලික ඉඩම් අඛණ්ඩ ව අත්පත් කර ගැනීමත්, ඇතැම් අවස්ථාවල උතුරු නැගෙනහිර පොලිසියේ සහාය ඊට හිමිවීමත් දක්නට ලැබෙන්නකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස දැනටමත් නොදියුණු සහ අඩු වරප්‍රසාද සහිත ශ්‍රී ලාංකීය සමාජයේ කොටසක් විශාල වශයෙන් අවතැන් වී ඇති අතර එය දැනටමත් නොසන්සුන් වූ වාර්ගික ආගමික තත්ත්වයක් උත්සන්න කරන්නකි.[589] ඉහත සඳහන් කළ සාම්පූර් සිද්ධියෙන් මෙම උත්සුකයන් පිළිබඳ පැහැදිලි අදහසක් ලබා ගත හැකි අතර, එහි දී රාජ්‍ය අනුග්‍රහය ඇති ව පුද්ගලයන්

---

[586] Fonseka and Dissanayake (148 වන පාද සටහන); තව දුරටත් බලන්න Fonseka and Jegatheeswaran (n 49).

[587] K.M. De Silva, 'Sri Lanka: Political-Military Relations' (November 2001) <https://www.clingendael.org/sites/default/files/pdfs/20011100_cru_working_paper_3.pdf> ප්‍රවේශය 2024 ජනවාරි 24; තව දුරටත් බලන්න Daniel W. Kent, 'Onward Buddhist Soldiers: The Sri Lankan Civil War through the Eyes of Buddhist Military Personnel' (2005) International Conference on Sri Lanka Studies <http://repository.kln.ac.lk/handle/123456789/5777> ප්‍රවේශය 2024 ජුනි 25.

[588] Oakland Institute, '*The Long Shadow of War*' (2015), 2020 වන විට උතුරු නැගෙනහිර සෑම පුරවැසියන් හය දෙනෙකුට ම එක් හමුදා නිලධාරියෙකු සිටින බවට චෝදනා කරයි.

[589] 'Why Can't We Go Home?'(9 October 2018) Human Rights Watch <https://www.hrw.org/report/2018/10/09/why-cant-we-go-home/military-occupation-land-sri-lanka> ප්‍රවේශය 2024 ජුනි 3 යුද්ධයෙන් පසුව 40"000ක් අවතැන් ව සිටින බව වාර්තා කළ අතර, බොහෝ දුරට එම පිරිස යාපනයේ පුද්ගලයන්ගෙන් සමන්විත විය.

විසින් සිය දේපළවලට ප්‍රවේශ වීම සීමා කිරීම ප්‍රාදේශීය ප්‍රජාවන් විසින් අභියෝගයට ලක් කරන ලදි.[590] යුද්ධය අවසන් වී වසර 15කට පසු අවතැන් කඳවුරුවල ජීවත් වන ප්‍රජාවන් තව දුරටත් පිටුවහල් කිරීම සඳහා 'ජාතික ආරක්ෂාව' යන සංකල්පය කඩතුරාවක් ලෙස යොදා ගන්නා ආකාරය මෙම සිද්ධියෙන් පෙන්නුම් කෙරේ. මෙසේ අත්පත් කර ගෙන සිටින භූමිය නිදහස් කිරීමට රාජ්‍ය හා මිලිටරිය අකමැත්තෙන් පසුවන තුරු, 'පශ්චාත් යුදී රාජ්‍යයක සිට 'පශ්චාත් ගැටුම්' රාජ්‍යයකට සංක්‍රමණය වීම ශ්‍රී ලංකාවට දුෂ්කර වූවකි.

මෙම වාර්තාවේ 2 වන පරිච්ඡේදයේ පෙන්නුම් කර ඇති පරිදි, හමුදාව විසින් අල්ලාගෙන සිටින ඉඩම් විවිධ පරිපාලන අංශ ආවරණය වන විශාල භූමි ප්‍රමාණයක් ආවරණය කළ හැකි නමුත් ගොවිපලක් පමණක් ඇතුළත් වන කුඩා ඉඩම් කොටස් පවා ඇතුළත් කළ හැකි ය. උදාහරණයක් ලෙස, වවුනියාවේ ආන්ඩිය පුලියන්කුලම (පරිච්ඡේදය 2.8.1 බලන්න) මෙම ගැටලු නිදර්ශනය කරයි, ඒ අනුව මුලින් කෘෂිකාර්මික ඉඩම් අක්කර 160ක් සහ වර්තමානයේ නාවික හමුදා කඳවුරු කිහිපයකින් සමන්විත වේ.[591] එසේ ම මන්නාරම මුල්ලිකුලම් ප්‍රදේශයේ (පරිච්ඡේදය 2.5.2 බලන්න), 'එස්. එල්. එන්. එස්. භරණ' නම් වූ නාවික හමුදා මූලස්ථානය මත භේදයන්ට තුඩු දී ඇති ඉඩමක ගොඩනැගිලි තිබුණ ද, එම ඉඩම මුලින් ප්‍රාදේශීය ප්‍රජාවන් විසින් වගා කටයුතු සඳහා භාවිතා කරන ලදි.[592] හමුදාව ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ ඉල්ලීම්වලට එකඟ වී ඉඩම් කිහිපයක් නිදහස් කර ඇතත්, අත්පත් කර ගත් ඉඩම් හමුදාව භාරයේ දිගටම පවතී.

මෙම අවස්ථාවල දී, ඉඩම් අත්පත් කර ගැනීමේ නෛතික ක්‍රියාවලිය අනුගමනය කරන ආකාරයෙහි නොගැළපීමක් දක්නට ලැබේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිදු කළ පර්යේෂණ මගින් ව්‍යවස්ථාපිත නීතිවල දක්වා ඇති අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට වඩා වෙනස් යථාර්ථයක් පෙන්නුම් කරයි, එහි දී ඉඩමේ නීත්‍යානුකූල හිමිකරුවන් බොහෝ විට අත්පත් කර ගැනීමේ උත්සාහයන් පිළිබඳ ව දැනුම්වත් කර නොමැති අතර, එවැනි අත්පත් කර ගැනීම් පිළිබඳ සොයා බැලීමට තාවකාලික ක්‍රමවේදයන් පමණක් උපයෝගී කර ගෙන තිබේ.[593] ඊටත් වඩා ගැටලු සහගත ලෙස, හමුදාව ඉඩම් නිදහස් කරන බවට සහතික වී ඇති අවස්ථාවක, වින්දිතයන් තම නිවෙස් වෙත ආපසු පැමිණ බලන කල ආරක්ෂක හමුදා විසින් එකී ඉඩම් තවමත් අත්පත් කර ගෙන සිටින බව හෝ අර්ධ වශයෙන් අත්පත් කර ගෙන සිටින බව හඳුනා ගෙන තිබේ.[594] බොහෝ අවතැන් වූ පුද්ගලයන්ට හමුදාකරණයට එරෙහි වීමට අවශ්‍ය ඉඩම් සම්බන්ධ ලියකියවිලි නොමැති වීම නිසා තත්ත්වය වඩාත් දුෂ්කර වී ඇත.[595] මෙම තත්ත්වයන් තුළ, අත්තනෝමතික ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වැළැක්වීම පිණිස වින්දිතයින්ට ඇති එකම ක්‍රියාකාරී පිළිවෙත විරෝධතා දැක්වීම පමණි. යාපනයේ මණ්ඩයිතිව් ප්‍රදේශයේ නාවික හමුදා මූලස්ථානය පිහිටු වීමට පෙර ඉඩම් මනින අවස්ථාවේ දී ම එකී ඉදි කිරීම අත හැර දැමීමට ඉඩම් හිමියන්ගේ, සමාජ ක්‍රියාකාරීන්ගේ සහ දේශපාලන පක්ෂවල විරෝධතා හේතු විය (පරිච්ඡේදය 2.3.3 බලන්න).[596]

මෙම සන්දර්භය තුළ ඇති ප්‍රධාන ම ප්‍රශ්නය වන්නේ 'ඇයි?' යන්න යි. හමුදා ව්‍යාප්තියේ අවශ්‍යතා සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් ලුහුබැඳීම හේතු ගණනාවක් නිසා සිදු වන බව පෙනේ. එසේ වුව ද, 4.1.1 පරිච්ඡේදයේ පැහැදිලි කර ඇති පරිදි, සිංහල-බෞද්ධකරණය සම්බන්ධයෙන් බරපතළ

---

[590] Centre for Policy Alternatives (1 වන පාද සටහන).
[591] Seelan (395 වන පාද සටහන).
[592] Fernando (171 වන පාද සටහන).
[593] Bhavani Fonseka, 'Legal and Policy Implications of Recent Land Acquisitions, Evictions and Related Issues in Sri Lanka' (17 November 2014) Centre for Policy Alternatives <https://www.cpalanka.org/legal-and-policy-implications-of-recent-land-acquisitions-evictions-and-related-issues-in-sri-lanka/> ප්‍රවේශය 2024 ජූලි 15.
[594] Fernando (171 වන පාද සටහන); තව දුරටත් බලන්න S.Rubatheesan, 'Nearly one year on, these resettled families still groping in the dark' *The Sunday Times* (21 July 2024) <https://www.sundaytimes.lk/240721/news/nearly-one-year-on-these-resettled-families-still-groping-in-the-dark-564605.html> ප්‍රවේශය 2024 ජූලි 25.
[595] Fonseka (601 වන පාද සටහන).
[596] *Virakesari* (87 වන පාද සටහන).

සැලකිල්ලක් යොමු වන අතර, එමගින් හමුදාව ජනවාර්ගික හා ආගමික ආඛ්‍යානයක් ප්‍රචලිත කිරීමේ රාජ්‍ය හස්තය ලෙස ක්‍රියා කරන බව පෙනේ.[597] මෙම අවස්ථාවන් හි දී 'ජාතික උරුමයට', 'ජාතික ආරක්ෂාවට' වඩා ප්‍රමුඛත්වයක් ලබා දී ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නිරීක්ෂණය විය.[598] ඉහත සඳහන් කළ පරිදි, හමුදාව විසින් ම සිංහල-බෞද්ධ ආචාර ධර්ම පවත්වා ගෙන යන අතර, යාපනයේ තෛඩි හි තිස්සමහාරාමය එයට සරල නිදසුනකි (පරිච්ඡේදය 2.3.6 බලන්න), එහි දී ඉඩම් හිමියන් සහ ප්‍රධාන වශයෙන් දෙමළ ප්‍රජාවන්ගෙන් සමන්විත ප්‍රදේශයක දෙමළ ජනයාට අයත් පෞද්ගලික ඉඩමක පිහිටි අධි ආරක්ෂක කලාපයක බෞද්ධ විහාරයක් ඉදි කර ඇත.[599] සිංහල-බෞද්ධත්වයට පිරිනැමෙන මෙම ප්‍රමුඛතාවය ජාතිකවාදීන් වෙත සහාය දීම දක්වා විහිදේ. යාපනයේ නිලවරායි ළිඳ ආශ්‍රිත සිදුවීම (පරිච්ඡේදය 2.3.2 බලන්න) මීට අදාළ සිද්ධි අධ්‍යයනයක් සපයනු ලැබේ, එහි දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් හමුදා ආධාර ඇති ව කැණීම් ස්ථානයක පදනමක් පිහිටු වීමට පටන් ගත් අතර, පසුව එම ස්ථානයේ හමුදාව විසින් බුද්ධ ප්‍රතිමාවක් ඉදි කරන ලද බවට දක්වා ඇත.[600] මීට අමතරව, වඩාත් මෑත කාලීන උදාහරණයක් වෙඩුක්කුනාරි ආති ලිංගේශ්වරර් කෝවිල වෙතින් වාර්තා වන අතර, එහි දී 2024 පෙබරවාරි මාසයේ දී හමුදා නිලධාරීන්ගේ සහාය ඇති ව බෞද්ධ භික්ෂූන් වහන්සේලා පිරිසක් ශිවන් කෝවිලකට වැඩම කර කෝවිල් කළමනාකාරිත්ව මණ්ඩලයේ විරෝධතාව නොසලකා, එම ඉඩම වැදගත් බෞද්ධ උරුමයක් බව ප්‍රකාශ කරන ලදි.[601]

මේ අතර, උතුරු නැගෙනහිර ප්‍රදේශයේ ප්‍රාදේශීය ප්‍රජාවන් වෙත ආර්ථික සංවර්ධනයේ වැය බරක් ජනිත කිරීමට ද මෙම සමගාමී හමුදා ව්‍යාප්තිය හේතු වී ඇත. සැලකිය යුතු කරුණක් නම්, සිවිල් ජීවිතයේ දෛනික ක්‍රියාකාරකම් තුළ, විශේෂයෙන් ම සංචාරක හා කෘෂිකර්ම ක්ෂේත්‍ර තුළ හමුදාව ශක්තිමත් වී තිබීම යි. මෙම අවස්ථාවල දී, 'ජාතික ආරක්ෂාව' මුවාවෙන් ලාභ ඉපැයීම සඳහා උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඉඩම් අත්පත් කර ගැනීම් සිදු වී ඇති අතර, ඒ අනුව, එම ප්‍රදේශවල දෙමළ-හින්දු සහ මුස්ලිම් ආඛ්‍යාන යටපත් කිරීමට හමුදාවට හැකි වී තිබේ. මෙම මිලිටරි වර්ධනයට විය හැකි හේතුවක් ලෙස, වෙනුගෝපාල් විසින් 'මිලිටරි මූල්‍යවාදය' යන්න හඳුන්වනු ලබන අතර, එමගින් හමුදා නිලධාරීන්ට ලැබෙන ඉහළ වැටුප් සහ ප්‍රතිලාභ හේතුවෙන් හමුදාවට පුද්ගලයින් බඳවා ගැනීම ප්‍රතිවිරෝධී ලෙස ඉහළ ගොස් ඇති අතර,[602] එය සිවිල් ජන ජීවිතයේ විවිධ අංශ විශාල වශයෙන් ආක්‍රමණය කිරීමට හේතු වී තිබේ.[603] මේ අනුව, මිලිටරිය විසින් ඉඩම් අත්පත් කර ගැනීම් හරහා වාණිජමය වාසි ද අපේක්ෂා කරන බව පෙන්වා දිය හැක්කකි. පෙර සාකච්ඡා කළ යාපනයේ ජනාධිපති මන්දිරය (පරිච්ඡේදය 2.3.5 බලන්න) මේ සම්බන්ධයෙන් හොඳ උදාහරණයකි.[604] ඊට ප්‍රතිවිරුද්ධ ව, කෘෂිකර්මාන්තය අතින් ගත් කල, ඉහත සඳහන් කළ වවුනියාවේ ආණ්ඩිය පුලියන්කුලම සිදුවීම (පරිච්ඡේදය 2.8.1 බලන්න) කෘෂිකාර්මික ඉඩම් මත හමුදා කඳවුරු ඉදි කිරීමට නිදසුනකි.[605]

එවැනි මිලිටරි ප්‍රයත්නයන් වටා ඇති හානිය විවිධාකාර වන අතර, කලාපයේ ප්‍රජාවන් අවතැන් වීමට අමතරව, මිලිටරි වියදම් සහ ලාභය පිළිබඳ විනිවිදභාවය නැති වී යන අතර එමගින් ඔවුන්ගේ පරිපාලන

[597] M.Rasaratnam, '*Tamils and the Nation: India and Sri Lanka Compared*' (Hurst and Co. 2016), විවිධ හමුදා ඒකක සිංහල රජවරුන්ගේ නම් ආශ්‍රයෙන් නම් කිරීම, බෞද්ධ චාරිත්‍ර එදිනෙදා හමුදා ජීවිතයට ඒකාබද්ධ කිරීම සහ හමුදාව සහ බෞද්ධ ස්වාමීන් වහන්සේලා අතර ගොඩනැගුණු සමීප සබඳතා හරහා කාලයාගේ ඇවෑමෙන් හමුදාවේ වෙනස් වන පෞර්ෂය මෙයින් හඳුනා ගනී.

[598] B.Blodgett, '*Sri Lanka's Military: The Search for a Mission*' (Aventine Press 2004), මෙය 1962 සිට සිංහල-බෞද්ධයන් පමණක් හමුදාවට බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් හඳුනා ගනී. ; තව දුරටත් බලන්න D.L. Horowitz, 'Coup Theories and Officers Motives: Sri Lanka in Comparative Perspective' (PUP 2014), හමුදාවේ සහ පොලිසියේ දෙමළ පුද්ගලයන්ගේ ප්‍රමාණය 1956 දී 40] සිට 1980 වන විට 4] දක්වා පහත වැටුණි.

[599] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (118 වන පාද සටහන).

[600] *Virakesari* (73 වන පාද සටහන).

[601] *Tamil Win* (432 වන පාද සටහන).

[602] 'Overview' (*The World Bank*) <https://www.worldbank.org/en/country/srilanka/overview> ප්‍රවේශය 2024 ජනවාරි 24, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදා සාමාජිකයින් සංඛ්‍යාව 2009 දී 223,100 සිට 2017 වන විට 317,000 දක්වා වර්ධනය වී ඇති බව වාර්තා වේ.

[603] R.Venugopal, 'The Politics of Market Reform at a Time of Civil War: Military Fiscalism in Sri Lanka' (2011) Economic and Political Weekly (49) 67-75 <https://www.jstor.org/stable/41319460> ප්‍රවේශය 2024 ජනවාරි 24

[604] *Tamil Guardian* (104 වන පාද සටහන).

[605] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (396 වන පාද සටහන).

වග වීම අඩාල වේ.[606] තවද, උතුරු නැගෙනහිර ප්‍රදේශයන් හි සංචාරක ව්‍යාපාරයේ ඒකාධිකාරිය හමුදාව යටතට පත් කිරීම නිසා දේශීයකරණය වූ සමාජ-ආර්ථික සංවර්ධනයට කිසිදු ඉඩක් නො ලැබෙන බව සහතික කර ඇත. [607] හමුදා ක්‍රියාකාරකම් වාණිජකරණය අවම කිරීම සඳහා රජය විසින් කැපවීම් කර තිබුණ ද,[608] එකී ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමේ හිඟයක් පවතී. පැහැදිලි හේතුව නම්, මෙහි පැහැදිලි ව පෙනෙනුයේ 'ගැරිසන් සමාජය' වන අතර, [609] එමගින් රජයේ ප්‍රමුඛ ජනවාර්ගික හා ආර්ථික ඉලක්කයන් ජාතික ආරක්ෂාව, ජාතික උරුමය සහ මූල්‍යවාදය යන හමුදාවේ අරමුණුවලින් අඛණ්ඩ ව සම්පූර්ණ වේ. [610] වාර්ගික-බහුතරවාදයේ සමස්ත ආඛ්‍යානය සමඟ ඡේදනය වන මූල්‍ය අවශ්‍යතාවල මෙම ප්‍රවණතාවය පුද්ගලික සංස්ථාවල මැදිහත්වීම් ඔස්සේ දක්නට ලැබෙන අතර ඒ පිළිබඳ පහත කොටසෙහි ගවේෂණය කෙරේ.

## 4.4. පුද්ගලික ආයතනයන්ගේ මූල්‍ය ප්‍රතිලාභ

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂණයන් හි හඳුනා ගෙන ඇති වඩාත් මෑත කාලීන ප්‍රවණතාවක් වන්නේ ස්වභාවික සම්පත් නිස්සාරණය සහ වෙළඳ භාණ්ඩකරණය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික සංස්ථා අතර සහයෝගීතාවය යි. එවැනි අවස්ථාවන්හි දී, බරපතළ පාරිසරික හානිය සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම ප්‍රවර්ධනය කරන වෙළඳපොළ මෙවලමක් බවට ඉඩම් පත් ව තිබේ. පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම හරහා ස්වභාවික සම්පත් සූරාකෑම, දැනටමත් දේශීය ප්‍රජාවන්ට සම්පත් සහ ඔවුන්ගේ ජීවනෝපාය සඳහා ඇති ප්‍රවේශය සීමා කර ඇති අතර, අවට ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන් මත පාරිසරික පීඩනයේ බර පැටවීමෙන් ආර්ථික අසමානතාවයන් ද උග්‍ර කළ හැකි ය. ආර්ථික කැළඹිලි සහිත ජාතියක සන්දර්භය තුළ, මෙම නව යෝජනා ක්‍රම, 'සංවර්ධනයේ' නාමයෙන් අඩු වරප්‍රසාදිත පුද්ගලයින්ගේ මානව හිමිකම්වලට වඩා මූල්‍ය ලාභයට ප්‍රමුඛත්වය දෙන බව ඉඳුරාම කිව හැකි ය. බහුජාතික සමාගම් මෙහි දී නිරන්තර චෝදනාවට ලක් වන අතර, ශ්‍රී ලංකාවේ නීති රාමුවේ පවතින හිඩැස්වලින් ප්‍රයෝජන ගැනීමේ නැඹුරුවක් පවතී. ඒ අතර ම, සියල්ලට අනුකූල ශ්‍රී ලංකා රජය මෙවැනි ඍජු විදෙස් ආයෝජන සාදරයෙන් පිළිගන්නා අතර ගැටුම් දිගටම පවතින කලාපවලට මෙකී හානිකර ආයෝජන හරවා යවනු ලබයි. මෙය වර්ගිකවාදී රාජ්‍ය න්‍යාය පත්‍රය පෝෂණය කරන අතර ලාභය මත පදනම් වූ සමාගම් විසින් විසින් ප්‍රචාරණය කරනු ලබන හානි මගින් අඩු වරප්‍රසාදිත ප්‍රජාවන් දිගින් දිගට ම දුර්වල වේ.

මන්නාරම ප්‍රදේශයේ වැලි කැණීම් ව්‍යාපෘතියක් සිදු කරනු ලබන ඕස්ට්‍රේලියානු සමාගමක් වන ටයිටේනියම් සැන්ඩ් ලිමිටඩ් හි ක්‍රියාකාරීත්වය සම්බන්ධ වාර්තාව මෙවැනි හානි පිළිබඳ කදිම නිදසුනක් ලෙස පෙන්වා දිය හැකි ය (පරිච්ඡේදය 2.5.4 බලන්න). මෙම සිදුවීමේ දී මන්නාරම දූපතේ වැලි ගොඩදැමීම සඳහා අදාළ පෞද්ගලික සමාගම විසින් අක්කර 296ක් අත්පත් කර ගෙන ඇති බව වාර්තා වන අතර, එය විවිධ ඇඟවුම් මතු කරයි.[611] පළමුව, යම් මතභේදයකට තුඩු දී ඇති ඉඩමකට හිමිකම් පෑමක් ලෙස 'ප්‍රකාශන ඔප්පුවක්' නිර්මාණය කර ඇති ඕනෑම පුද්ගලයෙකු වෙතින් ඉඩම් ලබා ගැනීමට ටයිටේනියම් සැන්ඩ්ස් සමාගමට හැකියාව ලබා දී ඇති අතර, ඒ සම්බන්ධයෙන් කනස්සල්ලක් පවතී. [612] ඉඩමේ ඉතිහාසය වටා අවිනිශ්චිතතාවයක් පැවතුන ද, පුද්ගලික ආයතනයකට ඉඩම් අත්පත් කර

---

[606] Human Rights Watch (597 වන පාද සටහන).
[607] PEARL (551 වන පාද සටහන).
[608] 'Sri Lanka aims to demilitarise island by 2018' *AFP* (6 July 2016) <https://www.straitstimes.com/asia/south-asia/sri-lanka-aims-to-demilitarise-island-by-2018> ප්‍රවේශය 2024 ජනවාරි 31.
[609] Øivind Fuglerud, '*Militarisation and Impunity in Sri Lanka'* (Routledge Handbook 2021), 'ගැරිසන් සමාජයකී යනු මිලිටරි, ආර්ථික හා දේශපාලන බලය දරන ප්‍රමුඛ ආයතනවලින් එකක් වන අතර ඔවුන්ගේ අරමුණු සහ අවශ්‍යතා අනුපූරක වීම සහ පාලක පන්තියේ වාසි සමඟ බද්ධ වී ඇත.
[610] ඉහත පාද සටහන.
[611] Mimi Alphonsus and S.Rubatheesan, 'Australian company's multi billion sand mining project mired in Mannar protests' *The Sunday Times* (16 June 2024) <https://www.sundaytimes.lk/240616/news/australian-companys-multibillion-sandmining-project-mired-in-mannar-protests-560380.html> ප්‍රවේශය 2024 මැයි 3.
[612] ඉහත පාද සටහන.

ගැනීමේ ක්‍රමයේ ඇති හිදැස් ප්‍රයෝජනයට ගනිමින් ඉඩම ලාභ සඳහා භාවිතා කළ හැකි ය. මේ හේතුවෙන්, තල් ඉඩම් අක්කර 35කට හිමිකම් කියූ ඔලයිතොඩුවායි ප්‍රදේශයේ පදිංචිකරුවෙකුට අවට ඉඩම් හිමියන් විසින් එම දේපල ඇඳා ගනිමින් ස්වභාවික සම්පත් නිස්සාරණය කිරීම ආරම්භ කිරීම හේතුවෙන් සිය ඉඩම අහිමි වීම වැනි තත්ත්වයන් ඒ ඔස්සේ උදා වී තිබේ. [613] මෙම ඉඩම් අත්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් අනුගමනය කරන ලද උපක්‍රම ද ගැටලුකාරී වන අතර, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ අධ්‍යයනයේ දී, ප්‍රාදේශීය ප්‍රජාවන් චෝදනා කළේ පුද්ගලයන් හිතාමතා ගංවතුර ඇති කර නිවැසියන්ට ඉවත් වීමට බල කර ඇති බවත්, විරුද්ධවාදීන් බිය ගැන්වීම සඳහා පොලිසියේ සහාය පවා ලබා ගෙන ඇති බවත් ය. [614] මෙම රැවටිලිකාර උපක්‍රමවලට ගොදුරු වූවන්ගේ නිවාස, ආහාර, ජලය සහ සෞඛ්‍ය ඇතුළු සියල්ල සඳහා ඔවුන්ට ඇති අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව මෙහි දී දක්නට ලැබෙන්නකි.

ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු බහුජාතික සමාගම් විසින් සිදු කරන පාරිසරික හානිය ද නැගී එන ප්‍රවණතාවක් ලෙස සැලකිය හැකි ය. නිදසුනක් වශයෙන්, මන්නාරමේ වැලි ගොඩදැමීම සම්බන්ධයෙන්, ප්‍රදේශයේ ප්‍රජාවන් පෙන්වා දී ඇත්තේ එවැනි ක්‍රියාකාරකම් නිසා ලවණ ජලය දූෂණයවීමටත්, දූපත ගංවතුරට ලක් වීමටත්, පවතින පස ද පසුව විනාශ වීමටත් හේතු වන බව යි. [615] ලාභ ඉපැයීමේ අරමුණින් නිවැසියන්ට සිය ජීවනෝපාය අහිමිවීමේ සහ අවතැන්වීමේ අවදානම් දිනෙන් දින ඉහළ යන අතර ශ්‍රී ලංකා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය එවැනි තත්ත්වයන් පැවතියදීත් සංස්ථාවට කැණීම් බලපත්‍රයක් මගින් අවසර ලබා දී ඇත. [616] සමාගම මෙම හානිය වසන් කිරීමට පුරෝකථනය කළ හැකි ලෙස උත්සාහ කර ඇත, උදාහරණයක් ලෙස ටයිටේනියම් සැන්ඩ්ස් විසින් පත් කළ උපදේශකයෙකු, " ලවණ ජලය ගොඩගැලීමක් සිදු නොවන බව" කියා සිටි අතර, ව්‍යාපෘතිය අවසන් වූ පසු ඉඩම් හිමියා කැමති ඕනෑම වෘක්ෂලතාදියක නැවත වගා කරන බවට ඉඩම් හිමියන්ට සහතික විය. [617] එහෙත්, භෞතික සාක්ෂි මගින් ඉඩම් අහිමි විය හැකි බව පෙන්වා දෙන අතර තව දුරටත්, සමාගම සිය පොරොන්දු ඉටු කරන බව සහතික කිරීම සඳහා ඵලදායී නීතිමය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක නොවේ.

මෙම ගැටලු අදානි ග්‍රීන් එනර්ජි සමාගම විසින් සිදු කර ගෙන යන සුළං බල ව්‍යාපෘතියට සමානකම් දක්වන බව පෙනී යන අතර (පරිච්ඡේද 2.5.1 සහ 4.1.2 බලන්න), එහි දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ප්‍රදේශයේ ප්‍රාදේශීය ප්‍රජාවන් සහ සිවිල් සමාජ සංවිධාන සමඟ පවත්වන ලද සාකච්ඡා මගින් ප්‍රධාන ගැටලු අනාවරණය විය. පක්ෂි සංක්‍රමණ රටාවලට විශාල හානියක් සිදු කළ හැකි සුළං ටර්බයින සවි කිරීම මෙයට ඇතුළත් විය, නමුත් අදානි සමාගමේ ප්‍රකාශකයෙකු එස්. එල්. එස්. සී. ඒ. ආයතනය විසින් කුරුල්ලන් සහ වවුලන් පිළිබඳ අධ්‍යයනයක් කර ඇති බවත් පාරිසරික ප්‍රමිතීන්ට අනුකූලව නව අධි තාක්ෂණික රේඩාර් පද්ධති ස්ථාපනගත කරන බවත් සඳහන් කරමින් සමාගමේ ස්ථාවරය ආරක්ෂා කරන ලදි. [618] මෙම පද්ධතීන් මගින් පැමිණෙන පක්ෂි රංචු හඳුනා ගෙන, අධි අවදානම් සහිත පක්ෂි විද්‍යාත්මක කාලවල දී ටර්බයින වහාම වසා දමන බවට කියා සිටී. [619] කෙසේ වෙතත්, මෙම පද්ධති සඳහා කිසිදු සැලසුමක් අද දක්වා ලබා දී නොමැත. ව්‍යාපෘති විස්තරවල නිශ්චිතභාවයක් නොමැතිකම, සෘණාත්මක බාහිර කරුණු නොසලකා හරිමින් යහපත් කරුණු පමණක් අවධාරණය කිරීම සහ

---

[613] ඉහත පාද සටහන.

[614] 'Landlocked Part II: A Visual Narrative of Some of the Land Conflicts in Northern and Eastern Provinces in Sri Lanka' (*Centre for Policy Alternatives*, 13 May 2024) <https://new.express.adobe.com/webpage/luo0aAcCdNfFZ?fbclid=PAZXh0bgNhZW0CMTEAAaYpcCnoWB0LwXjJuCEeoucDGv89XoY9oDwu9cH5L0CSKAEShCS4hR-hPAs_aem_AWAIvcYemjByyFW_VnjhmQMj57zC2ST4ODQz72BDzGSo__KS-7hjyTf_-ox9lfI7T_ouUmzKZ_uNYl0MjFloekf3> ප්‍රවේශය 2024 මැයි 3.

[615] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පවත්වන ලද සම්මුඛ සාකච්ඡාව (145 වන පාද සටහන).

[616] Alphonsus and Rubatheesan (619 වන පාද සටහන).

[617] ඉහත පාද සටහන.

[618] 'Indian Adani Group says "vicious campaign" against its Sri Lanka wind project' *Economy Next* (21 March 2024) <Indian Adani Group says "vicious campaign" against its Sri Lanka wind project | EconomyNext> ප්‍රවේශය 2024 මැයි 3.

[619] *The Sunday Times* (168 වන පාද සටහන).

විශ්වසනීය පාරිසරික ආරක්ෂණ සැලසුම් නොමැතිකම මන්නාරම සංවර්ධන ව්‍යාපෘතිවල 'හරිත හරණයී පෙන්නුම් කරයි. [620]

නිසැකව ම ගත් කල, ව්‍යාපෘති අනුමත කිරීමට රාජ්‍ය ආයතනවල කැමැත්තකින් තොරව මෙන් ම මහජනතාවගේ සැබෑ යහපතට හේතු වන දේ නොසැලකිලිමත් ලෙස නොසලකා හැරීමට ඉඩ සලසන හඳුනාගත හැකි දුර්වලතා සහිත ව්‍යවස්ථාපිත රාමුවක් නොමැතිව එවැනි ව්‍යාපෘති සිදු කළ නොහැකි ය. ඒ අනුව මෙතෙක්, මෙම සෘජු විදේශ ආයෝජන සඳහා ඇති එක ම සාර්ථක වැළැක්වීමේ පියවර බවට ප්‍රාදේශීය ප්‍රජාවන් සහ මහජනතාව විසින් සිදු කරන ක්‍රියාකාරී විරෝධතා පත් ව තිබේ. වැලි ගොඩදැමීමේ ව්‍යාපෘතියට ප්‍රදේශවාසීන්ගෙන් එල්ල වූ දැඩි විරෝධය හේතුවෙන් මන්නාරමේ පාරිසරික බලපෑම් ඇගයීම් තක්සේරුවක් සිදු කිරීමට මධ්‍යම පරිසර අධිකාරියට නොහැකි වීම ඊට සාක්ෂි සපයයි. [621] කෙසේ වෙතත්, අවසානයේ දී, ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ඉඩම් ඉලක්ක කර ගනිමින් රජය විසින් ව්‍යාප්ත කරන මෙන් ම භයානක 'සංවර්ධනී න්‍යාය පත්‍රයට එරෙහි ව අඛණ්ඩ ව සහ සක්‍රීය ව මහජනයා විරුද්ධ වීම මත විශ්වාසය තැබීම තිරසාර පියවරක් ලෙස දැක්විය නොහැක. මෙහි දී අවශ්‍ය වන්නේ රජය මගින් සමූහ වශයෙන් නෛතික හා ප්‍රතිපත්තිමය වෙනසක් ඇති කිරීම යි. ඒ සඳහා ඉදිරියේ දී ගත හැකි පියවර කිහිපයක් පිළිබඳ පහත කොටසින් සඳහන් කරයි.

# 5. ඉදිරි මඟ

## 5.1. නිර්දේශ

සමස්තයක් වශයෙන් ගත් කල, මෙම වාර්තාව මගින් හෙළිදරව් කරන ලද ඉඩම් ආශ්‍රිත ගැටුම්වල අන්තර් සම්බන්ධිත ප්‍රවණතා ඉඩම් ගැටුම් ඇති වන තැන්වල දී නීතිමය සහ ප්‍රතිපත්තිමය ගැටලු රාශියක් පෙන්නුම් කරයි. පහත දැක්වෙන පරිදි, මෙම කොටස රාජ්‍ය බලධාරීන්ට සහ අනෙකුත් ක්‍රියාකාරීන්ට රාජ්‍ය අනුග්‍රහය සහිත යටත් විජිතකරණ යෝජනා ක්‍රමවලට එරෙහි ව සටන් කිරීම, හමුදා ක්‍රියාකාරීන් හා සහසම්බන්ධිත ඉඩම් ගැටුම්වල පවතින වාර්ගික හා ආගමික බෙදීම් තුරන් කිරීමට, මෙන් ම මෑත කාලීන 'සංවර්ධන' න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී පරික්ෂාකාරී සහ තුලනාත්මක ක්‍රමවේදයන් අනුගමනය කිරීම සඳහා ද පුළුල් ප්‍රතිපත්තිමය නිර්දේශ මාලාවක් ඉදිරිපත් කෙරේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පසුගිය වාර්තාවල පුළුල් ලෙස උද්දීපනය කර ඇති ඇඟවුම් මෙන් ම නැගී එන නව ප්‍රවණතාවලට එරෙහි ව සටන් කිරීම සඳහා වන නිර්දේශයන් පහතින් ඉදිරිපත් කෙරේ:

### 1. යහපාලනය

විශ්ලේෂණය කරන ලද විවිධ සිද්ධීන් සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන මත පදනම් ව, විවිධ අරමුණු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් පිටුපස ඇති ක්‍රියා පටිපාටීන් හි විනිවිදභාවය සහ වග වීම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිසංස්කරණය කළ යුතු අතර, එහි දී තත්කාලීන ශ්‍රී ලංකාවේ සන්දර්භය රජය විසින් පිළිගත යුතුය අතර එය පශ්චාත් සිවිල් යුද අවදියක පසුවන මෙන් ම පාලන අර්බුදයකට ලක් වූ රටක් ය යන්න සැලකිල්ලට ගත යුතු ය. පෙර දී අවධාරණය කළ පරිදි, ඇතැම් ඉඩම් අත්පත් කර ගැනීම්

---

[620] 'Greenwashing – the deceptive tactics behind environmental claims' *United Nations Climate Action* <https://www.un.org/en/climatechange/science/climate-issues/greenwashing#:~:text=Being%20purposely%20vague%20or%20non,and%20can%20be%20easily%20 misinterpreted> ප්‍රවේශය 2024 මැයි 3.

[621] Alphonsus and Rubatheesan (619 වන පාද සටහන).

රහසිගත ව වැසී යාමේ ඉඩකඩ පවතින අතර, අත්පත් කර ගැනීමට අදාළ තර්කය, නෛතික ක්‍රියාවලිය මෙන් ම අත්පත් කර ගැනීම තුළින් මහජනතාවට ඇති වන පසුකාලීන බලපෑම් සම්බන්ධයෙන් සීමිත තොරතුරු ඇත. ඉඩම් අත්පත් කර ගන්නා "පොදු අරමුණ" සම්බන්ධයෙන් වඩාත් විවෘතව සිටීමෙන් සහ අනාගත අත්පත් කර ගැනීම් සඳහා ඉඩම් හඳුනා ගැනීමේ දී දිස්ත්‍රික් මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් ජනතාව ක්‍රියා කළ යුතු ආකාරය හෙළි කිරීමෙන් අත්පත් කර ගැනීම් සම්බන්ධ නිරන්තර අපැහැදිලිතාවය රජය මැදිහත් වීමෙන් විසඳිය යුතු ය. දෙවනුව, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ දී බල අතික්‍රමණය කරන රාජ්‍ය පාර්ශවකරුවන් වගකීමට යටත් කළ යුතු ය.

මිලිටරිකරණය වූ ඉඩම් සම්බන්ධයෙන් පාරදෘශ්‍යභාවය පිළිබඳ ප්‍රශ්නය විශේෂයෙන් දක්නට ලැබෙන්නකි. ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සිදු කළ සම්මුඛ සාකච්ඡාවල දී පාර්ශවකරුවන් විසින් 'ජාතික ආරක්ෂාව' මත පදනම් ව උතුරු හා නැගෙනහිර දෙපළාත්වල ත්‍රිවිධ හමුදාව විසින් දැනට අත්පත් කර ගෙන සිටින ඉඩම් සහ ඉඩම් ප්‍රමාණය මෙන් ම ඒවායේ නියම හිමිකරුවන් වෙත ඒවා නිදහස් කරන්නේ කවදා ද යන්න හඳුනා ගෙන රජය විසින් නිර්මාණය කරන ලද ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකි මාර්ගගත දත්ත ගබඩාවකට ඇතුළත් කිරීම යෝග්‍ය බව සඳහන් විය.

මීට අමතරව, මෑත කාලීන ව සිදු කරන ලද 'සංවර්ධන' ව්‍යාපෘති ඒවාට අදාළ කටයුතු නිසි පරිදි පාලනයවීමේ වැදගත්කම අවධාරණය කරන අතර, විශේෂයෙන් ම සුළං බලශක්ති ගොවිපලවල් ඉදිකිරීමේ මෙන් ම වැලි කැණීමේ ව්‍යාපෘතීන්ගේ පාරිසරික බලපෑම රාජ්‍ය බලධාරීන්ගේ පරීක්ෂාවකට ලක් ව ඇත්තේ අතිශය අවම වශයෙනි. එවැනි ව්‍යාපෘති පිටුපස ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ පවතින තොරතුරු නොමැතිකම පිළිබඳ ගැටලුව කෙරෙහි අනාගත 'සංවර්ධන' ව්‍යාපෘතීන් හි දී අවධානය යොමු කළ යුතු ය. මෙම ගැටලු පොදු අවකාශයේ සීමිත තොරතුරුවලින් සමන්විත 'උරුමය වැඩසටහනී වැනි නව ඉඩම් ප්‍රදාන යෝජනා ක්‍රම සමඟ ජේදනය වේ. එවැනි ව්‍යාපෘතිවල දිගු කාලීන බලපෑම් තක්සේරු කිරීම දුෂ්කර වන අතර, ඒවායින් ප්‍රවර්ධනය කරන හානිය වාර්තා නොවීම කෙරෙහි මෙය ද හේතුවකි. මේ අනුව, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් ප්‍රවර්ධනය කරනු ලබන අනාගත ඉඩම් අත්පත් කර ගැනීම්, එකී අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට පෙර විශේෂඥයන්ගේ මෙන් ම මහජනතාවගේ උපදේශනයන්ට ද යටත් කළ යුතු ය.

යහපාලනය ඉදිරියට ගෙන යාමට සමාන්තර ව ප්‍රවේශතා ගැටලු ද විසඳිය යුතු ය. බොහෝ අත්තනෝමතික ඉඩම් අත්පත් කර ගැනීම්වල දී, ඉඩම් අත්පත් කර ගන්නා පාර්ශවයන්ට ප්‍රමාණවත් දැනුම්දීමක් ලබා නොදෙන අතර, සමහර අවස්ථාවල දී, ඉඩම් අත්පත් කර ගන්නා රජය සහ අත්පත් කර ගැනීම් මගින් බලපෑමට ලක් වන බිම් මට්ටමේ ජනතාව අතර සන්නිවේදනයට භාෂාව බාධාවක් බව තහවුරු වී තිබේ. ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ තොරතුරු ලබා දීම, අත්පත් කර ගැනීමට පෙර දැනුම් දීම වැනි කටයුතු පැහැදිලි ව ප්‍රදර්ශනය කිරීම සහ බලපෑමට ලක් වූ ප්‍රජාවන්ට භාෂා තුනෙන් ම ඒවා ලබා දෙන බවට රජය මේ අනුව සහතික විය යුතු ය. බොහෝ ව්‍යවස්ථාපිත විධිවිධාන ප්‍රකාරව දැනටමත් එවැනි දැනුම්දීමක් සිදු කිරීම අවශ්‍ය වුව ද, ප්‍රායෝගික ව එය ක්‍රියාත්මක කෙරෙනුයේ ඉතා අවම වශයෙනි.

## 2. ගැටුම් අවුලුවාලීම

4.1 පරිච්ඡේදයේ පෙන්වා දී ඇති පරිදි, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් ප්‍රචාරය කරන ලද ඉඩම් ගැටුම් විවිධ ප්‍රජාවන් අතර, විශේෂයෙන් අන්ත ජාතිකවාදී අනුගාමිකයන් අතර වාර්ගික ආගමික ආතතීන් ඇති කරයි. අනාගත ගැටුම් සඳහා මෙවැනි විභවතාවන් ආමන්ත්‍රණය කිරීමට රජය විසින් කටයුතු කළ යුතු ය. මේ සම්බන්ධයෙන් ගැටුම් වළක්වා ගැනීමේ පළමු පියවර වන්නේ ආගමික ඉතිහාසය හේතුවෙන් මතභේදයට තුඩු දී ඇති සහ 'ජාතික උරුමය' සම්බන්ධ ගැටලු ඇති ඉඩම් පිළිබඳ ගැටුම් නිරාකරණය කිරීම යි. මෙම අවස්ථාවල දී, සුළු ජාතීන්ගේ සංස්කෘතිය සහ ආගමට වැය බරක් එක් කිරීම තුළින් සිංහල-බෞද්ධ උරුමයන් සඳහා විවිධ රජයේ දෙපාර්තමේන්තු විසින් පැහැදිලි ප්‍රතිපත්තිමය ප්‍රමුඛත්වය ලබා දීම වහාම සමාලෝචනයට ලක් විය යුතු ය. දෙවන අංගය නම්, ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල නැඟී එන හින්දු ජාතිකවාදී කතිකාවන්ට ආමන්ත්‍රණය

කිරීම සඳහා සංක්‍රාන්ති යුක්ති-විශේෂිත ව්‍යාපාර වැනි වඩාත් ඒකාබද්ධ සාමය ගොඩනැගීමේ ක්‍රියාමාර්ග රජය විසින් සිදු කිරීම යි.

## 3. නීති ප්‍රතිසංස්කරණ

3 වන පරිච්ඡේදයේ ගවේෂණය කර ඇති පරිදි, ඉඩම් අත්පත් කර ගැනීම් සහ ගැටුම් සම්බන්ධ නීතිමය රාමුව තුළ බහුවිධ කඩතොලු පවතින බව දක්නට ලැබෙන්නකි. මේ සම්බන්ධයෙන් ගෙන ඒමට අවශ්‍ය පළමු ප්‍රධාන වෙනස වන්නේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය සහ පළාත් සභාවේ බලතල පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම යි. පළාත් සභා නියෝජිතයින්ට ඉඩම් සම්බන්ධයෙන් සැබෑ බලතල බෙදා හැරීමකින් තොරව මධ්‍යම රජය විසින් ඉඩම් පරිපාලනය අඛණ්ඩ ව පවත්වාගෙන යාම මෙහි දී සැලකිය යුතු කරුණකි. මීට පෙර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පළ කරන ලද වාර්තාවල හඳුනා ගෙන ඇති පරිදි, උතුරු නැගෙනහිර පුරා ඇති ඉඩම් ගැටුම් රාශියකට විසඳුම් සෙවීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක කළ යුතු අතර පළාත් සභාවලට වැඩි ස්වාධීනත්වයක් පැවරිය යුතු ය. 13 වැනි සංශෝධනය තුළ දක්වා ඇති පරිදි මෙම පළාත් සභා නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ජාතික ඉඩම් කොමිෂන් සභාවක් මගින් ඉඩම් සම්බන්ධ ප්‍රතිපත්තිය සම්පාදනය කළ යුතු බව එයින් කියැවේ. ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සහ පුළුල් මධ්‍යම රජයේ න්‍යාය පත්‍රය මගින් මගහරිනු ලබන ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හැකියාව වෙනුවට ඉඩම් ගැටුම් සමනය කිරීමේ දී පළාත් ඉඩම් කොමසාරිස්වරුන්ට අර්ථවත් කාර්යභාරයක් මෙමගින් ලබා දෙනු ඇත.

ඉඩම් අත්පත් කර ගැනීමේ පනත වැනි පුළුල් පරාසයක පැතිර පවතින ව්‍යවස්ථාපිත විධිවිධානවලට "මහජන අරමුණ", "හදිසි භාවය" යනාදී භාෂාවට සුදුසු නිර්වචන ලබා දීම සඳහා ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. මෙම සංශෝධන විශේෂඥ මත විමසීම්වලින් මෙන් ම මහජන උපදේශන සැසි මගින් ද පෝෂණය කිරීම සඳහා විධිවිධාන හඳුන්වා දිය යුතු ය. අවසාන වශයෙන්, තරඟකාරී හිමිකම් පවතින විට, එම ආරවුල් විසඳීම සඳහා දිස්ත්‍රික්ක පුරා සමථ මණ්ඩල ක්‍රියාත්මක කිරීමට සහ පුළුල් කිරීමට මෙම ව්‍යවස්ථාපිත විධිවිධානවලට හැකියාව ඇත.

## 4. වන්දි ගෙවීම සහ ඉඩම් නැවත ලබා දීම

රාජ්‍ය පාර්ශවකරුවන් (රජයේ දෙපාර්තමේන්තු සහ හමුදාව) විසින් ආරම්භ කරන ලද ගැටලු සහගත ඉඩම් අත්පත් කර ගැනීම් හේතුවෙන්, මෙයට තොරතුරු නිසි පරිදි දැනුම් නොදීම, වන්දි ලබා නොදීම හෝ විකල්ප ඉඩම් ලබා නොදීම ඇතුළත් වන අතර, අවතැන් වූ වින්දිතයින් සංක්‍රාන්තික යුක්තිය යටතේ වන්දි ලැබීමට හිමිකම් කියයි. පැහැදිලිව ම, ඉඩම් අත්පත් කර ගැනීම් හේතුවෙන් ඍණාත්මක ලෙස බලපෑමට ලක් වූවන් සඳහා පුද්ගල සහ සාමූහික වශයෙන් පුළුල් වන්දි පැකේජයක් සැපයීම රජයේ වගකීම වේ.[622] මෙම ඉඩම් ගැටුම්වලින් පීඩාවට පත් වූවන් හඳුනා ගැනීම සඳහා, එහි සඳහන් වන්දි පැකේජයට හිමිකම් ලැබීමට සුදුසුකම් ලබන්නේ කවුරුන් ද යන්න පිළිබඳ ව පැහැදිලි නිර්ණායක සහිත ඉඩම් ලේඛනයක් නිර්මාණය කිරීමට රජය විසින් කටයුතු කළ යුතු ය.

තවද, අසාධාරණ ලෙස අත්පත් කර ගත් ඉඩම නැවත ලබා දීම මෙම වන්දි ක්‍රියාවලියේ කොටසක් වන අතර, එම ඉඩම එහි නීත්‍යානුකූල හිමිකරුවන්ට නැවත ලබා දීමෙන් ඔවුන්ගේ පදිංචිය, ඔවුන්ගේ ආගම් සහ ඔවුන්ගේ ජීවනෝපාය යථා තත්ත්වයට පත් වනු ඇති බව පැවසිය හැකි ය. [623] ඉඩම්

[622] Bhavani Fonseka, Luwie Ganeshathasan and Marjorie Tenchavez, 'Land Occupation In The Northern Province: A Commentary On Ground Realities And Recommendations For Reform' (March 2016) <https://www.cpalanka.org/land-occupation-in-the-northern-province-a-commentary-on-ground-realities-and-recommendations-for-reform/> ප්‍රවේශය 2024 ජුනි 27.

[623] ජාත්‍යන්තර මානුෂීය නීතියේ දළ උල්ලංඝනය කිරීම්වලට ගොදුරු වූවන් සඳහා පිළියමක් සහ වන්දි ගෙවීමේ අයිතිය පිළිබඳ මූලික මූලධර්ම සහ මාර්ගෝපදේශ (2005 දෙසැම්බර් 15 දින සම්මත කරන ලදි) UNGA Res 60/147, බලන්න

ප්‍රතිසංස්කරණය ක්‍රියාවට නැංවීමේ බරපතළ අභියෝගය වන්නේ එම භූමියට අදාළ ජනවාර්ගික ආතතීන් සහ ආර්ථික ගැටලු සමග බැඳී ඇති දේශපාලන ප්‍රතිරෝධය යි. [624]

## 5.2. නිගමනය

උතුරු හා නැගෙනහිර දෙපළාතේ ප්‍රාදේශීය ප්‍රජාවන් මුහුණ දෙන ඉඩම් සම්බන්ධයෙන් බහුවිධ අභියෝග වාර්තාවෙන් පෙන්වා දී ඇත. මෙම පර්යේෂණය ඉඩම් ගැටුම සම්බන්ධ සිද්ධි මාලාවක් සහ 'ජාතික උරුමය', 'සංවර්ධනය' සහ වෙනත් ප්‍රශ්නවල නාමයෙන් ඉඩම් අත්පත් කර ගැනීම් සමග රජයේ සහ අනෙකුත් ක්‍රියාකාරීන්ගේ භූමිකාව විමර්ශනය කරයි. තවද, රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ වර්ධනය වන භූමිකාව, විශේෂයෙන් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සහ පෞද්ගලික සංස්ථාවල කාර්යභාරය වාර්තාව පැහැදිලි කරයි. එපමණක් නොව, ජීවනෝපාය සහ පරිසරයට සදාකාලික හානියක් සිදු කරන සහ ජනතාවගේ ජීවන තත්ත්වයට හානි කරන ප්‍රාදේශීය ප්‍රජාවන්ට අයත් පෞද්ගලික දේපළ සංවර්ධනය සඳහා පවරා ගන්නා පුද්ගලික ක්‍රියාකාරීන්ට පනවා ඇති සීමිත බාධාවන් සහ රෙගුලාසි පිළිබඳ ව වාර්තාව සිය අවධානය යොමු කරයි.

යුද්ධයෙන් වසර පහළොවකට පසුව, උග්‍ර වූ වාර්ගිකවාදයේ සහ මිලිටරිකරණයේ සන්දර්භය තුළ ප්‍රාදේශීය ප්‍රජාවන් මුහුණ දෙන විවිධ අභියෝග ශ්‍රී ලංකාවේ බිඳෙනසුලු සාමය ගැන ඇඟවුම් සිදු කරයි. මේ සම්බන්ධයෙන්, සහ පර්යේෂණ සහතික කරන පරිදි, සියලු පාර්ශවකරුවන්ගේ හදිසි අවධානය අවශ්‍ය වන ක්ෂේත්‍රයක් ලෙස සහ ගැටුම් සඳහා ප්‍රේරකයක් ලෙස ඉඩම් යන්න දිගටම පවතී. මෙම ප්‍රවණතා ආමන්ත්‍රණය කිරීමට සහ තිරසාර විසඳුම් ගෙන ඒමට ඇති නොහැකියාව හෝ අකමැත්ත නිසාවෙන් ගැටුම් උග්‍ර කරන අතර නැවත ගොඩනැගීමේ සහ ප්‍රතිසන්ධානය සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන්ට තව දුරටත් බාධාවක් වනු ඇත.

<https://www.ohchr.org/en/instruments-mechanisms/instruments/basic-principles-and-guidelines-right-remedy-and-reparation> ප්‍රවේශය 2024 ජූලි 28.

624 Fonseka, Ganeshathasan and Tenchavez (n 630).